***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2018, 2019 සහ 2020 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා මාධ්‍ය, තාරුණ්‍ය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියා මාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දවස්වල මාධ්‍ය හමුවක් - press conference - ලංකාවේ හැම තැනම පවත්වමින් යනවා ලු. මහින්ද පතිරණ කියන සභාපතිතුමා තමයි ඒක පවත්වා ගෙන යන්නේ. ඒකට කිසිම වෙලාවක දෙමළ මාධ්‍යකරුවන් කාටවත් ආරාධනා කරලා නැහැ කියලා තමයි කියන්නේ. Especially, නුවරඑළියේ 21වැනි දා තිබෙනවා ලු. "දෙමළ මාධ්‍යයෙන් පවත්වන්න අපට මුදල් නැහැ. ඒ නිසා වෙන දවසක පවත්වන්නම්. දැනට ඒක කරන්න බැහැ" කියලා ඒ ගොල්ලන් කියනවා ලු. ඒ බෙදීම හොඳ නැහැ කියන එක තමයි මම මේ අවස්ථාවේ කියන්නේ.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, UNDP එකේ මූල්‍ය අරමුදල්වල දායකත්වයෙන් තමයි ඒ වැඩසටහන රට පුරා දියත් කරන්නේ. ඒ සම්පත් දායකයන්ට ගෙවීම් කිරීම, ඒ ස්ථාන ලබා දීම සහ ඒකට අවශ්‍ය අනික් සෑම වියදමක්ම දරන්නේත් UNDP එක. ඒ වැඩසටහන සඳහා පසුගිය වර්ෂයේ ලැබුණු මුදල් නිම වෙලා තිබෙනවා. මම ඒ ආයතනයෙන් ඉල්ලා සිටියා, මේ වර්ෂයටත් මුදල් ටිකක් ලබා දෙන්න කියලා. දෙමළ හා මුස්ලිම් ජනතාව ජීවත්වන ප්‍රදේශවල මාධ්‍යකරුවන් පුහුණු කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලෙස ඔබතුමා කරන ඉල්ලීම මම පිළිගන්නවා, මන්ත්‍රීතුමනි. ඒ වැඩසටහනට මුදල් ලැබුණොත්, මම ඒක කරලා දෙන්නම්.

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)

ගරු ඇමතිතුමනි, ඒ ගොල්ලන්ටත් ආරාධනා කරන්න. ඒ අය සිංහල දන්නවා. දෙමළ භාෂාවෙන් වෙනම කියන්න ඕනෑ නැහැ. සිංහල භාෂාව ඒ ගොල්ලන්ට තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා ආරාධනා කරන්න. ඇයි ආරාධනා නොකරන්නේ? Invite them.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)

ඒක කරන්න කියලා මම කියන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ලිපිලේඛනාදිය පිළිගැන්වීම යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියම ඉදිරිපත් කරමි.

(i) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(ii) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ඔක්තෝබර් 06 දිනැති අංක 2352/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

මෙම නියම සංචාරක හා ඉඩම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමතිතුමා පසුගිය දිනවල ඉන්දියාවේදී ප්‍රකාශයක් කළා, ශ්‍රී ලංකාව ඉන්දියාවේ කොටසක් කියලා. ඒක, කැබිනට් මණ්ඩලයේ සාමූහික මතයද, ආණ්ඩුවේ නිල මතයද, එහෙම නැත්නම් එතුමාගේ පෞද්ගලික මතයද? එවැනි පෞද්ගලික මතයක් තමන් නියෝජනය කරන රට වෙනුවෙන් ඉදිරිපත් කරන්න ඇමතිවරයෙකුට තිබෙන අයිතිය මොකක්ද?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිවරයා සම්බන්ධ වූ පසු ඒ ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න කටයුතු කරන්නම්. ඒක කැබිනට් මණ්ඩලයේ කථා වූ කාරණයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට, ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම පරිශීලනය කළා නම්, ඒකෙන් කිව්වේ මොකක්ද කියන එක නිවැරැදිව කියන්න පුළුවන්. සාමාන්‍යයෙන් සමාජ මාධ්‍යවල වෙන්නේ කරපු කථාවක් කපලා කොටලා විවිධ මත ඉදිරිපත් කිරීමයි. ඉන්දියාවත් ලංකාවත් අතර තිබෙන සබඳතාව පෙන්වලා, අපේ ඓතිහාසික සබඳතාව පෙන්වලා, සමානකම් පෙන්වලා, ලංකාවත් ඉන්දියාවත් අතර තිබෙන සංහිඳියාව පෙන්වලා සංචාරය කරන්න ලංකාවට එන්න කියලා ආරාධනා කරද්දී ප්‍රකාශ කළ සමහර වචන එකතු කරලා, සමහර වචන කපලා සමාජ මාධ්‍ය විසින් පාවිච්චි කරපු අවස්ථාවක් ඒක. ඒ සම්පූර්ණ මාධ්‍ය වාර්තාව ඇහුවාම ඒක නිවැරැදි කර ගන්න පුළුවන්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෞද්ගලිකව නිවැරැදි කිරීමක් නොවෙයි ඕනෑ. අදාළ ඇමතිවරයා එහෙම කියලා නැත්නම් නිල වශයෙන් ප්‍රකාශයක් කරන්න ඕනෑ, "මගේ කථාවේදී මම කිව්වේ මෙහෙමයි, එහෙම කථාවක් මම කිව්වේ නැහැ" කියලා. එතුමා කියනවා, airports තුනම දෙන්නම්, අරවා දෙන්නම්, මේවා දෙන්නම් කියලා. එහෙම කියලා "part" කියන වචනය පාවිච්චි කරන්නේ, ඉන්දියාවේ part එකක් කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි නැවත ලිපිලේඛනාදිය පිළිගැන්වීමට යොමු වෙමු, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2020/2021 වර්ෂය සඳහා කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමනි, ඔබතුමා මොන කාරණයට අදාළව ද කථා කරන්නේ?

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත අමාත්‍යාංශයට අදාළ කාරණයක් මම මේ මතු කරන්නේ.

ගිංතොට තුනී ලැලි සංස්ථාවේ අක්කර 17ක ඉඩම රුපියල් ලක්ෂ 82කට යසසිරි කස්තුරිආරච්චිට දීලා, දැන් එම ඉඩම block out කරලා විකුණනවා. එම කර්මාන්තයවත් එතැන පවත්වාගෙන යන්නේ නැහැ. රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය මේකද? කර්මාන්තශාලාවක් පවත්වාගෙන යන්නට රජයෙන් ලබා දීපු ඉඩම නිවාස හැදීමට block out කරලා විකුණන්න හැකියාවක් තිබෙනවාද? රජය ඒකට අවසර දෙනවාද? ඒකද, කර්මාන්ත අමාත්‍යාංශයේ කාර්යභාරය? *[බාධා කිරීමක්]* ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ලිපිලේඛන ඉදිරිපත් කරන වෙලාව නේ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සභාවේ ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා (ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க - ஆரம்பக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Chamara Sampath Dasanayake - State Minister of Primary Industries)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිංතොට තුනී ලැලි සංස්ථාව ගැන ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න විෂය භාර අමාත්‍යතුමා පාර්ලිමේන්තුවේ නැහැ. ඒ නිසා මම අනිවාර්යයෙන්ම අද හෝ හෙට උදේ වෙනකොට ඔබතුමාට ඒ සම්බන්ධ වාර්තාවක් ලබා දෙන්නම්.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඔබතුමාට පැහැදිලි උත්තරයක් ලබා දුන්නා.

නැවත ලිපි ලේඛන පිළිගැන්වීමට යොමු වෙමු.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 1996 අංක 9 දරන රාජ්‍යතාන්ත්‍රික වරප්‍රසාද පනතේ 4 සහ 5 වගන්ති යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂි වන විද්‍යාව පිළිබඳ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICRAF) අතර පවතින සත්කාරක රාජ්‍ය ගිවිසුමේ IV, V, VI, IX, X, XI, XII, XIII, XIV, XV සහ XVI වගන්තිවල නියමයන් බලාත්මක කිරීම සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 සැප්තැම්බර් 08 දිනැති අංක 2348/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය ඉදිරිපත් කරමි.

මෙම නියෝගය විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඔබතුමාගේ ගැටලුවට විසඳුමක් ලබා දුන්නා නේ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මම තව එක කරුණක් එතුමාගේ අවධානයට යොමු කළා. ඒකයි මම අවස්ථාව ඉල්ලුවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක මොකක්ද කියන්න.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු ප්‍රාථමික කර්මාන්ත රාජ්‍ය ඇමතිතුමනි, ගිංතොට තුනී ලැලි සංස්ථාව ගත්ත යසසිරි කස්තුරිආරච්චි කියන කෙනාට open warrant එකක් තිබෙනවා. මේ දවස්වල "යුක්තිය" වැඩසටහන යටතේ වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගන්නවා. මේ පුද්ගලයා දිගින් දිගටම මිනිස්සුන්ගේ EPF ගෙවන්නේ නැතුව සිටියදී ඔහු අත්අඩංගුවට ගන්නේ නැත්තේ ඇයි? "යුක්තිය" වැඩසටහන ක්‍රියාත්මක වෙනවා නම් මේ සේවකයන් වෙනුවෙන් කළ යුතු යුතුකමත් ඉටු කරන්න කියලා ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2021 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ උදේ කාලය න්‍යාය පත්‍රයේ වැඩ කටයුතුවලට යොදා ගනිද්දී අත්දැකීම් තිබෙන පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය කථානායකවරයෙකු හැටියටත්, නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩ කරපු උගත් නීතිඥවරයෙකු හැටියටත් බොහොම වැදගත්කමක් තිබෙන, දේශපාලන පවුලකින් පැවතෙන චන්දිම වීරක්කොඩි මැතිතුමා මේ පාර්ලිමේන්තුවේ අද හැසිරෙන විධිය දැක්කාම මට මතක් වෙන්නේ, තැන් දෙකකට වැටිච්ච ගිරවු දෙදෙනායි. ගිරවා වැටිලා ඉන්න තැනේ හැටියට බොළඳ, බාල ප්‍රචාර ලබා ගන්නා තැනට අද චන්දිම වීරක්කොඩි මැතිතුමාත් පත් වෙලා ඉන්නවා කියලා ඉතාම කනගාටුවෙන් වුණත් මට සඳහන් කරන්න වෙනවා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා. ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමනි, ඔබතුමා ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දවලින් තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන වටිනාම සම්පතක් තමයි මේ තුනී ලැලි සංස්ථාව. තුනී ලැලි සංස්ථාව හොරෙකුට දීලා, ඒ හොරා ඒක කෑලි-කෑලිවලට කඩලා විකුණනකොට - අපි දන්නවා ඒ පුද්ගලයා බොහෝදෙනෙකුට සල්ලිත් දීලා තිබෙනවා කියලා - ඔබතුමා මේ ආකාරයට හැසිරීම මම හිතන විධියට ගාල්ලේ කෙනෙකු හැටියට සුදුසු නැහැ. ඇත්තටම මට හිතාගන්න බැහැ, ගාල්ලේ මේ වාගේ මිනිස්සුත් ඉන්නවාද කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක් කරගන්න එපා. අපි න්‍යාය පත්‍රය අනුව වැඩ කටයුතු කරමු.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, ඔය කාරණය විවාදයක් කරගන්න එපා. ඔය ගැන හෙට ගරු රාජ්‍ය ඇමතිතුමා උත්තරයක් දෙනවා කිව්වා නේ.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මම එතුමාගේ නම කිව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ එවැනි කටයුතු සිද්ධ වෙද්දී හොයා බලා කථා කරන්න ඕනෑ වාගේම, නිවැරදි විධියට ප්‍රශ්න අහන්නත් ඕනෑ. යසසිරි කස්තුරිආරච්චි කාගේ ගෝලයෙක්ද, යසසිරි කස්තුරිආරච්චි කාටද සල්ලි දුන්නේ කියලා ඉතිහාසය දන්නවා. ප්‍රේමදාස හදපු ගෝලයෙක් සහ ප්‍රේමදාස එක්ක තිබුණු සම්බන්ධතා සියල්ල යසසිරි කස්තුරිආරච්චිට වෙන කා එක්කවත් තිබුණේ නැහැ. ඉතින් ඉන්නා තැන මොකක්ද කියලා දන්නේ නැතිව මේ විධියට කථා කරන්නේ මොකද කියලා මට නම් තේරෙන්නේ නැහැ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)

මට අවස්ථාව ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමා ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. දැන් මේක විවාදයක් කර ගන්න එපා.

නැවත ලිපි ලේඛන පිළිගැන්වීමට යොමුවෙමු.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා දිරිපත් කරමි.

මෙම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට මඩ ගැහුවේ නැහැ එතුමා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා එවැනි කථාවක් කිව්වේ නැහැ. එතුමා ප්‍රේමදාස කෙනෙක් ගැන කිව්වා. තවත් නමක් කිව්වා. ඒ මිසක් එතුමා පෞද්ගලිකව වෙන නමක් කිව්වේ නැහැ. ඒ නිසා ගරු සභාවේ වැඩ කටයුතුවලට බාධා කරන්න එපා. ඔබතුමා හිටපු නියෝජ්‍ය කථානායකවරයෙක් නේ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට මයික් එක දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, නැහැ. අවශ්‍යතාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. අපි න්‍යාය පත්‍රය අනුව වැඩ කරමු.

මීළඟට, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිගැන්වීම, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා. - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. බාධා කරන්න එපා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මට අවස්ථාව දෙන්න, ඇත්ත කථාව කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කථාව කියන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, එහෙම නම් කෙටියෙන් කියන්න.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මම කෙටියෙන් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ගනුදෙනුවේදී සල්ලි ගත්තේ කවුද කියන එක අනාවරණය කරලා දෙන්න. දිවංගත රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාට මඩ ගහන එක නොවෙයි කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මේ වෙලාවේ හොරා කවුද කියලා හොයා ගන්න. මිනිස්සු දන්නවා, කවුද සල්ලි ගත්තේ කියලා. මේ ජරා වැඩේ නවත්වන්න ඕනෑ. - *[බාධා කිරීම්]*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත සහ පරිපූරක පනත් කෙටුම්පත්, එනම් සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත, කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත, දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත, උකස් (සංශෝධන) පනත් කෙටුම්පත, ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත;

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

(ii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය; සහ

(iii) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන පනත) යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ මූලිකම කටයුත්ත මෙයයි. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයෝ පොඩි ණයක් ගන්නකොට බැංකුවට යම් කිසි collateral එකක් දෙනවා. එය චංචල collateral එකක් නම් - වාහනයක් වෙන්න පුළුවන්, refrigerator එකක් වෙන්න පුළුවන් - ඒක ලියා පදිංචි කරන්න ක්‍රමයක් හරියට තිබුණේ නැහැ. ඒක ලියාපදිංචි කරන ක්‍රමයක් හඳුන්වා දීම තමයි කරන්නේ. ඒකට අපේ කිසිම විරෝධයක් නැහැ. ඒක හොඳ දෙයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට වඩා වැදගත් කාරණාවක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට අදාළව ඉදිරිපත් වෙලා තිබෙනවා. මම පෙන්වා දෙන්න කැමැතියි, ඊයේ "The Island" පුවත් පතේ ප්‍රධාන ශීර්ෂ පාඨය. ඒකේ තිබෙන්නේ "Sugar tax scam takes shocking turn: Parliament directive to recover Rs. 16 bn disregarded" කියලා.

ඒකයි අතිශයින්ම වැදගත් කාරණාව. මොකද, ඒක පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වරප්‍රසාද පිළිබඳ වැඩක්. ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩු කියන "The Island" පුවත් පතේ නියෝජ්‍ය කර්තෘතුමා මුදල් අමාත්‍යාංශයේ වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවෙන් අහනවා, සීනි බදු වෙනස් කිරීම ගැන. මේ සම්බන්ධව චෝහාරික විගණනයක් කළා. සීනි බදු වෙනස් කිරීම නිසා රජයට අය විය යුතු මුදලින් බිලියන 16ක් අය වුණේ නැහැ කියලා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තිබෙනවා. ඒ ගැන මුළු රටේම සාකච්ඡා වෙලා තිබෙනවා. මේකට මොකක්ද වෙන්නේ කියලා අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී දිගින් දිගටම ප්‍රශ්න කරලා තිබෙනවා. මේ ගරු සභාවේදී මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා පවා කියලා තිබෙනවා, ඔවුන්ට යම් බදු ප්‍රමාණයක් ගහලා, ලාභයෙන් හෝ සියයට 30ක බද්දක් එකතු කර ගන්න බලාපොරොත්තු වෙනවා කියලා. ඒ වෙනුවෙන් මොකක්ද වෙන්නේ කියලා තොරතුරු දැන ගැනීමේ පනත යටතේ විමසීමක් කළාම, තොරතුරු නිලධාරි ඩී.එම්.ජේ. දසනායක, ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩුට ලියුමක් ලියලා කියනවා, බදු සංශෝධන මඟින් එහෙම අලාභයක් වෙලා නැහැ කියලා. එහෙම කියන්නේ කොහොමද? ඒ කාරණය විගණකාධිපතිවරයා කියලා තිබෙනවා. ඊට පස්සේ CID එකටයි, Commission to Investigate Allegations of Bribery or Corruption එකටයි ගිහින් මේ ගැන සොයන්න කියලා තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කරලා වාර්තා ඉදිරිපත් වෙලා තිබෙනකොට ඒ තොරතුරු නිලධාරියා එහෙම කිසිම දෙයක වෙලා නැහැ කියලා කියන්නේ කොහොමද? ආණ්ඩුව කියන්නේ සීනි බදු වංචාවක් වෙලා නැහැ කියලාද? ආණ්ඩුව කියන්නේ අවම වශයෙන් රජයේ භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදල වන රුපියල් බිලියන 16 පිළිබඳව ගැටලුවක් නැහැ කියලාද? මොකක්ද මෙතැන කියන්නේ?

විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට විශේෂ වාර්තාවක් ඉදිරිපත් කළා නම්, ඒක ගැන කමිටු හරහා මේ සභාවේ කථා කළා නම්, ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් ඒ සම්බන්ධයෙන් මෙතැන විග්‍රහයක් කරලා කළ යුතු දේ ගැන අප දැනුවත් කළා නම්, එහෙම දෙයක් වුණේ නැහැ කියලා කියන්න මේ පුද්ගලයා කවුද? එම නිසා මෙතැන වරප්‍රසාද පිළිබඳ ගැටලුවක් තිබෙනවා. මම ඒ ගැටලුව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කළ යුතුයි කියලා කියනවා. මා මේ කාරණය රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට දාලා, -මේක අද වෙච්ච වැඩක්- ඔවුන්ගේ මතය විමසලා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සභාවට සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා කියලා සඳහන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් මම මුලින්ම අහන්න කැමැතියි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න පෙර, මේක ඇත්තටම ඒ අමාත්‍යාංශයේ කාරක සභාවට ගියා ද, එතැනින් රපෝර්තුවක් ලැබුණා ද කියලා. ඒකට හේතුව මේකයි. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට, ඒ ගැන රපෝර්තුවක් තිබුණේ නැහැ. මම විශේෂයෙන්ම කියා සිටින්නේ පාර්ලිමේන්තුව තුළ ව්‍යවස්ථානුකූලවත්, ස්ථාවර නියෝග අනුවත් ඒ දේවල් සිදු විය යුතුයි කියලායි. මොකද, මේ පනත් කෙටුම්පතට ගේන Amendments මම තවම දැකලා නැහැ. අලුතින් Amendments ගේන්න පුළුවන් Committee Stage එකේදී. එම නිසා කරුණාකරලා අලුතින් Amendments ගේනවා නම් - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මේක ගැනයි මම කියන්නේ. කරුණාකරලා ගේනවා නම් - Committee on Public Finance එකට නොවෙයි මම කියන්නේ - ඒක අර කාරක සභාවට ඉදිරිපත් කරලා එතැනිනුත් වාර්තාවක් ගන්න ඕනෑ කියන එකයි මෙතැන සඳහන් කරන්නේ.

ඒ වාගේම ගරු කථානායකතුමාගෙන් අහන්න අවශ්‍ය ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර අවස්ථාවලදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සියලු සාමාජිකයන්ගේ එකඟත්වයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රීති සම්පාදනය කරනවා. ඒක ගරු කථානායකතුමා මීට ප්‍රථමයෙනුත් අපට කියලා තිබෙනවා. නමුත්, 2023 දෙසැම්බර් මාසයේ 31වැනි දා අපට ගැසට් පත්‍රයක් දුන්නා.

ඒ ගැසට් පත්‍රය දිහා බැලුවාම මට පෙනුණා, ඒ ගැසට් පත්‍රයේ තිබෙන දෙයයි, ඊට ඉස්සෙල්ලා කෙරුණු නීති සම්පාදනයයි අතර වෙනසක් තිබෙනවා කියලා. ඒකේ යම් යම් වෙනස්වීම් තිබුණා. ඉතින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වන ගරු කථානායකතුමාගෙන් මට දැනගන්න ඕනෑ, ගැසට් පත්‍රයේ පළ කරන රීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කළාද, එසේ නම් අනුමත කළේ කවදාද, එය අනුමත කිරීමේදී සියලු සාමාජිකයන් එකඟ වුණාද නැද්ද, සියලු සාමාජිකයන් එකඟ වුණේ නැත්නම් සාමාජිකයන් කී දෙනෙක් එකඟ වුණාද, ඒ වාගේම එය අනුමත කරන අවස්ථාවේදී රැස්වීමේ සිටි සාමාජිකයන් කවුද කියලා. ගරු කථානායකතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා වන නිසායි මම ඒ ප්‍රශ්න මේ ගරු සභාවේදී ඉදිරිපත් කළේ. මේ කාරණය මම නැවත ඉදිරිපත් කරන්නේ නියමිත ක්‍රම අනුගමනය කළ යුතුය කියන කාරණය අවධාරණය කරන්නයි. අපි දන්නේ නැහැ නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සිදු වන දේ. ගැසට් පත්‍රය බලලා, යම් වෙනසක්

තිබෙනවා නම්, ඒ වෙනස තේරුම් ගන්න අපට පුළුවන්. ඊට පසුව අපට දැන ගන්න ඕනෑ, ඒ වෙනස කරන කොට එය හරියාකාරව සිදු වුණාද නැද්ද කියලා. මොකද, මේවා ස්වාධීන ලෙස ක්‍රියාත්මක විය යුතුයි. කරුණාකර මේ කාරණය ගරු කථානායකතුමාට ඉදිරිපත් කරලා අපට පිළිතුරක් ලබා දෙන්න පුළුවන් නම් හොඳයි.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරන්නම්.

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි ඔබතුමාගෙනුත් අවසර අරගෙන ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට පෙර අපේ ගරු සභානායකතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් කරුණු දෙකක් යොමු කරන්න.

මා ඔබතුමාගේ අවධානය යොමු කරවන පළමුවන කාරණය මේකයි. මාතර දිස්ත්‍රික් රණවිරු සංවිධානය විශ්‍රාමික රණ විරුවන්හට පැන නැඟී ඇති ප්‍රධාන ගැටලු 6ක් ඉදිරිපත් කරනවා. පළමුවන එක තමයි, මාතර, කනත්තගොඩ රණවිරු ගම්මානය සඳහා ඔප්පු ලබා දීම. 1996 ඉඳලා මේ දක්වාම ඒ අයට ඔප්පු ලබා දීලා නැහැ.

අනෙකුත් ඒවා වන්නේ, 2016 වර්ෂයට පෙර විශ්‍රාම ගොස් සිටින රණ විරුවන්ටත් 2016 විශ්‍රාම ගිය රණ විරුවන්ට ලැබුණු සහන ලබා ගැනීමට කටයුතු කිරීම, මුළු දිවියෙන්ම වැන්දඹු අනත්දරු දායකත්වය නොමැති රණ විරුවන් 990දෙනෙකුට ඒ සහනය ලබා දීම, රජය පොදුවේ සියලු විශ්‍රාමික රණ විරුවන් සඳහා පිළිගත හැකි විශ්‍රාම හැඳුනුම්පතක් ලබා දීම, විශ්‍රාම ලබා යන විට නිත්‍ය සාමාජික මහතුන්හට උසස් වීමක් ලබා දෙන නිසා ස්වේච්ඡා සාමාජිකයන්ටත් එය ලබා දීමට කටයුතු සලසා දීම, ඉඩම් ඔප්පු නොමැති සියලු රණ විරුවන්හට ප්‍රදාන පත්‍රයක් හෝ ලබා දීම ආදියයි. මාතර දිස්ත්‍රික් රණවිරු සංවිධානයේ ගරු ලේකම් එම්.ටී. රංජන් කුමාර මහත්මයා ඒ යෝජනා 06 ඉදිරිපත් කරලා තිබෙනවා. මම එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මම ඔබතුමන්ලාටත් එහි පිටපතක් ලබා දෙන්නම්. ඒවාට අදාළ පියවර ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

---

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාමර සම්පත් දසනායක රාජ්‍ය ඇමතිතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ චන්දිම වීරක්කොඩි හිටපු ඇමතිතුමා - නීතිඥතුමා - අහපු ප්‍රශ්නයට උත්තරය මම දැන් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමියගෙන් ඇහුවා. ඒ ආයතනය ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතට ගැසට් වෙලා නැහැ. එම ආයතනය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ. අලුත් ගැසට් නිවේදනය මඟින් අමාත්‍ය ධුර භාර දුන් දවසේ ඉඳන් එම ආයතනය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ගැසට් වෙලා නැහැ. ගිංතොට තුනී ලෑලි සංස්ථාව අපේ අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ.

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
එහෙනම් බඩුම තමයි!

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ තිබෙන ඒ වටිනා වස්තුව කිසිම අමාත්‍යාංශයක් යටතට පවරන්නේ නැතිව කාට හරි දීලා පර්චස් 10, 15 ඉඩම් කැබලි විධියට block out කර තිබෙනවා කියන එකද ඒ කියන්නේ? තුනී ලෑලි සංස්ථාව සහ එම කර්මාන්තය විනාශ කර තිබෙනවා කියන එක ද මේ පිළිගන්නේ?

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
නැහැ, නැහැ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මේකද රටේ privatization ප්‍රතිපත්තිය? *[බාධා කිරීමක්]*

**ගරු වීරසුමන වීරසිංහ මහතා**
(மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ)
(The Hon. Weerasumana Weerasinghe)
දැන් විකුණන ඒවා- *[බාධා කිරීම්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවේ හිටපු අමරසිරි දොඩංගොඩ ඇමතිතුමා -මේ ගරු මන්ත්‍රීතුමාගේ මාමා- හිටපු කාලයේ තමයි පෞද්ගලීකරණය වෙලා තිබෙන්නේ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා අපි ඒ ගැන පසුව විමසීමක් කරලා ඔබතුමාට දැනුම් දෙන්නම්. දැන් මේක

විවාදයක් කර ගන්න එපා. *[බාධා කිරීමක්]*

ඔව්, ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු අමරසිරි දොඩංගොඩ හිටපු ඇමතිතුමාගේ පුතා ඔය එහා පැත්තේ පොහොට්ටුවේ ඉන්නේ. ඒකට මා පටලවන්න එපා. හැබැයි, ඒක 1994දී නොවෙයි, ඊට කලින් *[බාධා කිරීමක්]*

ඩී.බී. විජේතුංග ජනාධිපතිවරයාගේ කාලයේ තමයි යසසිරි කස්තුරිආරච්චිට දුන්නේ. හැබැයි, ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා දුන්නේත් lease එකක් විධියට. එතුමා දුන්නෙත් free grant එකක් නොවෙයි. *[බාධා කිරීමක්]* නමුත් දැන් කවුරු දුන්නාද කියන එක නොවෙයි ප්‍රශ්නය. මේ කර්මාන්තය නැති වෙන්න කැලිවලට කඩලා විකුණන එක තමයි මේ රටේ ප්‍රතිපත්තිය. මේක තිබෙන්නේ ජනාධිපතිවරයා යටතේ ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට ඒ ගැන සොයා බලා පිළිතුරක් දෙන්නම්.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපති ද මේකට වග කියන්න ඕනෑ? *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න. මොකද, මම රාජ්‍ය ඇමතිවරයා හැටියට උත්තර දෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙන්න, දෙන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මෙතුමා නියෝජනය කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් යටතේ,-

2000දී ගාල්ල දිස්ත්‍රික්කයෙන් මෙතුමා පාර්ලිමේන්තුවට එන්නේ. මෙතුමා එනකොට අමරසිරි දොඩංගොඩ හිටපු ඇමතිතුමා ඉස්පිරිතාලේ හිටියේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ළඟට එනකොටත් අමරසිරි දොඩංගොඩ ඇමතිතුමා ඒ කාලයේ කිව්වා, "එන්න එපා, වයර් එකක්වත් ගලවයි" කියලා. මෙතුමාගේ මාමා තමයි අමරසිරි දොඩංගොඩ හිටපු ඇමතිතුමා.ඒ කාලයේ මෙතුමා ගාල්ල දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙකු හැටියට නියෝජනය කරපු ආණ්ඩුවකින් තමයි ඒ ඉඩම දීලා තිබෙන්නේ.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පෞද්ගලික දෙයක් කියපු නිසා මට උත්තර දෙන්න වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා, වැඩි වෙලාවක් ගන්නේ නැතුව කෙටියෙන් උත්තර දීලා අවසන් කරන්න.

**ගරු නීතිඥ චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody, Attorney-at-Law)
මම මෙතැනට ආවේ විහිළු සපයන්න නොවෙයි. මම කථා කරන්නේ මාමාගේ වැඩේවත්, බාප්පාගේ වැඩේවත්, ආච්චිගේ සීයාගේ වැඩේවත් නොවෙයි. අපේ සම්පතක්, අපේ රටේ කර්මාන්තයක්, මේ රටේ අද පවතින පෞද්ගලීකරණය කිරීමේ,- දැන් ටෙලිකොම් එකත් දෙන්න හදනවා. IOC එක තව ටික දවසක් යනකොට,- මේ විධියට ගියොත් මම උදාහරණයකට කියන්නම්, ඇලෙක්සැන්ඩර් පෙදෙසේ තිබෙන ෂෙඩ් එක වහලා,- *[බාධා කිරීමක්]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
යන්නේ කොහෙද ඇහුවාම, "මල්ලෙ පොල්" - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ඒ ගැන සොයා බලා පිළිතුරක් දෙන්නම්.

ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, මම ඔබතුමාගේ අවධානය මේ කාරණයට යොමු කරන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම මම අවස්ථා ගණනාවකදී KIU එකේ දරුවන්ගේ ප්‍රශ්නය මතු කළා. ඇත්ත වශයෙන්ම ඔබතුමා යම් උත්සාහයක් අරගෙන තිබෙනවා, ඒ KIU ප්‍රශ්නය විසඳීමට. ඒ කියන්නේ පොලී රහිත ණය පෞද්ගලික විශ්වවිද්‍යාලවල දූ දරුවන්ට ලබා දීමේ වැඩපිළිවෙළ සම්බන්ධව.

ඇත්ත වශයෙන්ම අද මේ මොහොත වෙනකල්වත් රාජ්‍ය බැංකුවලින් යහපත් ප්‍රතිචාරයක් ඒ දරුවන්ට ලැබිලා නැහැ. හැබැයි, ඔබතුමා KIU එකේ පාලන අධිකාරියට ලිඛිතව දැනුම්

දීලා තිබෙනවා, මේ වැඩ කටයුත්ත කරගෙන යන්න, අධ්‍යාපන අමාත්‍යාංශය ඒ පිළිබඳ වගකීම දරනවා කියලා. හැබැයි, මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. KIU එක ඒ පොලී රහිත ශිෂ්‍ය ණය වැඩසටහනෙන් - Interest Free Students Loan Scheme එකෙන් - ප්‍රතිලාභ ලබන ඒ දූ දරුවන් එක්ක declaration form එකක් අත්සන් කරනවා. ඒ declaration form එකේ තුන්වැනි වගන්තියේ තිබෙනවා බොහොම අසාධාරණ දෙයක්. අධ්‍යාපන ඇමතිතුමාගේ ඉල්ලීම මත මේ කටයුත්ත ආරම්භ කළත් තවමත් Bank of Ceylon එක මේ පොලී රහිත ණය ලබා දෙනවාද නැද්ද කියන එක ගැන වගකීමෙන් කටයුත්තක් කරලා නැහැ. KIU එකේ පාලන අධිකාරිය කියනවා, "එය එසේ නොවුණහොත් මේ අධ්‍යාපන කටයුතු ආරම්භ කරපු studentsලාට ඒ අධ්‍යාපන කටයුත්ත නතර කරන්න වෙනවා. මොකද Bank of Ceylon එක හරි guarantee එකක් දීලා නැහැ, හරි වචනයක් දීලා නැහැ" කියලා. ඇමතිතුමනි, ඔබතුමා බොහොම ලොකු උනන්දුවක් ඒ ගැන දක්වලා තිබෙනවා. ඒ වාගේම ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඒකට මැදිහත් වෙලාත් තිබෙනවා.

අධ්‍යාපන ඇමතිතුමනි, ඇත්තටම මේ කාරණය අහන්න ඕනෑ ඔබතුමාගෙන් නොවෙයි. මුදල් රාජ්‍ය ඇමතිතුමා -රංජිත් සියඹලාපිටිය මැතිතුමා- මෙතැන ඉන්නවා. අපි එතුමාට කියලා තමයි නතර වෙලා තිබුණු private universitiesවල studentsලාට ලබා දෙන පොලී රහිත ණය වැඩසටහන නැවත ක්‍රියාත්මක කරන්න මේ රජය ඒ ප්‍රතිපත්තියට අවදි කළේ. එහෙම කරලාත් Bank of Ceylon එකේ පාලන අධිකාරිය සූදානම් නැහැ ජනාධිපති ලේකම් කාර්යාලයේත් ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාගේත් උපදෙස පිළිගන්න. මම පැහැදිලිව කියන්න ඕනෑ, මීට පෙර ණය ගත් අය ණය නොගෙවීම -ණය පැහැර හැරීම- නිසා වර්තමාන දූ දරුවන්ට දඬුවම් කරන්න එපා කියන කාරණය.

ඒ වාගේම තවත් කාණ්ඩයක් ඉන්නවා. ඒ කාණ්ඩයට register වෙන්න බැහැ. ඒ අයට ඒක ගැසට් කරලා නැහැ. මේ KIU එකේ ප්‍රශ්නය මම දිගින් දිගටම මතු කළා. මම ගෞරවයෙන් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා BOC එකේ පාලන අධිකාරියට කියන්න, සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න හරි වචනයක් දෙන්න කියලා. මොකද KIU management එක කියනවා මේ පිළිබඳව නිශ්චිත වැඩ පිළිවෙළක් නොතිබෙන්නේ නම් ඒ දරුවන්ගේ අධ්‍යාපනය නතර කරනවා, discontinue කරනවා කියලා. BOC එක ඒක කරන්නේත් නැත්නම් මම ඔබතුමාට යෝජනාවක් කරනවා, වෙනත් රාජ්‍ය බැංකුවක් හරහා ඒ දූ දරුවන්ට ලබා දෙන ඒ පොලී රහිත ණය වැඩසටහන ක්‍රියාත්මක කරන්න කියලා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය මතු කිරීම ගැන මම ගරු විපක්ෂ නායකතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ සතියේ තිබෙන මූල්‍ය අනුකමිටුවට මේ පිළිබඳ කැබිනට් පත්‍රිකාව එනවා. Deputy Secretary to the Treasury - DST, Bank of Ceylon පාලන අධිකාරිය, අපේ අතිරේක ලේකම් කියන මේ ඔක්කෝම සම්බන්ධ වෙලා මේ පිළිබඳව ගිය සතියේත් සාකච්ඡා කළා. ඒ අනුව භාණ්ඩාගාරය එකඟ වුණා, දැනට ණය නොගෙවා ඉන්න පළමුවෙනි, දෙවැනි කණ්ඩායම් දෙකේ 200කට මඳක් වැඩි පිරිසකගේ ණය ප්‍රමාණය Treasury එක මඟින් absorb කරගෙන ලංකා බැංකුවට set off කරන්න. ඒ කොන්දේසිය මත සහ අලුතින් ඇපකරුවෙක් ලබා ගැනීමේ කොන්දේසිය මත ඒ අය එම කටයුත්තට එකඟ වෙලා තිබෙනවා. එම කැබිනට් පත්‍රිකාව අනුමත වෙනවා, සඳුදා වෙනකොට. එතකොට මේ ගැන නිල වශයෙන් ඒ අයට දැනුම් දෙයි. හැබැයි, අපි KIU ආයතනයත් එක්ක සාකච්ඡා කළා, එතෙක් එම දරුවන්ට අසාධාරණයක් නොවන හැටියට කටයුතු කරන්න. ඒ අනුව ඒ සියලු දරුවන්ට e-mail මඟින් පණිවුඩ යවා තිබෙනවා. එහි පිටපතක් මටත් එව්වා. මම හිතන විධියට විපක්ෂ නායකතුමාත් ඒ ගැන දන්නවා. එහි පැහැදිලිව කියා තිබෙනවා, මම අධ්‍යාපන ඇමතිවරයා හැටියට කරන ලද සාකච්ඡාවේ ප්‍රතිඵල අනුව දැනට online තිබෙන පාඨමාලා සති දෙකක් තුළ physically පටන් ගන්න සූදානම් කියලා. ලබන සඳුදා වෙනකොට එම ප්‍රශ්නය විසඳෙයි, කැබිනට් පත්‍රිකාව අවසාන වශයෙන් සම්මත වුණාම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට දෝෂාරෝපණය කරනවා නොවෙයි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මේ කාරණයට මැදිහත් වෙලා මේ පියවර ගැනීම පිළිබඳව. හැබැයි, මෙතැන තිබෙන බරපතළ ප්‍රශ්නය මොකක්ද දන්නවාද? Bank of Ceylon එකේ පාලන අධිකාරිය සූදානම් නැහැ, කැබිනට් අමාත්‍යවරයකු හැටියට ඔබතුමා ලබා දෙන උපදෙස පිළිපදින්නටත්, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබා දුන් උපදෙස ක්‍රියාත්මක කරන්නටත්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් විනය පියවරක් ගන්නට ඕනෑ. කොහොමද, ගරු අමාත්‍යතුමනි, - *[බාධා කිරීමක්]* හරි ඉතින් එහෙම නම් රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා නේ. මම අහන්න කැමැතියි, යම් කිසි පුද්ගල කණ්ඩායමක් ණයක් අරගෙන ඒ ණය ගෙවීම පැහැර හැරීම නිසා අලුත් ශිෂ්‍ය කණ්ඩායමකට පොලී රහිත ණය ලබා දීම පැහැර හරින්නේ කොහොමද කියලා. ඒක කරන්න බැහැ නේ. ඒක රටේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්. ඒ දූ දරුවන්ගේ මානව අයිතිය උල්ලංඝනය කිරීමක්. මම මෙතැනදී ඇඟිල්ල දිගු කරන්නේ ඇමතිවරුන්ට නොවෙයි. Bank of Ceylon එකේ Chairmanට වහාම උපදෙස් දෙන්න, මේක පාර්ලිමේන්තුවේත් සාකච්ඡා කළ දෙයක්, ඒ නිසා මේක ක්‍රියාත්මක කරන්නය කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)

ගරු විපක්ෂ නායකතුමා ඉතා වැදගත් කාරණාවක් ඉස්මතු කළේ. දැන් අධ්‍යාපන ඇමතිතුමා පැහැදිලි කළ පරිදි ඒකට විසඳුමක් තිබෙනවා, අය නොවන ණය සියල්ලම මහා භාණ්ඩාගාරය භාරගෙන බැංකුවට නිදහස් කරලා මේ ණය ලබා දීම නැවත ක්‍රියාත්මක කරන්නට. එතුමා කිව්වා වාගේ යම් කිසි නොසැලකීමක් වෙලා නම් මම ඒ ගැනත් සොයා බලන්න ලෑස්තියි. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැංකුත් මේ වෙලාවේ අය නොවන ණය ගැන අවදානම් සීමාවට කිට්ටු වෙන තැනක ඉන්නේ. ඒ නිසා බැංකුවලටත් ප්‍රශ්නයක් තිබෙනවා, මානුෂික පදනමින් එහාට ගිහින් රටේ ආර්ථික ආරක්ෂාව පිළිබඳ පදනමේ ඉඳිමින් කටයුතු කිරීමේදී. කෙසේ වුවත්, මේ කාරණා පිළිබඳව අපි ඉතාම වුවමනාවෙන් සොයා බලා කටයුතු කරන්න සූදානම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මෙය විවාදයක් කර ගන්න සූදානම් නැහැ. මම ඉදිරිපත් කරන අවසාන කාරණාව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මෙයයි. මුදල් රාජ්‍ය අමාත්‍යතුමා කියනවා, බැංකු nonperforming loans ගැන හුඟක් හිතනවා කියලා. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් guarantees ඇතිව හෝ නැතිව කෝටි ප්‍රකෝටි ගණන් ණය ලබා ගෙන ඒ ණය ගෙවීම පැහැර හරින අයගේ නම් ලැයිස්තුව අපට ලබා දෙන්න ඔබතුමා තවම අපොහොසත් වෙලා තිබෙනවා. මම අවස්ථා ගණනාවකදීම ඒ ගැන ඔබතුමාගෙන් ප්‍රශ්න කළා. බැංකු ඔය තරමටම ණය පැහැර හරින අය ගැන සංවේදී නම්, ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් guarantees ඇතිව හෝ නැතිව ණය ලබාගෙන, ඒ ණය ගෙවීම පැහැර හරින ඒ ණය තෝරුන්ගේ, මෝරුන්ගේ, තල්මසුන්ගේ නාමලේඛනය ඔබතුමා මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි? මම ඒ ගැන කී පාරක් ඇහුවාද? ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට කාරණාවක් කියන්නම්. ඔබතුමා, ඒ බැංකුවලට කියන්න පොඩි දූ දරුවන්ගේ ණය පැහැර හැරීම් ගැන සංවේදී වෙනවා වාගේම, guarantees නැතිව ණය ලබාගෙන, ඒ ණය ගෙවීම පැහැර හරින ලොකු කොම්පැනි, ලොකු කෝටි ප්‍රකෝටිපතියන්ගේ, ඒ අමනෝඥ ක්‍රියාව කරන අයගේ නම් ලැයිස්තුව මේ ගරු සභාවට ලබා දෙන්න කියලා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැංකුව හැම ණය නොගෙවන්නෙක් සම්බන්ධවම කිසිදු විශේෂත්වයක් දක්වන්නේ නැතිව, එක සේ නීත්‍යනුකූලව කටයුතු කරනවා. බැංකුවට ඉහළ පහළ කියලා දෙයක් නැහැ. නමුත්, තමන්ගේ ගනුදෙනුකරුවන් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කිරීමේදී බැංකුවකට සම්ප්‍රදායක් තිබෙනවා, නීතිමය කරුණු තිබෙනවා. බැංකුවකට එපමණයි තිබෙන්නේ. ඒ නිසා බැංකු කිසිදු විශේෂත්වයකින් තොරව ණය නොගෙවන අයගෙන් ණය අයකර ගැනීම සඳහා උපරිම විධියට කටයුතු කරනවා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි.

ගරු විපක්ෂ නායකතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් මේ සභාවට ඉදිරිපත් කර තිබෙනවා. රාජ්‍ය නොවන විශ්වවිද්‍යාලවල දරුවෝ ඉතා බරපතළ අර්බුදයකට මුහුණ පාලා තිබෙනවා, ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි. පෞද්ගලික බැංකුවලින් ණය ගත් අය සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තිය ගැන මේ ගරු සභාව තුළ සාකච්ඡා වුණා. ඒ නිසා මම නැවත ඒ ගැන කියන්න අවශ්‍ය නැහැ. නමුත්, ඊට වඩා ඛේදජනක තත්ත්වයක් අද ඒ දරුවන්ට උදාවෙලා තිබෙනවා. ඒ නිසා සමස්ත ආණ්ඩුවේම අවධානය ඒ සඳහා යොමු කරන්න කියන ඉල්ලීම කරමින්, ගරු අධ්‍යාපන ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මාධ්‍ය වාර්තා කළා, විද්‍යාපීඨවල ඉගෙන ගන්න ශිෂ්‍යයන්ගේ ආහාර දීමනාව වැඩි කිරීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉදිරිපත් කරපු කැබිනට් පත්‍රිකාව,- දැනට ආහාර දීමනාව වශයෙන් ලබා දෙන්නේ රුපියල් 5000යි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, විද්‍යාපීඨ 19ක ශිෂ්‍ය ශිෂ්‍යාවන් අධ්‍යාපනය ලබනවා.

ඇත්තටම අධ්‍යාපන පද්ධතියට ඉතාම හරවත් ගුරුවරු ලැබෙන්නේ විද්‍යාපීඨ හරහායි. ඔබතුමාත් ඒක පිළිගන්නවා. මම හිතන විධියට ඒ නිසාම වෙන්න ඇති, ඔබතුමා මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ. එය ප්‍රතික්ෂේප වූ බව මාධ්‍ය වාර්තා කළා. මම ඒ ගැන තොරතුරු දන්නේ නැති නිසා මට ඒක නිවැරදි කර ගන්න අවශ්‍යයි. ඒක තමයි පළමුවැනි කාරණය. ඒක නිවැරදි වෙනවා නම්, එම දීමනාව කවදා ඉඳලාද දරුවන්ට ගෙවන්නේ? රුපියල් 5,000ක දීමනාව කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇමතිතුමා ඒක පිළිගත් නිසා වෙන්න ඇති කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්න ඇත්තේ. ගරු ඇමතිතුමනි, ඒ පිළිබඳව ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට මාස කිහිපයකට පෙර මම මුලින්ම උත්සාහ කළා, විද්‍යාපීඨ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රාජ්‍ය බැංකු දෙක හරහා රුපියල් 10,000ක ණය මුදලක් අරන් දෙන්න. නමුත් එම ණයවල පොලිය ගෙවීම පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණා. ඉගෙන ගන්න කාල සීමාව තුළ එකතු වන පොලියත් එකතු කරලා ගුරු වෘත්තිය ලැබුණාට පස්සේ එම ණය මුදල ගෙවන්න ශිෂ්‍ය ශිෂ්‍යාවන් කැමති වුණේ නැහැ. එම නිසා මම කැබිනට් පත්‍රිකාවක් දැම්මා, රුපියල් 5,000ක මුදල රුපියල් 3,000කින් වැඩි කරලා එම දීමනාව රුපියල් 8,000ක් කරන්න කියලා. එම කැබිනට් පත්‍රිකාව ගිය සතියේ මූල්‍ය කමිටුවෙන් අනුමත කරලා, ඊයේ තහවුරු කළා. එම නිසා ලබන මාසයේ ඉඳලා එම මුදල ගෙවනවා. හැබැයි, පුවත්පතේ වාර්තාව නිවැරදි නැහැ. ඒ අය තොරතුරු ගත්තේ කොහෙන්ද කියලා මම දන්නේ නැහැ. ඒ ගැන මම කනගාටු වෙනවා. ඒක වාර්තා කරපු මාධ්‍යවේදියාත් අධ්‍යාපනය සම්බන්ධයෙන් බොහොම උනන්දුවෙන් වැඩ කරනවා. ඔහුට කොහෙන් ඒ තොරතුරු ලැබුණාද කියලා මම දන්නේ නැහැ. එම මුදල ගෙවන එක ඊයේ confirm කළා. ලබන මාසයේ ඉඳලා මුදල් ගෙවයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කෙටි දැනුම් දීමක් කරන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ලෝකයේ අනෙක් රටවල්වල වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව සාකච්ඡා කරන්න ජාත්‍යන්තර විශේෂඥයෙක් උදේ 10.30ට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට එනවා. මම ආරාධනා කරන්න කැමැතියි, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් 225දෙනාගෙන් ඕනෑම කෙනෙක් උදේ 10.30 සිට 11.30 දක්වා මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තරය තුළ සිදු වන අපි නොදන්නා කාරණා ඔහුගෙන් දැන ගන්න පැමිණෙන්න කියලා.

Thank you.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඉතාම කෙටියෙන් කියන්න. ගරු විපක්ෂ නායකතුමාගේ ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්නය ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
හොඳයි, මම කෙටියෙන් අහන්නම්.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමාට මම අවස්ථා ගණනාවකදීම කිව්වා විදුහල්පතිවරුන් ස්ථානගත කිරීම පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා කියලා. එතැන ලොකු අසාධාරණයක් සිද්ධ වෙනවා. එම නිසා ඒ අයගේ ලකුණු ටික හරි ප්‍රසිද්ධ කරන්න කියලා මම කිව්වා. නමුත් විභාග දෙපාර්තමේන්තුවවත්, අධ්‍යාපන අමාත්‍යාංශයවත් මේ වෙනකල් ඒ කටයුත්ත කරලා නැහැ. විදුහල්පතිවරු ස්ථානගත කිරීමේ ක්‍රමය මොකක්ද කියන්න මගේ ළඟ තොරතුරු තිබෙනවා. ඔබතුමා කිව්වා, 2019 පත්වීම් ලැබූ අය ඉල්ලපු ස්ථාන ටික දීලා, වැඩි ලකුණු තිබෙන අය ජාතික පාසල්වලට දාලා, ඉතිරි අය ස්ථානගත කරනවා කියලා.

නමුත්, ඒ ක්‍රමයට පරිබාහිරව තමයි ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අලුතින් පත් වෙච්ච විදුහල්පතිවරුන් අතරේ විශාල ගැටලුවක් සහ හිත් බිඳීමක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකර මේ සඳහා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා කියන්න. අද වෙනකොට මධ්‍යම පළාතේ ලග්ගල ප්‍රදේශයට විදුහල්පතිවරු නැහැ. සමහර පාසල්වල විදුහල්පතිවරු වැඩිපුර ඉන්නවා. මා ළඟ ඒ තොරතුරු සියල්ල තිබෙනවා. ඒ නිසා මේ සඳහා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා කියන ලෙස මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අඩුම තරමින් ඒ සියලුදෙනා interview එකේදී ලබා ගත් ලකුණු සහ විභාග ලකුණු ප්‍රසිද්ධ කරන්න පුළුවන්ද කියන එක මම ඔබතුමාගෙන් අහනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ලකුණු ප්‍රසිද්ධ කරන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. මම කොහොම හරි ඒ ලකුණු ප්‍රමාණය ප්‍රසිද්ධ කරවන්නම්. ස්ථානගත කිරීමේදී විදුහල්පතිවරුන්ගේ සංගමය හා ගුරු සංගම් එක්ක සාකච්ඡා කරලා, ප්‍රතිපත්තියක් යටතේ කළේ. 2019 විභාගය මත මුලින් පත්වීම් දුන් එක්දහස් හත්සියදෙනා හෝ ඊට පෙරාතුව විදුහල්පති III ශ්‍රේණියේ කවුරු හරි ඉන්නවා නම්, ඒ අය පාසල් ඉල්ලනවා නම් ඒවාට ප්‍රමුඛතාව දෙනවා. ඊළඟට, ඒ ඒ පළාත තුළ වැඩිම ලකුණු අනුපිළිවෙළට තිබෙන පුරප්පාඩුවලට පත්වීම් දෙන්න කියන එක තමයි ප්‍රතිපත්තිය වුණේ. මේ යටතේ කොළඹ ජාතික පාසල්වලට වැඩිම ලකුණු අනුපිළිවෙළට -ලකුණු එකසිය අනූගණන් තිබුණු අය- හත්දෙනෙක් ස්ථානගත කළා. නමුත්, නැවත වතාවක් වෘත්තීය සමිතිවලින් කරපු දැන්වීමක් අනුව ඒක තාවකාලිකව පමණක් අත්හිටෙව්වා.

ගරු මන්ත්‍රීතුමියනි, ඊට අමතරව ප්‍රශ්න දෙකක් පැන නැඟුණා. ඒ තමයි, මධ්‍යම පළාතේ හා බස්නාහිර පළාතේ විදුහල්පති තනතුරේ cadre එක අනුව සිටිය යුතු සංඛ්‍යාවට වඩා වැඩි පිරිසක් විදුහල්පති ධුරය ලැබුවා. උදාහරණයක් වශයෙන් බස්නාහිර පළාතේ 202ක් විතර හා මධ්‍යම පළාතෙන් 180ක් විතර විදුහල්පති ධුරය ලැබුවා. හැබැයි, මම ඒ පිළිබඳව කැබිනට් පත්‍රිකාව දැම්මාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිරීක්ෂණ ආවා, ඒ පළාත්වල වැඩි නම් ඒ අය ආසන්නම පළාතට දමන්න කියලා. නමුත්, ඊළඟ සතියේ මම ඒකට අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කළා. එම අමාත්‍ය මණ්ඩල සටහනෙන් කිව්වේ, "වැඩි නැහැ. මොකද, වැඩ ආවරණය කරන අයගේ තනතුරු එක්ක පුරප්පාඩු තිබෙනවා කියලායි අපි අධිකරණයට දැනුම් දීලා තිබෙන්නේ"කියන එක. ඒ අර්ථයෙන් ගත්තාම, පුරප්පාඩු අනුව ඒ අයට තමන්ගේ පළාත තුළම පත්වීම් දෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමිය කිව්වා, මාතලේට විදුහල්පතිවරුන් අඩුයි කියලා. දැන් අතිරික්ත නැහැ. ඒ නිසා අඩු ඒවා ඒ ගොල්ලන්ගෙන් පුරවන්න පුළුවන්. මම ඒ තීන්දුව ඊයේ කැබිනට් මණ්ඩලයේ දී ගත්තා. ලබන සඳුදා වෙනකොට ඒ ගැන රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කරලා දැනුම් දීමක් කරනවා. මධ්‍යම පළාතේ අතිරික්තයක් නැහැ, ඒ ගොල්ලන් ස්ථානගත කරන්න කියන්න. බස්නාහිර පළාතේත් අතිරික්තයක් නැහැ, ඒ ගොල්ලන් ස්ථානගත කරන්න කියන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු කංචන විජේසේකර ඇමතිතුමා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர )
(The Hon. Kanchana Wijesekera )
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා අද න්‍යාය පත්‍රය අනුවද වැඩ කර ගෙන යන්නේ, නැත්නම් අද වෙනම ප්‍රශ්න පත්‍රයක් තිබෙනවාද? කරුණාකරලා කියන්න.

මොකද, අපටත් දැන් න්‍යාය පත්‍රය අනුව වරප්‍රසාද ප්‍රශ්න නඟන්න කියලා ඉඩ දීලා තිබෙනවා. හැබැයි දැන් ඔබතුමා න්‍යාය පත්‍රයෙන් පිට ගිහිල්ලා. ඒ නිසා එම ප්‍රශ්න ටික පස්සේ කථා කරගන්න. ඉස්සර වෙලා න්‍යාය පත්‍රයේ වැඩ ටික කරගෙන යන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
න්‍යාය පත්‍රය අනුව තමයි වැඩ කරන්නේ. ගරු මන්ත්‍රීවරුන්ම තමයි ඒක වෙනස් කරන්න කටයුතු කරන්නේ.

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27.(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඉක්මනින් කියන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, අනන්‍යතාවට ගැටලුවක් වෙන නිසා මම නම් සඳහන් කරන්නේ නැහැ. මම ඔබතුමාට කියන්නම්. නමුත් අර වැඩිම ලකුණු තිබෙන අයට ඒ කියන වරප්‍රසාදය ලැබිලා නැහැ කියන එකත් කියන්න ඕනෑ. ඊළඟට, වැඩබලන විදුහල්පතිවරු තමයි ගොඩක් තැන්වල ඉන්නේ. නමුත් ඒ ගොල්ලන් ස්ථිර කරලා හෝ ඒ අවශ්‍ය දේ කරලා දීලාත් නැහැ. ඒ නිසා වැඩබලන විදුහල්පතිවරුන්ගේ ගැටලුවට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ වාගේම අලුතින් පත්වීම් දීමේදී අසාධාරණයට ලක් වෙච්ච අය වෙනුවෙන් නිවැරදි ක්‍රමයක් සකස් කරනවා නම්, ගුරු-විදුහල්පතිවරු අතර විශ්වාසයත් ඇති වෙනවා කියලා මම හිතනවා. එහෙම නැති වෙනකොට ඒ ගොල්ලන්ට සිත් බිඳීමක් ඇති වෙනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩ ආවරණය කරන විදුහල්පතිවරුන්ටත් යම් ක්‍රමයක් හදලා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළා. රාජ්‍ය සේවා කොමිෂන් සභාව එවපු නිරීක්ෂණත් එක්ක තමයි ඒක ප්‍රමාද වෙන්නේ. ඒ නිසා නැවත වතාවක් අමාත්‍යාංශ ලේකම්ට සිදු වෙනවා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවත් එක්ක ඒ ගැන සාකච්ඡා කරන්න. ඒකට සති දෙක තුනක් යාවි. හැබැයි, ඒ අයට සාධාරණය ඉටු කරන්න තමයි කටයුතු කරගෙන යන්නේ. ඒ අය ගත්තාය කියලා මධ්‍යම පළාතේ, බස්නාහිර පළාතේ අතිරික්තයක් ඇති වෙන්නේ නැහැ. ඒ ගොල්ලන් ඒ පළාත් දෙකේ ස්ථානගත කරන්න පුළුවන්. යම් ආකාරයක වැඩි ලකුණු ගත්ත අය වෙනුවට අඩු ලකුණුවලින් අරගෙන තිබෙනවා නම්, ඔබතුමිය මට එවැනි අවස්ථා දැනුම් දෙන්න. ඒවා නිවැරදි කරන්න මම අවශ්‍ය පියවර ගන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ, ගරු රවුෆ් හකීම් මැතිතුමා කථා කරයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ගරු කංචන විජේසේකර තරුණ අමාත්‍යතුමාට හදිසියක් නම් එතුමා කථා කරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හදිසියක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. න්‍යාය පත්‍රයක් තිබෙනවා නේ. ඒකට බාධා කරන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නත් අහන්නේ නැති අද වාගේ දවසක, හදිසි ප්‍රශ්නයක් මතු වුණාම ඒ ගැන යමක් කියන්න පක්ෂ නායකයන්ට අයිතියක් තිබෙන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ගන්නේ නැත්තේ, ඊට වඩා වැදගත්කමක් තිබෙන -

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

ඔබතුමාගේ අනුමැතිය ඇතුව හදිසි ප්‍රශ්නයක් -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා ප්‍රශ්නය මොකක්ද කියලා කෙටියෙන් කියන්න කෝ, වටේ යන්නේ නැතුව.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මම අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් අහන්නේ.

දැන් හදිසි ප්‍රශ්නයක් හටගෙන තිබෙනවා, කුලියාපිටිය ආසනයේ. කුලියාපිටිය ආසනයේ මදීනා ජාතික පාසලේ විදුහල්පති පත් කිරීම මත විශාල ප්‍රශ්නයක් මතු වෙලා උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. ඒ පිළිබඳව විමර්ශනයක් කරලා

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය දැන් මෙතැන කථා කරන්න අවශ්‍ය-

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

SLPS ගණයේ විදුහල්පතිවරයෙක් පත් කළාට පස්සේ විශාල උද්ඝෝෂණයක් පැවැත්වෙනවා. මොකද එතැන -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

හරි. විපක්ෂ නායකතුමා, ඔබතුමා ස්ථාවර නියෝග 27.(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීමක්]* න්‍යාය පත්‍රයට අනුව වැඩ කරන්න ඕනෑ. මේ සභාව හැල්ලුවට ලක් වෙනවා නේ. ඔබතුමාට දීපු අවස්ථාව ඔබතුමා දැන් මන්ත්‍රීවරු කිහිපදෙනෙකුට දුන්නා. එහෙම කරන්න බැහැ.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

පක්ෂ නායකයකුට යමක් කියන්න අවස්ථාව නැද්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක හරි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට නොවෙයි කිව්වේ. *[බාධා කිරීමක්]*

අධ්‍යාපන ඇමතිතුමා, කෙටියෙන් කියන්න.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
මේ තරුණ ඇමතිවරු දැන ගන්න ඕනෑ, පක්ෂ නායකයන්ට ගරු කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයට යමු.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ගරු ඇමතිතුමා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට මම විනාඩියෙන් උත්තරයක් දෙන්නම්.

මදීනා ජාතික පාසලේ විදුහල්පති පුරප්පාඩුවක් තිබුණා. ඒක විදුහල්පති I ශ්‍රේණියේ පාසලක්, අපේ ලියවිලිවල හැටියට. මේ පිළිබඳව මීට පෙර අවස්ථාවල applications call කරලා, interview කරලා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යවලා තිබුණා. ඒ අතරතුර පරිපාලන සේවයේ නිලධාරියෙක් එතැන වැඩ ආවරණය කරනවා. දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නියම විධියට තේරුණු කෙනාට ලියුම එවලා තිබෙනවා. නමුත්, එම විදුහල්පතිවරයා භාර ගන්න පාසල් ප්‍රජාව සූදානම් නැහැ. ඒ නිසා දැන් අපි එම විදුහල්පතිවරයා ගෙන්වලා ඒ තත්ත්වය සමථයකට පත් කරන්න කටයුතු කරගෙන යනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

කාලීන ප්‍රශ්න මතු කරන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා. දැන් අපේ රවුෆ් හකීම් මැතිතුමා මතු කළේ කාලීන ප්‍රශ්නයක්. එතුමාට ඒකට අයිතියක් තිබෙනවා. මෙතැන ශීඝ්‍රගාමීව කටයුතු කරන්න බැහැ. මේක පාර්ලිමේන්තුව. මේ සභාවට ආවාම දවසම ඉන්න ඕනෑ, යන්න හදිසියෙන් ඇවිල්ලා බැහැනේ. මේ සභාවට ආවාම දවසම ඉන්න ඕනෑ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරුන්ට කාලීන ප්‍රශ්න අහන්න අවස්ථාවක් තිබෙනවා, ඒක වරප්‍රසාදයක්. ඒකට කිසිම අභියෝගයක් කරන්නේ නැහැ. නමුත්, න්‍යාය පත්‍රයේ කටයුතුවලින් පසුව තමයි ඒකට අවස්ථාව තිබෙන්නේ. ඔබතුමා න්‍යාය පත්‍රයක් හදලා අපට එවලා නියමිත වෙලාවට ඇවිල්ලා ප්‍රශ්නවලට උත්තර දෙන්න කියලා කියනවා නම්, අපට ඒ අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
### தனி அறிவித்தல் மூல வினா
### QUESTION BY PRIVATE NOTICE

## විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ අරමුදල් සම්බන්ධ ගැටලු
### ஓய்வூதியம் மற்றும் சமூக பாதுகாப்பு நிதியம் சம்பந்தமான சிக்கல்கள்
### ISSUES RELATED TO PENSION AND SOCIAL SECURITY FUNDS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා ඉදිරිපත් කරන ප්‍රශ්නය මෙයයි.

ජනගහන සංයුතියේ සිදුවන වෙනස්කම්, ආර්ථික හා සමාජයීය වටපිටාවේ සිදුවන අනපේක්ෂිත කඩාවැටීම් හමුවේ රටක සෑම පුද්ගලයෙක්ම පාහේ සමාජ ආරක්ෂණ ජාලයක සාමාජිකයෙකු විය යුතු වෙනවා. කෙසේ වෙතත්, සමාජ ආරක්ෂණ ක්‍රම අතර අන්තර් සබඳතාවක් නොමැතිවීම, සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමේ අරමුණු නිසි ලෙස වටහා නොගැනීම, ප්‍රතිලාභ ලබා දීමට ප්‍රමාණවත් අරමුදල් නඩත්තු කිරීමට නොහැකි වීම හා නිසි කලට සිදු කරන විද්‍යාත්මක පුරෝකථනවලින් බැහැරව තාවකාලික දේශපාලන වාසි මත සිදු කරන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමේ තීරණ හේතුවෙන් අද සෑම විශ්‍රාමික හෝ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ අරමුදලක්ම පාහේ පත්ව ඇත්තේ අස්ථාවර තත්ත්වයකටයි.

ඒ අනුව, සමාජ ආරක්ෂණ ක්‍රම කිහිපයක් සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්නවලට රජයෙන් නිශ්චිත පිළිතුරු හා පැහැදිලි කිරීම් මා බලාපොරොත්තු වෙනවා.

01. විශ්‍රාම වැටුප් විෂමතා සහිතව තවමත් විශ්‍රාම වැටුප් ලබා ගන්නා 2016-2020 දක්වා කාලයේ විශ්‍රාම ගත් 112,000ක් පමණ විශ්‍රාමිකයන්ගේ එම විෂමතා ඉවත් කිරීමට නිශ්චිත දිනයක් රජයට ඉදිරිපත් කළ හැකිද?

    විශ්‍රාමිකයන් සඳහා වැඩි කරන ලද රුපියල් 2,500ක ජීවන වියදම් දීමනාව, දැනට සේවයේ නියුතු රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ආකාරයට ජනවාරි මස සිට ලබා නොදීමට හේතු කවරේද?

02. පසුගිය වසර 10 තුළ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් වියදම සැලකිය යුතු ලෙස අඛණ්ඩව වැඩි වී ඇති බව නිරීක්ෂණය වනවා. එම වැඩි වීම සම්බන්ධව ඉදිරි වසර 10 සඳහා සිදු කරන ලද පුරෝකථන කෙසේද? විශ්‍රාම වැටුපේ අඛණ්ඩ වැඩි වීම රජයට දරා ගත නොහැකි බවට බොහෝ මත වරින් වර සංවාදයට ලක්වන හෙයින් තිරසර විශ්‍රාම වැටුප්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රතිලාභ ලබා දීම තහවුරු කිරීම සඳහා රජය සතුවන අධ්‍යයනය හා වැඩ පිළිවෙළ කුමක්ද?

03. මෙරට සමස්ත ගොවීන් - වී ගොවීන් ඇතුළු අනෙකුත් වගා කටයුතු කරනු ලබන ගොවීන් - පිළිබඳ නිශ්චිත සංගණනයක් සිදු කර තිබේද? ඒ කවදා ද? එම දත්ත ඇතුළත් වාර්තාව මෙම සභාවට ඉදිරිපත් කරන්නේද? ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට 2023 වර්ෂය වන විට ඇතුළත් සක්‍රිය සාමාජිකයන්/ දායකයන් සංඛ්‍යාව කොපමණද? එමගින් මේ වන විට ප්‍රතිලාභ ලබන සමස්ත ගොවීන් සංඛ්‍යාව කොපමණද? කොපමණ පිරිසක් තවදුරටත් විශ්‍රාම වැටුප් ලැබීමේ අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ සිටින්නේද?

04. රජය විසින් මෙම ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා වාර්ෂිකව යම් ප්‍රතිපාදන ලබා දීමක් සිදු කරන්නේද? ඒ කොපමණද? ඒ සඳහා ඉදිරි වසර 10 සඳහා වන ඇස්තමේන්තුගත වැඩිවීම හෝ අඩුවීම කොපමණද? එසේ නම් අඛණ්ඩව මෙම ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පවත්වාගෙන යෑම සඳහා රජයේ සැලසුම කුමක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාමිණී ජයසූරිය මැතිතුමාගේ සහ ආර්.එම්. ධර්මදාස බණ්ඩා මැතිතුමාගේ මූලිකත්වයෙන් එවකට ආණ්ඩු ආරම්භ කරපු වැදගත් වැඩසටහනක් වන ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය අද සහමුලින්ම කඩා වැටිලා තිබෙනවා. ඒ නිසා මේ ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය සක්‍රිය කරවලා ගොවීන්ගේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට වර්තමාන රජය ගන්නා පියවර කවරේද කියලාත් මම අහන්න කැමැතියි.

05. 2023 දෙසැම්බර් වන විට ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා ඇතුළත් සක්‍රිය දායකයන් සංඛ්‍යාව කොපමණද? මෙමගින් මේ වන විට ප්‍රතිලාභ ලබන සමස්ත ධීවරයන් සංඛ්‍යාව කොපමණද? විශ්‍රාම වැටුප් අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ රැඳී සිටින ධීවරයන් සංඛ්‍යාව කොපමණද? මේ සඳහා රජය විසින් වාර්ෂිකව යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරනු ලබන්නේද? ඒ කොපමණද? ඒ සඳහා ඉදිරි වසර 10 සඳහා වන ඇස්තමේන්තුගත වැඩිවීම හෝ අඩුවීම කොපමණද? ධීවර ජනතාව වෙත ආකර්ෂණය සැලසීම වෙනුවෙන් ආරම්භ කර ඇති මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය තිරසරව පවත්වාගෙන යෑම සඳහා රජයේ වැඩ පිළිවෙළ කවරේද?

06. එකිනෙකට සම්බන්ධයක් නොමැතිව ක්‍රියාත්මක වන විවිධ විශ්‍රාම අරමුදල් හෝ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රම වෙනුවට සෑම පුද්ගලයෙකුම ආවරණය වන විශ්‍රාම ප්‍රතිලාභ හිමි ජාතික සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා රජය යම් අධ්‍යයනයක් සිදුකොට තිබේද? එසේ නම් එය සභාගත කරන්නට හැකිද?

ගරු නියෝජ්‍ය කථානායකතුමාගේ අවසරයත් ඇතිව, මේ කාරණයත් සමඟ තවත් කාලීන ගැටලුවකුත් මේ අවස්ථාවේදී මා මතු කරනවා.

පසුගිය දිනක නාත්තණ්ඩියේ බහුදින ධීවර යාත්‍රාවක් - multiday fishing boat - දික්ඕවිට වරායෙන් පිටත් වෙලා ගිහිල්ලා තිබෙනවා, ගැඹුරු මුහුදේ මත්ස්‍ය කර්මාන්තය කරන්න. ඒ ගිය කණ්ඩායම සහ යාත්‍රාව සෝමාලියානු මුහුදු කොල්ලකරුවන් විසින් පැහැරගෙන තිබෙනවා. හැබැයි, පසුව සීෂෙල්ස් රටේ ආරක්ෂක අංශ මේ දෙගොල්ලන්ම ඔවුන්ගේ භාරයට අරගෙන තිබෙනවා. අපේ රටේ ධීවරයන් සීෂෙල්ස් රටේ ආරක්ෂක අංශ භාරයට පත් වෙලා දැන් මාසයක් විතර වෙනවා. ධීවර රස්සාවේ ගිය ඒ රබිත දූෂාන් ප්‍රනාන්දු, කණිෂ්ක හේමන්ත, අශේන් නිමන්ත ප්‍රනාන්දු, අවිශ්ක කෞෂල්‍යා ප්‍රනාන්දු, ප්‍රියන්ත කුමාර ප්‍රනාන්දු, ශමිත් කුමාර ප්‍රනාන්දු යන අයත්, ඒ බෝට්ටුවත් සීෂෙල්ස් රටින් දැන් නිදහස් කරන්නේ නැහැ. අපි ඊයේත් විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්තුමාටත් කථා කරලා ඉල්ලීමක් කළා, අපේ රටේ ධීවරයන් ආරක්ෂා කර දෙන්න කියාත්, ඒ බෝට්ටුවත්, ඒ අයත් නැවත ශ්‍රී ලංකාවට ගෙනෙන්නට කටයුතු කරන්න කියාත්. මම සභානායකතුමාගෙනුත්, ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමාට කථා කරලා සීෂෙල්ස් රටේ අනාථ වෙලා සිටින නාත්තණ්ඩිය ප්‍රදේශයේ ධීවරයන් සහ ඒ යාත්‍රාව අපේ රටට ගෙන්වාගන්න කියලා. මොකද, මාසයක් ගත වෙලාත් මේ සම්බන්ධයෙන් යම්කිසි පැහැදිලි වැඩ පිළිවෙළක් සිදු වෙලා නැහැ. ඒ රටේ සිටින ලංකාවේ තානාපතිත් ඒ අය බලන්න ගිහිල්ලා තිබෙන්නේ එකම එක වතාවයි. ඒ අයගේ අයිතිවාසිකම් ගැන මීට වැඩිය හොඳින් හොයා බලන්න කියලා තානාපති සේවයත් දැනුවත් කරන්න ඕනෑ. කරුණාකරලා මේ සඳහා ඔබතුමන්ලාගේ මැදිහත්වීම අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය, ධීවර විශ්‍රාම වැටුප් ක්‍රමය සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පිළිබඳව මම අහපු ප්‍රශ්නයට රජයෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා වැදගත් ප්‍රශ්නයක් යොමු කර තිබෙනවා, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට. මුදල් අමාත්‍යාංශයෙන් ඒ සඳහා අවශ්‍ය තොරතුරු අපි ලබා දුන්නා. එතුමන්ලා ඒ පිළිතුර ලබා දේවි.

හැබැයි, ඉතා සරලව කියන්න තිබෙන කාරණාවක් තිබෙනවා. සමාජ සුබසාධනය පැත්ත බැලුවොත්, මීට අවුරුදු දෙකකට පෙර බිලියන 65කින් කරපු සුබසාධන කටයුතු සඳහා අපි මේ වර්ෂයේ බිලියන 208ක් වෙන් කර තිබෙනවා. ඒකෙන් පේන්නේ, අපි පුළුල් සුබසාධන වැඩ පිළිවෙළක් සිදු කරන බවයි. මේ පිළිබඳව විස්තරාත්මක පිළිතුරක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉදිරියේදී ලබා දේවි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගෙන් පොඩි අඩු පාඩුවක් සිද්ධ වුණා. ඇත්ත වශයෙන්ම ගොවි විශ්‍රාම වැටුප් ක්‍රමය ආරම්භ කිරීම සඳහා වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව එදා ඉදිරිපත් කළේ ගරු විජේරත්න බණ්ඩා හිටපු ඇමතිතුමා. ඒ, අපේ රෝහිණී කවිරත්න මැතිනියගේ දයාබර පියාණන් බව මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

මේ ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් අපි ඉක්මනින් බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු කංචන විජේසේකර ඇමතිතුමා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමාට මම ස්තුතිවන්ත වෙනවා, වරප්‍රසාද ප්‍රශ්නය යොමු කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව. ඊට පෙර මම ඔබතුමාගෙන් යම් ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරුන්ට කාලීන ප්‍රශ්න අහන්න ඉඩ සලසා දීම පිළිබඳව අපට කිසි ගැටලුවක් නැහැ. නමුත්, න්‍යාය පත්‍රයේ තිබෙන කරුණුවලට ප්‍රමුඛතාව ලබා දීලා ඒ කටයුත්ත කරන්න. මොකද, ඒ අනුවයි අපි, අපේ දෛනික වැඩ පිළිවෙළ හදාගෙන තිබෙන්නේ.

## වරප්‍රසාද: රංජන් ජයලාල් මහතා විසින් මාධ්‍ය සාකච්ඡාවකදී කරන ලද අසත්‍ය ප්‍රකාශය
## சிறப்புரிமை: திரு. ரஞ்சன் ஜெயலாலினால் ஊடக சந்திப்பின்போது செய்யப்பட்ட தவறான பிரசாரம்
## PRIVILEGE: FALSE STATEMENT MADE BY MR. RANJAN JAYALAL IN A PRESS CONFERENCE

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා විදුලි පොදු සේවක සංගමය නම් වෘත්තිය සමිතිය නියෝජනය කරන රංජන් ජයලාල් නම් පුද්ගලයා 2024 ජනවාරි මස 22වන දින මාධ්‍ය හමුවක් පවත්වා "පාර්ලිමේන්තුව රුපියල් කෝටි 7ක් ලංකා විදුලිබල මණ්ඩලයට පොලු තියලා" යනුවෙන් ප්‍රකාශයක් කරන ලදී. එම ප්‍රකාශය එදිනම රාත්‍රී ප්‍රවෘත්ති තුළින්ද, පසුදින පුවත්පත් තුළින්ද පළ වී තිබුණි. ඒ ගැන මා විදුලිබල මණ්ඩලයෙන් සහ පාර්ලිමේන්තුවෙන් විමසූ අවස්ථාවේදී එය අසත්‍ය ප්‍රකාශයක් බව සහ එය මහජනතාව නොමඟ යවන සුළු එකක් බව පැහැදිලි විය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල මණ්ඩලයෙන් මට ලැබුණු තොරතුරු අනුව රාජ්‍ය ආයතනයක් හෝ ආයතනයක් හැටියට පාර්ලිමේන්තුව තමයි නියමිත කලට පසුගිය කාලය තුළදීම විදුලි බිල ගෙවීමට කටයුතු කර තිබෙන්නේ. ඒ නිසා රටේ මහජනතාව තුළ උත්තරීතර පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් වෛරයක් සහ ද්වේෂයක් ඇති කරන මෙම අසත්‍ය ප්‍රකාශය සිදු කළ රංජන් ජයලාල් නැමැති පුද්ගලයා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට කැඳවන ලෙස මා ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම පසුගිය දෙසැම්බර් මාසයේ කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා, පෙබරවාරි මාසයේ විදුලි බිල සංශෝධනය කළ යුතුයි කියලා. ඒ අනුව ලංකා විදුලිබල මණ්ඩලය ඔවුන්ගේ යෝජනාව මහජන උපයෝගිතා කොමිසමට ලබා දීලා තිබෙනවා. ඒ අතරතුර අපි විවිධ පාර්ශ්වවලින් ඉල්ලීමක් කළා විදුලි බිල සම්බන්ධයෙන් තිබෙන යෝජනා, ඒ වාගේම ඔවුන් දකින ගැටලු පිළිබඳව අපට තොරතුරු ලබා දෙන්න කියලා. ඒ අනුව අපි විපක්ෂ නායකතුමාටත්, අපේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ටත් ඒ සාකච්ඡාවට පැමිණෙන ලෙස ආරාධනා කළා. නමුත්, එදින ඊට සහභාගිවීමට නොහැකි බව එම මන්ත්‍රීවරු දැනුම් දීලා තිබුණා. කෙසේ නමුත්, ඒ සාකච්ඡාවට විවිධ පාර්ශ්ව සම්බන්ධ වුණා. විශේෂයෙන්ම අපේ විශ්වවිද්‍යාල නියෝජනය කරන ඉංජිනේරු සංගම්, ඉංජිනේරුවන් වාගේම විදුලිබල ක්ෂේත්‍රයේ ඉන්න ප්‍රවීණයන් ඇතුළු 40කට ආසන්න පිරිසක් එම සාකච්ඡාවට සම්බන්ධ වුණා. තවත් විවිධ ආයතනවල නිලධාරින් සම්බන්ධ වුණා. ඔවුන් යෝජනාත් ලබා දුන්නා. ඒ වාගේම පසුගිය 15වැනි දා මහජන උපයෝගිතා කොමිසම මහජන අදහස් විමසීම සඳහා විවෘත කළා. ඒ අවස්ථාවේදීත් යම් අදහස් ලබා දීලා තිබෙනවා. අපි ඒ අදහස් දෙකම එකතු කරලා රජය වශයෙන් - විශේෂයෙන් අමාත්‍යාංශයෙන් විදුලිබල මණ්ඩලයට- උපදෙස් ලබා දීලා තිබෙනවා.

අපි දැකලා තිබෙනවා, මේ වසරේ සමහර වියදම් පුරෝකථනය කරලා තිබෙන්නේ පසුගිය අවුරුදු 4ක අපි කරන්න තිබුණු නඩත්තු කටයුතු මේ වසරේ අවසන් කිරීමට බව. ඒ අනුව මේ වසරේ නඩත්තු කටයුතු කරන්නේ නැතිව ඉදිරි අවුරුදු තුන සඳහා ඒ මුදල් වෙන් කරන්න කියාත් අපි උපදෙස් ලබා දීලා තිබෙනවා. ඒ අනුව සංශෝධනය කරපු විදුලි ගාස්තු අය ක්‍රමය පිළිබඳ යෝජනාව මම හිතනවා, බදාදා හෝ බ්‍රහස්පතින්දා ලංකා විදුලිබල මණ්ඩලය ලබා දෙන්න කටයුතු කරයි කියලා. ඒ අනුව මීට පෙර බලාපොරොත්තු වුණාට වැඩිය විදුලි බිලේ අඩු කිරීමක් කිරීමට අපි බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරනවා. ඒ යෝජනාව අපි මහජන උපයෝගිතා කොමිසමට ඉදිරිපත් කරනවා. මහජන උපයෝගිතා කොමිසම ඒ යෝජනාව අනුව තීරණය ගනියි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. මීළඟට, ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සමාවෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අවසාන කාරණාව ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලබා දෙන්න. වෙන්නප්පුව වෙළෙඳ සංගමයේ කණ්ඩායමකුත් මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න කැමතියි, වෙන්නප්පුව වෙළෙඳ සංගමය ඇත්ත වශයෙන් මාත්, නිරෝෂන් පෙරේරා මැතිතුමාත් හමු වෙලා බොහොම බරපතළ ප්‍රශ්නයක් ඉදිරිපත් කළ බව. එය වෙන්නප්පුව වෙළෙඳ සංගමය වාගේම රටේම වෙළෙඳ ප්‍රජාව මුහුණ දෙන බරපතළ ගැටලුවක්. ඔබතුමා දන්නවා, කොවිඩ් වසංගතය පැවැති සමයේ විශේෂයෙන්ම ණය මුදල් ගෙවීම සඳහා ව්‍යාපාරවලට යම්කිසි සහන කාලයක් ලබා දුන්න බව. හැබැයි, ඒ සහන කාලය ලබා

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දීමේදී වාණිජ බැංකු කටයුතු කරන ආකාරය තුළ මේ රටේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙනවා. වෙන්නප්පුව වෙළෙඳ සංගමයේ සාමාජිකයන් මේ කාරණාව පිළිබඳව මාත්, නිරෝෂන් පෙරේරා මැතිතුමාත් දැනුවත් කළා.

ඇත්ත වශයෙන්ම වාණිජ බැංකුවලින් කරලා තිබෙන්නේ අදාළ ණය කාල සීමාව දීර්ඝ කිරීමක් නොවෙයි, ණය නොගෙවූ කාලයට අදාළ ණය මුදල් තවත් අලුත් කොටසක් හැටියට ණයක් බවට පරිවර්තනය කරන එකයි. ව්‍යාපාරිකයන් ව්‍යාපාර කටයුතුවලින් ලබන ආදායම්වලින් ණය වාරිකය ගෙවනකොට, ඒ මුදල් ගෙවන්නේ අලුතින් සකස් කරපු ණය සඳහා. එතකොට පරණ ණය ගෙවන්නට හැකියාවක් නැහැ. ඇත්තටම moratorium කියන ක්‍රියාවලිය තුළ තාවකාලික සහනයක් මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට ලැබුණත්, දැන් ඒ අයට තිබෙන බර - burden එක - double, treble or quadruple වෙලා. ඒ කියන්නේ, විශාල ප්‍රමාණයකින් ණය බර වැඩි වෙලා.

විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි, මේ balloon system එක යටතේ, පළමු ණය වාරිකය සහ පොලී මුදල ණය මුදලක් බවට පත් වන බව. ඒ වාගේම තවත් ණය බරක් එක්කහු වෙනවා, moratorium එක කාලයේ නොගෙවපු වාරික මුදලයි, පොලියයි එක්ක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකේ ප්‍රතිඵලය මොකක්ද දන්නවාද?

මෙන්න බලන්න, පත්තරය. මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න මොහොතේ මම මේ කාරණාව පෙන්වා දෙන්න ඕනෑ. මේ පත්තර පිටුවේ විශාල කොටසක සඳහන් කර තිබෙන්නේ මොනවා ගැනද? *Parate* execution ගැන. ඒ කියන්නේ, පරාටේ නීතිය උපයෝගී කරගෙන මේ රටේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන් සම්පූර්ණයෙන්ම විනාශ කරන වැඩසටහනක් ගැන. අපි පුන-පුනාම උගුර ලේ රස වනකල් මේ සභාවේ ඉල්ලීමක් කළා, පරාටේ නීතිය ඉවත් කරන්න නොවෙයි, තාවකාලික විරාමයක් ලබා දෙන්න කියලා. තාවකාලික විරාමයක් ලබා දෙනකොට බැංකු පද්ධතියට අහිතකර දෙයක් සිද්ධ වෙනවා නම්, ජාත්‍යන්තර මූල්‍ය ආයතනත් එක්ක සාකච්ඡා කරලා, මොකක් හෝ standby facility එකක් තියාගෙන, බැංකු පද්ධතියත් ආරක්ෂා කරගෙන, මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන් ටික සුරක්ෂා කරන්න. ඔබතුමන්ලාම කියනවා, දළ දේශීය නිෂ්පාදිතයට සියයට 50ක්ම දායකත්වය ලබා දෙන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් කියලා. රැකියා නියුක්තිය ගත්තොත්, ඒකට සියයට 52ක දායකත්වයක් ලබා දෙන්නේ මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න, මේ අසාධාරණය. ඔක්කොම *parate* execution ගැන. මේවායින් හැම දාම පත්තර පිටු පුරවලා. පත්තරවල ප්‍රවෘත්තිවලටත් වඩා පළ වෙන්නේ *parate* execution ගැන. මේ රටේ දසලක්ෂ සංඛ්‍යාත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් මම ඉල්ලීමක් කරනවා. කරුණාකරලා මහ බැංකුවට ගෙනැල්ලා ඒ අය අන්දන්නේ නැතිව, ජනාධිපති ලේකම් කාර්යාලයට ගෙනැල්ලා ඒ අය අන්දන්නේ නැතිව, තරු පහේ හෝටල්වල සම්මන්ත්‍රණ තියලා ඒ අය අන්දන්නේ නැතිව, මේ *parate* execution ක්‍රියාවලිය තාවකාලිකව නතර කරන්න. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් ණය මර උගුලක, ණය විෂම චක්‍රයක පැටලිලා ඉන්නේ.

ඒ නිසා මම මේ ගැන විශේෂයෙන් මේ අවස්ථාවේ මතක් කරන්න කැමතියි. අද වෙන්නප්පුව වෙළෙඳ සංගමය වෙනුවෙන් මෙරිල් වැන්ඩලින් සහ ගාමිණී හේරත් යන මහත්වරු ගැලරියට ඇවිත් ඉන්නවා, පාර්ලිමේන්තුවෙන් මේ සඳහා ලැබෙන ප්‍රතිචාරය -උත්තරය- මොකක්ද කියලා බලන්න. වෙන්නප්පුවේ විතරක් නොවෙයි. දැන් මුළු රටේම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් මේ මර උගුලේ හිර වෙලා, තෙරපිලා, අසීමිත පීඩනයකින්, අසහනයකින් සිටිනවා. ඒ අය අමාරුවෙන් හදා ගත්ත ව්‍යාපාර, තමන්ගේ දහඩිය මහන්සිය තුළින් නිර්මාණය කළ ව්‍යාපාර ඇස් ඉදිරිපිටම කඩාගෙන වැටෙනවා; විනාශ වෙනවා. කරුණාකරලා මේ පිළිබඳව මෙම ගරු සභාවට දැන් උත්තරයක් ලබා දෙන්න ඕනෑ. හැම තැනකම කරන්නේ ඇන්දවිල්ල. ජනාධිපති ළඟට ගියාම එකක් කියනවා. මහ බැංකු අධිපති ළඟට ගියාම තව එකක් කියනවා. එහෙම වෙන්න බැහැ.

අනෙක් කාරණාව මෙයයි. මේ moratorium එක ඇත්ත වශයෙන්ම සහනයක් හැටියටයි ප්‍රකාශයට පත් කළේ. දැන් ණය බර double, treble or quadruple වෙලා තිබෙනවා. විශාල ප්‍රමාණයකින් ණය බර වැඩි වෙලා තිබෙනවා. මේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් අමාරුවෙන් හදාගත්ත ව්‍යාපාර, අමාරුවෙන් ගත්ත පෞද්ගලික දේපළ, තමන්ගේ ශුද්ධ වූ ව්‍යාපාර ආරක්ෂා කරගන්න ඕනෑ. මේ දේපළ ලබා ගත්තේ කොමිස් ගහලා නොවෙයි; හොරකම් කරලා නොවෙයි; අල්ලස් අරගෙන නොවෙයි; දූෂණ කරලා නොවෙයි. මේ අය බොහොම මහත්මා ගුණාංගයන්ගෙන් යුතුව උපයා ගත්ත දේවල් අද ඇස් ඉදිරිපිටම කඩාගෙන වැටෙනවා. තමන්ගේ නිවස, ඉඩම -දේපළ- තමන්ගේ ඇස් ඉදිරිපිටම කිසිම වග විභාගයකින් තොරව පරාටේ නීතිය හරහා වෙන්දේසියට යොමු වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට හිතක්, පපුවක් තිබෙනවා නම් කරුණාකරලා පරාටේ නීතියට තාවකාලික විරාමයක් ලබා දෙන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මම අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ කාරණාව පිළිබඳව වෙන්නප්පුව නියෝජනය කරන ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාටත් අදහසක් ඉදිරිපත් කරන්න පොඩි අවස්ථාවක් ලබා දෙන්න කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමා කෙටියෙන් කියන්න. මොකද, න්‍යාය පත්‍රයට අනුව කටයුතු කරන්න තිබෙනවා.

**ගරු නිරෝෂන් පෙරේරා මහතා**
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරුණු මම සනාථ කරනවා. මොකද, මම වෙන්නප්පුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. වෙන්නප්පුව වෙළෙඳ සංගමය අපිත් එක්ක ඉතාම සමීපව කටයුතු කරනවා. විශේෂයෙන් වෙන්නප්පුව ප්‍රදේශය ඉතාලිය හා සම්බන්ධ වෙලා විදේශ විනිමය ගෙනැත් විශාල වශයෙන් ව්‍යාපාර කරන ප්‍රදේශයක්. ඒ වුණත් දැන් වෙන්නප්පුව ප්‍රදේශයටත් ඉතාම අමාරු කාලයක් තමයි උදා වෙලා තිබෙන්නේ. රජයේ සංඛ්‍යාලේඛන අනුව මේ වසර කිහිපය තුළ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර 263,000ක් විතර වැහිලා ගිහින් තිබෙනවා.

ඒ වාගේම මේ බැංකු කටයුතු කරන විධිය අපට පේනවා. මේක මේ වැල් පොලී trap එකක් හැටියට මේ ගොල්ලන් රඳවාගෙන ඉන්න, හැමදාම මේ ව්‍යාපාරිකයන් බැංකුවලට පොලිය ගෙවලාත්, ඒ අයගේ ණය අඩු වෙන්නේ නැති උගුලක් හැටියටයි මේ වැඩ කටයුතු කරලා තිබෙන්නේ. ඒ හින්දා මේ සම්බන්ධයෙන් රජයට වගකීමක් තිබෙනවා. මොකද, අපේ ආර්ථිකය දුවන්නේ මේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින්. ඒවා කඩා වැටුණොත් තව තවත් මේ ආර්ථිකය පල්ලෙහාට යනවා. අපේ බදු ප්‍රතිශතය තවත් පල්ලෙහාට යනවා.

ඒ වාගේම, මේ රටේ ජනතාවගේ දේපළ අද වන විට වෙන්දේසි කරලා, ඒ දේපළ වෙන්දේසිවලින් ගන්න මුදල්වලින් බැංකු පද්ධතිය දුවන තත්ත්වයක් අද ඇතිවෙලා තිබෙනවා. ඒ හින්දා බැංකුත් ආරක්ෂා කරන්න ඕනෑ. අපි ඒක පිළිගන්නවා. නමුත්, බැංකු ආරක්ෂා කරන ගමන්ම මේ රටේ ආර්ථිකයට පණ පොවන ඒ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ආරක්ෂා කරන්න, වෙන්නප්පුව වෙළඳ සංගමය ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව, විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව මම අනුමත කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා පිළිතුරක් දෙනවා ද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතා වැදගත් කරුණක් එතුමන්ලා පෙන්වා දෙන්නේ. රටක සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ඉතා වැදගත්. එතුමන්ලා යෝජනා කරනවා, මේ ගැන මානුෂිකව හිතන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපි මේ රටේ සිටින දෙකෝටි විසිලක්ෂය පිළිබඳවම මානුෂිකව බලන්න ඕනෑ. ඒ නිසා තමයි මේ රටේ දෙකෝටි විසිලක්ෂයම අසීරුවට පත් වුණු වෙලාවේ කවුරුත් බාර ගත්තේ නැති රට ජනාධිපතිවරයා බාර ගත්තේ මුදල් ඇමතිවරයා හැටියට. ඒ නිසා මේ අර්බුදයකට විසඳුම් සොයන අවස්ථාවක විවිධ පාර්ශ්වවලට ඇතිවන ගැටලු පිළිබඳව අපට ඉතා ගැඹුරින් කථා කරන්න පුළුවන්. ඒකෙන් මම මේ කාරණය ලඝු කරන්නේ නැහැ. දැන් කිව්වා, බැංකුවල අය නොවන ණය සීමාව සියයට 13 දක්වා ගිහිල්ලා තිබෙනවා කියලා. බැංකුවක් යම් අසීරුතාවකට පත් වුණොත් මුළු ආර්ථිකයම වැටෙනවා. අපේ රටේ බැංකුවල දැන් ඉන්න තැන්පතුකරුවන් සංඛ්‍යාව පන්කෝටි හැත්තෑලක්ෂයක්. මේ පන්කෝටි හැත්තෑලක්ෂයෙන් සියයට 60ක් රුපියල් 5,000ට වඩා අඩු තැන්පතු තියපු ජනතාව. එතකොට බැංකුවේ වත්කම්වලින් සියයට 80ක් තිබෙන්නේ මේ තැන්පතුකරුවන්ගේ. රජය ප්‍රධාන වශයෙන් බැඳෙනවා, මේ සියල්ලටම පිළිතුරු සොයන්න. ඒ නිසා තමයි වරින් වර චක්‍රලේඛ නිකුත් කරමින් විවිධ විධියට මේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් රැක ගන්න උත්සාහ කරන්නේ. දැන් මහ බැංකුව වෙනමම දෙපාර්තමේන්තුවක් ඒ සඳහා පිහිටුවා තිබෙනවා, එක එක සිද්ධියෙන් සිද්ධියට බලන්න, පොදුවේ මේ පරාටේ බලතල යම් කාලයකට අහිමි කළොත් බැංකු පද්ධතියට වෙන අපහසුතාව නිසා. නමුත්, මෙතුමන්ලා පෙන්වා දෙන කරුණු පිළිබඳ, මේ චක්‍රලේඛවලින් අගතියක් වෙනවා ද වැනි කරුණු පිළිබඳව තවදුරටත් සොයා බලන්න අපි සූදානම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහන්න කැමැතියි ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන්, රජයේම කොටසක් වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ආකාරයට- *[බාධා කිරීමක්]* නැහැ, එහෙම ගැටලුවක් නැහැ. එතුමාට chance එකක් දෙනවා අපි. එහෙම කිසි ප්‍රශ්නයක් නැහැ. වෙනත් පැත්තකට හරවන්න යන්න එපා, අපි මේ කථා කරන්නේ වැදගත් මාතෘකාවක්. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන්ම සඳහන් කරනවා මේ රටේ කුඩා කර්මාන්ත, කුඩා ව්‍යවසාය 250,000කට වැඩි ප්‍රමාණයක් වැහිලා තිබෙනවා කියලා. ඔබතුමා ම දන්නවා ඒකේ බරපතළකම. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ, අපට ඒ ගැන නිශ්චිත උත්තරයක් අවශ්‍ය නිසායි. දැන් ඔබතුමා මහ බැංකුවේ එක ආයතනයක් පිළිබඳ විභාග කරනවාලු මේකෙන් මොකක්ද වෙන්නේ කියලා. මම අහන්නේ ඒවා ගැන නිරතුරුව අධ්‍යයනයක් කරන්නේ නැද්ද? මේවා මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්, භාණ්ඩාගාරයේ නිලධාරින් අමුතුවෙන් study කරන්න ඕනෑ දෙයක් නොවෙයි නේ. ඇත්ත වශයෙන්ම, පරාටේ නීතිය නිසා මේ රටේ කුඩා කර්මාන්ත ක්ෂේත්‍රයේ මේ බරපතළ කඩා වැටීම ගැන ඔබට තිබෙන්නට ඕනෑ නිරන්තර සමීක්ෂණයක්. ඉතින්, මේ කුඩා කර්මාන්තකරුවන් යම් ඉල්ලීමක් කරපු පළියට ඒ ගැන සමීක්ෂණය කරනවාය කියන එක මම හිතන්නේ දුර්වල පාලනයක ලක්ෂණයක්. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේකට නිශ්චිත උත්තරයක් දෙන්න කියලා. දැන් මම අපේ විපක්ෂ නායක කාර්යාලයේදී යුරෝපා හවුලේ කොමසාරිස්තුමිය මුණගැස්වුවා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත කරුවන්ට. ඒ වාගේම, ADB එකේ Country Director සම්බන්ධ කරලා දුන්නා. ඉතින් ඔබතුමන්ලාට ඇයි බැරි මේ බරපතළ ප්‍රශ්නය ඒ මූල්‍ය ආයතනවලට පැහැදිලි කරන්න? විශේෂයෙන්ම මේ අය මුහුණ දෙන ප්‍රශ්නයට යම්කිසි තිරසර විසඳුමක් අපට අවශ්‍යයි. බැංකු පද්ධතියත් ආරක්ෂා කරගෙන මේ පරාටේ නීතියට පොඩි විරාමයක් ලබා දෙන්න.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන්නේ මම මේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. අපි අර්බුදයක ඉඳලායි ගොඩට යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ අර්බුදයෙන් ගොඩ යද්දී, සාර්ව රාමුව තුළ පිළිතුරු සොයද්දී අපට එක්වරම සියලු අංශවලට පිළිතුරු සොයන්න බැහැ. ඒ නිසා තමයි බැංකු ආරක්ෂා කරන්න මේ අය වැය ලේඛනය තුළින් රුපියල් බිලියන 800ක මුදලක් අපි වෙන් කළේ. ඒ විදේශ ආයතන සමඟත් සාකච්ඡා කළා. ඒ එක්කම, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ණය දීමට රුපියල් බිලියන 30ක් වෙනම වෙන් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට යන්න වෙලා තිබෙන්නේ පියවරෙන් පියවර. සමස්ත ආර්ථිකය ආරක්ෂා කරගෙන මේ තිබෙන හැම අංශයක් කෙරෙහිම අවධානය යොමු කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, අර මහා ආර්ථික අර්බුදය තවම තිබුණා නම් ඔය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් විතරක් නොවෙයි, සමස්ත ජන ප්‍රජාවේම ජීවන තත්ත්වය මේ වෙනකොට කඩා වැටිලා. ඒ නිසා තමයි අපි අඩියෙන් අඩිය ඉස්සරහට යන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, මෙතුමන්ලා කියන ඒවා නොවැදගත් කියලා. අපි ඉතාම ගැඹුරින් මේ පිළිබඳව අවධානය යොමු කරන්න සූදානම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සුසිල් ප්‍රේමජයන්ත අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්නේ. මම ඔබතුමාට පසුගිය දා ප්‍රශ්නයක් යොමු කළා, කුලියාපිටියේ තාක්ෂණවේදී ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ දරුවන් අසාමාන්‍ය ලෙස අසමත් වීම පිළිබඳව. ඔබතුමා ඒ වෙලාවේ මට පිළිතුරක් දුන්නා වාගේම, නැවත ඒ පිළිබඳව සොයා බලා සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියලා වාර්තා කරන්නම් කිව්වා. ඒකට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා දැන ගන්න පුළුවන් නම් හොඳයි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මට ඒ පිළිබඳව මතකයෙන් කියන්න අමාරුයි. මම ඔබතුමාට හෙට පිළිතුරක් දෙන්නම්.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ රටේ ප්‍රධාන නාළිකාවේ වාගේම "දෙරණ" නාළිකාවේත් මේ ගැන ප්‍රකාශ වුණා. සෞඛ්‍ය ඇමතිතුමාත් මේ සභාවේ ඉන්න නිසායි මම මේ කියන්නේ. කෝටි 14ක් වැය කරලා මාතර ප්‍රධාන රෝහලට CT scan යන්ත්‍රයක් ඇණවුම් කරලා තිබෙනවා. ඒ ඇණවුම් කරපු යන්ත්‍රයේ අවශ්‍යතාව වැඩි නිසා airfreight කරලා තමයි රටට ගෙන්වලා තිබෙන්නේ. ගෙනැල්ලා දැන් මාස දෙකක් වෙනවා ලු. නමුත් මේ යන්ත්‍රය නිදහස් කරන්නේ නැතිව රේගුවේ තබාගෙන ඉන්නවා ලු. මම හිතන විධියට, රටේම තිබෙන්නේ CT scan යන්ත්‍ර 44යි. ඒ යන්ත්‍රවලින් 6ක් වැඩ කරන්නේ නැති ලු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ගම්වල ඉන්න රෝගීන්ට CT scan යන්ත්‍රයේ තිබෙන වටිනාකම හොඳින්ම දැනිලා තිබෙනවා. ඔවුන්ට ඒ පරීක්ෂණ පෞද්ගලිකව කරගන්න විධියක් නැහැ. ගරු ඇමතිතුමනි, රේගුවෙන් මේ යන්ත්‍රය ඊයේත්, අදත් රඳවාගෙන ඉන්නවා ලු. මේ යන්ත්‍රය නිදහස් කරගෙන මාතර ප්‍රධාන රෝහලට ලබා දීමට අවශ්‍ය කටයුතු කළොත් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (කර්මාන්ත අමාත්‍ය සහ සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - கைத்தொழில் அமைச்சரும் சுகாதார அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Industries and Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට අසාධාරණ රඳවා ගැනීමේ බද්දක් පනවා තිබුණා. අපි වරාය සහ නාවික ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒ බද්ද නිදහස් කර දෙන්න කියලා. ඉන් පසුව අපි CT scan යන්ත්‍රය නිදහස් කර ගන්නවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු අපි දැනටමත් කරලා තිබෙන්නේ.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත් කෙටුම්පත
### யுனெஸ்கோவிற்கான இலங்கை தேசிய ஆணைக்குழு சட்டமூலம்
### SRI LANKA NATIONAL COMMISSION FOR UNESCO BILL

"එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***
***2024 මාර්තු 05 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.***

*கல்வி அமைச்சர் மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*
*2024 மார்ச் 05, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha, Minister of Education; to be read a Second time upon Tuesday, 05th March, 2024 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 9 දක්වා ඉදිරිපත් කිරීම.

## සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත
## பிணைப்பொறுப்பளிக்கப்பட்ட கொடுக்கல்வாங்கல்கள் சட்டமூலம்
## SECURED TRANSACTIONS BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත, විෂය අංක 3 - උකස් (සංශෝධන) පනත් කෙටුම්පත, විෂය අංක 4 - කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත, විෂය අංක 5 - දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත, විෂය අංක 6 - සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත, විෂය අංක 7 - ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම සඳහා ද, විෂය අංක 8 - ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය සහ විෂය අංක 9 - ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන රෙගුලාසි ද අනුමත කිරීම සඳහා මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු මේ ගරු සභාවේ අවධානය පිණිස මම මේ අවස්ථාවේ දැනුම් දෙනවා, සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත පිළිබඳ කාරක සභා අවස්ථාවේදී සංශෝධනයක් ඉදිරිපත් කිරීමට තිබෙන බව. ඊට ආනුෂංගිකව අනෙක් ඒවායේත් සංශෝධන එන්න පුළුවන්. ඒ නිසා අද පස් වරු 4.30 දක්වා විවාදය පවත්වා, සංශෝධන ගෙන ඒම සඳහා කාරක සභා අවස්ථාව අපි වෙනත් දිනයකට කල් තබනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විවාදය ආරම්භ කිරීම, ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 45ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.57]

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (රාජ්‍ය වැවිලි ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අමාත්‍ය සහ මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - அரச பெருந்தோட்ட தொழில் முயற்சிகள் மறுசீரமைப்பு அமைச்சரும் நிதி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of State Plantation Enterprises Reforms and State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගන්නේ ඉතා විශේෂ පනත් කෙටුම්පත් කිහිපයක්. අපි සම්පූර්ණ පාර්ලිමේන්තු ක්‍රමය එක්ක අනුගත වෙමින් අද මේ පනත් කෙටුම්පත් සම්මත කිරීමේ කටයුත්ත කල් තැබීමට සූදානම්. නමුත් මම හිතනවා, ඒවාට අදාළ විවාදය වැදගත් කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතින් බලාපොරොත්තු වන්නේ, විශේෂයෙන් රටේ ආයතනවල, පුද්ගලයන්ගේ ද්‍රවශීලතාව වෙනුවෙන් වැඩි පහසුකම් සැලසීමයි. එක පැත්තකින්, ඔවුන්ට මූල්‍යමය පහසුකම් ලබා ගැනීම වඩාත් සරල කරන්න, වඩාත් ශක්තිමත් කරන්න සහ වඩා වැඩි අවස්ථාවක් ලබා දීම සහ අනෙක් පැත්තෙන්, මූල්‍ය පහසුකම් සපයන බැංකු වැනි ආයතනවලට වඩාත් හොඳ ආරක්ෂාවක් ලබා දීම මෙයින් අපේක්ෂා කරනවා.

අපේ රටේ ණය ලබා ගැනීමේදී බොහෝ විට ඇප හැටියට තියන්න පුළුවන් වන්නේ ඉඩම් සහ වාහන බව අපි දන්නවා. ඒකට හේතුව වුණේ සාමාන්‍යයෙන් අපේ රටේ ඉඩම් අවුරුදු 150ක විතර ඉතිහාසයක් සහිතව රජයේ ලියාපදිංචි වෙලා තිබීමයි. බොහෝ විට ඉඩම් ලියාපදිංචිය සිදු කර තිබෙන නිසාම ඉඩමක් ඇපයට තබාගෙන ණයක් දෙන විට මූල්‍ය පහසුකම් සපයන ආයතනයකට ඉතා පහසුවෙන් ඒ ඉඩමේ ඉතිහාසය, ඒ ඉඩමේ නිසි අයිතිකරු, වර්තමාන තත්ත්වය ආදි සියල්ල නිශ්චිතව බලාගන්න පුළුවන්කමක් තිබෙනවා. ඒ වාගේම එය නීත්‍යනුකූලව ඇපයට තබා ගැනීම සඳහා වන ඉතා පහසු ක්‍රමයක් තිබෙනවා. ඒ නිසා නිරවුල් ඉඩමක් හිමි අයෙකුට එය ඇපයට තබා ණය මුදලක් පහසුවෙන් ලබා ගන්න පුළුවන්. ඊට අදාළ පෙළපත නිරවුල් නැත්නම් එය රක්ෂණය කරන ක්‍රමයකුත් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊට අමතරව, වාහනවලටත් පැහැදිලි ලියාපදිංචියක් තිබෙනවා. හැම නීත්‍යනුකූල වාහනයක්ම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබෙනවා. අපි ඒකට කියනවා, "registration පොත" කියලා. ඒ පොතත් එක්කම වාහනයක් තිබෙන කෙනෙකුට මූල්‍ය පහසුකමක් සපයා ගන්න හරිම පහසුයි. ඒ පහසුකම් සැපයීමට ඕනෑ තරම් ආයතන තිබෙනවා. හැබැයි, අපට එදිනෙදා ඇති වන මූල්‍ය අවශ්‍යතා -කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙන්න පුළුවන්, ප්‍රාග්ධන අවශ්‍යතා වෙන්න පුළුවන්- සපුරා ගන්න තමන් සතුව තිබෙන වෙනත් චංචල දේපළ ඇපයට තැබීම සඳහා පැහැදිලි ක්‍රමයක් නැහැ. අපි හිතමු, ආයතනයේ තිබෙන විශේෂ වූ යන්ත්‍රයක්, වෙනත් උපකරණයක් වැනි දෙයක් කියලා. එවැන්නක් ඇපයට තැබීමේදී අර වාගේ පැහැදිලි ලියා පදිංචියක් මූල්‍ය පහසුකම් බලාපොරොත්තු වන පුද්ගලයා සතුව නැහැ. ඒ වාගේම බැංකුවට හෝ වෙනත් මූල්‍ය ආයතනයකට ඒ දේපළ අයිතිය පිළිබඳ විශ්වාසයක් ඇති කර ගන්නත් බැහැ. මෙන්න මේ අපහසුතාව මඟ හැරවීමට තමයි අද අපි මේ නීතිය හඳුන්වා දෙන්නේ. ඒ වත්කම කොටස් දෙකකට බෙදෙනවා. ඒවා තමයි, ස්පර්ශ කළ හැකි වත්කම් සහ ස්පර්ශ කළ නොහැකි වත්කම්. ස්පර්ශ කළ හැකි වත්කමක් කියලා බොහෝ විට සලකන්නේ යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ වාගේ දේවල්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්පර්ශ කළ නොහැකි වත්කම්වලට ගැනෙනවා, විශේෂයෙන් කොටස් අයිතිය, ණය සහතික ආදිය. අපි ගොඩනැගිල්ලක් බදු අරගෙන තිබෙනවා නම්, ඉදිරි වර්ෂය සඳහා අපි බදු ගෙවා තිබෙනවා නම්, ඒ කාල සීමාවත් ඇපයට තැබිය හැකි වටිනාකමක් හැටියට මේ පනත් කෙටුම්පත් තුළින් අපි හඳුන්වා දෙනවා.

ඉතින් මෙන්න මේ ක්‍රමය යටතේ මෙවැනි චංචල දේ ලියාපදිංචි කිරීම තුළින් වඩාත් පහසුවෙන් ඒවා ඇපයට තියලා ණයක් ලබා ගන්න මූල්‍ය අවශ්‍යතාව තිබෙන කෙනාට පුළුවන් වෙනවා. ඒ වාගේම, ඒවා ඇපයට තබාගෙන ණය සුරක්ෂිතභාවය ඇතිව මූල්‍ය පහසුකම් සපයන්න මුදල් සපයන්නාටත් පුළුවන් වෙනවා. මීට අදාළව 2009 අංක 49 දරන පනත තිබුණත් එහි අඩු පාඩු රාශියක් තිබුණු නිසා එහෙම පනතක් තිබුණා ද, එය ක්‍රියාත්මක වුණා ද කියන එක ගැනවත් සමාජය දැනුවත් වෙලා ක්‍රියාත්මක වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඊට පසුව 2019දී ඒ අඩු පාඩු සකස් කරලා ගැසට් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

නමුත් ඒ වෙලාවේ ඇති වුණු විවිධාකාර වූ දේශපාලන ප්‍රශ්න නිසා ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න බැරි වුණා. අපි දැන් නැවත වතාවක් ඒ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙනවා. මේ කාල සීමාව තුළ ඇති වුණු යම් යම් වෙනස්කම්වලටත් ගැළපෙන පරිදි මේ පනත් කෙටුම්පත යාවත්කාලීන කරලා තිබෙනවා. සුරක්ෂිතලත් අධිකාරියක් පිහිටුවන්න නියමිතයි මේ කටයුතු නියාමනය කරන්න. ඒ භාණ්ඩවල ලියාපදිංචිය සිදු වන්නේ ණය තොරතුරු කාර්යාංශයේ. ඉතා පැහැදිලි, නිරවුල් ක්‍රමයක් තුළ මෙවැනි චංචල දේපළ ලියා පදිංචි කරන්නේ මූල්‍ය පහසුකම් සපයන්නාට ඒ කටයුත්ත -ණය සැපයීම- වඩාත් පහසු කරන්නයි. ඒ වාගේම ණය ලබා ගැනීම පහසු කරන්නයි. එනම්, චංචල දේපළ

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

-වාහන සහ ස්ථිර නොවන දේපළ- ඇපයට තබා ණය ලබා ගැනීම පහසු කරන්නයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තුළින් අපි බලාපොරොත්තු වන්නේ, රටේ ආයතනවල ද්‍රවශීලතාව පහසු කිරීම මඟින් රටේ මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීමට අවස්ථාව සැලසීමයි. විශේෂයෙන් අපි නිතර කථා කරන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයාගේ මූල්‍ය අවශ්‍යතාවලට තවත් නීත්‍යනුකූල තල්ලුවක්, හැකියාවක්, ශක්තියක් ලබා දීමයි.

ඒකත් එක්කම බැඳුණු පනත් කෙටුම්පත් කිහිපයක් ගැනයි අපි අද අනෙකුත් කාරණා හැටියට කථා කරන්නේ. විශේෂයෙන් සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතට සාපේක්ෂව භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පතේ වගන්තිවල ද යම් යම් වෙනස්කම් සිදු වෙනවා. ඒ වාගේම, උකස් (සංශෝධන), කල්බදු මූල්‍යකරණ (සංශෝධන), දේශීය භාර ලදුපත් (සංශෝධන), සමාගම් (සංශෝධන), ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) යන පනත් කෙටුම්පත් සියල්ල ද සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතට මූලිකත්වය දෙමින් වෙනස් කිරීමක් වෙනවා. අනෙකුත් පනත් කෙටුම්පත්වලට වඩා ප්‍රමුඛව සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතින් ආවරණය වන පරිදි අදාළ වෙනස් කිරීම් සිදු වෙනවා. අපි සූදානම්, මේ පනත් කෙටුම්පත් පිළිබඳව අද විවාද කරලා ඉන් පසුව කාරක සභා අවස්ථාවේ විය යුතු සංශෝධන අපේ පාර්ලිමේන්තු ක්‍රමය අනුව යමින් අනුමත කරගන්න.

සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත වර්තමාන ආර්ථිකමය කරුණුවලදී ඉතා වැදගත් වන පනත් කෙටුම්පතක් හැටියට පෙන්වා දුන්නා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා වන අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා. ඒ පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ විධියට නිවැරැදි දේ ඇගයීමකට ලක් කරලා, දෙපාර්ශ්වයම කථා කරලා මේ කටයුතු කරන්න අපට පුළුවන් නම් එය මෙවැනි කාලයක මේ රටට, මේ සමාජයට ඉතා වැදගත් පණිවුඩයක් ගෙන යෑමක් හැටියට මම දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ රෙගුලාසි ද අනුමැතිය සඳහා අද ඉදිරිපත් කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, අපේ රට විශාල මූල්‍ය අර්බුදයකට මුහුණ දුන් රටක් බව. එය විසඳා ගැනීම සඳහා අපට සරලම, ඉතා පහසුම, ඉතා පහසුවෙන් ඉටු කළ හැකි ක්‍රියාවක් වුණා, අපේ අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම හෝ නැවැත්වීම. රේගු සංකේතාංක 2,000කට ආසන්න ප්‍රමාණයක් නවත්වලා තමයි අපි අපේ රුපියලේ අගය වැඩි කර ගත්තේ. එවැනි උපක්‍රමයක් පාවිච්චි කරලායි, අපේ සෘණ වෙච්ච සංචිත ප්‍රමාණය ධන කර ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආනයන වෙළෙඳ පොළ නැවත විවෘත කර තිබෙනවා. ආනයනය නවත්වා තිබුණු භාණ්ඩ සියල්ල නැවත ක්‍රමක්‍රමයෙන් ආනයනය කරමින් තිබෙනවා. නමුත් දැනටත් වාහන පමණක් ගෙන්වන්න දෙන්නේ නැහැ. වාහන ගෙන්වන එක දැනටත් නවත්වා තිබෙනවා. ඒ පිළිබඳව විශේෂ කමිටුවකින් සොයා බැලීමක් කරගෙන යනවා. ඉදිරියේදී වාහනවල අවශ්‍යතාව, ඒ සඳහා යන ඉන්ධන වියදම, ඒ වාගේම අපේ තිබෙන ඩොලර් සංචිතය යනාදි කරුණු ඔක්කෝම සලකා බලමින් තිබෙනවා. අනාගතයේදී අපි වාහන ආනයනය කරන්නේ කොහොමද, රටට අවශ්‍ය වාහන මොනවාද යනාදිය පිළිබඳව ද සලකා බලමින් තිබෙනවා. ඒක වෙනම පැත්තක්. නිතර අහන ප්‍රශ්නයක් නිසායි මම ඒ ගැන කිව්වේ. නමුත් අපට දැනට ඒ පිළිබඳ අදහසක් නැහැ. නමුත් අපි පසු ගිය දා අත්‍යවශ්‍ය වාහන කිහිපයක් ගෙන්වන්න අවසර දුන්නා. 'වාහන කිහිපයක්' කියන වචනය එයට පාවිච්චි කරන්න පුළුවන්. මොකද, වාහන 29යි ගෙනැල්ලා තිබෙන්නේ. ඒ, රාජ්‍ය ආයතනවල අත්‍යවශ්‍ය කටයුතු සඳහා. උදාහරණයක් හැටියට, ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට අවශ්‍ය වුණා, රැම්ප් රථ -ගුවන් යානයෙන් බහින්න පාවිච්චි කරන රථ- තුනක් ගෙන්වන්න. ඒකටත් පිරිමැසුම් පන්තියේ රැම්ප් රථ තුනක් ගෙන්වන්න තමයි අපි අවසරය දුන්නේ. අධ්‍යාපන අමාත්‍යාංශයට බස් රථ දෙකක්, සෞඛ්‍ය අමාත්‍යාංශයට ජංගම මාතෘ ඒකක තුනක්, සෞඛ්‍ය අමාත්‍යාංශයට ඩබල් කැබ් රථ 21ක්, කම්කරු අමාත්‍යාංශයට වාහනයක් ගෙන්වන්න ඉඩ දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ රැම්ප් රථ තුන ඇරෙන්න අනෙක් වාහන 26ම විදේශ ආධාර ලබන ව්‍යාපෘති හරහා විදේශවලින් ලැබෙන මුදල්වලින් ගෙන එන්නයි අපි ඉඩ දුන්නේ.

අපි ඒ වාගේ සුවිශේෂ පාලනයක් කරගෙන තමයි අපේ සංචිතය, අපේ රුපියල, අපේ රටට අත්‍යවශ්‍ය දේවල් ගෙන ඒමේ හැකියාව ආරක්ෂා කර තිබෙන්නේ. ආණ්ඩුවට වාහන ගෙනෙනවා කියලා මේ ගැන වෙනත් චිත්‍රයක් මවන්න ඉඩ තිබෙන නිසායි මම මේ ගැන සවිස්තරව පාර්ලිමේන්තුවට කියන්න හිතුවේ. ගෙන්වා තිබෙන මේ වාහන 29න් වාහන 26ක් විදේශ ආධාරවලින් ලද මුදල්වලින් ගෙන්වූයේ. අනෙක් වාහන තුන අත්‍යවශ්‍ය වාහන. රැම්ප් රථ වෙනුවට වෙන මොකුත් පාවිච්චි කරන්න බැහැ. ඒ වාගේම ජාත්‍යන්තර ගුවන් සමාගම්වලට අදාළ යම් ප්‍රමිතියක් තිබෙනවා, යම් කිසි අවුරුදු ගණනකට වඩා පරණ රැම්ප් රථ පාවිච්චි කරන්න එපා කියලා. එය ජාත්‍යන්තරමය වශයෙන් ගුවන් මගීන්ගේ ආරක්ෂාවත් එක්ක බැඳුණු කාරණාවක්. මෙන්න මේ වාගේ අත්‍යවශ්‍ය කාරණා සම්බන්ධයෙන් පමණයි රජයට වුණත් එම වාහන 29 ගෙනෙන්න අපි ඉඩ දුන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ කාරණා ඉදිරිපත් කළේ, විශේෂයෙන්ම අද මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ පනත් කෙටුම්පත් කිහිපයක් දෙවැනි වර කියවීමට ඉදිරිපත් කළ නිසායි.

මට තව කොච්චර වෙලාව තිබෙනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමාට තව මිනිත්තු 30ක කාලයක් ඉතුරු වෙලා තිබෙනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම මීට අමතරව විශේෂයෙන්ම කථා කරන්න බලාපොරොත්තු වෙනවා, පසුගිය දා මහ බැංකුව විසින් පෙබරවාරි මාසය වෙනුවෙන් ඉදිරිපත් කළ මුදල් ප්‍රතිපත්ති වාර්තාව ගැන. මම හිතන විධියට අපි සියලුදෙනාම මේ පිළිබඳව කථා බහ කරන එක ඉතාම වැදගත්. මොකද, මම දැක්කා පසුගිය දා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රසිද්ධ සභාවක කථාවක් පවත්වා තිබුණා. එතුමා ඒ වෙලාවේ විශේෂ කාරණාවක් කියා තිබුණා. එය අප කාටත් වැදගත්. එතුමා ඒ කථාව පවත්වා තිබුණේ පෙබරවාරි 17වැනි දා පැවැති ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා ශාඛාව - ICC Sri Lanka - සංවිධානය කළ වැඩ මුළුවේදී. එහිදී එතුමා අපට ගත යුතු වැදගත්ම කථාවක් කියා තිබුණා. ගොඩක් අයට අවුරුදු දෙකකට පෙර මේ රටේ තිබුණු ආර්ථික තත්ත්වය මතක නැහැ. එක්කෝ,

එය අමතක කරන්න උත්සාහ කරනවා, නැත්නම් අනෙක් අයට එය අමතක කරන්න පොලඹවනවා. අන්න ඒ අවස්ථාවේදී මේ ආර්ථිකය ගොඩගන්න සැබෑවට වෙහෙසුණු මිනිස්සුන්ට කනගාටුවක් ඇති වෙනවා කියලා එතුමා කියා තිබුණා. අපි දකිනවා, දැන් එහෙම තත්ත්වයක් තිබෙන බව ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එක්කෝ සමහර අයට එදා පැවැති තත්ත්වය මතක නැහැ, තමන්ගේ ආත්මාර්ථය නිසා. සමහරු ඒ අතීතය අමතක වුණා වාගේ හැසිරෙනවා. එහෙම නැත්නම් මුළු සමාජයටම ඒ තත්ත්වය අමතක කරවන්න උත්සාහ කරනවා, තමන්ගේ අරමුණු කරා ළඟාවීමට පසුබිමක් හදා ගැනීම සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට තිබුණේ කිසිදු කෙනෙක් භාර නොගන්නා වූ දැවැන්ත ආර්ථික අර්බුදයක් සහිත තත්ත්වයක්. අද අපි ඒ තුළ ඉඳිමින් තමයි එක එක කෙළවරවල්වලින් අල්ලා ගෙන ප්‍රශ්න කරන්නේ, අර කණ්ඩායමට කොහොමද, මේ කණ්ඩායමට කොහොමද, මේ පළාතට කොහොමද,මේ දිස්ත්‍රික්කයට මොකද වෙලා තිබෙන්නේ කියලා. ඔව්, ප්‍රශ්නයක් තිබෙනවා. ප්‍රශ්නයක් නැත්තේ නැහැ. හැබැයි, ඒ අවස්ථාවේ යම් කෙනෙක් යම් කිසි වැඩ පිළිවෙළක් ඉදිරිපත් නොකළා නම්, මේ රට භාර නොගත්තා නම් අද වනවිට පළාතක් ගැන කථා කරන්නත් බැහැ, කණ්ඩායමක් ගැන කථා කරන්නත් බැහැ. එහෙම කථා කරන්න දෙයක් ඉතුරු වෙන්නේත් නැහැ. මුළු -සමස්ත- සමාජයම විනාශ වෙන්නයි ගියේ. මෙන්න මේ කාරණය අමතක කරපු එක ගැන, එම සිදුවීම් අමතක කරලා අපි හැසිරෙන එක ගැන කනගාටුයි කියන එක තමයි මම දකින විධියට මේ ගමනට දැවැන්ත කැප කිරීමක් කළ ඒ ලේකම්වරයා සඳහන් කළේ. ඒ නිසා තමයි මම හිතුවේ මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ තිබෙන කරුණු ටිකක් අපි කථා කළොත් හොඳයි කියලා.

මහ බැංකුව මේ ගැන පෙන්වා දෙනවා, 2024 පෙබරවාරි වාර්තාව තුළින්. මෙය ආසන්නතම වාර්තාව. කෙටි කාලයකට ඉස්සෙල්ලා අපේ රටේ පැවැති ණය පොලිය ගෙන බලමු. අද අපි බැංකු ගැන පුන පුනා කථා කරනවා. ණය පොලිය සියයට 16ක් බවට පත් කළා. ඇයි, අපි ණය පොලිය සියයට 16ක් බවට පත් කළේ? මේවාට මහ පෙන්වන්නා තමයි මහ බැංකුව. ඇයි, මහ බැංකුවට ණය සඳහා වන පොලිය සියයට 16ක් බවට පත් කරන්න සිද්ධ වුණේ? ඒ අපි මවා ගත් ණය පොලියක් මත ඉඳිමින් වියදම් කරන්න ගිහිල්ලා රට හිර වුණු නිසායි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි සියයට හයේ, හතේ පොලියට ණය දුන්නා. සියයට හයේ, හතේ පොලියට ණය අරගෙන මිනිස්සු ඒ මුදල් වියදම් කළා. හැබැයි, ඊට ගැළපෙන ආර්ථිකයක් රටේ තිබුණේ නැහැ. දැවැන්ත ඉල්ලුමක් සහ ඒ සමඟ දැවැන්ත උද්ධමනයක් ඇති වුණා. අපි දැක්කා, සියයට 70ට රටේ උද්ධමනය ඉහළ ගිය බව. ඒ දවස්වල පෙර දින රාත්‍රියේ භාණ්ඩවල තිබුණු මිල නොවෙයි, ඊළඟ දවසේ උදේ වෙනකොට තිබුණේ. ඒ වාගේ දෙගුණයක් වෙලා තිබුණා. ලෝකයේ ආහාර උද්ධමනය වැඩිම රටවල් අතරින් අපේ රට පස්වන තැනට ආවා. මේ තත්ත්වය පාලනය කරන්න තිබුණු එකම හා පහසුම මූල්‍ය උපකරණය තමයි ණය සඳහා වූ පොලිය වැඩි කරන එක. දැන් පුන පුනා ඒ ගැන කියනවා. ණය පොලිය සියයට 16ට වැඩි කරලා තමයි අපි ලෝකයේ වේගයෙන්ම උද්ධමනය පාලනය කර ගත් රට බවට පත් වුණේ. මොකක්ද ඒකෙන් වුණේ? මිනිස්සු ණය ගන්න තිබුණු කැමැත්ත අඩු වුණා. මිනිස්සු ඉතුරු කරන්න තිබෙන කැමැත්ත වැඩි වුණා. මේක ඉතා සරල ආර්ථික උපකරණයක්. ඒ අනුව තමයි අපි උද්ධමනය පාලනය කළේ. අපි පසුගිය කාලයේ ණය සඳහා වන පොලිය සියයට 16ක් කළා.

නමුත් අවුරුදු එකහමාරක කාලය තුළ අපි ණය පොලිය සියයට 10කට ගෙනැල්ලා තිබෙනවා. එය, මහ බැංකු වාර්තා අනුව පෙන්වා දෙනවා. ඒක තමයි අපි අමතක කරන්න හදන සත්‍යය. අපි අමතක කරන්න උත්සාහ ගන්නවා, එහෙම දෙයක් වුණේ නැහැ, අපි මේ ඉන්නේ සාමාන්‍ය රටක කියලා. අපි කථා කරන්නේ එහෙමයි, අපි ප්‍රශ්න කරන්නේ එහෙමයි, අපි උද්ඝෝෂණය කරන්නේ එහෙමයි. ඒ නිසා තමයි රාජ්‍ය නිලධාරියෙක් කියලා තිබුණේ, මේ අය හිටියේ මේ රටේ නොවෙයිද කියලා කනගාටු හිතෙනවා කියලා.

ඊළඟට අපේ රටේ උද්ධමනය සියයට 70ක් දක්වා ඉහළ ගියා. ආහාර උද්ධමනය සියයට 95යි. උද්ධමනය සියයට 95යි කියන්නේ, ඊට සමකාලීන කාලයට සාපේක්ෂව ආහාර උද්ධමනය දෙගුණයකින් වැඩිවෙලා තිබෙනවා. ආදායම එහෙම ම තිබියදී, ආදායම අඩුවෙද්දී එයින් ඇති වුණු සමාජ අර්බුදය ගැන අමුතුවෙන් අපට කියන්න අවශ්‍ය නැහැ. මේ කියන්නේ, නිශ්චිත වැටුපක් ගන්නා පුද්ගලයා ගැන නොවෙයි. කිසිදු ආදායමක් නැති පුද්ගලයෙක් එවැනි අර්බුදයකට මුහුණ දෙන්නේ කොහොමද? තවදුරටත් ඒ උද්ධමනය ඉහළ ගියා නම් ලෝකයේ අනෙක් රටවල වාගේ මේ රටේ මිනිස්සුත් කඩවල් කඩාගෙන ඇතුළට යයි. ඊට පස්සේ මේ රටේ නීතිය රැකෙන්නේ නැහැ. දරුවාගේ බඩගින්නත් එක්ක පියාට මවට නීතිය අනුව හැසිරෙන්න බැහැ. තවදුරටත් උද්ධමනය ඉහළ ගියා නම්, අද අපි මේ කථා කරන සමාජ ආරක්ෂාව මේ රටේ ඉතුරු වෙන්නේ නැහැ. සියයට 70ක් දක්වා, සියයට 95ක් දක්වා ආහාර උද්ධමනය ඉහළ ගිය රටක සියලු දේ විනාශ වෙනවා.

මහ බැංකු වාර්තා පෙන්වා දී තිබෙනවා, සියයට 70ක තිබුණු උද්ධමනය අද සියයට 6යි කියලා. විශාල විරෝධතා මධ්‍යයේ රාජ්‍ය ආදායම හොයා ගන්න VAT සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීමත්, ඉතා සුළු භාණ්ඩ ප්‍රමාණයකට සියයට 0 සිට සියයට 18ක් දක්වා VAT අය කිරීමත් යන සියල්ලම ක්‍රියාත්මක වෙද්දී සියයට 70කට තිබුණු උද්ධමනය සියයට 6 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒකත් වැඩියි. මහ බැංකුව කියලා තිබෙනවා, උද්ධමනය සියයට 5ක මට්ටමක තබා ගන්න ඕනෑ කියලා. අපි ඒකට උත්සාහ ගන්නවා. සියයට 70ක තිබුණු බඩු මිල අද සියයට 6ක් දක්වා අඩුවීම තුළින් අපි ජයග්‍රහණයක් ලබාගෙන නැද්ද? අපි කියලා තිබෙනවා, ඒ ප්‍රමාණයත් වැඩියි කියලා. අපි එය මේ වර්ෂය මැද වෙද්දී සියයට 5න් පහළට ගෙනෙන්න සූදානම්. මේ ජයග්‍රහණය කාගේද? එය සමස්ත රටේම ජයග්‍රහණයක්. ඒක තමයි අපි අමතක කරන්න, අමතක කරවන්න උත්සාහ ගන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සියයට 95ට තිබුණු ආහාර උද්ධමනය පෙබරවාරි මාසය වෙනකොට සියයට 3.3යි. එහෙම වුණේ කොහොමද? බදු වාගේ දේවලින් රාජ්‍ය ආදායම එකතු කර ගැනීමේදී අපි අත්‍යවශ්‍ය දෙයට බදු ගහලා නැහැ. ඒක තමයි කැපී පෙනෙන ලක්ෂණය. සාමාන්‍ය උද්ධමනය සියයට 6 දක්වා අඩු වෙද්දී ආහාර උද්ධමනය සියයට 3.3ක පවත්වා ගන්න පුළුවන් වෙලා තිබෙන්නේ සාමාන්‍ය ජනතාව ගැන හිතපු නිසායි. අපි අත්‍යවශ්‍ය දේට බදු ගහලා රාජ්‍ය ආදායම එකතු කර ගන්න කටයුතු කරලා නැහැ. සියයට 95ක් තිබුණු ආහාර උද්ධමනය සියයට 3.3ක් දක්වා පහළට ගෙනාවා කියන එක, අමතක කළ හැකි කාරණාවක්ද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

අපි රාජ්‍ය ණය ප්‍රමාණය ගණනය කරන්නේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂවයි. අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා අපේ රටේ රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 128ක්. අවුරුද්දක් තුළ අපේ රටේ මුළු නිෂ්පාදනය 100 නම්, අපි 128ක් ණයයි, අපි ආර්ථිකමය වශයෙන් හිරවුණු වෙලාව බලනකොට. අද මේ රට එතැනට ඇවිල්ලා නැහැ. දැන් අපට එය සියයට 107 දක්වා ටික ටික පහළට ගෙනෙන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඉතින්, ඒවා ජයග්‍රහණ නොවෙයිද ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

ඊළඟට අපි ආර්ථික වර්ධනය ගැන බලමු. 2022 වර්ෂයේ කෘෂි කර්මාන්තයේ ආර්ථික වර්ධනය ගත්තොත්, පළමුවැනි කාර්තුවේ සෘණ 4.4යි. එය තිබුණු ගණනට වඩා 4.4කින් අඩුවෙලා තිබෙනවා. දෙවැනි කාර්තුවේ දී සෘණ 7.9යි. තෙවන කාර්තුවේ දී සෘණ 6.7යි. ඒ කාබනික පොහොර ව්‍යාපෘති සහ වෙනත් ආර්ථික ප්‍රශ්න නිසායි. 2022 සිව්වැනි කාර්තුවේ දී ධන 0.7යි. 2022දී කර්මාන්ත දෙස බැලුවොත්, පළමුවැනි කාර්තුවේ දී සෘණ 3.7යි. දෙවැනි කාර්තුවේ දී සෘණ 10.1යි. තුන්වැනි කාර්තුවේ දී සෘණ 21.3යි. සිව්වැනි කාර්තුවේ දී සෘණ 30.1යි. ඒ අපේ රට වැටුණු තැන. 2022දී සේවා ගත්තොත්, පළමුවැනි කාර්තුවේ දී ධන 1.8යි. දෙවැනි කාර්තුවේ දී සෘණ 1.8යි. තුන්වැනි කාර්තුවේ දී සෘණ 4.2යි. සිව්වැනි කාර්තුවේ දී සෘණ 3.9යි. පොදුවේ දළ දේශීය නිෂ්පාදිතයට අනුව 2022 පළමුවැනි කාර්තුවේ සෘණ 0.5යි. දෙවැනි කාර්තුවේ සෘණ 7.4යි. තුන්වැනි කාර්තුවේ සෘණ 11.5යි. සිව්වැනි කාර්තුවේ සෘණ 12.4යි.

අපි බැලුවොත්, 2022 පළමුවැනි මාස නවයේදී කෘෂි කර්මාන්තය සියයට 6.4කින්, කර්මාන්ත සියයට 11.6කින්, සේවා අංශය සියයට 1.3කින් සෘණ වෙලා තිබෙනවා. 2022 වර්ෂයේ සමස්ත ආර්ථිකය සෘණ සියයට 6.3කින් පහළට ගිහිල්ලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2023 වර්ෂය ගත්තොත්, පළමුවැනි කාර්තුවේ කෘෂි කර්මාන්තය යාන්තම් නැඟිටින්න පටන් අරගෙන තිබෙනවා. එය සියයට 0.8යි. දෙවැනි කාර්තුව වෙනකොට ඒක සියයට 3.6යි. තුන්වැනි කාර්තුව වෙනකොට සියයට 3යි. පළමුවැනි මාස නවයේදී කෘෂි කර්මාන්තය සියයට 2.5 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කාර්මික ප්‍රදේශයක සිටින කෙනෙකු විධියට ඔබතුමා දන්නවා ඇති, කෘෂි කර්මාන්තයේ පොඩි නැඟිටීමක් තිබෙන බව. අරක නැහැ, මේක නැහැ කියලා ප්‍රශ්න තිබෙනවා තමයි. නමුත් නැඟිටීමක් තමයි පෙනෙන්නේ. නැඟිටිනවා කියලා එක් වරම ප්‍රාතිහාර්යයක් පාන්න බැහැ. හැබැයි, සෘණ සියයට 6.4ක තිබුණු කෘෂි කර්මාන්තය වර්තමාන තත්ත්වයට පැමිණීම ඉතා හොඳ නැඟිටීමක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කර්මාන්ත අංශය බැලුවොත්, 2023 පළමුවැනි කාර්තුවේදී සෘණ සියයට 23.4 දක්වා වැටුණා. දෙවැනි කාර්තුව වන විට සියයට සෘණ 11.5ක් වුණා. තෙවන කාර්තුව වන විට කර්මාන්ත ක්ෂේත්‍රය සියයට 0.3කින් ධනවෙලා තිබෙනවා. ඒ වාගේම සේවා ක්ෂේත්‍රය ගත්තාම, 2023 පළමුවැනි කාර්තුවේ දී සෘණ සියයට 5යි, දෙවැනි කාර්තුවේ දී සෘණ සියයට 0.8යි. නමුත් තුන්වැනි කාර්තුවේ දී ඒක සියයට 1.3ක් වෙලා තිබෙනවා. පොදුවේ අපේ රටේ ආර්ථිකය 2023 පළමුවැනි කාර්තුවේ දී සෘණ සියයට 11.5යි, දෙවැනි කාර්තුවේ දී සෘණ සියයට 3.1යි, තුන්වැනි කාර්තුවේ දී සියයට 1.6යි. 2022 සිව්වැනි කාර්තුවේ දී සෘණ සියයට 12.4ක් වූ රට, ඊට වර්ෂයකට අඩු කාලයකදී සියයට 1.6 දක්වා පරිවර්තනය වුණා කියන්නේ ජයග්‍රහණයක් නොවෙයිද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේක අමතක කරන්න පුළුවන්ද? ඒක අමතක කරන්න පොළඹවන එක සාධාරණද? මෙන්න මේ නිසා තමයි අර රාජ්‍ය නිලධාරියා ඔහුගේ දේශනාවේදී කියලා තිබුණේ, සමහර අයගේ හැසිරීම කෙරෙහි අපට කනගාටු හිතෙනවා කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම 2022දී අපේ රටේ ජංගම ගිණුම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5ක්, සෘණ. 2023 වර්ෂයේ තත්ත්වය තවම ගණනය කරලා නැහැ. අපි බලාපොරොත්තු වෙනවා, ඒක ධන තත්ත්වයකට එයි කියලා. නමුත් තවම ඒක සම්පූර්ණයෙන් ගණනය කරලා නැහැ. 2022 වර්ෂයේ දී වෙළෙඳ හිඟය ඩොලර් බිලියන 5.2යි. 2023 වසර වන විට අපට ඒක සියයට 4.9කට අඩු කර ගන්න පුළුවන් වුණා. 2022 වසරේ සංචාරක ඉපැයීම ඩොලර් බිලියන 1.1යි. 2023දී ඒක ඩොලර් බිලියන 2.1ක් හැටියට සම්පූර්ණයෙන්ම දෙගුණ වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කියන්නේ, සියයට 100කින්ම වර්ධනය වෙලා තිබෙනවා. මේවා ජයග්‍රහණ නොවෙයිද ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඔබතුමා දන්නවා, මේ වන විට දකුණු පළාතේ හෝටල් කාමරයක් වෙන් කර ගන්න ඉඩ නැහැ කියලා. නුවර පළාතේත් ඒ විධියේම වර්ධනයක් තිබෙනවා. මේ රට ගැන, රටේ තිබෙන සාමකාමීත්වය පිළිබඳව ලෝක වාසීන්ට යම් කිසි විශ්වාසයක් ඇති වීම නිසා නොවෙයිද මෙහෙම වුණේ? දින ගණනාවක් කොළඹ තිබුණු මහා අවිධිමත් ක්‍රමය, රාජ්‍ය ආයතනවල අවිධිමත් පාලනය, රාජ්‍ය ආයතන තුළට අවිධිමත් කඩා වැදීම වාගේ දේවල් වෙනස් කිරීම නිසා නොවෙයිද ලෝක ප්‍රජාව තමන්ගේ සංචාරක ගමනාන්තය හැටියට ශ්‍රී ලංකාව තෝරා ගැනීමට කැමති වුණේ? එහෙම නැතුව අපි ඒකට බල කරලාද? අපි ඔවුන්ට ගෙවීමක් කරලා ගෙන්වාගෙනද? ආර්ථිකමය වශයෙන් ජයග්‍රහණයක් ලබාගෙන තිබෙනවා කියන්නේ මේක නේද? ඉතින්, මේක අමතක කරන්නයි දැන් උත්සාහ කරන්නේ. ඒ වාගේම මේක අමතක කරවන්නයි දැන් උත්සාහ කරන්නේ. ඒක තමයි අර රාජ්‍ය නිලධාරියා ඒ සභාවේදී කරපු කථාවේ හරය වුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රුපියලේ අවප්‍රමාණය ගත්තොත්, අපේ රටේ මුදල ඩොලරයට සාපේක්ෂව 2022දී සියයට 44.8කින් අවප්‍රමාණ වෙලා තිබෙනවා. 2023 වන විට ඒක අධිප්‍රමාණ වෙලා තිබෙනවා. ඒ කියන්නේ අපි සියයට 12.1කින් ධන පැත්තට ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව අපේ රුපියල ශක්තිමත් වෙලා තිබෙනවා. මේවා නේද අපි අද කථා නොකරන මාතෘකා බවට පත්වෙලා, එකින් එක කෙළවරවල් අල්ලාගෙන, අර කෙළවරයි මේ කෙළවරයි ගැන කථා කරන්නේ? ඔව්, මම කියන්නේ ප්‍රශ්න නැත්තේ නැහැ. අමාරුයි. සමස්ත ප්‍රජාවටම අමාරු නැහැ කියලා කාටවත් කියන්න බැහැ. මේ රටේ ඇති වුණු ආර්ථික අර්බුදයත් එක්ක හැම කෙනෙකුම තමන් බුක්ති වින්ද භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ අයිතිය නැතිවෙලා තිබෙනවා. ඔවුන්ගේ ආදායම අඩුවෙලා තිබෙනවා. ඔවුන්ගේ ව්‍යාපාර එදාට වැඩිය අභියෝගවලට ලක්වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි රට ක්‍රම ක්‍රමයෙන් ඉස්සරහට අරගෙන යන්න අපට සිද්ධවෙලා තිබෙනවා. ඒ සඳහා කිසිම කෙනෙකුට ප්‍රාතිහාර්ය කරන්න බැහැ. ඔය කියන සරල ක්‍රමය තුළ මේ ආර්ථිකය සතියෙන් ගොඩ ගන්න ඔය කිසිම කෙනෙකුට බැහැ.

මම ඕනෑම තැනකදී ඒ ගැන අභියෝග කරනවා. කාට හරි එහෙම ක්‍රමයක් තිබෙනවා නම්, කරුණාකරලා පෙන්වා දෙන්න. මොකක්ද ඒ ක්‍රමය? මේ ආපු ක්‍රමයට වඩා වෙනස් ක්‍රමය මොකක්ද?

දැන් පරාටේ බලතල ගැන පුන පුනා කථා කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම කියන්නේ නැහැ, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයාට අමාරු නැහැ කියලා. ඔහුට අමාරුයි. රටක භාණ්ඩ ඉල්ලුම අඩු වෙලා, දින ගණන් රට වැහිලා, මිනිස්සු අතේ සල්ලි නැති වුණාම, වැඩිම පහර වදින්නේ සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයාට. හැබැයි, පරාටේ බලතල පාවිච්චි කරන්න පුළුවන්කම තිබෙන්නේ කුමන ණය සීමාවෙන් ඉහළටද? රුපියල් ලක්ෂ 50කට වැඩිය ණය ගත්ත කෙනෙකු සම්බන්ධයෙන් තමයි, පරාටේ බලතල පාවිච්චි කරලා බැංකුවකට කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්නේ. අපේ රටේ මනුස්සයෙක් රුපියල් ලක්ෂ 50ක ණයක් ගන්නවා වුණත්, ඒ මනුස්සයාට අමාරු නැහැ කියලා මම කියන්නේ නැහැ. හැබැයි, අපි කියන්නේ සාපේක්ෂව. ලක්ෂ 50කට වැඩිය ණය ගත්ත කණ්ඩායම අපි ආරක්ෂා කළ යුතුයි. හැබැයි, අපට සිද්ධ වෙලා

තිබෙනවා, පවුල් විසිලක්ෂයකට දෙන්න ගිය අස්වැසුම ප්‍රතිලාභය, ලක්ෂ විසිහතර දක්වා වර්ධනය කරන්න. ඒ මිනිස්සුන්ට ජීවත් වෙන්න ම බැහැ. එදා වේල කන්න නැති මිනිස්සු ප්‍රමාණයක් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ තත්ත්වයත් එක්ක තමයි අපට මේ ප්‍රශ්නවලට උත්තර සොයන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි, අපි සමස්තයක් වශයෙන් පරාටේ බලතල ක්‍රියාත්මක කිරීම නවත්වා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියයට 13ක් වෙච්ච බැංකුවල අය නොවන ණය ප්‍රමාණය තවදුරටත් වර්ධනය වීමේ ප්‍රතිඵලය ඔබතුමා දන්නවා. බැංකුවක් යම් කිසි විධියකින් අක්‍රිය වුණොත්, බැංකුවක් ගැන ස්ථිර විශ්වාසය සමාජයට නැති වුණොත් මොකක්ද වෙන්නේ? එහෙම වුණොත් කඩා වැටෙන්නේ එක පන්තියක් නොවෙයි, සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකය තමයි කඩා වැටෙන්නේ. රජයට මේවාට උත්තර සොයන්න වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි අපි විටින් විට චක්‍රලේඛ නිකුත් කරමින්, වෙනම දෙපාර්තමේන්තුවක් දාලා, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයාත් ආරක්ෂා කරන්න කටයුතු කරන්නේ. හැබැයි, ඒ සියලු දෙපාර්තමේන්තුවලට සමස්තයක් වශයෙන් ඔවුන් හිටපු තත්ත්වයටම එකවරම ආරක්ෂාව ගෙනෙන්න ක්‍රමයක් නැහැ. ඒ නිසා තමයි රජය පුළුවන් විධියට ඒ කටයුතු කරන්නේ.

දැන් ගරු අධ්‍යාපන ඇමතිතුමා කිව්වා, ණය නොගෙවීම නිසා ප්‍රශ්නයක් ඇති වෙච්ච විශ්වවිද්‍යාල සිසුන් ගැන. ඔවුන්ගේ මුදල් අපි ගෙවන්නම් කියලා භාණ්ඩාගාරය භාර ගත්තා. හැබැයි, භාණ්ඩාගාරයට ඊට එහා යන්න පුළුවන්කමක් නැහැ. භාණ්ඩාගාරයත් ඉතාම අසීරු ගමනක යන්නේ. අපට යම් යම් විධියේ ජනප්‍රිය පෙන්වා දීම් කරන්න පුළුවන්. එක කණ්ඩායමක් පැත්තේ හිටගෙන ඒ කණ්ඩායමට අමාරුයි කියනවා. අනෙක් කණ්ඩායම ළඟට ගිහිල්ලා, එතැන හිටගෙන ඒ කණ්ඩායමටත් අමාරුයි කියනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කථා කරන්න අවශ්‍ය වෙන්නේ, මේ රටේ දෙකෝටි විසිලක්ෂයම පැත්තේ හිටගෙන. එහෙම තමයි විපක්ෂයටත් වගකීම තිබෙන්නේ, අපටත් වගකීම තිබෙන්නේ. එතැන ඉඳලා අපි හොඳ අනුපිළිවෙළක් කියන්න ඕනෑ. අපි ඉස්සෙල්ලාම ජීවත් වෙන්න ම බැරි පුද්ගලයා ආරක්ෂා කළ යුතුද? අංක එක විය යුත්තේ ඔහුට අස්වැසුම දෙන එකද?

බැංකු ආරක්ෂා කරනවා කියන්නේ, ඒ බැංකුවල ඉන්න අධ්‍යක්ෂ මණ්ඩල ආරක්ෂා කරනවා කියන එක නොවෙයි, බැංකුවල ඉන්න පන්කෝටි හැත්තෑලක්ෂයක් වෙච්ච ගනුදෙනුකරුවන් ආරක්ෂා කරන එක. ගනුදෙනුකරුවන්ගෙන් සියයට 60ක් විශ්වාසය මත රුපියල් 5,000ට අඩු ඉතුරුම් බැංකුවේ දාලා තිබෙනවා. එතකොට බැංකුවක් කඩා වැටුණොත්, අපි ඉස්සෙල්ලා ආරක්ෂා කළ යුත්තේ, අර පන්කෝටි හැත්තෑලක්ෂයෙන් රුපියල් 5,000 අභිමි වෙන තුන්කෝටි පනස් ලක්ෂයක් වූ ජනතාවද, ඊට එහා කණ්ඩායමද? අන්න ඒ ප්‍රශ්නයට තමයි, රජයක් හැටියට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා ඉස්සර ඉඳන් අපේ සාම්ප්‍රදායික දේශපාලනයේ තිබුණු ජනප්‍රිය සටන් පාඨ තෝරා ගන්නා එක මඳකට කල් තබන්න කියලා තමයි අපේ විපක්ෂයෙනුත් මම ඉල්ලා සිටින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රටේ තිබෙන්නේ ඒ පසුබිම නොවෙයි. මට ඒක තමයි පෙන්වා දෙන්න අවශ්‍ය වුණේ.

අපේ රටේ සංචිත ප්‍රමාණය ගැනත් මේ ලේඛනයේ කියලා තිබෙනවා. අපි සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකකට සීමා වෙච්ච රටක් බවට පත් වුණා. අපේ සංචිත සෘණ වුණා. අපේ තිබුණු සංචිත පාවිච්චි කරලා, බලෙන් රුපියලේ අගය ආරක්ෂා කරන්න අපි උත්සාහ කළා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කවුරු පිළිගත්තත් නැතත් ඒක සිද්ධ වුණා. අපේ තිබුණු සංචිත එළියට දාලා රුපියල ආරක්ෂා කරන්න ගියා. අපි ඒක දිගින් දිගටම කර ගෙන ගියා. ඒකේ අවසාන ප්‍රතිඵලය තමයි, අපි ළඟ සංචිත නැති වුණු එක. ඒ නිසා තමයි, නැව් ඇවිල්ලා අපි මුදල් ගෙවනතුරු මුහුදේ නවත්වා ගෙන සිටියේ. එහෙම නැව් කීයක් ආපහු ගියාද? අන්න එතැන ඉඳන් තමයි, අපි මේ උඩට ඇවිල්ලා තිබෙන්නේ. දැන් අපි ළඟ තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 4.4ක සංචිතයක්. ඒ තමයි අර නැව් ඇවිල්ලා, සල්ලි නැතුව ආපහු ගිය වාතාවරණයේ ඉඳලා අවුරුදු එකහමාරක් යනකොට තත්ත්වය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්න ඒක අපහසුවෙන් වුණත් අමතක කරවීමට තමයි සමහර කණ්ඩායම් ගෙයක් ගෙයක් ගානේ යන්නේ; නගරයක් නගරයක් ගානේ යන්නේ. ඒ වාගේම පත්තර පිටු පුරවන්නේ, පාර්ලිමේන්තුවේ වෙලාවෙන් සියයට 90ක් පාවිච්චි කරන්නේ, අන්න ඒ අපි ආපු ගමන අමතක කරන්නයි.

මෙන්න මේක තමයි අර රාජ්‍ය නිලධාරියා කියලා තිබුණේ. කනගාටු හිතෙනවා, අනෙක් නිලධාරින් හිටියේ මේ රටේ නොවෙයිද කියලා. සමහර විට මම මේ කියන දේ පුන පුනා කීමක් වෙන්නත් පුළුවන්. හැබැයි පුන පුනා කියන්න වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මේ ආපු ගමන යම් තැනකදී නැවතුණොත්, යම් කෙනෙක් අලුත් අත්හදා බැලීමක් කරන්න හැදුවොත්, මේ ධනාත්මක ගමන් මාර්ගය නතර වෙන්නේ කොතැනද කියන එක ගැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේක කවුරුවත් භාර නොගත්ත අභියෝගයක්. ඔය කියන ක්‍රම තිබුණු සියලුදෙනාට ආරාධනා කළා, මේ රට භාර අරගෙන කරගෙන යන්න කියලා. ඒ වෙලාවේ කිසිම කෙනෙක් රට භාර නොගෙන, අද රට යම් තැනකට පත් වුණාම සම්පූර්ණ වෙනස් ක්‍රමයකට, සියල්ල අමතක කරලා කථා කරනවා. මෙන්න මේක තමයි අපි මේ රටට ආදරය කරන ප්‍රජාවට මතක් කරලා දෙන්න අවශ්‍ය. කරුණාකරලා අපි ආපු ගමන, අපි හිටපු තැන, රට භාර ගන්න කෙනෙක් නොහිටපු බව නැවත මතක් කරන්න -ආවර්ජනය කරන්න- අවශ්‍යයි. එතැන ඉඳලා අපි අලුත් දේවල් ගැන කථා කරන්න මාතෘකා සූදානම් කර ගනිමු කියන යෝජනාව තමයි මට කරන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක දේශපාලන යෝජනාවක් නොවෙයි. ඒක රටක් වෙනුවෙන් වූ යෝජනාවක් හැටියට මා ඉදිරිපත් කරනවා.

නැවතත් මම කියන්නේ, මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත් පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පෙන්වා දුන් ධනාත්මක කරුණුවලට අපි ස්තුතිවන්ත වෙන බවයි. ඒ වාගේම පාර්ලිමේන්තු ක්‍රමය ආරක්ෂා කිරීම පිළිබඳව ඔවුන් පෙන්වා දුන් කරුණුවලට ගරු කරමින් කටයුතු කරන්නත් අපි සූදානම්. ඒ ගැනත් සඳහන් කරමින්, මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට නැවත වතාවක් මාගේ බලවත් හෘදයංගම ස්තුතිය පිරිනමනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 13ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.28]

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගන්නා පනත් කෙටුම්පත් අතර තිබෙන සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත දිහා බලනකොට අපට පෙනෙන එක දෙයක්

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

තිබෙනවා. රජය බංකොලොත් වුණාම, IMF යනවා; ජාත්‍යන්තර සංවිධාන පස්සේ දුවනවා; ජනාධිපතිතුමා කියපු විධියට හිඟා කනවා. හැබැයි, රටේ සාමාන්‍ය ජනතාව බංකොලොත් වුණාම මොකක්ද කරන්නේ? අද ඇත්ත වශයෙන්ම ඔවුන්ගේ දේපළ උකස් තියලා තිබෙන්නේ. කන කර බඩු උකස් කරලා තිබෙන්නේ. දැන් ඉතුරු වෙලා තිබෙන්නේ ගෙදර තිබෙන ඒවාල දේපළ විතරයි. ඒ, අයිස් පෙට්ටිය, වාහනය, TV එක. මේ පනතින් කරන්නේ ඒ වාගේ දේපළත් බැංකුවකට උකස් තියලා යම්කිසි මුදලක් ලබා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති කිරීමයි. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමා කිව්වා, මේ පනත ගෙනෙන්නේ ද්‍රවශීලතාව වැඩි කර ගන්න කියලා. ඒක එක පැත්තක්. ඒක හරි. නමුත්, සාමාන්‍ය ජනතාවට දැන් උකසට තියන්න දෙයක් නැහැ. දැන් ඉඩම උකස් තියලා. කන කර බඩු උකස් තියලා. දැන් ඉතුරු වෙලා තිබෙන්නේ ගෙදර තිබෙන අයිස් පෙට්ටියයි, TV එකයි, කාර් එකයි. ඒවාත් උකස් තියලා මුදලක් ලබා ගත හැකි මාර්ගයක් තමයි අද මෙතුමා ඉදිරිපත් කරන්නේ. අපි දන්නවා, මේ රටේ සාමාන්‍ය ජනතාව ඉන්න තත්ත්වය. එම නිසා අපට මේ පනත් කෙටුම්පතට විරුද්ධ වෙන්න බැහැ. හැබැයි, මේ අය කරන්නේ ණයකාරයන් බිහි කරන එක.

ආණ්ඩුව අද මුළු ලෝකයටම ණය වෙලා. අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන හයක් ගෙවන්න ඕනෑ, ණය වෙනුවෙන්. මේ වෙනකොට අවුරුදු දෙකකින් ඒ ණය ගෙවලා නැහැ. ඒකයි මේ ෂෝ එක දාගෙන ඉන්නේ. මම හැමදාම ඒක කියනවා. අවුරුදු දෙකකින් ණය ගෙවලා නැහැ. ණය ගෙවන්නේ නැතුව හොඳට රඟපානවා. ඇත්ත වශයෙන්ම අපේ අර්බුදයට මුල මොකක්ද? අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා බොහොම කනගාටු වුණා කියලා, එතුමාගේ පෙන්වාදීම් ගැන. *[බාධා කිරීම්]* I do not want to be disturbed, Sir. මම කථා කරනකොට disturb කරන්න එපා. මේක කච්චේරියක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කරුණ හැමදාම අහනවා. මහ බැංකුවයි, මුදල් අමාත්‍යාංශයයි මේ පාර්ලිමේන්තුවට කිව්වාද, රට බංකොලොත් කියලා? කිව්වාද ඇමතිතුමනි? ඔබතුමා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පෙන්වාදීම් ගැන කිව්වා.

අපේ රට බංකොලොත් වෙන්න කලින් මහ බැංකුවේ හරි මුදල් අමාත්‍යාංශයේ හරි නිලධාරියෙකු කිව්වාද, අපේ රට බංකොලොත් වේගෙන යනවා කියලා? ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. අපට කවුරු එක්කවත් පෞද්ගලික අමනාපයක් නැහැ. පාර්ලිමේන්තුවටයි මුදල් බලය තිබෙන්නේ. ඒ නිසා ඒ අයට තිබුණා අපට ඒ බව දැනුම් දෙන්න. 2020, 2021, 2022 වර්ෂවලදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිකම කළේ ආණ්ඩුවේ මන්ත්‍රීවරු. ඒකත් විපක්ෂයටයි දෙන්න තිබුණේ. ඒ සභාපති ධුරය අපට දෙන්නේ නැතිව ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙකුට දුන්නා, ස්ථාවර නියෝග අත්හිටුවලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුවයි, මුදල් අමාත්‍යාංශයයි රට බංකොලොත් කියන එක අවුරුදු 3ක් තිස්සේ හැංගුවා. ඒකයි මට තිබෙන ප්‍රශ්නය. කවදාද ඒක හෙළිදරව් වුණේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, 2022 මැයි මාසයේ අපට දේශනයක් දෙන්න මහ බැංකුවේ ප්‍රධානියා ආවා. ඒ දේශනය දෙන්න ආවාම මම ඇහුවා, අපේ සංචිතය කොපමණ තිබෙනවාද කියලා. මොකක්ද එතුමා කිව්වේ? "Only US Dollars 20 million." එහෙම කිව්වාට Central Bank newsletter එකේ තිබෙනවා, US Dollars 2.5 billion කියලා. Newsletter එකේ තිබෙනවා, US Dollars 2.5 billion කියලා, මහ බැංකුවේ අධිපතිතුමා කියනවා, "Only US Dollars 20 million" කියලා. එදා තමයි අපි දැනගත්තේ රට බංකොලොත් කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ තර්කය මේකයි. මහ බැංකුවේ නිලධාරියෙක්වත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙක්වත් කිසිම දවසක මේ පාර්ලිමේන්තුවටවත්, එහෙම නැත්නම් පුවත් පත් සාකච්ඡාවක් තියලාවත් කිව්වේ නැහැ රට බංකොලොත් කියලා. ඔවුන් කළේ විශාල වැරැද්දක්. මුදල් රාජ්‍ය ඇමතිතුමනි, ඇත්ත වශයෙන්ම ඒ අයට දඬුවම් කරන්න තිබුණා. දැන් තමුන්නාන්සේලා මොනවාද කරලා තිබෙන්නේ? මහ බැංකුවේ නිලධාරීන් හැම ආණ්ඩුවක් එක්කම යම් යම් දේවල් කළා. අපි ඒවා මේ සභාවේ කථා කරන්න ඕනෑ නැහැ. දේශපාලනයට සම්බන්ධ දේවල් ඒ අය හැංගුවා.

දැන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පෙන්වාදීම, රට බංකොලොත් වෙන්න කලින් කළාද? බංකොලොත් වුණාට පස්සේ යම් යම් දේවල් ඔවුන් පෙන්වා දෙන්න පටන් ගත්තා. මට හිනා ගියා. මොකද එතුමා කියලා තිබුණා, "රට බංකොලොත් වේගෙන යනවා. මගේ භාර්යාව විතරයි මගේ මානසික තත්ත්වය දන්නේ" කියලා. භාර්යාවට කියලා වැඩක් නැහැ නේ රටට කියන්න ඕනෑ දේ. වර්තමාන මහ බැංකු අධිපතිතුමාවත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාවත් කිසිම දවසක රටට හෙළි කළේ නැහැ, පාර්ලිමේන්තුවට හෙළි කළේ නැහැ රට බංකොලොත් කියලා. දැන් තමුන්නාන්සේලා මොකක්ද කරලා තිබෙන්නේ? *[බාධා කිරීමක්]* මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, I want your attention. *[බාධා කිරීමක්]* තවම චාරිත්‍ර දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේක හොඳින් අහගෙන ඉන්න. මහ බැංකුව රට බංකොලොත් වෙන එක හැංගුවා. ඒ ගැන කවුරුවත් Parliament එකටවත් කිව්වේ නැති බව ඔබතුමාත් දන්නවා නේ. දැන් මේ අය මොකක්ද කරලා තිබෙන්නේ? රට බංකොලොත් කළ මහ බැංකුවේ නිලධාරීන්ට සියයට 70ක පඩි වැඩිවීම් දීලා තිබෙනවා. සියයට 70ක! You have increased their salary by 70 per cent. කොහොමද ඒක කරන්නේ? ඒ ලැයිස්තුව කියවන්න මට වෙලාව යනවා. මහ බැංකුවේ

නිලධාරින්ම තමයි ඇවිල්ලා කියන්නේ පටි තද කර ගන්න, staff එක අඩු කර ගන්න කියලා. මුළු රටටම උපදෙස් දෙන්නේ ඒ අය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ වැටුප රුපියල් 712,000කින් පමණ වැඩි කරගෙන තිබෙනවා. ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමනි,- *[බාධා කිරීමක්]* I am speaking to the Hon. State Minister. Please, do not disturb him. මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ වැටුප රුපියල් 712,000කින් පමණ වැඩි කරගෙන තිබෙනවා. එහෙම කරන එක හරිද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මම ඒ කාරණයට පිළිතුරක් දෙන්නද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

Yes, of course.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ කවුරුත් අඩුම වැටුපකට රටට වැඩ කරන්න පුළුවන් නම් හොඳයි. හැබැයි, ලෝකයේ හැම රටකම වාගේ මහ බැංකුවල සේවය කරන අයගේ වැටුප් තල හුඟක් ඉහළයි. ඒකට හේතුව තමයි, ඉතා ඉහළ ගණයේ ආර්ථික විද්‍යාඥයන් ආයතනයේ රඳවා ගන්න අවශ්‍ය වීම. මම මේ කාරණය ගැන හොයා බැලුවා. මහ බැංකුවේ සාමාන්‍ය ශ්‍රේණියේ හිටපු සේවකයන්ගෙන් 2022, 2023 කාලය තුළ 1,000කට ආසන්න පිරිසක් ලංකාව අත්හැර ගිහිල්ලා තිබෙනවා. ඒ කියන්නේ සියයට 10ක්. සාමූහික ගිවිසුමක් අනුව ඔවුන්ට අවුරුදු තුනකට වතාවක් වැටුප් වැඩි කරගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වැටුප් වැඩි කිරීම කරන්නේ නැතුව මේ වෙලාවේ සේවය කරනවා නම් හොඳයි. මහ බැංකුවට තිබෙන ස්වාධීන අයිතියක් හැටියට තමයි ඒ වැටුප් වැඩි කරගැනීම සිදු වෙලා තිබෙන්නේ කියන එක මම මෙතැනදී පැහැදිලි කරන්න අවශ්‍යයි. පවතින තත්ත්වය අනුව රටේ සියලුදෙනාටම අමාරුයි. ඒ නිසා අඩු වැටුපකට වැඩ කරන්න අපට පුළුවන් නම් හොඳයි. හැබැයි, එහෙම රටක් නොවෙයි නේ මේක. දැන් විවිධ පාර්ශ්ව, එම රාජකාරිවල නියුතු අය රඳවා ගන්න ඒ වෙනුවට ආදේශන නොමැති නිසා යම් විශේෂත්වයක් දක්වන්න වෙලා තිබෙනවා. ඒක තමයි තත්ත්වය.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කියනවා, මහ බැංකුවේ සේවය කරන්නේ විශේෂ දක්ෂතා තිබෙන අය කියලා. ඒ ගොල්ලෝ නේද රට බංකොලොත් කළේ? මොකක්ද ඒ විශේෂ දක්ෂතාව? ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තිබෙනවා ඊට වඩා හැකියාවක්. ඒ ගොල්ලන් අවුරුදු තුනක් බුදියගෙන හිටියා. එක්කෙනෙකුගේ වැටුප,- *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීවරු කරුණාකරලා මම මේ කියන කථාව අහගෙන ඉන්න. මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ වැටුප රුපියල් 712,000ක පමණ ඉඳලා රුපියල් 1,600,000ට පමණ වැඩි කරගෙන. මගේ ළඟ දිග ලැයිස්තුවක් තිබෙනවා. කාර්යාල කාර්ය සහායක තනතුරේ වැටුප රුපියල් 75,000කින් වැඩි කරගෙන තිබෙනවා. ඒ අයට බලයක් නැහැ. ඒ අය කොළේ වහලා වැඩේ කරගෙන තිබෙනවා. මේ ලැයිස්තුව මම ඔබතුමාට දැන් එවන්නම්, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ඔබතුමාට මම මේ කාරණය පැහැදිලි කරන්න කැමතියි. පනතේ ඉංග්‍රීසි පිටපතේ තිබෙනවා, "Notwithstanding anything to the contrary in any other written law," -ඒ කියන්නේ, වෙනත් ඕනෑම නීතියක ලිඛිතව තිබුණත් - "...the Governing Board may appoint and remove employees of the Central Bank, and may prescribe by rules regarding the remuneration" කියලා. ඉංග්‍රීසි පිටපතේ තිබෙනවා, "Notwithstanding anything to the contrary in any other written law," කියලා. හැබැයි, පනතේ සිංහල පිටපතේ ඒක නැහැ. සිංහල පිටපතේ තිබෙන්නේ, "පාලක මණ්ඩලය විසින්, මහ බැංකුවේ සේවානියුක්තයන් පත් කිරීම සහ ඉවත් කිරීම කළ හැකි අතර, ඔවුන්ගේ පාරිශ්‍රමික ඇතුළුව ඔවුන්ගේ සේවා නියුක්ති නියම සහ කොන්දේසි නිශ්චය කළ හැකි ය" කියලා. පාලක මණ්ඩලයට නිශ්චය කරන්න පුළුවන්. නමුත්, ඒවා පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. අධිකරණයෙන් ගණන් ගන්නේ සිංහල පිටපත. සිංහල පිටපතේ නැහැ, "වෙනත් ඕනෑම නීතියක ලිඛිතව තිබුණත්" කියලා. ගරු ඇමතිතුමනි, එම නිසා එය නීති විරෝධී ගෙවීමක්. ඒක වහාම නවත්වන්න කියලා මම ඔබතුමාට කියනවා.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉතා වැදගත් කරුණක් පෙන්වා දෙන්නේ. නමුත්, මහ බැංකුවේ ස්වාධීනත්වය අපි පසුගිය වසරේ පනතක් මඟින් තවත් ශක්තිමත් කළා. මහ බැංකුවේ තිබෙන ගිවිසුමක් අනුවයි වසර තුනෙන් තුනට වැටුප් වැඩිවීම කරන්නේ. පාලක මණ්ඩලයට ඒක තීරණය කරන්න අයිතියක් තිබෙනවා. හැබැයි, මහ බැංකුවේ කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවන්නේ අපේ ඒකාබද්ධ අරමුදලින් නොවෙයි, ඔවුන්ගේ ගිණුමෙන්. ඒ නිසා මම කියන්න යන්නේ නැහැ, මේවායේ තිබෙන කාරණා පිළිබඳව. හැබැයි, එවැනි ස්වාධීනත්වයක් මහ බැංකුවට තිබෙනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා හැටියට ඔබතුමා පෙන්වා දෙන කරුණුත් මම පරිශීලනය කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්වාධීනත්වය කියන්නේ මේ පාර්ලිමේන්තුව මහ හැරීම නොවෙයි. මේක පුදුම දෙයක් නේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැටුප පවා පාර්ලිමේන්තුවෙන් අනුමත කරනවා. මහ බැංකුවේ නිලධාරින්ගේ වැටුප සියයට 70කින් වැඩි කර තිබෙනවා. ඒ ගොල්ලන්ට පුළුවන් ඒක ගණනය කරන්න. නමුත් ඒ වැටුප් වැඩිවීමට පාර්ලිමේන්තුවේ අවසරය ඕනෑ. බලන්න, ඒ පනතේ සිංහල පිටපත. ගරු ඇමතිතුමනි, සිංහල පිටපතේ නැහැ, "වෙනත් ඕනෑම නීතියක ලිඛිතව තිබුණත්" කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

I will take three minutes, Sir.

ඒ පනතේ සිංහල පිටපතයි, ඉංග්‍රීසි පිටපතයි වෙනස්. ඉංග්‍රීසි පිටපත අනුව මේ අයට මේ වැටුප් වැඩිවීම කරන්න පුළුවන්. නමුත් අධිකරණය ගණන් ගන්නේ පනතේ සිංහල පිටපත. පනතේ

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

ඉංග්‍රීසි පිටපතේ තිබෙනවා, “Notwithstanding anything to the contrary in any other written law,” යනුවෙන්. එහෙමයි ඉංග්‍රීසි පිටපතේ තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් lawyer කෙනෙක් නේ. නමුත් සිංහල පිටපතේ ඒක නැහැ. මේ අය කොළේ වහලා ඔබතුමන්ලා රවටලා තමයි මේ වැඩේ කරලා තිබෙන්නේ. ඒ නිසා මේක නීති විරෝධී ගෙවීමක්. තමුන්නාන්සේලා මේ ගෙවීම නැවැත්වූවේ නැත්නම් අපි ඉදිරියේදී මේ මුදල ඒ අයගෙන් අය කර ගන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සඳහා නීතිපතිගේ උපදෙස් ගන්න. මම අවංකවමයි ඔබතුමාට එහෙම කියන්නේ. අවුරුදු තුනක් ඒ ගොල්ලන් කොළේ වැහුවා. රට බංකොලොත්වීම ගැන Parliament එකටවත්, COPE එකටවත්, Public Finance Committee එකටවත් කිව්වේ නැහැ. ඒ නිසා මේ බංකොලොත්වීම කියන කාරණයේදී ඒ ගොල්ලන් කොහොමද ගැලවුම්කාරයෝ වෙන්නේ? ඒගොල්ලන්ගේ වැටුප අඩු කරන්නයි තිබුණේ. "මම කිව්වේ නැහැ රට බංකොලොත් කියලා, මම කිව්වේ ණය ගෙවන්න බැහැ කියලා" මහ බැංකු අධිපතිතුමා කියනවා මම අහගෙන හිටියා. ඔහු හැරෙන-හැරෙන පැත්තට දිව දෙකේ කථා කියනවා. ඔහු මේ ආණ්ඩුවත් එක්කත් වැඩ කළා, මහින්ද රාජපක්ෂත් එක්කත් වැඩ කළා. ඒක නේ මහින්ද රාජපක්ෂ ඔහුට තානාපතිකමක් දීලා පිටරට යැව්වේ.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මේ කාරණයත් කියනවා. මහ බැංකුවේ අයට මෙහෙම වැටුප් වැඩි කරගන්න පුළුවන්. එතකොට රාජ්‍ය සේවකයන්ගේ වැටුප්? සියලු රාජ්‍ය සේවකයෝ කීයද ඉල්ලන්නේ? වෛද්‍ය වෘත්තිකයන් රුපියල් 35,000කින් වැටුප වැඩි කරන්න කියායි ඉල්ලුවේ. අන්තිමේදී ඒ ගොල්ලන් කිව්වා, ඒකෙන් දෙකෙන් පංගුවක් දෙන්න, අපි දෙකෙන් පංගුවකට settle වෙන්නම් කියලා. නමුත් ඒ මුදල දුන්නේ නැහැ. අපේ සෞඛ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. නමුත් ඒ මුදල දුන්නේ නැහැ. මේ ගොල්ලන් මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිගේ වැටුප රුපියල් ලක්ෂ 7කින් පමණ වැඩි කරගෙන තිබෙනවා. එතැනින් පහළ තනතුරුවලට රුපියල් ලක්ෂ 5කින්, රුපියල් ලක්ෂ 4කින් මාසික වැටුප වැඩි කරගෙන තිබෙනවා. මට වෙලාව නැහැ ඒ ලැයිස්තුව කියවන්න. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට මෙහි පිටපතක් දෙන්නම්. මම ඔබතුමාගෙන් අහනවා, මේ අයට මේ මුදල ලැබිය යුතුද කියලා. මේ අය නේ අපට කියන්නේ පටි තද කරගන්න කියලා. Staff එක අඩු කරගන්න, වැටුප් ගෙවන්න බැහැ කියලා ඒ අය හැම තැනටම ලියුම් යවනවා.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මේ කාරණයත් කියනවා. එතකොට මේ ගොල්ලන්ට ඕනෑ විධියට pension එක හදා ගන්නත් පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අනුව ආටිගල, ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්, කබ්රාල් වැරදිකාරයෝ වුණා. ඒ ගොල්ලන් Central Bank එකේ හිටපු කට්ටිය. ඒ අය මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කළා කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දුන්නා. ගරු ඇමතිතුමනි, දැන් ඒ අයටත් මේ වාසිය දෙනවාද? කබ්රාල්ට, ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන්ට සහ ආටිගලට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් ලබා දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන විධියට විශ්‍රාම ගිය අයගේ දීමනාවත් ඕනෑ විධියට වැඩි කරගන්න පුළුවන්. මම ඔබතුමාට කියනවා, ඔවුන්ට වැටුප නිශ්චය කරන්න - determine කරන්න - අයිතිය තිබෙන බව. හැබැයි, ඒක අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතුව ඒක කරන්න බැහැ. ඒ ගොල්ලන්ගේ පෞද්ගලික සල්ලිද මේවා?

පුදුම වැඩක් නේ මේක. මේ විධියට වෙන කොහේද තිබෙන්නේ? මේ විධියට කරන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියලා තිබෙනවාද? It has to come to Parliament. පාර්ලිමේන්තුවේ අයිතිය පාවා දෙන්න එපා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ පිළිබඳව ඔබතුමා නීතිපතිගෙන් උපදෙස් ගන්න. මොකද, පනතේ ඉංග්‍රීසි පිටපතයි, සිංහල පිටපතයි වෙනස්. සිංහල පිටපත තමයි නීතියෙන් පිළිගන්නේ කියන එක මම මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.46]

**ගරු ශාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනත් කෙටුම්පත් කිහිපයක් සම්මත කිරීම සඳහා අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය අවුරුද්ද ඇතුළත ලංකාවේ කර්මාන්ත 230,000කට වඩා වසා දමා තිබෙනවා. ඒ වාගේම මේ අවුරුද්දේ විතරක් Environmental Protection Licences 4,000ක් විතර renew කරලා නැහැ. Board of Investmentහි renewals 7,000ක් අරගෙන නැහැ. ඒ කියන්නේ, මේ අවුරුද්ද ඇතුළත තවත් කර්මාන්තශාලා 11,000ක් පමණ වැසී යන තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ වාගේම mortgage කරපු ඉඩම්, එහෙම නැත්නම් රජයට ණය ගෙවන්න බැරිව, companies හරහා ණය ගෙවන්න බැරිව නැවත වාරයක් සන්තක කරගන්න යන, recover කරගන්න යන ඒවා සම්බන්ධයෙන් ඒ කර්මාන්තශාලා හිමියන් පොඩි time frame එකක්, moratorium එකක් ඉල්ලා තිබෙනවා. ඒ කියන්නේ, ණය ගෙවන්න පොඩි කාලයක් ඉල්ලා තිබෙනවා.

මේ වෙනකොට ආයෝජකයන්ට, සුළු කර්මාන්තවලට කිසිදු සහනයක් ලැබිලා නැහැ. 2024 අය වැයේ සුරංගනා කථා තිබුණාට සුළු කර්මාන්තවලට කිසිදු සහනයක් ලැබිලා නැහැ කියලා ඔවුන් කියනවා. මම ඇමතිතුමාගේ කථාව පාර්ලිමේන්තුවට එන ගමන් ඇහුවා. උද්ධමනය මේ අවුරුද්ද තුළ අඩු වෙලා තිබීම පිළිබඳවත් ඔබතුමා සඳහන් කළා. හැබැයි ඔබතුමා දන්නවා, hyperinflation එකක් තිබුණේ 2022දී බව. Hyperinflation එකක් තිබුණාම අපේ බඩු මිල සියයට 200කින්, 300කින් පවා වැඩි වුණා. එතකොට පසුගිය අවුරුද්ද තුළ සහ මේ අවුරුද්ද තුළ inflation එක අඩු වෙලා තිබිලා, එතැනින් එහාට තවත් වැඩි වෙනවා නම්, මේ ආණ්ඩුව අරුම පුදුම ආණ්ඩුවක් වෙන්න ඕනෑ. මොකද, hyperinflation එකකින් පස්සේ මේ අවුරුද්දේ inflation එක හරි නම් සෘණ අගයක් තිබෙන්න ඕනෑ. ආණ්ඩුවේ රාජකාරිය හරියට කරලා තිබෙනවා නම්, මේ අවුරුද්දේ inflation එක සෘණ අගයක් තිබෙන්න ඕනෑ. නමුත් Inflation එක තවමත් single digit එකක තිබෙනවා කියන්නේ, ඒක මේ ආණ්ඩුවේ හැකියාවක් හෝ මේ ආණ්ඩුව මේ රට වෙනුවෙන් කරලා තිබෙන දෙයක් නොවෙයි. ආණ්ඩුවේ රාජකාරිය හරියට නොකළා කියන එක තමයි මේවායෙන් සනාථ වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු ලක්ෂ්මන් කිරිඇල්ල හිටපු ඇමතිතුමා සඳහන් කළා, මේ රට බංකොලොත් වීම පිළිබඳව. හිටපු අග්‍රාමාත්‍යවරයෙකු මෙන්ම හිටපු ජනාධිපතිවරයෙකු වන ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා, ඒ වාගේම බැසිල් රාජපක්ෂ

මැතිතුමා, Finance Ministry එකේ ඒ නිලධාරින් -මේ සියලුදෙනාම- ආර්ථිකය විනාශ කිරීම පිළිබඳව වගකිවයුතු පුද්ගලයන් කියලා උසාවියෙන් කිව්වා. හැබැයි වන්දි ගෙවන්න ඕනෑ කියලා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට කිව්වා වාගේ, මේ අයට වන්දි, එහෙම නැත්නම් ඒ මුදල් නැවත ගෙවන්න ඕනෑ කියලා කිව්වේ නැහැ. මේ වෙනකොට ඒක news එකක් පමණයි. උසාවියෙන් තීන්දුවක් ලැබුණා. රජයක් -ආණ්ඩුවක්- හැටියට ඒ ගැන පරීක්ෂණයක් පවත්වා නඩු තීන්දුවක් දීලා තිබෙනවා. හැබැයි, ඒකට චෝදනා ලබපු කට්ටියට, මේ රට විනාශ කරපු කට්ටියට විරුද්ධව එතැනින් එහාට ගත්ත ක්‍රියාමාර්ගයක් ගැන මේ වෙනතුරු අපට දකින්න නැහැ.

පාස්කු ප්‍රහාරය ගත්තොත්, පාස්කු ප්‍රහාරය කවුද කළේ, පාස්කු ප්‍රහාරයෙන් මොකක්ද වුණේ කියලා සොයන්න "Channel 4" නාළිකාවෙන් ආවා. ඊට පස්සේ ජනාධිපතිතුමා මොනවාද කිව්වේ? අපට ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍ය නැහැ, අපි රට තුළ පරීක්ෂණයක් කරනවා කිව්වා. හැබැයි මේ වෙනතුරු ඒවා යට ගිහිල්ලා තිබෙනවා. අද මාතෘකාව වෙලා තිබෙන්නේ, ජනාධිපතිවරණය. ජනාධිපතිවරණය කොහොමද දිනන්නේ කියලා තමයි එතුමන්ලා හිතන්නේ. මම දැක්කා හිටපු ජනාධිපතිතුමාත් කිව්වා, "රනිල්ගේ හැටි අපි දන්නවා නේ. එතුමා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන හැටි අපි බලමු. සමහර විට එතුමා ඒ වාගේ දේවල් කරන්න පුළුවන්" කියලා. රටේ ජනතාවගේ ජීවන තත්ත්වය, ආර්ථික තත්ත්වය පිළිබඳව අද කිසිදු සාකච්ඡාවක් නැහැ. ඉදිරි ජනාධිපතිවරණය දිනන්නේ කොහොමද, මොන මොන දේවල් කියලා ද රටේ ජනාධිපතිකම දිගටම තියා ගන්නේ කියන එක තමයි අද ප්‍රධාන මාතෘකාව බවට පත් වෙලා තිබෙන්නේ.

මේ අවුරුද්ද ඇතුළත අපේ රටට සංචාරකයෝ තුන්ලක්ෂ ගණනක් ඇවිල්ලා තිබෙනවා කිව්වා. ඒ සංචාරකයන්ගෙන් රටට ලැබී තිබෙන විදේශ විනිමය බැලුවාම, ඔබතුමන්ලාගේ Budget එක අනුව revenue targetsවල කියපු එකයි, දවසකට සංචාරකයෙක් රට තුළ වියදම් කර තිබෙන මිලයි අතර විශාල පරතරයක් තිබෙනවා. ඒ කියන්නේ, සංචාරක කර්මාන්තයෙන් රටට ලැබුණා කියන විදේශ විනිමය ප්‍රමාණය ඒ සංචාරකයන් ගණනින් බෙදුවොත්, එක සංචාරකයෙක් -මේ රට තුළ හිටපු දවස් ගණන බැලුවාමත්- ඉතාම සුළු මුදලක් තමයි වියදම් කර තිබෙන්නේ.

ඉතින් මේ සංචාරක කර්මාන්තය දියුණු වෙනවා කියන එකේදී සංචාරකයෝ රට තුළට එන ප්‍රතිශතය විතරක් නොවෙයි, රට තුළ ඒ සංචාරකයෝ වියදම් කරන මුදලත් බලන්න ඕනෑ. එහෙම නැතිව සංචාරකයෝ මෙච්චර ප්‍රමාණයක් එනවා, සංචාරකයන්ගෙන් මෙච්චර ආදායමක් රටට එනවා කියලා ජනාධිපතිතුමා අත කොට ෂර්ට් එකක් ඇඳගෙන, ගාල්ලට ගිහිල්ලා බලලා කිව්වාට ඒක රට දියුණු කරන ක්‍රමයක් නොවෙයි. මේ සඳහා ඉතාම නිවැරදි වැඩ පිළිවෙළක්, එහෙමත් නැත්නම් විදේශ ආයෝජන අපේ රට තුළට ගෙනෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ වනතුරු රජය මඟින් ඉදිරිපත් කරන්න අපොහොසත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ issues ටික -මේ ආර්ථික ප්‍රශ්න, ආර්ථික අර්බුදය- මුළු ලංකාව පුරාම තිබෙනවා. උතුරු-නැඟෙනහිර අපේ ජනතාවගේ ගැටලු මේ පාර්ලිමේන්තුවේ කියනවා නම්, ඇත්තටම දෙමළ භාෂාවෙන් තමයි කියන්න ඕනෑ. නැත්නම්, අපට චෝදනා කරනවා පාර්ලිමේන්තුව ඇතුළට ගිහිල්ලා රටේ දෙමළ ජනතාවගේ, උතුරු-නැඟෙනහිර ජනතාවගේ ප්‍රශ්න කථා කරන්නේ නැහැ කියලා.

இன்று நீங்கள் இந்த நாட்டில் வாழும் மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்காக இச்சபையில் சில சட்டமூலங் களைக் கொண்டுவந்து, சில சட்டங்களைத் திருத்துவதற்கு முயற்சிக்கின்றீர்கள். ஆனாலும், வடக்கு, கிழக்கில் தமிழ் மக்கள் முகங்கொடுக்கும் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய வகையிலான சட்டமூலங்களைக் கொண்டுவருவதற்கான எந்தவோர் ஏற்பாட்டையும் நீங்கள் செய்வதாக இல்லை. அதாவது, அந்த மக்கள் எதிர்பார்க்கும் மாற்றங்களைக் கொண்டுவருவதற்கு இந்த அரசாங்கம் எந்தவோர் ஏற்பாட்டையும் செய்வதில்லை.

TURCஆனது, அரசாங்கம் சர்வதேசத்தை சந்தோசப்படுத் துவதற்காகக் கொண்டுவரும் ஒரு சட்ட முன்மொழிவாகும். 'உண்மையைக் கண்டறியும் ஆணைக்குழு' என்று இதற்குப் பெயர் வைத்திருக்கிறீர்கள். வடக்கு, கிழக்கு மக்கள் இதனை நிராகரிக்கிறார்கள். ஏனென்றால், கொல்லப்பட்ட மக்களின் உறவுகளுக்கு இந்த ஆணைக்குழுவினூடாக நீதி கிடைப் பதற்கான எந்தவொரு வாய்ப்பும் இல்லை. இன்று வடக்கு, கிழக்கில் இருக்கும் வலிந்து காணாமல் ஆக்கப்பட்ட உறவுகளின் சங்கம், ஏனைய சங்கங்கள் மற்றும் சிவில் சமூக அமைப்புக்கள் என்பன இதனை நிராகரித்து இருக்கின்றன. எத்தனையோ ஆணைக்குழுக்களுக்கு முன்பாக அந்த மக்கள் தங்களுடைய அவலங்களைச் சொல்லியும் இதுவரை எந்தவொரு தீர்வும் கிடைக்கவில்லை. தங்களுக்குத் தேவையான விடயங்களைச் சர்வதேச சமூகத்துக்குச் சொல்வதற்காக, இந்த நாட்டிலுள்ள தமிழ் மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்கு முயற்சி எடுப்பதாகக் காட்டுவதற்காக இப்பொழுது அரசாங்கம் இத்தகைய புதிய சட்டமூலங்களைக் கொண்டு வருகின்றது. அரசாங்கமானது இதுவரை தமிழ் மக்கள் எதிர்பார்க்கும் எந்தவொரு தீர்வையும் முன்வைக்கவில்லை.

எங்களுக்கான அரசியல் அதிகாரங்கள் எங்களுக்குத் தரப்பட வேண்டும். அந்த வகையில், ஒரு புதிய அரசியலமைப்பினூடாகத் தமிழ் மக்களினதும் அவர்களுடைய பிரதிநிதிகளினதும் கைகளில் அரசியல் அதிகாரங்கள் வழங்கப்பட வேண்டுமென்ற விடயத்தில் இதுவரை எந்த முன்னேற்றமும் இல்லை. நான் நேற்றைய தினம், மாண்புமிகு ஜனாதிபதி அவர்களின் உரையொன்றைப் பார்த்தேன். அதில் அவர், ஜனாதிபதித் தேர்தலைக் குறிவைத்துப் பேசுவதுபோல் இருந்தது. தேர்தலொன்று வரவிருப்பதாகவும் அதற்கு முன்னர், தமிழ் மக்களுடைய பிரச்சினைகளைத் தீர்க்கத் தான் தயாராக இருப்பதாகவும் கூறியிருக்கிறார். இந்திய முதலீட்டுச் சம்மேளனம் தொடர்பான நிகழ்வொன்றின்போதே அந்த உரை ஆற்றப்பட்டிருந்தது.

இன்று வடக்கு, கிழக்குத் தொடர்பில் மாண்புமிகு ஜனாதிபதி அவர்கள் ஒரு விடயத்தைச் சொல்கிறார். அதாவது, தமிழ் மக்களுடைய பிரச்சினையைத் தீர்க்க தான் தயார் என்று சொல்கிறார். ஆனால், நேற்றைய தினம் ஜனாதிபதி செயலகத்தில் நடந்த கூட்டத்தில் குச்சவெளி பிரதேச செயலாளர் பிரிவிலுள்ள நான்கு புதிய விகாரைகளும் பௌத்த மதத்துக்கு மிகத் தேவையான விகாரைகள் என்பதாகப் பேசப்பட்டிருக்கிறது. இன்று கிழக்கிலிருக்கும் குச்சவெளிப் பிரதேச மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பது பற்றிப் பேசாமல், இந்த நான்கு விகாரைகள் பற்றித்தான் ஜனாதிபதி செயலகத்தில் பேசப்படுகின்றது.

எங்களுடைய மக்களுடைய அடிப்படைப் பிரச்சினைகளில் ஒன்றுதான் தொல்பொருள் சார்ந்த பிரச்சினை! இன்று மட்டக்களப்பு மாவட்டத்தில் நெல்கல்மலை என்ற

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

பிரதேசத்தில் குடும்பிமலைக்குப் பக்கத்திலுள்ள இராணுவ முகாமுக்குள் புதிய விகாரையொன்று அமைப்பதற்கான ஏற்பாடுகள் நடக்கின்றன. மட்டக்களப்பிலுள்ள சில வீதிகளின் புனரமைப்புக்காக நாங்கள் RDAஇடம் நிதி கேட்டால், நிதி இல்லை என்று சொல்கிறார்கள். ஆனால், இந்த விகாரைக்குச் செல்வதற்காக மட்டும் 700 மீற்றர் நீளமான பாதை அமைக்கப்படுகின்றது. அந்தப் பிரதேசத்தில் எந்தவொரு குடியேற்றமும் இல்லை; அங்கு தமிழ் மக்களும் இல்லை; சிங்கள மக்களும் இல்லை. ஆனால், அங்கு புதிதாக விகாரையொன்று அமைக்கப்பட்டு வருவதுடன், அதற்குச் செல்வதற்காகப் புதிதாக 700 மீற்றர் நீளமான பாதையையும் அமைக்கப்படுகின்றது. இது யாருடைய பணத்தில் அமைக்கப்படுகின்றது? எங்களுடைய வடக்கு, கிழக்கு மக்களும் வரி செலுத்துகின்றார்கள். அவர்களுடைய வரிப் பணத்தை எடுக்கின்ற அரசாங்கம் அவர்களுக்கு எதிரான செயற்பாடுகளில் ஈடுபடுகின்றது.

மாண்புமிகு ஜனாதிபதியுடனான சந்திப்பின்போது, இராணுவ முகாம்களை அகற்றுவது பற்றிப் பேசினால், அவர் அதற்கு இணக்கம் தெரிவிக்கிறார். ஆனால், இங்கு இராஜாங்க அமைச்சர் அவர்கள் அதற்கு மாற்றமானதொரு நிலைப்பாட்டைத் தெரிவிக்கிறார். அதாவது, மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் அகற்றப்பட வேண்டுமென தீர்மானிக்கப்பட்ட குருக்கள்மடம், முறக்கொட்டாஞ்சேனை போன்ற இராணுவ முகாம்களை அகற்றுவது பற்றிப் பேசினால், தான் அதற்கு இணக்கம் தெரிவிப்பதில்லையெனச் சொல்கிறார். "அரசாங்கத்தின் கொள்கையின் அடிப்படையில், தமிழ் மக்களுக்கு எதிரான செயற்பாட்டைத்தான் மேற்கொள்வோம்" என்பது அவர்களுடைய நிலைப்பாடாக இருந்தாலும், ஆகக் குறைந்தது எங்களுடைய மக்களுடைய வாழ்வாதாரத்தை உயர்த்தக்கூடிய வகையிலான விவசாயம் போன்ற விடயங்களுடன் தொடர்புடைய திட்டங்களைக்கூட அரசாங்கம் அமுல்படுத்துவதற்குத் தவறியிருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
நான் முடிக்கிறேன்.

கடந்த பெரும்போகத்தின்போது அரசாங்கத்தால் நெல்லைக் கொள்வனவு செய்ய முடியவில்லை. அதுமாத்திரமல்ல, நிலக்கடலையை - கச்சானை - உற்பத்தி செய்கின்றவர்கள் தமது உற்பத்தியைச் சந்தைப்படுத்தும்போது, அதற்கு உரிய விலை கிடைப்பதில்லை. அரசாங்கம் நிலக்கடலையை இறக்குமதி செய்வதற்குத் தடைவிதித்து இருந்தாலும், நாட்டுக்குள் நிலக்கடலை வந்திருக்கிறது. அதனால் உள்நாட்டு உற்பத்திக்கு உரிய விலை இல்லை என்பதாகச் சொல்கிறார்கள். அதேபோல், ஓரிலட்சம் கிலோமீற்றர் நீளமான யானை வேலி அமைப்பதாக அரசாங்கம் கூறியது. எனினும், இன்று நாங்கள் கிராமம் கிராமமாகச் சென்று வனவிலங்கு அதிகாரிகளுடன் பேசி, யானைப் பிரச்சினையைத் தீர்க்கவேண்டிய நிலை ஏற்பட்டிருக்கிறது.

எதிர்வரும் ஜனாதிபதித் தேர்தலைக் குறிவைத்து, நீங்கள் மீண்டும் தமிழ் மக்களை ஏமாற்ற முயற்சி செய்கிறீர்கள் என்பது மிகத் தெளிவாகத் தெரிகிறது. நீங்கள் இந்த வருடத்துக்குள் தமிழ் மக்களுக்கான ஓர் அரசியல் தீர்வை வழங்குவதற்குரிய ஆரம்பக்கட்ட நடவடிக்கைகளையாவது எடுக்காமல்விட்டால், இந்த அரசாங்கம் எவ்வாறான பொய்களைச் சொன்னாலும், மீண்டும் ஆட்சிக்கு வர முடியாது என்பதை நான் இந்தச் சபையில் ஆணித்தரமாகச் சொல்ல விரும்புகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.57]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පිළිබඳව කථා කරද්දී විශේෂයෙන්ම සාකච්ඡාවට ලක් වුණා මහ බැංකුවේ නිලධාරීන් රුපියල් ලක්ෂ 7කින් පඩි වැඩි කර ගත්තු එක පිළිබඳව. මහ බැංකුවේ ස්වාධීනත්වය පිළිබඳව කථා කරන වෙලාවේ අපි මේ ප්‍රශ්නය මතු කළා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පනවපු කොන්දේසිවලට යට වෙලා මහ බැංකුවට අසීමිත ස්වාධීනත්වයක්, නිදහසක් දුන්නාම ඇති වෙච්ච තත්ත්වය තමයි මේක. පළමුවෙනි ප්‍රතිඵලය තමයි මේක. තව ඉස්සරහට මොනවා වෙයිද කියලා කියන්න බැහැ. රටේ ජනතාව දවසකට රුපියල් 50ක්, 100ක් වැඩියෙන් හම්බ කර ගන්න බැරුවයි ඉන්නේ. රුපියල් 50ක්, 100ක් තමන්ගේ ආදායමට එකතු කර ගන්න බැරුවයි ඉන්නේ. එවැනි මොහොතක රුපියල් ලක්ෂ 7කින් පඩි වැඩි කර ගන්නවා කියන එක මේ රටේ කිසි කෙනෙකුට අනුමත කරන්න පුළුවන්, සාධාරණීකරණය කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඔබතුමන්ලා මොන උත්තරය දුන්නත්, මොන පැහැදිලි කිරීම කළත් ඒක වැරදියි. ඒ වැරැද්ද නිවැරදි කරන්න යම් මැදිහත්වීමක් මුදල් ඇමතිවරයා විධියට කළ යුතුයි කියන එක මම මුලින්ම අවධාරණය කරන්න කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දේශපාලනයේ තීරණාත්මක වෙනසක් කරපු දෙයක් තමයි ගෝල් ෆේස් අරගළය. ගෝල් ෆේස් අරගළයට මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සහභාගි වුණා. ඒ සහභාගි වෙච්ච ජනතාවගේ අපේක්ෂාව වුණේ වංචාවෙන්, දූෂණයෙන් තොර අලුත් රටක් නිර්මාණය කිරීමයි. එදා රට ආර්ථික වශයෙන් ප්‍රපාතයට වැටීමත් එක්ක මුහුණ දුන්නු දුෂ්කරතා නිසායි ජනතාව ඒ අරගළයට මැදිහත් වුණේ. මේ රටේ දේශපාලනයේ ඓතිහාසික වෙනස්කමක් කරපු තැනක් තමයි ගෝල් ෆේස් පිට්ටනියේ "Gota, go home!", කියමින් අරගළ කළ ස්ථානය. එය අරගළයේ සන්ධිස්ථානයක් වුණා. නමුත්, ඉතිහාසයේ ඛේදවාචකය මොකක්ද? ඔබතුමන්ලා ආර්ථිකය මෙහෙයවන්න හදන්නේ කැසිනෝ ආර්ථිකය තුළින්. ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමනි, මීට කලින් අවස්ථාවක අලුතින් කැසිනෝ බලපත්‍ර දීම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ දී ප්‍රශ්න කරපු වෙලාවේ ඔබතුමා කිව්වා, එසේ බලපත්‍ර දුන්නේ නැහැ කියලා. නමුත්, කැසිනෝ බලපත්‍ර නිකුත් කරලා තිබෙනවා. ඒ නිකුත් කළ බලපත්‍රවල පිටපත් මේ ගරු සභාවට ඉදිරිපත් කළා.

කොළඹ විතරක් නොවෙයි, මහනුවර, ගාල්ල, යාපනය වැනි ස්ථානවල පවා අලුතින් කැසිනෝශාලා පටන් ගන්න දැන් අවසර

දෙමින් යනවා. ඉතිහාසයේ සරදම කියන්නේ, ගෝල්ෆේස් පිට්ටනියේ "ගෝඨා ගෝ හෝම්" අරගළ භූමියේත් කැසිනෝහලක් ආරම්භ කරන්න දැන් ඔබතුමන්ලා බලපත්‍ර දෙන්න යන එකයි. ඒක කොයි තරම් සාහසික ද බලන්න. මොකද, එය මේ රටේ දේශපාලනයේ හැරවුම් ලක්ෂ්‍යයක් ඇති කරපු ස්ථානය. ඔබතුමන්ලා නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඒ කටයුත්ත සඳහා යම් සමාගමකට බලපත්‍රයක් දෙන්න යනවා. චීන සමාගමක නමක් එයට තිබෙන්නේ. චීන සමාගමක නමක් තිබුණාට ඒ කැසිනෝශාලාව පිටුපස ඉන්නේ මීගමුවේ කුප්‍රකට සූදුකාරයෙක්. ඒක තමයි කවුරුත් දන්නා ඇත්ත. ඔබතුමන්ලා මේ රටේ ජනතාවගේ ජීවිතත් එක්ක සෙල්ලම් කරනවා. ඓතිහාසික දේශපාලන වෙනස්කමක් කරපු ඒ ස්ථානය ඒ සඳහා තෝරා ගැනීම ම ඇත්තටම ජනතාවගෙන් කරන පළි ගැනීමක්; ඒ අරගළය කරපු ජනතාවගෙන් කරන පළි ගැනීමක්. ඒ නිසා ඒක කරන්න එපා. ඔබතුමන්ලාට මේ ආර්ථිකය හසුරුවන්න වෙනත් ක්‍රම නැති හින්දා ද කැසිනෝ ආර්ථිකය ගෙනැල්ලා ඒ ස්ථානයේම කැසිනෝශාලාවක් පවත්වාගෙන යන්න අවසර දෙන්න හදන්නේ? මේක බරපතළ වැරැද්දක් කියන එක මම ප්‍රකාශ කරන්න කැමැතියි.

මේ රජයේ ආයතන විකිණීමේදී දිගින් දිගටම සිද්ධ වන දේ බලන්න. Unsolicited proposals දාලා, කිසිදු ටෙන්ඩර් පටිපාටියක් නැතිව - procurement procedure - තමන්ගේ හිතවතුන්ට ඒ ආයතන විකුණනවා. පසුගිය කාලයේ අපි දැක්කා 'විසුම්පාය' ගොඩනැඟිල්ල විකුණන සූදානමක් තිබෙන බව. 'විසුම්පාය' කියන්නේ පුරාවිද්‍යාත්මක ඓතිහාසික වටිනාකමක් තිබෙන ස්ථානයක්. එදා සුදු අධිරාජ්‍යය ඒක පාවිච්චි කළේ හමුදාමය කටයුතු සඳහා. එය, පසු කාලයකදී මේ පාර්ලිමේන්තුවේ හිටපු කථානායකවරයෙකු වූ අනුර බණ්ඩාරනායක මැතිතුමා, හිටපු අගමැතිවරයෙකු වූ දි.මු. ජයරත්න මැතිතුමාගේ නිල නිවස විධියට පාවිච්චි කළ තැන. ඔබතුමන්ලා අද කිසිදු ටෙන්ඩර් පටිපාටියක් නැතිව එය එක්තරා ආයතනයකට විකුණනවා. විකුණන්න යද්දී අඩුම ගානේ රජයේ තක්සේරුවට සරිලන විධියට එය විකුණන්න එපා යැ. ඒකවත් කරන්නේ නැහැ. අපට ආරංචි විධියට ඊට අදාළව රජයේ තක්සේරුව වෙලා තිබෙන්නේ රුපියල් බිලියන 9යි. හැබැයි, ඔබතුමන්ලා එය දෙන්න යන්නේ රුපියල් බිලියන හතරහමාරකට. ඒ කියන්නේ, භාගෙට භාගයක්ම පාඩුයි. අපි ඉල්ලා සිටිනවා, රජයේ තක්සේරුව පිළිබඳ ඒ නිල වාර්තාව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා. නාගරික සංවර්ධන හා නිවාස ඇමතිවරයා කියලා තිබෙනවා මම දැක්කා, "රජයේ තක්සේරුවට අඩුවෙන් අපි ඒක දෙන්නේ නැහැ" කියලා. හැබැයි, රජයේ තක්සේරුව කීයද කියලා කියන්නේ නැහැ. නමුත්, මාධ්‍ය මඟින් ඉතා පැහැදිලිව වාර්තා කර තිබුණා, රජයේ තක්සේරුව රුපියල් බිලියන 9යි කියලා. රුපියල් බිලියන 9කට තක්සේරු කරපු ගොඩනැඟිල්ල කොහොමද හෝටලයක් සඳහා රුපියල් බිලියන හතරහමාරකට දෙන්නේ? කවුද ඒක තීරණය කළේ? රුපියල් බිලියන හතරහමාරක පාඩුව කවුද දරන්නේ? එතැන තමයි අත යට ගනුදෙනු සිද්ධ වෙන්නේ, එතැන තමයි වංචාව සිද්ධ වෙන්නේ. 'විසුම්පාය' ගොඩනැඟිල්ල මේ රටේ ඓතිහාසික වැදගත්කමක් තිබෙන ස්ථානයක්. ඒක පාවිච්චි කරන්නේ මොන වුවමනාව වෙනුවෙන් ද කියන එක පිළිබඳව රජයට ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්න පුළුවන්. ඒ පිළිබඳ විවාදයක් නැහැ. හැබැයි, රුපියල් බිලියන හතරහමාරක පාඩුවට ඒක දෙන්නේ කොහොමද? එය රජයේ තක්සේරුවට වඩා අඩු මුදලක් වුණේ කොහොමද? අන්න, ඒ පිළිබඳව මේ සභාවට පැහැදිලි කිරීම අත්‍යවශ්‍ය වෙනවා.

ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාගේ අවධානයට තවත් කාරණයක් යොමු කරන්න මා කැමැතියි. ජාතික ලොතරැයි මණ්ඩලය මීට ඉහතදී -2022දී- මාස 4ක කාලයක් සඳහා "ගොවි සෙත" ටිකට් පත් මුද්‍රණය කිරීම ටෙන්ඩර් පටිපාටියෙන් තොරව වෙනත් ආයතනයකට දුන්නා. එය DPJ Holdings ආයතනට දීම හරහා 2022 මැයි මාසයේ 12වැනි දා ඉඳලා 2022 සැප්තැම්බර් මාසයේ 05වැනි දා දක්වා වූ මාස 4ක කාලය තුළ ඒ ටිකට් පත් මුද්‍රණයේදී මිලියන 500ක අලාභයක් සිදු වෙලා තිබෙනවා. ඒ මිලියන 500ක අලාභය කොහොමද සිද්ධ වුණේ කියන එක ගැන වහාම පරීක්ෂණයක් පවත්වන්න. මාස 4ක කාලයකට ඒ ආයතනයට තාවකාලිකව ඒ ටිකට් පත් මුද්‍රණය කිරීමට ලබා දුන්නේ කොහොමද? එතැන සිද්ධ වෙච්ච ගනුදෙනුව පිළිබඳව වහාම පරීක්ෂණයක් කරන්න කියලා මම මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. දැනට විදේශ කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධව තානාපති කාර්යාලවලට අනුයුක්ත කර තිබෙනවා, වාණිජ නිලධාරින්. ඒ වාණිජ නිලධාරින්ගේ කාර්යභාරය සම්පූර්ණයෙන් අවසන් කරන්න රජය දැන් කටයුතු කරනවා. ජාත්‍යන්තර ගිවිසුම් අත්සන් කරද්දී, ජාත්‍යන්තර වෙළෙඳ ගිවිසුම් අත්සන් කරද්දී ඒ නිලධාරින් සහ ඒ ආයතනය තමයි විශාල කාර්යභාරයක් කළේ.

SAFTA හෝ පසුගිය කාලයේ අත්සන් කළ හැම ගිවිසුමකදීම රටට අවාසි කොන්දේසි මොනවාද, වාසි කොන්දේසි මොනවාද කියලා දීර්ඝ වශයෙන් විශ්ලේෂණය කරලා ඒ ගිවිසුම් සම්පාදනය කරපු නිලධාරින් සම්පූර්ණයෙන් අයින් කරලා, ඒ ඒකකයත් වහලා දාලා, එය අයිති වෙළෙඳ අමාත්‍යාංශයෙනුත් ඒක අයින් කරලා, ඒක ජනාධිපති කාර්යාලයට අනුයුක්ත කරලා දැනට අලුතින් කිසිවෙක් බඳවා ගන්නේ නැතිව ලෝකයේ විවිධ රටවල තානාපති කාර්යාලවලට අනුයුක්ත කරලා තිබෙන මේ නිලධාරින් වහාම කැඳවලා ඒක withdraw කරන්න යන එක ජාතික අපරාධයක්. මේක විදේශ ගිවිසුම් අත්සන් කරද්දී අපට බරපතළ හානිදායක තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වෙන ක්‍රියාවක්. ඒ නිසා වහාම ඒ ගැන අවධානය යොමු කරන්න කියමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කෙටි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා වැදගත් කරුණු කිහිපයක් කිව්වා. විශේෂයෙන් මහ බැංකුවේ වැටුප් වැඩිවීම මුදල් අමාත්‍යාංශයට පාලනය කරන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පනතින්ම ඔවුන්ට ඒ අයිතිවාසිකම ලැබිලා තිබෙනවා. ඔවුන් අවුරුදු තුනකට වතාවක් ඔවුන්ගේ ගිවිසුම් මඟින් වැටුප් වැඩිකර ගැනීම කරනවා. පාලක මණ්ඩලය තමයි ඒ අවසාන තීරණය ගන්නේ. ඒක ඒකාබද්ධ අරමුදලින් කරන ගෙවීමක් නොවෙයි, ඔවුන්ගේ ගිණුමකින් කරන ගෙවීමක්. මම විශ්වාස කරන්නේ මේ වෙලාවේ වැටුප් වැඩිකර නොගෙන වැඩ කරන්න පුළුවන් නම් කාටත් හොඳයි කියලායි. හැබැයි, මේ විශේෂිත ශ්‍රමය ආරක්ෂා කර ගැනීමේ ප්‍රශ්නයකුත් මහ බැංකුවට තිබෙනවා. ඒ පැත්තත් අවධාරණය කිරීම වැදගත්.

ඒ වාගේම රජය කිසිම වෙලාවක මේ රටේ පුද්ගලයන්ට කැසිනෝශාලා විවෘත කරන්න ඉඩ දෙන්න බලාපොරොත්තු

[ගරු රංජිත් සියඹලාපිටිය මහතා]

වෙන්නේ නැහැ. අපි අලුත් කැසිනෝශාලාවක් විවෘත කරනවා නම්, අලුත් ගැසට් එකෙන් රුපියල් බිලියන 10ක ගාස්තුවක් අය කරනවා. ඒ කියන්නේ කැසිනෝශාලාවක් ආරම්භ කිරීම පහසු නැහැ. ඒ බිලියන 10ට දෙන්නේත් විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය වෙනුවෙන්. අපේ රටට කැසිනෝ සඳහාම එන සංචාරකයනුත් ඉන්නවා. ඒ නිසා තමයි මෙතෙක් ක්‍රියාත්මක නොවුණු නීතියක් දැන් ක්‍රියාත්මක කරන්නේ. ලාංකිකයෙක් කැසිනෝශාලාවකට යනවා නම් අපි ඔහුගෙන් ඩොලර් 50ක් එක වතාවකට අය කරනවා. ඩොලර් 50ක් කියන්නේ කීයක්ද කියලා ඔබතුමා දන්නවා. අපි තව අවුරුදු දෙකකින් ඒක ඩොලර් 200ක් බවට පත් කරනවා. ඒ කියන්නේ රුපියල් 60,000ක් ගෙවලා තමයි ලාංකිකයෙකුට ඒවාට යන්න වෙන්නේ. ඒ අනුව අපි ලාංකිකයන්ට නොවෙයි කැසිනෝශාලා දමන්නේ, විදේශීය සංචාරකයන්ට පමණයි.

ඒ වාගේම විසුම්පාය වෙන්න පුළුවන්, වෙන ඕනෑ තැනක් වෙන්න පුළුවන්, අපි විවෘතභාවයෙන් සහ රජයේ තක්සේරුවට අඩුවෙන් ප්‍රතිව්‍යුහගත කිරීමක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ජාතික ලොතරැයි මණ්ඩලය සම්බන්ධ කාරණාවක් එතුමා කිව්වා. මම ඒ ගැන අදම සොයා බලන්න බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சரித்த ஹேரத்)
(The Hon. (Prof.) Charitha Herath)
Sir, I rise to a point of Order.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා ඒකාබද්ධ අරමුදලට සම්බන්ධයක් නැහැ, Central Bank එක පඩි වැඩි කරන්නේ ඒ ගොල්ලන්ගේම මුදල් කමිටුවේ තීරණයක් මත කියලා. හැබැයි, අවසාන වශයෙන් කැබිනට් එකේ authority එකට යටත්ව තමයි ඒක තිබෙන්නේ. ඒ නිසා ඒකාබද්ධ අරමුදලින් මුදල් ගියේ නැති වුණත්, රාජ්‍යයේ මුදල් තමයි ඒකට යන්නේ. එතුමන්ලා ඒ මුදල් පඩි විධියට ගන්නේ රාජ්‍යයට එකතු කරලා. ඒ නිසා Cabinet decision එකකින් ඒක වෙනස් කරන්න පුළුවන් කියලායි මම හිතන්නේ.

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
මම ඒවා නිවැරදි කරන්න යනවා නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම තිබෙන තත්ත්වයයි වාර්තා කරන්නේ. ඔබතුමා උගත් කෙනෙකු හැටියට පෙන්වා දෙන මේ කරුණු සියල්ලම ග්‍රහණයට අරගෙන අපට මේක කරන්න පුළුවන් කාරණාවක්. මේ කථා බහට ලක් වෙන කාරණාව පිළිබඳ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.07]

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

අද දින සාකච්ඡාවට ගැනෙන පනත් කෙටුම්පත් සහ පනත් සංශෝධන පිළිබඳව මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා දීර්ඝ පැහැදිලි කිරීමක් කළා. ඒ වාගේම විටින් විට එතුමාගෙන් අහපු සමහර ප්‍රශ්නවලට එතුමා පැහැදිලි පිළිතුරු දීමක්ද කළා. ඒ නිසා මම මේක අවස්ථාවක් කර ගන්නවා, අපේ ආර්ථිකය නිසි මඟට හැරවීම සඳහා අපි ගත යුතු සමහර ක්‍රියාමාර්ග පිළිබඳව යම් කිසි පැහැදිලි කිරීමක් කරන්න.

මේ පාර්ලිමේන්තුවට විටින් විට ඉදිරිපත් කරන අණපනත් මඟින් අපි බොහෝ වෙලාවට උත්සාහ කරන්නේ යම් යම් කටයුතු නිසි මඟට හැරවීම සඳහා යම් යම් සානුබල ලබා දීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාලසීමාව තුළ අපේ ආර්ථිකය නිසි මඟට ගැනීම සඳහා ප්‍රධාන යෝජනා දෙකක් සමාජ මාධ්‍යවලත්, විවිධ සාකච්ඡාවලදීත්, සමහර අවස්ථාවල මුද්‍රිත මාධ්‍යවලත් සාකච්ඡාවට ගැනෙනවා.

මේ මත දෙක පිළිබඳව කෙටියෙන් අදහස් දක්වන්නම්. එකක් තමයි, අපේ කලාපයේ විශේෂයෙන්ම ඉන්දියාවේ ආර්ථිකයේ ඇතිවන ප්‍රසාරණයෙන් - අපි ඒකට කියනවා, spillover effect කියලා - වාසි ලබාගෙන අපේ ආර්ථිකය නිසි මඟට ගැනීමට කටයුතු කිරීම. මේක තරමක විවාද සම්පන්න කාරණයක්. ළඟදී දවසක එක්තරා කැබිනට් අමාත්‍යවරයෙක් කරපු යම්කිසි සාකච්ඡාවක් සමාජ මාධ්‍ය තුළ සංසරණය වන ආකාරය අපි දැක්කා. ඒ වාගේම අපි දැක්කා, මේ ගරු සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කරනවා. ගරු විමල් වීරවංශ මැතිතුමාත් ගරු අමාත්‍යවරයා කළ ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කළ යුතුයි කියන කාරණය අද ඉස්මතු කළා. ඉන්දියාව මත රැඳෙන එක ආර්ථික උපාය මාර්ගයක් විධියට මේ දවස්වල කරුණු සාකච්ඡාවට ගන්නවා. මම දන්නේ නැහැ, ඒක කොතරම් දුරට අපට යථාර්ථයක් කර ගන්න පුළුවන් ද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සාකච්ඡාව මීට අවුරුදු 50කට ඉස්සෙල්ලාත් සිද්ධ වෙච්ච සාකච්ඡාවක්; තරමක් යල්පැනගිය එකක්. නමුත්, අද එදාට වඩා ඉන්දියාව ප්‍රබල නිසා අපේ සමහර අය කෙටිකාලීන වාසි වෙනුවෙන් පෙනී සිටිනවා දෝ කියන කාරණය අපට මතු කරන්න වෙනවා.

දෙවැනි කාරණය හැටියට, ආර්ථිකය නිසි මඟට හැරවීම සඳහා සාකච්ඡාවට ගැනෙන මේ අවුරුදු 75ක කාලසීමාව තුළ අපි අනුගමනය කරපු යම් යම් ආර්ථික ප්‍රතිපත්ති, ආර්ථික මොඩල ප්‍රතික්ෂේප කරලා, අලුත් එකකට යන්න ඕනෑ කියන සාකච්ඡාවක් මේ වෙලාවේ සිද්ධ වෙනවා. මේ පිළිබඳව අදත් මේ සභාවේ සාකච්ඡාවට ලක්වූ ආකාරය අපි දැක්කා. මට කලින් කථා කරපු ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාත් මේ පිළිබඳව එතුමාගේ අදහස් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම සහ ආර්ථිකයේ සමහර තීරණාත්මක තීන්දු තීරණ සම්බන්ධයෙන් එතුමන්ලාගේ අදහස ප්‍රකාශ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු 75ක කාලසීමාව තුළ අපි අනුගමනය කරපු ආර්ථික මොඩල සම්පිණ්ඩනය කළොත්, මොඩල 10ක් අපට හඳුනා ගන්න පුළුවන්කම තිබෙනවා. මේවා එක්තරා විධියක ආර්ථික යුග. මේවා හුදෙකලාව, ස්වාධීනව වෙච්ච ඒවා නොවෙයි. අපි විවිධ අවස්ථාවල විශ්වාස කළා, මේ ආකෘතිය හරහා අපට මේ ආර්ථිකය යම්කිසි නවීකරණය කිරීමක්, නිසි මඟට ගැනීමක් කරන්න පුළුවන් කියලා. අපි ඒ පළමුවැනි

යුගය ගැන කථා කළොත්, 1948ට ඉස්සෙල්ලා තමයි මේ යුගය ආරම්භ වුණේ. ඒ තමයි ඩී.එස්. සේනානායක මැතිතුමා අග්‍රාමාත්‍යවරයා විධියට කටයුතු කරනකොට අනුගමනය කරපු ආර්ථික මොඩලය. දේශීය ආර්ථිකය ආහාර අතින් ස්වයංපෝෂිත කිරීම, ජනපීඩිත කලාපවලින් ජනපීඩනය අඩු කලාපවලට ජනතාව සංක්‍රමණය කිරීම, පැවති වැවිලි වතු ආර්ථිකය ඒ ආකාරයෙන්ම නඩත්තු කරගෙන යෑම, යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තිය තවදුරටත් ඉදිරියට ගෙනයෑම, ඒකට අලුත් වචනයක් එකතු කරලා නව යටත් විජිත ආර්ථික ප්‍රතිපත්තියට අවශ්‍ය කරන සානුබල සැපයීම වාගේ කාරණා තමයි ඒ අනුව සාකච්ඡාවට ගැනුණේ. සේනානායක යුග දෙකක් තිබුණා. ඩී.එස්. සේනානායක මැතිතුමාගෙන් පස්සේ ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ පැත්තටත් රාජ්‍ය බලය සංක්‍රමණය වුණා. එතකොටත් එතුමාගේ පියා අනුගමනය කරපු ආර්ථික ආකෘතියට වඩා ලොකු වෙනසක් කරන්න එතුමා උත්සාහ කළේත් නැහැ. බතින් බුලතින් රටේ ආර්ථිකය සවිමත් කරන්න ඕනෑ කියලා එතුමාත් විශ්වාස කරපු නිසා එතුමාට නමකුත් පටබැඳුණා, "බත් දුන් පියා" කියලා. එතුමාගේ පියා "ජාතියේ පියා" වෙනකොට, පුතා "බත් දුන් පියා" වුණා. එතුමා කිහිප වරක් මේ රටේ අග්‍රාමාත්‍යවරයා විධියට කටයුතු කළා. එතුමාගේ කාලසීමාව තුළ අපට පේනවා, එවැනි තීරණාත්මක කැපී පෙනෙන වෙනසක් මේ රටේ ආර්ථිකය තුළ සිද්ධ වුණේ නැහැ කියලා. ඒ නිසා තිබුණු ප්‍රශ්න ඒ ආකාරයටම පැවතියා කියන එකයි අපේ විශ්වාසය.

ඊළඟට අපි එනවා බණ්ඩාරනායක යුගයට. 1956 පිළිබඳව විවාදසම්පන්න අදහස් ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත්, බණ්ඩාරනායක මැතිතුමාගේ කාල සීමාව තුළ අනුගමනය කරපු සමහර ආර්ථික ප්‍රතිපත්ති නිසා මේ රටේ ව්‍යවසාය පන්තිය මුළුමනින්ම බිඳ වැටුණාය කියන එකයි මගේ විශ්වාසය. ජනසතු කිරීම හරහා බස් මුදලාලිලා ළඟ තිබුණු බස් පවා ජනසතු කළා. සමහර අවස්ථාවල දේශීය වශයෙන් ආර්ථිකයට යම්කිසි තීරණාත්මක බලපෑමක් කරන්න පුළුවන්කම තිබුණු අංකුර ව්‍යවසායකයන් සියලුදෙනා මේ කාල සීමාව තුළ විනාශ වුණා. අපි කථා කරනවා ස්වභාෂාව හඳුන්වා දීම පිළිබඳව. හැබැයි, මම හිතනවා බණ්ඩාරනායක මහත්මයා ඉංග්‍රීසියෙන් හිතපු කෙනෙකු නිසා, එතුමා ස්වභාෂාව කියන එක ඉංග්‍රීසියෙන් කිව්වේ "vernacular" කියායි. එතකොට සිංහල අය සිංහල භාෂාවෙනුත්, දෙමළ අය දෙමළ භාෂාවෙනුත්, වෙනත් භාෂා කථා කරන අය ඒ භාෂාවලිනුත් කටයුතු කිරීම සඳහා වන අවකාශය තමයි නිර්මාණය කරන්න ගියේ. නමුත්, දකුණට මේක එනකොට "Sinhala Only" කියලා ආවා. උතුරට යනකොට මේක සිංහල විරෝධී අදහසක් බවට පත් වුණා. මේකේ අවාසනාවන්ත ඉරණම වුණේ අපේ පරම්පරාවේ බොහොමයකට අවුරුදු 10ක්, 12ක් ඉස්කෝලේ ගිහිල්ලා ඉංග්‍රීසි ඉගෙන ගන්න අවස්ථාව ලැබුණත්, ඉංග්‍රීසි භාෂාව පිළිබඳව දැනුමක් නැහැ. ජාත්‍යන්තරයට ගිහිල්ලා අපට කථා කරන්න තිබුණු අවස්ථාව ඇහිරී ගියා. ඒ විතරක් නොවෙයි. එක පන්තියකට පමණක් රටේ රාජ්‍ය බලය, පාලන බලය, තීන්දු තීරණ ගැනීමේ බලය ඒක රාශි වුණා.

බණ්ඩාරනායක අගමැතිතුමාගේ යුගය සහ බණ්ඩාරනායක මැතිනියගේ යුගය වශයෙන් බණ්ඩාරනායක යුග දෙකක් තිබෙනවා. එතුමියත් කිහිප වතාවක් අගමැති ධුරය දැරුවා. හැබැයි, තීරණාත්මක ලෙස 1970-1977 යුගය ගැන තමයි බොහෝ අය කථා කරන්නේ. බණ්ඩාරනායක මැතිනිය බණ්ඩාරනායක මැතිතුමාටත් වඩා වේගයෙන් මේ ආර්ථිකය හැකිළවීමේ ක්‍රියා මාර්ගයක නිරත වුණා. මේ ජනසතු කරන ව්‍යාපාරය තවදුරටත් වේගවත් කරලා, 1972-1974 ඉඩම් ප්‍රතිසංස්කරණ හරහා රන් පවුම් වතුත්, රුපියල් වතුත් ජනසතු කරලා, "ජනවසම", "උසවසම", රාජ්‍ය වැවිලි සංස්ථාව වාගේ ඒවා ආරම්භ කරලා, ඊළඟට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම පටන්ගෙන, විවිධ කර්මාන්ත මේ රට තුළ ආරම්භ කළා. හැබැයි, 1977 වෙනකොට මෙහි වැදගත්කම අපි හඳුනාගෙන තිබුණේ නැහැ. ඒවායේ වැදගත්කම තේරුම් ගැනීමට අපි උත්සාහ කළේත් නැහැ. ඒ වෙනකොට රටේ ආර්ථිකය හැසිරවීම පිළිබඳ සාකච්ඡාව වෙනත් දිශාවකට යොමු වෙලා තිබුණා. මට මතකයි, 1977 මැතිවරණ වේදිකාවලට නැඟපු බොහෝ කථිකයන් අරගෙන ආවේ බී ලූනු, මයිසූර් පරිප්පු, රෝස් පාන්, සීනි බනිස්. රුස්වීම අහගෙන හිටපු අයගෙන් අහනවා මේවා දැකලා තිබෙනවාද කියලා. 1977 වේදිකාව මුළුමනින්ම අරක් ගත්තේ, බඩ. ඒ වේදිකාව තුළ සාකච්ඡා කෙරුණේ නිදහස්, විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් මේ රටට ගැළපෙනවා කියන එකයි.

බණ්ඩාරනායක යුගයට පස්සේ ආවේ ජයවර්ධන යුගය. ජයවර්ධන යුගය මේ රටේ ආර්ථිකයේ ඉතාම තීරණාත්මක වෙනස්කම් ගණනාවක් කළා. ඒවා පිළිබඳව තමයි අදත් සමහර අවස්ථාවල අපි සාකච්ඡා කරන්නේ. රාජ්‍ය ව්‍යවසාය පෞද්ගලීකරණය කිරීම, අපේ ආර්ථිකය මුළුමනින්ම ජාත්‍යන්තරයට විවෘත කිරීම වාගේ ආර්ථිකය තීරණාත්මක ලෙස හැරවීම සඳහා යම් යම් දැඩි ක්‍රියා මාර්ගවලට යන්න ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට සිද්ධ වුණා. එහි ප්‍රතිඵල අගයලා බැලුවොත් අපට පෙනෙනවා, අපට ලැබුණු ශුද්ධ වාසියට වඩා අවාසිය වැඩි බව. ඒ නිසා තමයි අදත් ජයවර්ධන යුගය පිළිබඳව කථා කරනකොට බොහෝ අය ඒ යුගය පිළිබඳව විචිකිච්ඡාවෙන් කථා කරන්නේ. මට මතකයි, "රාවය" පුවත් පතේ කර්තෘ වික්ටර් අයිවන් මැතිතුමා අවස්ථා ගණනාවක ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා හඳුන්වා දීමට සුවිශේෂ වචනයක් පාවිච්චි කළා. එතුමාගේ ගෞරවය ආරක්ෂා කරන්න ඕනෑ නිසා මම ඒ වචනය පාවිච්චි කරන්න කැමැති නැහැ. නමුත්, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා කපටි නරියෙකුට තමයි උපමා කළේ. ඒක ඇත්ත. කාටවත් පෙනුණේ නැහැ මේ යුගයේ බැරෑරුම්කම පිළිබඳව. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධන යුගය තුළ නැවත වාරයක් මේ රටේ සංහිඳියාවට, මේ රටේ තරුණ අසහනයට කිසියම් ආකාරයක උඩගෙඩි දීමක් සිද්ධ වුණාය කියන එකයි මගේ විශ්වාසය.

1983 වසරේ ආරම්භ කෙරුණු උතුරු-නැඟෙනහිර බෙදුම්වාදයටත්, දකුණේ තරුණයන්ගේ නැඟිටීමටත් ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිතුමා අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තිය සෘජුව බලපෑවා කියන එකයි මගේ විශ්වාසය.

ඊළඟට අපි දැක්කා, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගය. ගරු චම්පික රණවක මැතිතුමා පසුගිය ඉරිදා එක්තරා සිංහල පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් - interview - දීලා තිබුණා. ඒ සම්මුඛ සාකච්ඡාව තුළ විවිධ කාරණා සාකච්ඡා කර තිබුණා. ඒ අතරින් වැදගත් කාරණයක් එතුමා ඉස්මතු කරලා තිබුණා. ඒ තමයි, අපට ආයෙත් නම් ප්‍රේමදාස යුගයකට යන්න බැහැ කියන එක. මම දන්නේ නැහැ, එතුමා මොන අදහසකින් ඒක කිව්වා ද කියලා. ප්‍රේමදාස යුගය කිව්වාම ඉතාම භීෂණ, ජීවිතයට අවදානමක් තිබුණු, තරුණයන් සොය සොයා මරණ යුගයක් තමයි අපට නම් මතක් වෙන්නේ. අපට මතකයි "මේ කවුද, මොනවාද කරන්නේ?" කියන එක. ඒ දේවල් කරන කාලයේ අපි හිටපු නිසා අපට ඒ ගැන තිබෙන්නේ පුදුමාකාර බියක්. ඒ විතරක් නොවෙයි, අපට දැනුම් තේරුම් එනකොට දැණුනා, මේ යුගය තුළ බලය රඳවා ගැනීම සඳහා යම් යම් මෙහෙයුම් කෙරුණා මිසක් ආර්ථිකය හැසිරවීම සඳහා තීරණාත්මක යමක් කෙරුණේ නැහැ කියන එක. දුප්පත් මිනිස්සුන්ගේ බඩ පුරවන්නත්, නිවාස නැති අයට නිවාස දෙන්නත් මිස ආර්ථිකය ඔසවා තැබීම සඳහා වන තීරණාත්මක තීන්දුවක් ගන්න හම්බ වුණේ නැහැ. අපි එක කාලයේ විශ්වවිද්‍යාලයේ හිටපු අය. ඒ නිසා ගරු චම්පික රණවක මැතිතුමා මේ සියලු කාරණා එකට ගොනු කරලා තමයි ප්‍රේමදාස යුගයකට නම් ආපහු යන්න බැහැ කියන ප්‍රකාශය කරන්න ඇත්තේ කියා මම හිතනවා.

[ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා]

ඊළඟට, චන්ද්‍රිකා බන්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ පාලන කාල සීමාවට අපි එනවා. බොහෝ අය එතුමියගේ පාලන කාල සීමාව පිළිබඳව වචන තුනකින් තමයි කථා කරන්නේ. ඒ කාලයේ පුස් වෙඩිල්ලක් පත්තු වුණා කියලා තමයි කියන්නේ. ඒ කියන්නේ, මහා ලොකුවට යමක් කෙරුණු කාලයක් විධියට ඒ යුගය අපි දකින්නේ නැහැ. ඒ නිසා මම ඒ යුගය පිළිබඳව කථා කරන්න කල්පනා කරන්නේ නැහැ.

ඊළඟට අපි එනවා, මහින්ද රාජපක්ෂ යුගයට. කෙනෙක් කවදා හරි දවසක ඉතිහාසය ගැන ලියන කොට මේ යුගය පිළිබඳව ලියයි. අපි දන්නවා, ඉතිහාසයේ මේ කාල සීමාව තුළ අපේ රටේ ආර්ථිකයේ තීරණාත්මක වෙනස්කම් ගණනාවක් සිද්ධ වුණු බව. ඒ කාලයේ අලුත් වරායවල්, ගුවන් තොටුපළවල්, මහාමාර්ග, දුම්රිය මාර්ග, නිවාස, පානීය ජලය, විදුලි බලය වාගේ බොහෝ දේවල් ලැබුණා. ඒ නිසා මේ රටේ මිනිස්සු අදත් කථා කරන්නේ මහින්ද රාජපක්ෂ යුගය පිළිබඳවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙලාව වැරදුණාද මම දන්නේ නැහැ. මට විනාඩි 18ක් තිබෙනවා කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ කථාව පටන් ගත්තේ 12.06ට. එතකොට, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි දෙකක් විතර දෙන්න පුළුවන් ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
නැහැ, නැහැ, මම කියන්නේ අතිරේක විනාඩි දෙකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Lunch එකට සභාවේ කටයුතු අත්හිටුවන්නට තිබෙනවා.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
මට 12.30ට ඉවර කරන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
තව කථිකයෙකුත් ඉන්නවා.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
අපි අපේ ආර්ථික මොඩලය තීරණය කරද්දී මේ සියලු යුගවලින් අපි ලබපු අත්දැකීම් මුල් කරගෙන අපේ ආර්ථිකයේ තිබෙන සුවිශේෂී තත්ත්ව 5ක් අවබෝධ කරගන්නට ඕනෑ. පළමුවැනි එක තමයි, මානව සහ භෞතික සම්පත් අපි කොහොමද උපයෝගී කරගන්නේ කියන එක. දෙවැනි එක තමයි, මේ මානව සහ භෞතික සම්පත්වල කාර්යක්ෂමතාව අපි ඉහළ නංවන්නේ කොහොමද කියන එක. තුන්වැනි එක තමයි, අර්බුද අවස්ථාවකදී අපේ මත අපට රැඳෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාවට නඟන්නේ කොහොමද කියන එක. මෙය බොහෝ අවස්ථාවලදී හඳුන්වන්නේ self-reliance කියලායි.

ඊළඟට, හතරවෙනි කාරණය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 5ක් ගන්න පුළුවන්.

**ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார)
(The Hon. (Prof.) Ranjith Bandara)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආර්ථිකය පුරා විහිදී යන බලපෑමක් ඇති කරන්න පුළුවන් ආකාරයට අපි කොහොමද ආර්ථිකය ප්‍රසාරණය කරන්නේ? ඒක තමයි හතරවැනි කාරණය.

පස්වෙනි කාරණය තමයි මේ සම්ප්‍රදාය මත රැඳී පවතින අතරවාරයේ අපි කොහොමද අපේ ආර්ථිකය නවීකරණයකට යොමු කරන්නේ කියන කාරණය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වැඩිපුර කාලය ලැබිච්ච නිසා මම කැමැතියි, මේ කාරණා 5 පිළිබඳව යම්කිසි සංක්ෂිප්ත කරුණු ටිකක් මේ සභාවට ඉදිරිපත් කරන්න.

පළමුවෙනි කාරණය මෙයයි. අපේ රටේ විතර මානව සහ භෞතික සම්පත් ඌන උපයෝජනයකට ලක් වෙච්ච රටක් මම දැකලා නැහැ. මේ ළඟදී මම දැක්කා, පේරාදෙණිය විශ්වවිද්‍යාලය මසකට වැය කරන මුදල පිළිබඳව එම විශ්වවිද්‍යාලයේම වැඩ ඉංජිනේරුවරයා විසින් කරන ලද පැහැදිලි කිරීමක්. එම විශ්වවිද්‍යාලයට පඩි ගෙවන්න විතරක් රුපියල් මිලියන 638ක්, වතුර බිලට රුපියල් මිලියන 4.5ක්, විදුලි බිලට රුපියල් මිලියන 40ක් වැය වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව විසින් නඩත්තු කරන විශ්වවිද්‍යාල 22ක් තිබෙනවා. එතකොට අඩුම ගානේ රුපියල් බිලියන 18ක් අපි මේ විශ්වවිද්‍යාලයක් මාසයක් නඩත්තු කරන්න වියදම් කරනවා. හැබැයි, ඒවායෙන් එළියට එන උපාධිධාරීන් බොහොමයක් රැකියා පෝලිම්වල ඉන්නේ. මම පසුගිය දවසක කිව්වා, සිවිල් ඉංජිනේරු උපාධිය ලබා ගත් අයටත් සේවා වියුක්තියක් ඇති වෙලා තිබෙනවා කියලා. ඒ නිසා භෞතික සම්පත් අත්හරින්නත්, මේ රටේ මානව සම්පත් සක්‍රිය ලෙස පාවිච්චි කරන්නත් අපට තිබෙන උපාය මාර්ගය මොකක්ද? තේරෙන භාෂාවෙන් කිව්වොත්, රස්සා දෙන්නේ කොහොමද? පුරන්වෙලා තිබෙන කුඹුරු කොහොමද අපි වැඩ කරන්නේ? ආහාර නිෂ්පාදනය ඉහළ නංවන්නේ කොහොමද? මේවා තමයි අපි සාකච්ඡාවට ගත යුතු කාරණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය ඵලදායීතාව - productivity - ඉහළ නැංවීම. තවම අපි ගන්නේ අක්කරයකින් වී බුසල් 40ක් නම්, තවම පොල් ගසකින් අවුරුද්දටම කඩන්නේ පොල් ගෙඩි 30ක් නම් එතැන මොකක් හරි ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේ කාරණා පිළිබඳව අපි සැලකිල්ල දැක්විය යුතුමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තුන්වෙනි කාරණය තමයි self -reliance කියන එක. මේ "self-reliance" කියන එක අර්ථ දක්වා තිබෙන්නේ, "reliance on one's own powers and resources rather than those of others" යනුවෙන්. කිසියම් රටකට යම්කිසි අර්බුද අවස්ථාවක තමන්ට තිබෙන බලය සහ සම්පත් මත රඳන්න පුළුවන් ආර්ථිකයක් හදන්න පුළුවන්කම තිබෙනවා නම්, ඒ ආර්ථිකය self-reliance එකක්. නමුත්, අපි එතැනට ගිහිල්ලා නැහැ. අපි එතැනට යන්න උත්සාහ කරමින් සිටියා. එක්තරා අවස්ථාවක අපි ඒක මුළුමනින්ම බිඳ වැට්ටුවා.

හතරවෙනි කාරණය, මම සඳහන් කරපු ආර්ථිකය පුරා බලපෑමක් ඇති කළ හැකි වැඩ පිළිවෙළක් අපි කොහොමද ක්‍රියාත්මක කරන්නේ කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් අපි බොහෝ තැන්වල දකින්නේ හුදෙකලාව ක්‍රියාත්මක කරන දේවල්. එදා ප්‍රශ්නවලට උත්තර දෙන ඒවා තමයි අපි අදත් කරන්නේ. හැබැයි අපට පුළුවන්කමක් තිබෙනවා නම්, ආර්ථිකයේ කේන්ද්‍රය ශක්තිමත් කරලා මේ කේන්ද්‍රය මත ඇති කරන ප්‍රගතිය ආර්ථිකය පුරා විසිරී යන ආකාරයට හසුරුවන්නට, මම හිතනවා, අපේ ආර්ථික මොඩලය සාර්ථක වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියපු අවසාන කාරණය තමයි, සම්ප්‍රදාය ආරක්ෂා කරමින් අපි නවීකරණයට යන්නේ කොහොමද කියන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් විධියට අපේ යැපුම් කෘෂි කර්මාන්ත අංශය බලන්න. හුඟක් වෙලාවට අපි ඒක අත්හැර දැම්මා. අපි හුඟක් වෙලාවට අපේ ළදරු කර්මාන්ත අත්හැර දැම්මා. මෙහි අවසාන ප්‍රතිඵලය වුණේ මොකක්ද?

ඒවා සාම්ප්‍රදායිකයි කියලා අපි අත්හැරියා. අපි ඒවාට නවීකරණය කැඳෙව්වේ නැහැ. ඒකේ අවසාන ප්‍රතිඵලය වුණේ මොක්කද? එදා තමන්ගේ කුඹුරෙන් වී බුසලක්, දෙකක් ගත්ත අයත් දැන් කුඹුර පාළු වෙන්න ඇරලා ළඟ තිබෙන කඩේට ගිහිල්ලා හාල් සේරුවක් අරගෙන ඇවිල්ලා වේල පිරිමහ ගන්න තැනට පත් වෙලා තිබෙනවා. තමන්ගේ වත්තේ තිබෙන පොල් ගහ කපලා පන්සලේ තිබෙන උත්සවයට වේදිකාව ගහන්න දීපු අය නැවත පොල් පැළයක් හදපු නැති නිසා දැන් පොල් ගෙඩියක් ගන්නත් කඩේට යනවා. මේක තමයි ඇත්ත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දේශීය ආර්ථිකය රැඳිලා තිබෙන ඉතා කුඩා ආර්ථික ක්‍රියාකාරකම් අපි ආරක්ෂා කර ගත යුතු වෙනවා. අපේ ආර්ථිකය කිසියම් ආකාරයක ඉහළ පිම්මක් පනින්නට ඕනෑ නම් මේ පස්වැදෑරුම් වැඩ පිළිවෙළ පිළිබඳව ඔබතුමන්ලාගේ අවධානය යොමු වෙන්න ඕනෑය කියන විශ්වාසයෙන් මම කථාව නතර කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Sitting is suspended for lunch till 1.00 p.m.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කථානායකතුමාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, HON. DEPUTY SPEAKER in the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානාකතුමනි, ගරු ගෙව්ඳු කුමාරතුංග මන්ත්‍රීතුමාට වෙන් වුණු කාලයත් මට ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමාට වෙන් වුණු මිනිත්තු හයයි, ඔබතුමාට වෙන් වුණු මිනිත්තු හයයි එකතු කරලා ඔබතුමාට මිනිත්තු දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් අමාත්‍යාංශයට අදාළ පනත් කෙටුම්පත් කිහිපයක් සාකච්ඡාවට ගන්නා මේ වෙලාවේදී මම කැමැතියි, අපේ රටේ ආර්ථිකයේ අද සිදු වෙමින් පවතින්නේ කුමක්ද කියන කාරණය පිළිබඳව මේ ගරු සභාව හමුවේ කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න. ඔබතුමා දන්නවා, මීට කලින් මේ සභාවේ බොහෝ මන්ත්‍රීවරු පැවසූ පරිදි, අපේ රටේ ආර්ථිකය බංකොලොත්භාවයට පත් වුණාට පස්සේ අපි දැන් ගැලවීමේ මාවතේ යනවා කියලා එක කොටසක් කියන බව. අපට පෙනෙන්නේ මේක ගැලවීමේ මාවත නොවෙයි, වැළලීමේ මාවත කියායි.

මැතකදී ගෞරවනීය මහා නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ නමක් ජනාධිපතිවරයා ආමන්ත්‍රණය කරමින් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා මම දැක්කා, මේ රටේ රාජ්‍ය ආයතන විකිණීමේ ක්‍රියාවලියේදී ජාතික ආරක්ෂාවට පවා බලපෑමක් වෙනවා, ඒ නිසා මේ ක්‍රියාදාමය ගැන නැවත සලකා බලන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සිදු වෙමින් පවතින්නේ වෙන මොකක්වත් නොවෙයි. මා මීට කලින් මේ ගරු සභාවේදී කිව්වා, සංචාරක හා ඉඩම් ඇමති හරින් ප්‍රනාන්දු මැතිතුමා ඉන්දියාවට ගිහිල්ලා කරපු කථාව ගැන. එතුමා කියනවා, ලංකාව ඉන්දියාවේ part එකක් කියලා. ඒක වැරදිලා කියවුණු එකක් නොවෙයි. මනුෂ නානායක්කාර ඇමතිතුමා නම් ඒක නිකම් හරි සැහැල්ලුකොට සලකා කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක නිකම් කියැවුණු එකකුත් නොවෙයි. ඒක වෙමින් පවතින ක්‍රියාවලියකට අනුව බොහොම දැනුවත්ව සිදු කරපු කථාවක්. එතුමා කියන්නේ "Sri Lanka is a part of

[ගරු විමල් වීරවංශ මහතා]

India, actually" කියලා. "Actually" කියලා කියන්නේ. මේක කවුරුවත් edit කරපු එකක් නොවෙයි. මේ කියන්නේ නිසැක වශයෙන්ම ශ්‍රී ලංකාව ඉන්දියාවේ කොටසක් කියායි. තමුන්නාන්සේලා දැන් මේ කරමින් යන්නේ ඒක. මට හිතා ගන්න බැරි දෙයක් තිබෙනවා. හැටනවලක්ෂයේ ජනවරමෙන් මේ පාර්ලිමේන්තුවට ආපු පොහොට්ටු මන්ත්‍රීවරු ටික දෙන දේ කාලා, වෙන දේ බලාගෙන ඉන්න එකයි කනගාටුවට කාරණය වෙලා තිබෙන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-බොරළුගොඩ සිංහයෝ- මේ අපරාධය වෙන්න ඉඩ හැරලා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ ඉන්නවා.

රාජපක්ෂලා ඔක්කෝම ටික ඉන්නවා, මේ අපරාධයට කරගහලා. දැන් මොකක්ද මේ කරමින් තිබෙන්නේ? ටෙලිකොම් ආයතනය දෙන්න යනවා, ඉන්දියානු සමාගමකට. විදුලිබල මණ්ඩලය කෑලිවලට කඩා ඉන්දියානු සමාගම්වලට දෙනවා. මන්නාරමේ සුනිත්‍ය බල ව්‍යාපෘති අදානිට දෙන්න යනවා. අවුරුදු 50ක් යනතුරු විදුලිය ඒකකයක් මිලදී ගන්නේ රුපියල් 50ට. සුළං බලයෙන්, තාප බලයෙන් උත්පාදනය කරන විදුලි ඒකකයක් රුපියල් 50කට මිලදී ගන්නේ මොන කෙංගෙඩියකටද? සාමාන්‍ය මනුස්සයෙකුගේ නිවසක වහලේ සවිකර තිබෙන සූර්ය පැනලයකින් නිපදවන විදුලිය ඒකකයක් මිලදී ගන්නේත් රුපියල් 30ක්, රුපියල් 35ක් වාගේ මිලකට. නමුත්, අදානිගෙන් මිලදී ගන්න හදන්නේ රුපියල් 50කට. එතකොට මේ රටේ විදුලිය පිරිවැය අඩු වෙනවාද?

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරින් ප්‍රනාන්දු ඇමතිවරයාම කියනවා නේ, ඉන්දියාවට අපේ airports තුනක් දෙනවා, වරායවල් දෙනවා කියලා. ඉතින් ඔය ඔක්කෝම දුන්නාම අන්තිමට ඉතුරු වෙන්නේ මොකක්ද? මේ පාර්ලිමේන්තුවද? මේකත් දීලා දමන්න. එතකොට කොහොමත් මේක ඉතුරු වෙන්නේත් නැහැ.

ඊළඟට, තමුන්නාන්සේලා මාර්තු මාසයේ අත්සන් කරන්න යනවා, එට්කා ගිවිසුම. කෝ, එම ගිවිසුම දැක්කාද, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්? කෝ, එය කැබිනට් මණ්ඩලයට පෙන්වූවාද? නැහැ. ඒ සම්බන්ධව එක රාජ්‍ය නිලධාරියෙක් පත් කරලා ලේකම් කාර්යාලයක් අටවාගෙන ඉන්නවා. එට්කා ගිවිසුම ගැන සංවේදී මේ රටේ වෘත්තිකයන් පිරිසක් ඔහුව හම්බ වෙන්න ගියා. එසේ ගියාම ඔහු දුන්නු උත්තරය තමයි, ලේඛන මොකුත් දෙන්න බැහැ, මේ වතාවේ ඉන්දියාව හරි aggressive කියන එක. ඒක තමයි ඔහු දුන්නු උත්තරය. කිසි ලේඛනයක් දෙන්න බැහැ කිව්වා. එට්කා ගිවිසුම අත්සන් කළාම මේ රටේ වෙළෙඳාමට සහ රැකියාවලට නිදහසේ ඉන්දියානුවන්ට එන්න පුළුවන්කම ලැබෙනවා. එතකොට ඔවුන් බුලත් විට කඩ දමා ගනියි; රූප ලාවණ්‍ය ආයතන දමා ගනියි; ඔවුන්ට දොස්තර රස්සාවට එන්න පුළුවන්; ඉංජිනේරු රස්සාවට එන්න පුළුවන්. හැම වෘත්තියක්ම ඔවුන්ට විවෘත වෙනවා. ඒකට කොහෙන්වත්, කාගෙන්වත් අනුමැතියක් ගන්න ඕනෑ නැහැ. ටෙලිකොම් ආයතනය ඉන්දියාවෙන් ගත්තාම, විදුලිබල මණ්ඩලය හතරට-පහට කඩා ඉන්දියාවෙන් ගත්තාම ඒවායේ ඉන්නා සේවකයෝ විශ්‍රාම යනකොට, ලාංකිකයන්ට අවස්ථාවක් ලැබෙනවා වෙනුවට ඉන්දියානුවන්ට අවස්ථාව ලැබෙන්න පුළුවන්. මීට අවුරුදු 200කට කලින් සුදු ජාතිකයෝ උඩරට වතුකරයට ඉන්දියානු සම්භවයක් තිබෙන දෙමළ ජනයාව ගෙනාවේ මෙහේ තබාගන්න බලාගෙන නොවෙයි, වැඩ ටික කරගෙන යවන්න බලාගෙනයි. හැබැයි, ඔවුන් එහෙම ගියේ නැහැ. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව කොටසක් යැව්වා. ඒ, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම හරි කියපු මිනිස්සුත් අද මේ අපරාධය වෙන්න ඉඩ හැර බලාගෙන ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එට්කා ගිවිසුම අත්සන් කළා කියන්නේ මේ රටේ අවසානයේ ආරම්භය එය බවට පත් වෙනවා කියන එකයි. ඔබතුමා දන්නවා නේ, වෙළෙඳාමට ආවාම, රැකියාවලට ආවාම ටික කාලයක් යනකොට, ඒ අය මෙහේ බින්න බහින බව. ඊට පසුව ග්‍රාම නිලධාරියෙක් අල්ලාගෙන උප්පැන්න සහතිකයත් හදා ගන්නවා. හැඳුනුම්පතත් ලැබෙනවා. දැන් අපේ හැඳුනුම්පත් සැකසීම සඳහා අවශ්‍ය ජෛව දත්ත පද්ධතියම දෙන්න යන්නේත්, ඉන්දියානු සමාගමකට. මිල්කෝ සමාගම, අමුල් සමාගමට දෙන්න යනවා. මිල්කෝ සමාගමයි, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපොළවල් ටිකයි ඉන්දියාවට දෙන්න යනවා. ඒවා අමුල් සමාගමට දෙන්නේ නැතුව ආරියසීල වික්‍රමනායක වාගේ ලංකාවේ ඉන්නා ධනපතියෙකුට දෙන්නකෝ. ඒ මිනිස්සුන්ට බැරිද, එම ආයතන දියුණු කරන්න? දැනටමත් එවැනි කටයුතු සිදු කර පෙන්වා තිබෙනවා, ඒ අය. එක පැත්තකින් ඉන්දියානු සමාගම් වළල්ලක් අපේ ආයතන ගිල ගන්නවා. අනෙක් පැත්තෙන් එට්කා ගිවිසුම ගහලා වෙළෙඳාමට, රැකියාවට ඒ අයට නිදහසේ එන්න ඉඩ හදා දෙනවා. ඔය ටික ඔක්කෝම කළාට පසුව ලංකාවක් කියලා රටක් ඉතුරු වෙන්නේ නැහැ. අවුරුදු 200කට කලින් ආපු මිනිස්සු මෙහේ පදිංචි වුණා වාගේ මේ හරහා රස්සාවට, වෙළෙඳාමට එන කෙනා මෙහේ පදිංචි වෙන්න ගන්නවා. සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමනි, කැලණිය හන්දියේ ඉන්දියානු කඩ වැඩි වෙනවා, මේ රටේ මිනිස්සුන්ගේ කඩවලට වඩා. තමුන්නාන්සේලා අත ඔසවාගෙන ඉන්න, ඔය රාජ්‍ය ඇමති කට්ටක් දිහා බලාගෙන.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉන්න. හැබැයි, මේවා වෙන්න ඉඩ හැරලා දෙන දේ කාලා වෙන දේ බලාගෙන ඉන්නවා නම්, අර හැටනවලක්ෂයේ ජනවරමට පස්සා පැත්ත හැරෙව්වාටත් වඩා වැඩි දෙයක් තමයි තමුන්නාන්සේලා කරන්නේ.

අද රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනයන්න ඉඩ දීලා බලාගෙන ඉන්නා එකද, යුතුකම? හරින් ප්‍රනාන්දු ඇමතිවරයා, "ලංකාව ඉන්දියාවේ part එකක්" කියලා කිව්වේ නිකම්ද? "රටේ ස්වෛරීත්වය ආරක්ෂා කළේ යුද කරලා. "මම ඒකට සේනාධිපති හැටියට නායකත්වය දුන්නා" කියන රාජපක්ෂලා ලජ්ජාවක් නැතුව කරගහන්නේ මේ නින්දිත පාවා දීමට; මේ රට ඉන්දියානුකරණයට. ඒ ගැන කටක් අරින්නේ නැහැ, මේ ඉන්නා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නමුත් අපි ඒ ගැන සංවේදීයි; අපි දන්නවා ඒකෙන් වෙන්නේ මොකක්ද කියලා. ඒ දේවල් වුණාට පසුව අඬලා වැඩක් නැහැ. ඒ

නිසා එට්කා ගිවිසුම අත්සන් කරන්න ඉඩ දීලා තමුන්නාන්සේලා බලාගෙන හිටියොත්, තමුන්නාන්සේලා තරම් මේ සියවසේ මේ රටට එරෙහිව අගතිදායක දෙයකට කරගහපු වෙනත් පිරිසක් නැති වෙනවා. ඒ නිසා අපි වැඳලා ඉල්ලන්නම්, මාර්තු මාසය ඇතුළත අත්සන් කරන්න නියමිත ගිවිසුම ගැන දඩ බඩ ගාලා සාකච්ඡා පවත්වා ඉක්මනින් තීරණයක් ගන්න කියලා. ඒ සම්බන්ධයෙන් ඉන්දියාවේ team එකක් ඉන්නවා. හැබැයි, ලංකාවෙන් එක් කෙනායි ඉන්නේ; අර නිලධාරියා විතරයි. අන්තිමට ඒක කැබිනට් මණ්ඩලයට පෙන්වන්නේත් නැහැ.

තායිලන්තයත් එක්ක අත්සන් කළ වෙළඳ ගිවිසුම කැබිනට් එකට පෙන්නුවාද? Framework එකක් කියලා එකක් එව්වා. අර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒක "හරි ෂෝක්" කියලා අනුමත කළා. අගමැතිතුමාත් ඇතුළුව. කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා. අගමැතිතුමාත් ඇතුළුව සියලු දෙනා Framework එකට අනුමැතිය දුන්නා. අත්සන් කරලා බැලින්නම්, ඒ වෙළෙඳ ගිවිසුම ලංකාවට අවාසිදායකයි. ඒ ගැන කතිකාවක්වත් තිබෙනවාද? තමුන්නාන්සේලාගේ තනතුරු, තාන්න මාන්න ටික විතරක් රැකුණොත් ඇද්ද? මේ රටේ අනාගතය පිළිබඳව තමුන්නාන්සේලාට වගවීමක් නැද්ද, වගකීමක් නැද්ද? අඩු ගණනේ හරින් ප්‍රනාන්දු අමාත්‍යවරයා අර කරපු ප්‍රකාශය, බරපතළ වැරදි ප්‍රකාශයක්, බැහැපන් එළියට කියලා කියන්නවත් කොන්දක් නැද්ද? අඩු ගණනේ තමුන්නාන්සේලාට, - මම කියන්නේ පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ට, හැටනවලක්ෂයේ ජන වරමට අයිතිය තිබෙන; එතැනින් පෙකණි වැල කැපිච්ච අයට- අර වාගේ බරපතළ ප්‍රකාශයක් කරපු මිනිහෙක්ව තියාගෙන නැළවි නැළවී ඉන්න ලජ්ජා නැද්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අපේ පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මේ රට ඉන්දියානු කොලනියක් වෙන්නයි; විසිනවවැනි අර්ධ යටත්විජිත කොලනිය වෙන්නයි මේ යන්නේ. ඒකයි හරින්ට කියැවුණේ ලංකාව ඉන්දියාවේ කොටසක් කියලා. ඒක නිකම් නොවෙයි කියැවුණේ. මේ සැලැස්ම ගැන දන්නා නිසායි කියැවුණේ. පොහොට්ටුවේ කට්ටිය ඒවා දන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ඒවා පොහොට්ටුවේ අයට කියන්නේ නැහැ. පොහොට්ටුවේ අයව තියාගෙන ඉන්නේ අත් ඔසවන්න විතරයි. ඒකට තමුන්නාන්සේලාට මොනවා හරි වරප්‍රසාද ටිකක් දෙනවා. එතකොට තමුන්නාන්සේලා ඕනෑම කුණකට කර ගහනවා. හැබැයි, හරින් ප්‍රනාන්දු අමාත්‍යවරයා දන්නවා. මොකද, ඔහුට කියනවා. ඔබතුමන්ලා මොනවාද දන්නේ? ඔබතුමන්ලා ඇස් වහගෙන අපායේ ගේට්ටුවෙන් ඇතුළට ගෙනියන කට්ටියක්. අපාය ඇතුළට ගියාම තමයි, "හපොයි! අපායට ආවා නේද" කියලා හිතෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආරක්ෂක හමුදාව තමයි මේ රට බේරා ගත්තේ, මේ රටේ ස්වෛරීත්වයට පණ දුන්නේ. අතීතයේ අපේ මුතුන් මිත්තන්ගේ ඉඳලා මෑත කාලයේ තරුණ දරුවන් පවා ලක්ෂ ගණනක් ජීවිත පුද දීලා, පණ දීපු මේ රටේ ස්වෛරීත්වයට මේ අපරාධය කරන්න ඉඩ දීලා බලාගෙන ඉන්නවා නම්, මේ සභාවේ ඉන්නේ මහජන නියෝජිතයෝ නොවෙයි, වෙන කවුදෝ ටිකක් කියලායි මට නම් කියන්න වෙන්නේ.

අද මෙතැන කථා කළා, මහ බැංකුවේ අයගේ පඩි වැඩි කරගැනීම ගැන. මුදල් රාජ්‍ය ඇමතිතුමා කියනවා, "අපි මහ බැංකුව ස්වාධීන කළා, ඒ පඩි වැඩිකර ගැනීම ඒ ගොල්ලන්ට කරන්න පුළුවන්, අපට මුකුත් කරන්න බැහැ" කියලා. ඔය ස්වාධීනකරණයට අපි විරුද්ධව හිටියේ ඔන්න ඔය හේතු නිසායි. මම මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් අහනවා, මහ බැංකුවට හිතෙන හිතෙන විධියට පඩි වැඩි කර ගන්නද ස්වාධීනත්වය හදලා දුන්නේ කියලා. මේ රටේ මිනිස්සු තුන් වේල කන්න විධියක් නැතිව හාමතේ මැරෙද්දී, මහ බැංකුවේ ඉන්න සෙට් එකට සියයට 70කින් පඩි වැඩි කර ගන්නද මහ බැංකුව ස්වාධීන කරලා දුන්නේ? හැබැයි ඒ අතරේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාත් සියයට 70කින් පමණ පඩි වැඩි කරගෙන තිබෙනවා. එතකොට ඒ පඩි වැඩිකර ගැනීම කරගත්තේ මොන පනත අනුවද? මොන ස්වාධීනත්වයට අනුවද? හැන්ද අතේ තිබෙන අය හිතෙන හිතෙන විධියට බෙදාගෙන කන්නයි, හැන්ද අතේ නැති අයට හාමතේ මියැදෙන්නයිද තිබෙන්නේ? ඒකද මේ අර්බුදය විසින් මේ රටට පෙන්වා දෙන මාවත? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාවා දීමට ඉඩ දෙන්න එපා. කරුණාකරලා, පොහොට්ටුවේ මන්ත්‍රීවරු අවදිව, සංවේදීව මේ සිදුවෙන ක්‍රියාවලිය දිහා බලලා මෙය වළක්වන්න තමන්ට තිබෙන හයිය පාවිච්චි කරන්න. එහෙම නැතිව කොඳු බිඳගත් නිවට නියාලුවන් විධියට ඉතිහාසයේ පොතට නම එකතු කර ගන්න එපා කියන එක අවධාරණය කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.12]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුව සම්බන්ධව කථා කරනකොට ආණ්ඩු පක්ෂයේ අය කථා කරන්නේ සිහියෙන්ද, එහෙම නැත්නම් මෝඩකමට කථා කරනවාද, එහෙමත් නැත්නම් රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට ඇන්දිලා කථා කරනවාද කියලා මට නම් තේරෙන්නේ නැහැ. දැන් සමහර අය කියනවා, දැන් රට හරි පාරට ගෙනැල්ලා තිබෙනවා, පෝලිම් නැහැ, කළුවරේ ඉන්න ඕනෑ නැහැ කියලා. ඔව්, අද ලක්ෂ 10ක් පමණ ගෙවල්වල විදුලිය කපලා තිබෙනවා. පෝලිම් නැති වුණාට පෙට්‍රල් ලීටරය රුපියල් 361ට නග්ගලා තියෙන්නේ. මේ රට බංකොලොත් කරපු උදවියම තමයි ඒ විධියට කථා කරන්නේ. අනෙක් පැත්තෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා දැන් මොකක්ද කරන්නේ? රනිල් වික්‍රමසිංහ මහත්මයා තවම ණය ගෙවන්න ආරම්භ කරලා නැහැ. ණය පොලිය ගෙවන්න ආරම්භ කරලත් නැහැ. රට බංකොලොත්භාවයෙන් මුදා ගන්න නම් ඉස්සෙල්ලාම ඒක සිදුවුණු විධිය ගැන කල්පනා කරන්න ඕනෑ. සමහර අය තැටිය රත් වෙච්ච වෙලාවේ රොටිය පුච්චා ගන්න ලැහැස්ති වෙනවා. ඇත්තවශයෙන්ම රට බංකොලොත් වුණේ ඩොලර් බිලියන 86ක පමණ ණය ගත්ත නිසා. මේ ණය ගත්තේ කවුද? ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 4යි. ප්‍රේමදාස ජනාධිපතිතුමා අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 1.7යි. ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා අරගෙන තිබෙන්නේ ඩොලර් බිලියනයයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අරගෙන තිබෙනවා ඩොලර් බිලියන 31ක්. ඒ මොනවාටද?

සම්මන්ත්‍රණශාලා හදන්න, නැව් නැති වරායවල් හදන්න, ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටුපොළවල් හදන්න, ඒ වාගේම අධිවේගී මාර්ග හදන්න. මම දන්නේ නැහැ, දියුණු වෙමින් පවතින රටකට ණය අරගෙන මේවා හදන්න පුළුවන්ද කියලා.

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

මේවා අත්‍යවශ්‍යයි. හැබැයි, සාමාන්‍යයෙන් කරන්නේ, මේවාට ආයෝජකයෝ ගෙනැල්ලා, ඒ අය ලවා ආයෝජනය කරවලා, ඒ ආයෝජනයේ ප්‍රමාණය අනුව RoI - Return on Investment - එක ගණන් හදලා අවුරුදු 20ක්, 25ක් හෝ 30ක් හෝ එම ව්‍යාපෘතියේ ආදායම ඔවුන්ට ලබා දෙන එක. මොකද, ඊටපස්සේ ඔවුන් ගුවන් තොටුපොළ උස්සාගෙන යන්නද? වරාය උස්සාගෙන යන්නද? අධිවේගී මාර්ගය උස්සාගෙන යන්නද?

මීට අවුරුදු දෙක තුනකට කලින් තමයි සිංගප්පූරුවේ Changi Airport එක රජයට අයිති වුණේ. දැන් මහතීර් මොහොමඩ්ලාව, ලී ක්වාන් යූ ලාව එකට තියලා ගේන්න කථා කරපු කට්ටිය අන්තිමට කළේ, ණය අරගෙන, ණය අරගෙන, සල්ලිත් අච්චු ගහලා, කාටවත් ඇහුම්කන් දෙන්නේ නැතුව තකතීරු විධියට වැඩ කරලා රට බංකොලොත් කරපු එක. එම නිසා කවුරු හරි කියනවා නම් මේක අවුරුදු 75ක ශාපය කියලා, ඒක පට්ටපල් බොරුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවුරුදු 75දී තමයි ඩී.එස්. සේනානායක මහත්මයා ගොවි ජනපද ව්‍යාපාර හැදුවේ, ලලිත් ඇතුලත්මුදලි මහත්මයා මහපොළ ශිෂ්‍යත්ව වැඩසටහන හැදුවේ, ඒ වාගේම ගාමිණී දිසානායක මහත්මයා මහවැලිය හදලා, වික්ටෝරියා, රන්දෙනිගල හදලා මුළු රටටම electricity දුන්නේ. මේ අවුරුදු 75 දී තමයි රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා ජනසවිය ගෙනාවේ; ඒ වාගේම නිවාස දසලක්ෂයේ වැඩසටහන ක්‍රියාත්මක කළේ. එසේම අදටත් දළ වශයෙන් ඩොලර් මිලියන 13,000ක අපනයන ආදායමක් එන ඇඟලුම් කර්මාන්තශාලා 200 හැදුවේත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා. ඒ වාගේම මේ අවුරුදු 75 ඇතුළත - 1971දී සහ 1989දී- තමයි මේ රට ලේ විලක් බවට පත් කෙරුවේත්. මේ අවුරුදු 75දී තමයි ජනතා විමුක්ති පෙරමුණ කෘෂිකර්ම ඇමතිකමයි, ධීවර ඇමතිකමයි, ග්‍රාමීය ආර්ථික ඇමතිකමයි, සංස්කෘතික ඇමතිකමයි අරගෙන කටයුතු කළේ. ඔවුන් එක සමුපකාරයක්වත් හැදුවේ නැහැ, එක මාළු factory එකක්වත් හැදුවේ නැහැ. ඒ වාගේම එක වැවක්වත් හදන්නේ නැතුව මේ රටේ ජනතාව ඇන්දුවා. 2005දී සුනාමි වංචාව සම්බන්ධයෙන් චෝදනා එල්ලවෙලා තිබියදී, චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුවෙන් ඇමතිකම් අරගෙන අනෙක් පැත්තට ගිහිල්ලා නැවතත් මහින්ද රාජපක්ෂ මැතිතුමාව ජනාධිපති කරන්න ඕනෑය කිව්වා. අද පොහොට්ටුවට සමහර ආර්ථික න්‍යායන් රනිල් වික්‍රමසිංහ මහත්මයා හරහා හෝ තේරුම් ගන්න පුළුවන්කම ලැබීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම ජනතා විමුක්ති පෙරමුණේ නායකයෝ ඉන්දියාවට ගිය එක ගැනත් අපි ස්තුතිවන්ත වෙනවා. අද අවුරුදු 22, 23 දරුවන්ට තේරෙන්නේ නැහැ, ඔවුන් ඉපදෙනකොටම ඔවුන්ගේ අනාගතය වැඩවර්ජනවලින්, උද්ඝෝෂණවලින් විනාශ කළේ මේ කණ්ඩායම බව. මේ රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ, මෙහෙම කරන්න ඕනෑ, අරහෙම කරන්න ඕනෑ කියලා අද පොහොට්ටුවේ කට්ටිය කෑ ගැහුවාට, 2001 දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කෝටි 45,000ක් යොදවලා "Regaining Sri Lanka" වැඩසටහන කරලා පාඩු ලබන රාජ්‍ය ආයතන රාජ්‍ය-පෞද්ගලික ආයෝජනවලින් ප්‍රතිව්‍යුහගත කරන්න හදනකොට මහ පාරට පැන්නේ මේ ගොල්ලෝ තමයි. ඒක විනාශ කළේ මේ ගොල්ලෝ තමයි. එදා ඒවා කළා නම්, අද මේ විපාකය නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මම ඔබතුමාට උදාහරණයක් දෙන්නම්. අපි තෙල් ගහනකොට IOC එකෙන් ගැහුවත්, ඒ වාගේම සිපෙට්කෝ එකෙන් ගැහුවත් එකම ගණන යන්නේ. ණයට තෙල් ගහන්නෙත් නැහැ, cash දීලා ගහන්නේ. හැබැයි, සිපෙට්කෝ එක බිලියන ගණන් පාඩුයි, IOC එක බිලියන ගණන් ලාභ ලබනවා. මෙන්න මේ ප්‍රශ්නය එදා අපි address කරනකොට තමයි අපට කිව්වේ, "අන්න, රටට, ජාතියට, ආගමට විරුද්ධ එවුන්. මේක අපේ රට, අපට ඕනෑ විධියට තමයි කරන්නේ" කියලා. ගේ ඇතුළට වෙලා ඕනෑම කෙනෙකුට චණ්ඩි පාට් දමන්න පුළුවන්. එළියට ගියාට පස්සේ තමයි ගුටි කන්නේ. ඒ වගේ දෙයක් තමයි අද අපේ රටට වෙලා තිබෙන්නේ. එම නිසා මේ යථාර්ථය තේරුම් ගන්න. ජනතාව අන්දන්න එපා.

දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? බදු බරින්, බඩු මිලෙන් මිරිකලා, බිල්වලින් මිරිකලා මේ ආණ්ඩුව ජනතාවගේ රීරි මාංස උරා බොන්නේ මොවුන්ට කිසිදු වැඩ පිළිවෙළක් නැති නිසායි. ඒ නිසා  බදු ආදායම විතරයි ඔවුන් රාජ්‍ය ආදායම බවට පත් කරගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට එක උදාහරණයක් දෙන්නම්. හෙණ ගහනවා වගේ බදු ගහලා, ගිය අවුරුද්දේ උපයන විට ආදායම් බද්ද තුළින් අපේක්ෂා කළේ රුපියල් බිලියන 100යි. නමුත් මේ වෙනකොට රුපියල් බිලියන 150ක් හොයලා තිබෙනවා. එම නිසා අපි පැහැදිලිවම කියනවා, රාජ්‍ය ආදායමට බලපෑමක් නොවෙන්න, උපයන විට ආදායම් බද්ද අනිවාර්යයෙන්ම සියයට 24 දක්වා, මේ රටේ විධායක නිලධාරීන්ට  ගහලා තිබෙන මේ බද්ද අඩු කරන්න පුළුවන් කියලා.  ඒ වාගේම බදු ආදායම රාජ්‍ය ආදායම බවට පත් කිරීම නිසා තමයි බඩු මිල මේ තරම් ඉහළට ගිහිල්ලා තිබෙන්නේ. එක ඍජු විදේශ ආයෝජනයක් ගෙනැල්ලා නැහැ, ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය දියුණු කරන්න මොකුත්ම කරලා නැහැ, අපනයන ආදායම වැඩි කරන්න කිසිම දෙයක් කරලා නැහැ.

අපේ රට තේ, පොල් හා රබර්වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,300ක් විතර සොයන කොට තමයි, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා ඇඟලුම් අපනයනය ගෙනැල්ලා ඇමෙරිකානු ඩොලර් මිලියන 13,000ක් අපනයන ආදායමට එකතු කළේ. අදත් ඒ සල්ලි නිසා තමයි, තෙල් ගේන්නේ, බෙහෙත් ගේන්නේ, ආහාර ද්‍රව්‍ය ගේන්නේ. දැන් ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා, අලුත් වෙළෙඳ පොළවලට යන්න ඕනෑයකියලා කයිය ගහනවා. 2022 අය වැය ලේඛනයෙන් තොරතුරු තාක්ෂණයට වෙන් කළේ රුපියල් මිලියන 50යි. මම දන්නේ නැහැ, ඒකෙන් computers කීයක් ගන්න පුළුවන්ද කියලා. අද ඉන්දියාව දිහා බලන්නකෝ. ඔවුන් අලුත් වෙළෙඳ පොළවලට ඇතුළු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාව තොරතුරු තාක්ෂණ වෙළෙඳ පොළෙන් අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 130ක් සොයනවා. දළ වශයෙන් ගත්තාම, ඒක මුළු සවුදි අරාබියම තෙල් අපනයනයෙන් සොයන ආදායම වාගෙයි. කෝ, අපි ඒ වෙළෙඳ පොළට ඇතුළු වෙලා තිබෙනවාද? Medical tourismවලට යොමු වෙලා තිබෙනවාද? මම නම් කියන්නේ කොළඹ නගරයේ පෞද්ගලික රෝහල් ඕනෑ තරම් හදන්න ඉඩ දෙන්න ඕනෑ කියලායි. එහෙම හදන්න දුන්නොත් තමයි, අපට මාලදිවයිනේ වෙළෙඳ පොළයි, දකුණු ඉන්දියාවේ වෙළෙඳ පොළයි ග්‍රහණය කරගන්න පුළුවන් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,  අපේ අපනයන ආදායම වැඩි කරලා, රාජ්‍ය ආදායම වැඩි කරගෙන, ඒ හරහා බදු අඩු කරන්න පුළුවන්. බදු අඩු කළොත් තමයි, බඩු මිල අඩු කරන්න පුළුවන් වෙන්නේ. වික්‍රමසිංහ ජනාධිපතිවරයාට ඒ ගැන කිසිම කැක්කුමක් නැහැ. රාජ්‍ය ඇමතිතුමා නම් කියයි. අපි අවුරුදු 20ක් හිටියා නේ, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්ක. එතුමා නොයෙක් සුරංගනා කථා කියනවා. හැබැයි, ආදායම වැඩි කළේ නැහැ. 2015 -2019 කාලයේදී ඇමෙරිකානු ඩොලර් බිලියන 11ක් ණයට ගත්තා. මහින්ද රාජපක්ෂ මහත්මයා ගත්ත ණය ගෙවන්න  ණය ගත්තා. අපි කරන්න ඕනෑ, ණය ගෙවන්න තවත් ණය ගැනීම

නොවෙයි. ආදායම වැඩි කර ගැනීමේ අලුත් ක්‍රමෝපායන් පාවිච්චි කිරීම හරහා තමයි, අපට බදු අඩු කරලා, බඩු මිල අඩු කරන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා, මේ ආණ්ඩුවට ඒක කරන්න බැරි නම්, අපි ඉදිරි මැතිවරණයකින් පස්සේ, ඒ අලුත් වෙළෙඳ පොළ ග්‍රහණය කරගැනීම අනිවාර්යයෙන්ම කරනවා. ඒ සඳහා මිත්‍රශීලී ආයෝජන ලැබෙන වාතාවරණයක් උදා කරන්න නම්, යම් කාලයකට වැඩ වර්ජන නවත්වන්න ඕනෑ. හේතුව, අපට ගොඩ එන්න ඕනෑ. මිලියන 22ක ජනතාවක් බඩගින්නේ ඉන්න, ළමයින්ට ඉස්කෝලේ යන්න බැරි වෙන, පෙළපොත් ටික ගන්න බැරි වෙන, පාසල් දරුවන්ට සපත්තු කුට්ටමක්, school bag එකක් ගන්න බැරි වෙන මේ අසරණ තත්ත්වයෙන් මිදෙන්න නම්, එවැනි වැඩ පිළිවෙළක් ගෙනියන්න ඕනෑ. එහෙම නැතුව මිනිස්සු රවටලා, බලය හුවමාරු කරලා, කටයුතු කරන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ, ලෝකය එක්ක සම්බන්ධ වෙලා, ලෝකයාගේ උදවු අරගෙන, ඒ වැඩ පිළිවෙළ කරන්න මේ කණ්ඩායමට බැහැ, ඒ අය ජනතාව ප්‍රතික්ෂේප කරලා තිබෙන්නේ. අපි ඒ වැඩ පිළිවෙළ ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலும் அமுனுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු දිලුම් අමුණුගම රාජ්‍ය ඇමතිතුමා.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාවේදීත් මේ ගැන පැහැදිලි කරන්නම්. ගරු මරික්කාර් මන්ත්‍රීතුමා කියපු කාරණා ගැන අහගෙන ඉන්න අය සමහර විට නොමඟ යන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ගිය අවුරුද්දේ ආයෝජන කිසිවක් ආවේ නැහැ නොවෙයි, ඉලක්කය තිබුණේ ඇමෙරිකානු ඩොලර් බිලියන එකයි. ගිය අවුරුද්දේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක්ම ආයෝජන ආවා. ඔබතුමා දන්නවා, ජනාධිපතිතුමා පත් වුණාට පසුව මුල් මාස හය තුළ, රටේ තත්ත්වය තිබුණේ කොහොමද කියලා. හැබැයි, අන්තිම මාස හයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක ආයෝජන ගෙනැල්ලා, අපි ගිවිසුම් අත්සන් කරලා දැන් ඒ ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. ඔබතුමා කියපු කාරණාවල ඇත්ත තිබෙනවා. නමුත් මොනවත්ම ආවේ නැහැ, කියන එක අසත්‍යයක්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියනවා නම්, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක ආයෝජන ආවා කියලා, මම ඒක පිළිගන්නම්. ඒ මුදල්, මුදල් හැටියට තවම පැමිණිලා නැතුව ඇති. ඒකයි මම කියන්නේ. මොකද, මේ වාගේ විශාල වැඩ කොටස් ගණනාවක් කරන්න තිබෙනවා. ඇත්ත වශයෙන්ම ජනාධිපතිතුමාට අපිත් යෝජනාවක් කළා. කොළඹ නගරයේ අක්කර 902ක් තිබෙනවා, වතු නිවාසවලට අයත්. ඒකෙන් අක්කර 300ක ගෙවල් හදලා, අක්කර 600ක් ආයෝජකයන්ට දෙන්න පුළුවන්. එතකොට විශාල මුදල් ප්‍රමාණයක් රටට ගේන්න පුළුවන්. අන්න ඒකයි මම යෝජනා කළේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 17ක කාලයක් තිබෙනවා.

[1.22 p.m.]

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)
First of all, Hon. Deputy Speaker, before I participate in this Debate, I would like to clarify some matters regarding the Amendment I proposed to the Penal Code. I presented the Penal Code (Amendment) Bill as a Private Members' Bill on the 04th of April, 2023. We took up the Second Reading of that Bill on the 13th of December, 2023. That Bill seeks to decriminalize the conduct of the LGBTQ community. I think we all are aware that Sections 365 and 365A of the Penal Code are the sections we propose to amend to decriminalize the conduct of the LGBTQ community. So, most of the members of that community are keen on knowing what is going on with regard to the Bill. Therefore, I would like to clarify the situation.

Last December, after the Second Reading of the Bill, it was referred to the Legislative Standing Committee chaired by the Hon. Deputy Speaker. After the prorogation of Parliament, a new Parliamentary Session started and the new Members for the Legislative Committee are due to be nominated. Afterwards, the Committee would nominate co-opted Members to consider that Bill. On the 13th of December, 2023, I requested the Secretary-General to take necessary steps regarding this Penal Code (Amendment) Bill. So, after the appointment of the Legislative Standing Committee, I think the co-opted Members from the Government and the Opposition would be named to consider the Bill. Thereafter, the Legislative Standing Committee would have a discussion and decide on the Bill and finally, it would be taken up in Parliament for its Third Reading. So, I believe that for the LGBTQ community and those who are interested in the Penal Code (Amendment) Bill to decriminalize the conduct of the LGBTQ community, this clarification is enough. At the same time, I would like to **table*** this letter requesting the Secretary-General of Parliament to expedite this whole process.

I heard and saw some of the interested parties accuse the Ministry of Justice, Prison Affairs and Constitutional Reforms saying that they have not given the necessary report on time. I must tell you that, as normally done in regard to any Private Members' Bill, if the relevant

---

***** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා]

Minister does not submit his report on the Bill within a six months' time, then I could move the Second Reading of the Bill. Sir, we have already passed that time period, the Bill is on the correct path and now, we have come to the latter part of the process. I believe, hopefully by March or April, without delaying the entire process, we could consider the Bill at the Legislative Standing Committee and report to Parliament. I would like to have the support of the Legal Draftsman, the Attorney-General's Department and at the same time, the support of the Ministry of Justice, Prison Affairs and Constitutional Reforms with their report, which is necessary for the legislative process of the Bill at the Legislative Standing Committee. So, that is where we are now and I believe that in the near future, we could pass the Bill and make it a law of this country.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනයේ මට පූර්වයෙන් කථා කළ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මස් කටු ගැන, කොඳු කඩා ගත්තු ඒවා ගැන නිරන්තරයෙන් කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව ප්‍රබලම කාලයේ මම සමහර අවස්ථාවල එතුමා එක්ක වාද විවාද කළා. අපේ ජනතාව අපට ඡන්දය දුන්නේ, එක රටක් - එක නීතියක් හදන්න. හැබැයි ඒ වෙලාවේ අපේ ආණ්ඩුවේ ඉඳලා දැන් විපක්ෂයේ වාඩි වෙලා ආණ්ඩුව විවේචනය කරන මන්ත්‍රීවරු එදා අපත් එක්ක හිට ගත්තා නම්, අපේ ආණ්ඩුව අදටත් ඒ විධියටම ඉන්නවා. ඒ නිසා කොඳු කඩා ගත්තු ඒවා ගැන, මස් කටු සුප්පු කරපු ඒවා ගැන කරුණාකර අපත් එක්ක කථා කරන්න එන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අදටත් පාවිච්චි කරන්නේ මගේ වාහනය. මට අදටත් පාර්ලිමේන්තුවෙන් වාහනයක් ලැබිලා නැහැ. මම පාර්ලිමේන්තුවේ වාහනයක් පාවිච්චි කරන්නේ නැහැ. අපි එහෙම වරප්‍රසාද අරගෙන නැහැ. 2022 අවුරුද්දේ අරගළය අවස්ථාවේ මැයි 9 වැනි දා අපේ ගෙවල්වලට ගහන්න සුමාන දෙකකට ඉස්සර වෙලා -ඒ කියන්නේ 2022 අප්‍රේල් 11වැනි දා වනකල්- මම අඩු තරමින් පොලිස් නිලධාරියෙකුවත් පාවිච්චි කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, නීතිඥ වෘත්තියේ යෙදෙන කෙනෙකු හැටියට මම දන්නවා, පොලිස් නිලධාරින් ඉතා අඩුයි කියලා; අධිකරණ ක්‍රියාවලියේ කටයුතු කල් යන්න එය විශාල වශයෙන් බලපානවා කියලා. එහෙම නම්, අප දැන් ආණ්ඩුවට සහයෝගය දෙන්නේ අපේ එල ප්‍රයෝජනවලටයි කියලා අපට ඇඟිල්ල දිගු කරන්න එන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් බොහෝදෙනා, පුංචි පුංචි වචන අල්ලාගෙන කෑ ගහනවා. "We are part of you" කියන්නේ, ඒ වාගේ එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "We are part of you" කියන්නේ, අපි ඔබ එක්ක ඉන්නේ කියන එකයි. අපට වචන අල්ලාගෙන ඕනෑ තරම් කථා කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ලොහාන් රත්වත්තේ මහතා (වැවිලි කර්මාන්ත හා මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லொஹான் ரத்வத்தே - பெருந்தோட்டக் கைத்தொழில் மற்றும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Lohan Ratwatte - State Minister of Plantation Industries and Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.*

**ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த)
(The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කලින් කිව්ව පරිදි වචන අල්ලාගෙන ඕනෑ තරම් කථා කරන්න අපට පුළුවන්. "We are part of you," කිව්වාම, අපි සහෝදරත්වයෙන් ඉන්නවා; අපි එකතු වෙලා ඉන්නවා; අපි එකට ඉන්නවා කියන්න පුළුවන්. අපට ඕනෑම වචනයක් එක්ක එහෙම හරඹ කරන්න පුළුවන්. නමුත් අපි ඇත්ත කථා කරමු. ඇත්තටම අපට මොකක්ද වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඔය කියන සිංහ සෙයියාවෙන් කෙළින් ඉන්න අපට පුළුවන්ද? ඉන්දියාවෙන් අවසානයේ හම්බ වෙච්ච ඩොලර් මිලියන 400, 500 තිබුණේ නැත්නම් අපට ජීවත් වෙන්න පුළුවන්ද? අපි යථාර්ථයට මුහුණ දෙන්න එපා යැ. අපට ජීවත් වෙන්න මුදල් නැතුව තිබියදී පිහිට වුණේ කවුද? ඇත්ත තමයි කථාව. සමහර විට විදේශ රටවල් ගණනාවකින් අපට නොයෙක් නොයෙක් බලපෑම් කරන්න පුළුවන්. හැබැයි, අපි අදටත් විශ්වාස කරනවා, සියලු ප්‍රධාන රාජ්‍යයන් හමුවේ නොබැඳි පිළිවෙතක් එක්ක අපි ඉස්සරහට යනවා කියලා.

දැන් මට මතක් වෙනවා ඉස්සර අප විපක්ෂයේ ඉන්න කොට 1990 ගිලන් රථ සේවය ගැන කිව්වේ මොනවාද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් ඒ ගැන දන්නවා ඇති. නමුත්, දැන් ඒ ගැන අගය කරමින් කථා කරනවා. විමල් වීරවංශ මහත්තයා, උදය ගම්මන්පිල මහත්තයා, නීතිඥයෙකු හැටියට මම -අපි ඔක්කෝම- දේශමාමක පිල නියෝජනය කරපු අය. එදා 1990 ගිලන් රථ සේවාව ගෙන ආ වෙලාවේ මොන තරම් භයානක බිල්ලෙක් මැව්වාද? "ඒකට ගේන්නේ ඉන්දියානු රියදුරෝ" කිව්වා. "ඒ උපකරණ සියල්ලෙන් ඉන්දියාවට රේඩාර් වදිනවා" කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔහොම කථා කියමින් වැඩ කළොත් එහෙම අපට මේ ලෝකයේ ජීවත් වෙන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අපි අදවත් තේරුම් ගන්න ඕනෑ, අපට තිබෙන තත්ත්වය ගැන. අපි ඉස්සර වෙලාම කෙළින් කටින් හිටගන්න

පුළුවන් තත්ත්වයට පත් වෙන්න ඕනෑ. එතකොට තමයි ඉදිරියේදී අපට අපේ රට ගැන කථා කරන්න පුළුවන් වෙන්නේ. ඒක තමයි ඇත්ත.

මම කියන්නේ නැහැ, කාටවත් දීන වෙන්න කියලා. අපි කවදාවත් ඔය කියන දීනත්වයට අත ඔසවන්නේ නැහැ. එහෙම අත ඔසවන්න අවශ්‍යතාවකුත් අපට නැහැ. අපි ආපහු දේශපාලනය කරනවාද නැද්ද කියන ප්‍රශ්නය අදාළම නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, මේ වෙලාවේ කවුද මේක භාර ගන්නේ? මට මතකයි, මේ පාර්ලිමේන්තුව සම්පූර්ණයෙන් වටලලා මේ පාර්ලිමේන්තුව අත්පත් කර ගන්න ෆැසිස්ට්වාදී දේශපාලන ව්‍යාපාර කොතරම් දුරට කැස කැවාද කියලා. ඒ අනුව බැලුවාම, අද සමහරුන් මැරිලා ඉපදිලා වාගේ කථා කරන මේ ස්වරූපය ගැන අපට පුදුම හිතෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඕනෑම දෙයක භයංකාරත්වයක් මවන්න පුළුවන්. අද ලෝකය ගත්තාම, ඔය කියන ආකාරයේ ස්වෛරීත්වයක් ද තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තාක්ෂණික දියුණුවත් එක්ක බැලුවාම අද අප කවුරුත් දන්නා කාරණයක් තමයි, රටවල් වශයෙන් වෙන් වෙලා සිටියත් ලෝකය කියන්නේ අද එකට ගන්න පුළුවන් ඒකකයක් කියන එක. තාක්ෂණයත් එක්ක අද අප සියලුදෙනා එකට බැඳිලායි ඉන්නේ. එහෙම තත්ත්වයක් තිබියදීත් අපි භයංකාරත්වයක් මවනවා, ඉන්දියානු විරෝධයක් මවනවා. අප විසින්ම බියට පත් වෙලා මේ ඇති කරගන්න හදන භයංකාරත්වය මොකක්ද කියන ගැටලුව අපට තිබෙනවා.

පසුගිය කාලයේ ඉන්දියානු ව්‍යාප්තවාදය ගැන ලොකුවට කියපු ජනතා විමුක්ති පෙරමුණත් අද ඒ පැවැති මතවාදය වෙනස් කරලා, ඉන්දියාවත් එක්ක එකට වැඩ කරන්න ඕනෑ කියන කාරණය පිළිගෙන තිබෙනවා.

ඉන්දියාව වේවා, චීනය වේවා, ඇමෙරිකාව වේවා, රුසියාව වේවා, යුරෝපා සංගමය වේවා, අපි මේ සියලු අයත් එක්ක එකට වැඩ කරන්නේ කොහොමද? මම හිතන විදියට, ඒ හැකියාව රනිල් වික්‍රමසිංහ මැතිතුමා ප්‍රකට කරලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයත් එක්ක වැඩ කරනකොට අපට සමහර නුපුරුදුකම්, ගැළපෙන්නේ නැතිකම් තිබෙනවා. ඒක අදටත් තිබෙනවා. හැබැයි අපි මේ වෙලාවේ එතුමා සමඟ වැඩ කරන්නේ වෙන මොනවත් නිසා නොවෙයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා අර්බුදයට නායකත්වය දීපු නිසායි. අද ඩොනල්ඩ් ලූ මැතිතුමා කියනවා, "ආර්ථික වශයෙන් දුබල බවට පත් වෙලා, බංකොලොත්භාවයෙන් ඉතාමත් ශීඝ්‍රයෙන් නැඟ ආ රාජ්‍යයකට උදාහරණයක් ගන්නවා නම් ඒ ලංකාව" කියලා. ඔය කියන තත්ත්වය උඩ, විශාල ආර්ථික පරිහානියකින් ඉතාම ඉක්මනින් ඔබ්බට ඒම සම්බන්ධයෙන් උදාහරණයකට ගන්න පුළුවන් සඵලම රට ලංකාව කියලා එතුමා කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ බංකොලොත්භාවයෙන් මේ තත්ත්වයට පත් වෙනකොට විශාල ගැටලු ඇති වුණු බව අපි පිළිගන්නවා. පූර්වයේ අපි සතුටු කළ, අපේ ජනතාවට සමහර වෙලාවට PAYE tax එක විශාල ප්‍රතිශතයකින් ගෙවන්න වුණු බව අපි පිළිගන්නවා. අපි කොහොමද මේ අර්බුදයෙන් ගොඩ එන්නේ? එතැනින් එහාට ගිහිල්ලා අපි Tax Identification Number එකක් හඳුන්වලා දුන්නා. ඒ සියල්ලම අලුත් දේවල්. අදේශපාලනික තීන්දු තීරණ අපි ගත්තේ. Tax Identification Number එකක් අපි කාටවත් පුරුදු නැහැ, හුරු නැහැ. Tax Identification Number එකක් ගැන කථා කරනකොට අපට භයක් තිබෙනවා අපිවත් tax උගුලට අහුවෙයිද කියලා. ලංකාවේ ජනතාවට බදු ගෙවීම සම්බන්ධයෙන් සාධාරණ යුතුකමක් ගැන ආකල්පයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බදු ගෙවිය යුතු විශාල ප්‍රමාණයක් බදු ගෙවන්නේ නැහැ. හැබැයි, අපි Tax Identification Number එකක් ගෙන ආ යුතුයි කියලා, ඒ වෙනුවෙන් පෙනී සිටිනවා. දීර්ඝ කාලයක්, PAYE tax එක සම්බන්ධයෙන් දේශපාලන වශයෙන් තීන්දු තීරණ අරගෙන, PAYE Tax එක කැපුවේ නැහැ. අද අපි ඒක කපනවා. නමුත් අපි ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා.

බොහොම ලේසියි විපක්ෂයට ගිහිල්ලා විවේචනය කරන්න, බොහොම ලේසියි විපක්ෂයට ගිහිල්ලා යෝජනා එක් කරන්න, බොහොම ලේසියි විපක්ෂයට ගිහිල්ලා කියන්න, "මෙන්න මේ විධියටයි අපි සහන සපයන්නේ, අපි මේ විධියටයි සහන සපයන්නේ" කියලා. "තමුන්නාන්සේලා මේ රට අරගෙන යන්නේ විශාල අගාධයකට" කියලා චෝදනා කරන්න බොහොම ලේසියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අගාධයේ තිබෙන රටක්, අමාරුවේ වැටිලා තිබෙන රටක් තුළින් අපේ අනාගත දේශපාලනය තීන්දු කරනවාට වඩා, අපේ දේශපාලන අනාගතයට මොකක්ද වෙන්නේ කියලා තීරණය කරනවාට වඩා ඒ අගාධයට වැටුණු රට ඔසවන්න යම් දායකත්වයක් දෙන්න පුළුවන් නම් ඒක තමයි නායකත්වය කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අර්බුදය හමුවේ පලා යාම නොවෙයි අර්බුදය හමුවේ තමන් කොච්චර දුරට සාර්ථකව මුහුණ දෙනවාද, ඒ අර්බුදය හමුවේ ජනතාවට නායකත්වය දෙන්නේ කොහොමද කියන ඒවායි වැදගත්. ඒ නායකත්වය හමුවේ තමයි නියම නායකයන් කවුද කියලා තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. අද අපි සියලුදෙනාම ආණ්ඩුවේ මන්ත්‍රීවරු හැටියට අපි ඉන්න DCC එකේ වැඩ කරනවා. අපට පුළුවන් හැම මුදලක්ම ජනතාවට අරගෙන දෙන්න අපි උත්සාහ කරනවා. ඒ මුදල් වඩා ඵලදායී ලෙස ජනතාවට ලබා දෙන්න අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිගින් දිගටම විපක්ෂය අපව විවේචනය කරනවා, "අපි බලයට ආවාම මෙහෙම කරනවා, තමුන්නාන්සේලා යන්නේ වැරදි පාරේ" කියලා. එවැනි විවේචන කරනවාට වඩා අපි මේ වෙලාවේ කළ යුත්තේ මේ රට තිබෙන තැනින් උඩට ගේන එක. අපි කවුරුත් දන්නවා නේ පසුගිය කාලයේ ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සපුරා ගන්න බැරිව ජනතාව කුපිත වෙලා හිටියේ. අපට පුළුවන්කමක් ලැබුණේ නැහැ ඒ සඳහා අවශ්‍ය නායකත්වය දෙන්න. එදා ජනතාවගේ සමහර අවශ්‍යතා වුණේ මුදල් හදල් වියදම් වෙන දේවල් නොවෙයි. මම මුලින් ප්‍රකාශ කළා වාගේ "එක රටක්, එක නීතියක්" ඇති කරන්න ජනතාව බලාපොරොත්තු වුණා. සෑම දෙනාම, -මුස්ලිම් ජාතිකයා, සිංහල ජාතිකයා, දමිළ සහෝදරයා අපි සියලුදෙනාම- එක පෞද්ගලික නීතියකට නතු කරන්න මුදල් යන්නේ නැහැ. විශාල ජන වරමක් ලැබුණා, අපට ඒක ඇති කරන්න. හැබැයි, අපට කරන්න බැරි වුණා. අද අපි නොයෙකුත් පෞද්ගලික නීතිවලට වෙන් වෙලා. අවුරුදු 12කට වැඩි මුස්ලිම් දැරියකට දෙමාපිය කැමැත්ත මත විවාහ වෙන්න පුළුවන් නීතිය තවම වෙනස් වෙලා නැහැ. අපි උඩරට විවාහ නීතිය වෙනස් කළා කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සලකලා. හැබැයි, මුස්ලිම් කාන්තාවට බලපාන්නේ අපේ සාමාන්‍ය කාන්තාවට බලපාන සාමාන්‍ය නීතිය නොවෙයි.

ඒ අයට වෙනම අධිකරණ පද්ධතියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි මේ එකම රටේ මනුෂ්‍යයන්ට විවිධ ආකාරයෙන් බලපාන නීති? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ප්‍රතිසංස්කරණ කරගෙන යන වෙලාවේ මම මේ යෝජනාව කරන්න කැමැතියි. පොහොට්ටුවේ මන්ත්‍රීවරයෙකු හැටියට මට ජනතාව බලය දුන්නේ, "එක රටක් - එක නීතියක්" ගෙනෙන්න කියන කාරණය මත. දිගින් දිගටම මම පෙනී සිටියේ ඒ කාරණය මතයි. මම හිතනවා, දියුණු කිසිම රටක වර්ගවාදය, ආගම්වාදය අනුව වෙන් කරලා සකස් කරපු නීති පද්ධතියක් නැහැ කියලා. එම

[ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා]

නිසා, විපක්ෂයට ගිහින් ඉන්න අපේ සහෝදර මන්ත්‍රීවරුන්ගෙන් මම මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. අපි දැන්වත් එකතු වෙලා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට කියමු, "එක රටක් - එක නීතියක්" කියන සංකල්පය ක්‍රියාත්මක කරන්න කියලා. පුද්ගල නීති සියල්ල අවසන් කරලා, එක සාමාන්‍ය නීතියකට මේ රටේ සියලු මනුෂ්‍ය ප්‍රජාව නතු කරන්න කියන ඉල්ලීම අපි එකතු වෙලා කරමු.

පසුගිය කාලයේ අපි පාර්ලිමේන්තුව තුළ ඉතා වැදගත්, ඵලදායි අණපනත් ගණනාවක් සම්මත කළා. දූෂණ විරෝධී පනත් සම්මත කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු අපි යාවත්කාලීන කළා. මහ බැංකුවට අදාළව Parliamentary Budget Office එකක් පිහිටුවීමට අපි පනතක් ගෙනාවා. එම නිසා මම මේ වෙලාවේ ඉල්ලනවා, අපි සියලුදෙනා බෙදිලා වෙන් වෙලා ඉන්නවාට වඩා එකතු වෙලා මේ කටයුත්ත කරමු කියලා. අපි ඔක්කෝම කැමතියි මුස්ලිම් දැරියකට අවුරුදු 18 වනතෙක් නිදහසේ ඉගෙන ගන්න ලැබෙනවා නම්. අපි කවුරුත් කැමතියි තේසවලමෙයි නීතිය වාගේ කාරණා නිසා අපි බෙදිලා වෙන් වෙලා ඉන්නවාට වඩා, උඩරට නීතිය වාගේ කාරණා නිසා අපි බෙදිලා වෙන් වෙලා ඉන්නවාට වඩා, එක සාමාන්‍ය නීතියක් යටතේ අපි ඔක්කෝටම කටයුතු කරන්න පුළුවන් නම්. ඒක තමයි වෙන්න ඕනෑ දේ. "එක රටක් - එක නීතියක්" වෙනුවෙන් අපි සියලුදෙනාටම එක්කහු වෙන්න පුළුවන් නම් මේක හොඳ අවස්ථාවක්. ඒ සඳහා මම ආරාධනා කරනවා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, අද විපක්ෂයේ වාඩි වෙලා ඉන්න 30ක්, 35ක් පමණ වන ආණ්ඩු පක්ෂයෙන් ඉවත්ව ගිය අපේ මන්ත්‍රීවරුන්ටත්. මේ කාරණය වෙනුවෙන් තමයි පොහොට්ටුව ලකුණට ඡන්ද ලැබුණේ. එම නිසා මම ඒ අයටත් ආරාධනා කරනවා, ගරු ජනාධිපතිතුමාට ඒ බල කිරීම කරන්න කියලා. අපිත් ආණ්ඩුවේ ඉඳගෙන ගරු ජනාධිපතිතුමාගෙන් ඒ ඉල්ලීම කරනවා. "එක රටක් - එක නීතියක්" සංකල්පය ක්‍රියාත්මක කරන්න මුදල් වැය වෙන්නේ නැහැ. ඒ වෙනුවෙන් වැය කළ යුත්තේ ශ්‍රමය පමණයි. ඒ සඳහා අපි සියලුදෙනා එක්කහු වෙලා ජනතා අභිලාෂය, අපි ජනතාවට දුන්න ඒ පොරොන්දුව ඉෂ්ට කරන්න මේ පාර්ලිමේන්තු කාලය තුළ අපි සියලුදෙනා එක්කහු වෙලා වැඩ කරමු කියන කාරණය මතක් කරමින්, මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.38]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනත් කෙටුම්පත් කිහිපයක් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ මම විශේෂයෙන්ම මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා, අපේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සිදු වන අසාධාරණයක් ගැන. එදා යහ පාලන ආණ්ඩුව කාලයේ විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතුවලට සියයට 15ක බැංකු පොලියක් ලබා දෙන්න කටයුතු කළා. ඒ වැඩිහිටියෝ ඒ ලැබුණු සියයට 15ක බැංකු පොලියෙන් තමයි ජීවත් වුණේ. සමහර විට තැන්පත් කළේ ඒ අය විශ්‍රාම ගත් විට හම්බ වුණු gratuity එක වෙන්න පුළුවන්, වෙනත් දීමනාවක් වෙන්න පුළුවන්. ඒ මුදල් බැංකුවේ තැන්පත් කරලා එයට ලැබුණු සියයට 15ක් වූ පොලියෙන් ඒගොල්ලන්ගේ බෙහෙත් හේත් අරගෙන, දරුවන්ට ප්‍රශ්නයක් නොවන විධියට ඔවුන්ට බරක් නොවන විධියට ජීවත් වුණා. නමුත්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වුණාට පසුව රටේ ඇති වෙච්ච ආර්ථික අර්බුදයත් එක්ක ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ඉතිරිකිරීම්වලට ලැබුණු පොලිය වර්තමානය වනවිට සියයට 9, 10 දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ අය අද ඉතා අමාරුවෙන් තමයි අවශ්‍ය බෙහෙත් ටික අරගෙන, ඕනෑ එපාකම් ටික ඉටු කර ගන්නේ. ඊළඟට තිබෙන ප්‍රශ්නය මේකයි. ඒ අයට ලැබෙන ඒ පොලියෙන් සියයට 5ක වාගේ tax එකකුත් අය කරනවා. ලැබෙන පොලී ආදායමෙනුත් සියයට 5ක tax එකක් අය කරනවා කියන්නේ, ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ වැඩක්. පොලියත් අඩු වෙලා; ලැබෙන පොලී ආදායමෙනුත් සියයට 5ක tax එකක් අය කරනවා. ගරු දොලවත්ත මන්ත්‍රීතුමාත් මේ සම්බන්ධව කථා කළා.

දැන් බදු ෆයිල් එකක් අරින්න කියලා TIN එකක් ගන්න කියලා වැඩ පිළිවෙළක් හඳුන්වා දී තිබෙනවා. හැබැයි, එම අංකය යටතේ බදු අය වනකොට ආපහු බැංකුවෙන් tax එකක් අය කරන්න ඕනෑ නැහැ. තැන්පතුවලට බැංකුවෙන් පොලිය ලැබෙනකොට tax එකක් අය කරනවා. අපි ඇහුවාම කියනවා, ලැබෙන පොලී ආදායම රුපියල් ලක්ෂයකට වඩා අඩු නම් කපන මුදල ආපහු ගන්න පුළුවන් කියලා. නමුත්, එහෙම ගත්තු කෙනෙක් නැහැ. එහෙම ගන්න ක්‍රමවේදයක් නැහැ. ගන්න පුළුවන්, ආපහු දෙනවා කිව්වාට ගත්තු කෙනෙකුත් නැහැ; පහසුවෙන් ගත හැකි ක්‍රමවේදයකුත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලියාපදිංචි වෙලා TIN එකක් ලබා ගත්තාම බැංකුවට ඒ සල්ලි ටික එකතු වනවා. එක එක්කෙනාගේ TIN එක අනුව වර්ෂයක් ගණනේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට තොරතුරු ලැබෙනවා. එතකොට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පුළුවන් රුපියල් ලක්ෂයට වැඩි වැටුපක් ලබන අයගෙන් tax එක අය කරන්න. TIN එක අනුව වැටුපෙන් අය කර ගන්න පුළුවන්. ඒ ක්‍රමවේදයට අපේ අකමැත්තක් නැහැ. එහෙම අය කර ගන්න පුළුවන්කම තිබෙද්දී මාසිකව තැන්පතුවලට ලැබෙන පොඩි පොලියට සියයට 5ක tax එකක් අය කරන එක ඉතාම අසාධාරණයි. දැන් TIN එකක් හඳුන්වා දීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට බදු මුදලක් ලැබෙනවා නම්, ඇයි තැන්පතුවලින් සියයට 5ක් කපන්නේ? අහිංසක මිනිහෙකුට රුපියල් 25,000ක් හෝ රුපියල් 50,000ක් පොලිය වශයෙන් හම්බ වුණා කියමුකෝ. ඉතින්, රුපියල් ලක්ෂයට වඩා අඩුයි නේ. ඒකෙන් කපපු සියයට 5 ගන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගිහිල්ලා කොළ පුරවලා රස්තියාදු වෙන්න ඔහුට පුළුවන්ද?

"TIN" එක හඳුන්වා දුන්නා නම්, ඒක ක්‍රියාත්මක වෙනවා නම් පොලිය ගෙවද්දි සියයට 5ක tax අය කරන්නේ ඇයි කියන කාරණය ගැන අපි ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා. මුදල් ඇමතිවරයා සහ මුදල් රාජ්‍ය ඇමතිවරු මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න කියන එකත් අපි විශේෂයෙන් කියනවා.

ආර්ථික අර්බුදයක් ඇති වෙලා මේ රට බංකොලොත් වෙලා තියෙද්දී මේ ආර්ථික අර්බුදයට පිළියමක් වශයෙන් සහ රට යථා තත්ත්වයට ගොඩනැඟීම සඳහා රජය කරන්නේ මොනවාද? මාසිකව වැටුපක් ගන්නා අයගෙන් තමයි බද්ද අය කරන්නේ. එහෙම නැත්නම් එදිනෙදා ආහාරපානවලට සියයට 18ක VAT පනවලා ඒ ආහාරපානවලින්; එදිනෙදා අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවලින් තමයි බද්ද අය කරන්නේ. මාසයේ පඩි ගන්න අයගෙන් සහ මේ රටේ තිබෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය පරිභෝජනය කරන සාමාන්‍ය මිනිස්සුන්ගෙන් තමයි රාජ්‍ය ආදායම හදන්නේ. යම් කොටසක් බදු ගෙවන ජනතාවගෙන් අය කරනවා. නමුත් රජය රාජ්‍ය ආදායම හදන්න target කරලා තිබෙන්නේ පෞද්ගලික බදු ආදායම. ඒ නිසා අපි කියනවා, මුදල්

අමාත්‍යාංශය වශයෙන් වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැන මීට වඩා උනන්දු වෙන්න ඕනෑ, මීට වඩා හොයන්න ඕනෑ කියලා.

මේ රටේ නාස්ති වෙන දේවල් කොච්චර කරනවාද? පරිසර අමාත්‍යාංශයේ වාර්තා අනුව බැලුවොත් දිනකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 938ක් එළියට එනවා. ප්ලාස්ටික් කියන්නේ ලංකාවේ නිෂ්පාදනයක් නොවෙයි, පිටරටින් ආනයනය කරන එකක්. ඩොලර්වලින් තමයි ප්ලාස්ටික් ගෙනෙන්නේ. දවසකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 938ක් පරිසරයට විසි කරනවා. මේ විසි කරන එකෙන් ආපහු දිනකට ටොන් 300ක් එකතු කරගන්නවා. මේකෙන් ටොන් 34ක් දවසකට ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරනවා. දිනකට පරිසරයට අවිධිමත් ලෙස ප්ලාස්ටික් ටොන් 638ක් එකතු වෙනවා. ඒ අවිධිමත් විධියට දවසකට එකතු වෙන ප්ලාස්ටික් ටොන් 638න් දවසකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය වශයෙන් ටොන් 8.45ක් ජල මූලාශ්‍ර වන වැව්වලට, ගංගාවලට, මහ මුහුදට යනවා. ඒ වාගේම, යම් යම් පුද්ගලයන් විසිනුත් තමන්ගේ ප්‍රදේශය තුළට දවසකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 139ක් විසි කරනවා. මිනිස්සු ප්ලාස්ටික් පුච්චනවා. ප්ලාස්ටික් පුච්චන එක වැරදියි කියලා රුපියල් 15,000ක දඩයක් පමුණුවා තිබෙනවා. මොකද, ශ්වසනයේදී මේ පුච්චපු දුම ආශ්වාස ප්‍රශ්වාස කරනකොට cancers ඇති වෙනවා, නොයෙකුත් ලෙඩ හැදෙනවා. නමුත් අපේ රටේ මිනිස්සු දවසකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 419.47ක් -ටොන් 420ක්- පුච්චනවා. ප්ලාස්ටික් අපද්‍රව්‍ය ටොන් 70ක් නීතිවිරෝධී ලෙස අවට පරිසරයට විසි කරනවා. මෙවැනි තත්ත්වයක් තියෙද්දි ප්ලාස්ටික් කියන දේ අවම කරගන්න පුළුවන් නම් ඉතාම හොඳයි. අවශ්‍ය දේට විතරක් ඒවා යොදාගත්තාට කමක් නැහැ.

ප්ලාස්ටික් සම්බන්ධයෙන් තිබෙනවා, 4R කියලා සංකල්පයක්. ඒ අනුව, reuse කරන්න ඕනෑ; නැත්නම් භාවිතයට ගන්න එපා, භාවිතයට ගන්නවා නම් පුළුවන් තරම් අවම ප්‍රමාණයෙන් ගන්න; එහෙම නැත්නම් ප්‍රතිචක්‍රීකරණයට යන්න වැනි දේවල් එම සංකල්පය තුළ තිබෙනවා. ඒ concepts ටික පිළිගන්න පුළුවන් නම්, රුපියල් කෝටි ගණනක්, ඩොලර් මිලියන ගණනක් වෙන රටවලට පූජා කරමින් මේ ප්ලාස්ටික් ගන්නේ මොකටද? ප්ලාස්ටික් ලංකාවේ නිෂ්පාදනයක් නොවෙයි. මුදල් අමාත්‍යාංශයට මේ ගැන හිතන්න පුළුවන් නම් අපිට මීට වඩා ඩොලර් ප්‍රමාණයක් ඉතුරු කරගන්න පුළුවන් වෙනවා. ඊළඟට. PET plastic ගත්තොත්, වසරකට එම බෝතල් හදන්න ප්ලාස්ටික් ටොන් 1,900ක් විතර ආනයනය කරනවා. ඒ සඳහා රුපියල් කෝටි 875ක් වියදම් කරනවා. ඩොලර් මිලියන 26ක් වියදම් කරලා PET plastic ගෙනැල්ලා විසි කරන ඒවා එකතු කරගන්නේ බොහොම පොඩි ප්‍රමාණයක්. නමුත් මාසයකට ප්ලාස්ටික් ටොන් 800ක් පරිසරයට මුදා හරිනවා. අපි ඒ ටික එකතු කරගන්නේ නැතුව මෙන්න මේ වාගේ filaments රටින් ගෙන්වනවා. ප්ලාස්ටික් බෝතල්වලින් තමයි ප්ලාස්ටික් කෙඳි හදන්නේ. කොසු සෑදීම වාගේ දේවල්වලට පාවිච්චි කරන කෙන්ද හදන්නේ විසි කරන ප්ලාස්ටික් බෝතල්වලින්. හැබැයි මේ කෙඳි රටින් ගෙන්වන්නේ ඇයි? මම කියන්නේ මේ වාගේ දේවල් ගැන අපි හිතන්න ඕනෑ කියන එකයි. මේ රටේ කරන නාස්තිය ගැන අපි හිතන්න ඕනෑ. අපි පිටරටින් ප්ලාස්ටික් කෙඳි ගේනවා. ඒ සඳහා යන මුදල බැලුවොත්, ඩොලර් මිලියන 1.9ක වටිනාකමින් යුක්ත ප්ලාස්ටික් කෙඳි රටින් ගෙනෙනවා.

අපේ කසළ ටික, ප්ලාස්ටික් ටික මුහුදුවලයි, ගංගාවලයි, ඇළ දොළවල්වලයි, වතුවලයි -රටේ හැම තැනම- තිබෙද්දී, ඒවා එකතු කරගන්න වැඩ පිළිවෙළක් හදන්නේ නැතුව ඩොලර් මිලියන 1.9ක් දීලා පිට රටින් ප්ලාස්ටික් කෙඳි ගේනවා. මාසයකට ප්ලාස්ටික්වලින් හදපු කොහු ඉදල් විතරක් කන්ටේනර් ගණනාවක් ගෙන්වනවා. බදු අය කිරීම ම නොවෙයි අපි කළ යුත්තේ. මේ වාගේ දේවල් ගැන අවධානය යොමු කළොත්, අපේ රටෙන් ඩොලර් එළියට යන එක නවත්වා ගන්න පුළුවන්. Filaments ගැන කිව්වොත්, ඒවා ආනයනය කිරීම සඳහා ඩොලර් මිලියන 1.9ක් පමණ වැය වෙනවා. අපේ රටේ කුණු ගොඩවල්වල විශාල ප්ලාස්ටික් ප්‍රමාණයක් තිබෙද්දී, ඇළ දොළවල්වල විශාල ප්ලාස්ටික් ප්‍රමාණයක් පාවෙද්දී, වර්ෂයකට ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඇතුළු විසි කරන සුන් බුන් විතරක් මිලියන 3ක ප්‍රමාණයක් මේ රටට ආනයනය කරනවා. මේවා අපේ රටේ තිබෙන දේවල්. අපේ රටේ තිබෙන දේ අපි රැකගන්නේ කොහොමද, අපේ රටේ තිබෙන දේවල්වලට අපි value එකක් දෙන්නේ කොහොමද, අපේ රටේ ඩොලර් ටික රැක ගන්නේ කොහොමද කියලා අපි මීට වඩා පුළුල්ව හිතන්න පටන් ගත්තොත්, ජනතාවගෙන් මේ විධියට බදු අය කරගන්න ඕනෑ නැහැ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරලා, අපේ රටේ ඩොලර් ටික ඉතුරු කරලා, මුදල් නාස්තිය අවම කරලා, ජනතාවගෙන් අය කරන බදු ප්‍රමාණය අඩු කරන්න කියලා මම අවසාන වශයෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නාලක ගොඩහේවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.48]

**ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා**
(மாண்புமிகு (கலாநிதி) நாலக்க கொடஹேவா)
(The Hon. (Dr.) Nalaka Godahewa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් පනත් සම්බන්ධයෙන් තිබෙන සාකච්ඡාවකට සහභාගි වෙන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. ගොඩක් වෙලාවට මේ රටේ සිද්ධ වෙච්ච දේවල්වලට, වැරැදිවලට ජනතාව දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කරනවා; චෝදනා කරනවා. හැබැයි, ඔවුන්ට අමතක වෙන දෙයක් තමයි, දේශපාලනඥයන් වාගේම මේ රටේ මුදල් පාලනය කරන, මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය කරන මහ බැංකුවේ, මහා භාණ්ඩාගාරයේ සිටින ප්‍රධාන පෙළේ නිලධාරිනුත් මේවාට විශාල වශයෙන් වගකියන්න ඕනෑ කාර්යභාරයක් කර තිබෙනවා කියන එක. අපට මතකයි, 2010-2015 කාලයේ මේ රටේ පිටුපසින් ඉඳගෙන ආර්ථිකය කළමනාකරණය කරපු අදිසි හස්තයක් ගැන. ඒ ගැන ආණ්ඩු පක්ෂය වාගේම විපක්ෂයත් කථා කළා.

2015න් පස්සේ යහ පාලන - Good Governance - ආණ්ඩුව බලයට පත් වුණා. "යහ පාලනය" කියන සංකල්පය මාස දෙක තුනක් යන්න කලින් පොළොවේ ගහලා, කුඩු පට්ටම් කරලා දැම්මේ ඒ වෙලාවේ මහ බැංකුවට පත් වෙලා ආපු මහ බැංකු අධිපතිවරයා. ලංකා ඉතිහාසයේ විශාලතම සුදු කරපටි හොරකම, මහ බැංකු බැඳුම්කර කොල්ලය ඒ අවස්ථාවේ සිද්ධ වුණා. 2015-2019 කාලයේ තමයි, මේ රටේ වැඩිම ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණයක් ගත්තේ. ඒ, බිලියන 12.5ක්. ඒ ගැන තර්ක ඉදිරිපත් කරනකොට අපේ සහෝදර මන්ත්‍රීවරු කිව්වා, ඒවා ගන්න සිදුවුණේ ණය ගෙවීම සඳහා කියලා. ණය ගෙවීම සඳහා ඒවා ගන්න සිද්ධ වුණාට වඩා වැඩි හේතුවක් එතැන තිබෙනවා. ඒ තමයි, ඒ කාල සීමාව තුළ ආදායම් වැඩි කරගෙන ඒ ණය ගෙවීම සඳහා අපි අසමත් වීම. 2015-2019 කාලයේ අපනයන වර්ධනය ගත්තොත්, අවුරුද්දකට සියයට 1.6ක අපනයන වර්ධන වේගයක් තමයි තිබුණේ. සියයට 1.6ක වාගේ අපනයන වර්ධන වේගයකින් ඒ ණය පියවාගන්න බැරිවුණු නිසා තමයි ඒ විධියට ණය ගන්න සිදුවුණේ.

ඊටපස්සේ -2019 දී- ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව බලයට පත් වුණා. ආර්ථිකයේ කඩා වැටීම

[ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා]

සම්බන්ධයෙන් ඒ ආණ්ඩුවේ හිටපු මහ බැංකු අධිපතිවරු දෙදෙනෙකුම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වැරැදිකරුවන් කර තිබෙනවා. හැබැයි, අපි එක කාරණයක් කියන්න ඕනෑ. ආර්ථිකයේ කඩා වැටීම සම්බන්ධයෙන් ඔවුන් පමණක්ම වැරැදිකරුවන් වන්නේ, ඊට පෙර හිටපු අයට - උදාහරණයක් වශයෙන් සුදුකරපටි හොරකම කරපු අයට, ණය ගත්ත අයට- විරුද්ධව චෝදනා ඉදිරිපත් වුණේ නැති නිසායි. ඒ අවස්ථාවේ එම පුද්ගලයන්ගේ නම් ටික ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වුණා නම්, සමහර විට ඔවුනුත් වැරැදිකරුවන් වශයෙන් නම් කරන්නට ඉඩ තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට වර්තමාන මහ බැංකු අධිපතිවරයා සහ මහා භාණ්ඩාගාර ලේකම්වරයා පත් වුණා. ඔවුන් ආපු ගමන් මොකද කළේ? ඔවුන් පත්වීම් ලබා දවස් 3ක් යන්න කලින් මේ රට බංකොලොත් කියලා ප්‍රකාශ කළා. අඩු ගණනේ ඒ ගැන පාර්ලිමේන්තුවටවත් දැනුම් දුන්නේ නැහැ. ඒක හරි දෙයක් ද, වැරැදි දෙයක් ද, කියන එක පිළිබඳව මේ රටේ විවාදයක් තිබුණා. මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා මේ පාර්ලිමේන්තුවේ කමිටුවකට ඇවිල්ලා කිව්වා, රට බංකොලොත් කියලා අපි කිව්වේ නැහැ කියලා. ඒ කියන්නේ ඔහුගේ හදවත දන්නවා, බංකොලොත් බව ප්‍රකාශ කිරීම නිසා අපේ රටට හානියක් සිදු වෙලා තිබෙනවා කියලා. ඒ වාගේම වර්තමාන මහ බැංකු අධිපතිවරයා විසින් පසුගිය අවුරුදු දෙක තිස්සේ ගෙන ගිය වැඩ පිළිවෙළ දිහා බැලුවොත්, එය මේ රටේ මහා විනාශයක් ඇති කරපු වැඩ පිළිවෙළක් කියන එක මම පැහැදිලිවම කියනවා.

මොකද මහ බැංකු අධිපති කියන තනතුරට ආපු වෙලාවේ ඉඳන්ම ඔහුගේ ප්‍රතිපත්තියක් තිබුණා, උද්ධමනය පාලනය කරන්න, ණය පොලී අනුපාත - interest rates - ඉතා ඉහළ මට්ටමක තබාගන්න. ඔහු පැහැදිලිවම, විවෘතවම කිව්වා, මේ පොලී අනුපාත ඉහළ මට්ටමක තබාගන්නවා, එහෙම තමයි උද්ධමනය පාලනය කරන්නේ, එසේ කිරීම සඳහා ආර්ථිකය සංකෝචනය කරන්න ඕනෑ කියලා. වැරදීමක් නොවෙයි, එය පැහැදිලිවම කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය සංකෝචනය කිරීම සඳහා ඒ ආකාරයට පොලී අනුපාත ඉහළ මට්ටමක තබා ගැනීම නිසා තමයි අද මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්පූර්ණයෙන්ම කඩා වැටිලා තිබෙන්නේ. මම පැහැදිලි කරන්නම්, ඒක වෙන්නේ කොහොමද කියලා. මේ මහ බැංකු අධිපතිවරයා මේ විධියට පොලී අනුපාත ඉහළට ගෙනියන්න කලින් මේ රටේ තිබුණේ තනි ඉලක්කමේ පොලී අනුපාතයක්. එතකොට ඒ තනි ඉලක්කමේ පොලී අනුපාතයට ණය ගත්ත ව්‍යාපාරිකයන්ට පොලී අනුපාත වැඩි කළාම මොකක්ද වුණේ? අපි හිතමු, සියයට 9ක, සියයට 10ක පොලී අනුපාතයකට ණයක් ගත්ත ව්‍යාපාරිකයෙකුට එක පාරටම පොලිය සියයට 20ට, සියයට 25ට වැඩි කළාම ඒ ව්‍යාපාරිකයා ව්‍යාපාරය කරගෙන යන්නේ කොහොමද කියලා. ඔහුට එම ව්‍යාපාරය කරගෙන යන්න බැහැ. මට ඊයේ-පෙරේදා ව්‍යාපාරිකයෙක් කිව්වා, ඔහුට අවුරුද්දක් තුළ රුපියල් මිලියන 400ක් පොලිය ගෙවන්න තිබුණා, නමුත් පොලී අනුපාත වැඩි කිරීම නිසා ඒ අවුරුද්ද තුළ රුපියල් මිලියන 1,200ක් පොලිය ගෙවන්න වුණා කියලා. එතකොට කොහොමද, ඔහු ව්‍යාපාරය කරන්නේ? කරන්න බැහැ. ඔහු ලොකු ව්‍යාපාරිකයෙක්. ලොකු ව්‍යාපාරිකයන්ට පමණක් නොවෙයි, මේක ස්වයං රැකියා කරන මනුස්සයාට පවා බලපානවා. බොහෝ වෙලාවට ස්වයං රැකියා කරන අය උදේට ණයක් අරගෙන මොකක් හෝ ව්‍යාපාරයක් කරලා හවසට තමයි ඒ ණය ගෙවන්නේ. එතකොට මේ වාගේ අධික පොලියකට ණය ගන්න සිද්ධ වුණාම ඒ මිනිස්සුන්ට එම ව්‍යාපාරය කර ගන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා තමයි මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බරපතළ ලෙස පසුගිය කාලයේ කඩා වැටීමකට ලක් වුණේ. අද ගණන් බලා තිබෙනවා, ඒ ක්ෂේත්‍රවල ඉන්න අය අපට කියලාත් තිබෙනවා, ව්‍යාපාර ලක්ෂ ගණනක් කඩා වැටිලා තිබෙන බව. සමහර ඒවා සම්පූර්ණයෙන්ම වහලා දාලා. සමහර ව්‍යාපාර කරගෙන යන්න බැරිව අල්ලාගෙන ඉන්නවා, මොකක්ද ආර්ථිකයට වෙන්නේ කියලා බලාගෙන. එතකොට මේ ව්‍යාපාර ආයෙත් ගොඩ ගන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ව්‍යාපාරිකයෙක් කියන්නේ ඉතාම වටිනා පුද්ගලයෙක්. මේ මුළු රටටම ව්‍යවසායකයන් දෙලක්ෂ පණස්දාහකට අඩු සංඛ්‍යාවක් තමයි ඉන්නේ. ව්‍යවසායකයෙක් නිකම් හදන්න බැහැ. බොහොම අමාරුවෙන්, බොහොම උත්සාහයෙන් තමයි ඒ මිනිස්සු උඩට එන්නේ. ඒ මිනිස්සුන්ට මේ විධියට ගහලා, වට්ටලා ඊට පස්සේ බැංකු පද්ධතිය හරහා ඒ මිනිස්සුන්ගේ දේපළ විකුණා දානවා නම්, වෙන්දේසි කරලා දානවා නම්, පරාටේ නීතිය ක්‍රියාත්මක කරනවා නම්, ඒක මොන තරම් ලොකු අපරාධයක්ද? එතකොට මේ මහ බැංකු අධිපතිවරයා අද පරාටේ ක්‍රමයට දේපළ විකිණෙන ව්‍යාපාරිකයන් ගැන කිසිම අනුකම්පාවක් දක්වන්නේ නැහැ. ඊයේ -පෙරේදා webinar එකකට ඇවිල්ලාත් ඔහු විනාඩි 10ක් ඉඳලා කථා කරලා නැඟිටලා යනවා. එහෙම කරන්න පුළුවන්ද, මහ බැංකු අධිපතිවරයෙකුට? මේ ප්‍රශ්නයවත් ඔහු තේරුම් ගන්න ඕනෑ. මේ මිනිස්සුන්ගේ දේපළ විකුණලා, මේ මිනිස්සු විනාශ කරලා දැම්මාම ඉදිරියට මේ රටේ ආර්ථිකය පවත්වාගෙන යන්නේ කොහොමද? මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නේ කොහොමද? මේ රටේ ආර්ථිකය සක්‍රිය කරන්නේ කොහොමද කියන එක පිළිබඳව තේරුම් ගන්න බැරි නිලධාරින් තමයි අද අපට ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකු නිලධාරින් පසුගිය ජනවාරි මාසයේ ඉඳලා සියයට 70කින් ඔවුන්ගේ පඩි වැඩි කරගෙන තිබෙනවා. අද උදේ ඉඳන් පාර්ලිමේන්තුවේ ඒ ගැන සාකච්ඡා කළා. මට වෙලාව නැති නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, එකක් කියන්න ඕනෑ. මේවා කරන්න බලය දුන්නේ කවුද? මේවා කරන්න බලය දුන්නේ, මේ පාර්ලිමේන්තුවමයි. මහ බැංකුව ස්වාධීන කරනකොට අපි ඊට විරුද්ධව ඡන්දය දුන්නා, මේක කරන්න එපා කියලා. මේ රටේ ආර්ථිකය කඩා දාපු, ආර්ථිකය සංකෝචනය කරපු ව්‍යාපාරිකයෝ ගැන පපුවේ තෙතමනයක් නැති මිනිස්සුන්ට මේ විධියට ඔවුන්ගේ ආයතන ස්වාධීන කරලා සම්පූර්ණ බලය දුන්නාම මේ මිනිස්සු කරන්නේ එම ආයතන ස්වාධීනව පවත්වා ගෙන යෑම නොවෙයි, රට හදන එක නොවෙයි, තමන්ට බෙදා ගන්න එක කියලා අපි එදා කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද සිද්ධ වෙලා තිබෙන්නේ අන්න ඒ කාරණයයි. අද මහ බැංකුව ස්වාධීන කිරීම හරහා ඔවුන්ගේ පංගුව ඔවුන් වැඩි කරගෙන තිබෙනවා. මහ බැංකු අධිපතිවරයා විතරක් නොවෙයි, මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාත් මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක්. ජනවාරි මාසයේ ඉඳන් රුපියල් ලක්ෂ 7කින් විතර ඔහුගේ වැටුප වැඩි වෙලා තිබෙනවා. අපේ රටේ මිනිස්සුන්ට කන්න නැහැ, බොන්න නැහැ. රාජ්‍ය සේවකයන් පාරේ උද්ඝෝෂණය කරනවා, රුපියල් 20,000ක වැටුප් වැඩි කිරීමක් ඉල්ලා. නමුත්, ඒක රජයෙන් දෙන්නේ නැහැ. ඉතින් මේ විධියට මහ බැංකුවේ සේවය කරන නිලධාරින්ට තමුන්ගේ ගොඩ වැඩි කර ගන්න ඉඩ දෙනවාද, එහෙම නැත්නම් අපි ඔක්කෝම එකතු වෙලා මේ කාරණය පිළිබඳව සාකච්ඡා කරන්න ඕනෑද කියන කාරණය ඔබතුමන්ලා හමුවේ තබමින් මගේ කථාව අවසන් කරනවා. අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.55]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතාම වැදගත් පනත් කෙටුම්පත් කිහිපයක් ගැන තමයි අද දවසේ අපි කථා කරන්නේ. මට ඒ සම්බන්ධව කථා කරන්න ලැබීමත් ලොකු සතුටක්. මොකද අපි දකිනවා, සාමාන්‍යයෙන් රටක් පවතින මට්ටම සොයා බලන ඉතා වැදගත්ම සාධකය ආර්ථිකය කියලා. රට කොයි මට්ටමේ ද තිබෙන්නේ, මේ රට දියුණු රටක් ද, එහෙම නැත්නම් දිළිඳු රටක් ද යන්නට වැදගත් වෙන්නේ ඒ රටේ ආර්ථික තත්ත්වයයි. මේ ආර්ථිකය නිවැරදිව ගෙන යෑමේ භාරදූර වගකීම තිබෙන්නේ මහ බැංකුවට. ඒ සඳහා බොහෝ තීන්දු-තීරණ ගන්න තිබෙනවා. ඒ වාගේම ඒවා ක්‍රියාත්මක කරවන්නත් ඕනෑ. අපි පාර්ලිමේන්තුවේ දී නොයෙකුත් තීන්දු-තීරණ ගන්නවා. අණපනත්වලට නොයෙකුත් වෙනස්කම් කරනවා; සංශෝධන කරනවා.

මේ සංශෝධන කරලා, ඒවා ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනකොට මහ පොළොවේ ඒවා ක්‍රියාත්මක නොවන ස්වභාවයක් තමයි දකින්න තිබෙන්නේ. මේක ලොකු ප්‍රශ්නයක්. අපේ එදිනෙදා කටයුතු කරගෙන යෑමේදී ඒවාට බලපාන නොයෙක් නීති තිබෙනවා. ඒ නීති අනුව ඒ දේවල් ක්‍රියාත්මක කරන්න පුළුවන්. හැබැයි සමහර වෙලාවට ජනතාව දන්නේ නැහැ, ක්‍රියාත්මක කරන්න ඕනෑ ක්‍රමය මොකක්ද කියලා. කොළඹ වාගේ නොවෙයි, ගම්වල ඉන්නේ අහිංසක මිනිස්සු. අපේ ගම් පළාත්වල ඉන්නේ කිසිම දෙයක් නොදන්න අහිංසක මිනිස්සු. ඊයේ-පෙරේදා එක ගමකට ගිහිල්ලා මම කථා කරනකොට, අස්වැසුම ප්‍රතිලාභය ලැබෙන එක මනුස්සයෙක් මට කිව්වා, "සර්, මට කවදාවත් ගිණුමක් තිබිලා නැහැ. මගේ ජීවිත කාලයේ මම බැංකුවකට ගිහිල්ලා නැහැ. දැන් මට ගිණුමක් හදලා තිබෙනවා, ඒකට සල්ලි ටිකකුත් වැටෙන නිසා බැංකුවකට යන්න පුළුවන්" කියලා. අන්න, ඒ වාගේ අහිංසක මිනිස්සු ටිකක් තමයි ගම්වල ඉන්නේ.

සමහර වෙලාවට ඔවුන් ගොවිතැන් කරන අය වෙන්න පුළුවන්. ඔවුන්ට මුදලක් හම්බ වුණාට පස්සේ ඒකෙන් ත්‍රිරෝද රථයක් ගන්න හෝ වෙනත් කුමන හෝ දෙයක් කරන්න යනවා. හැබැයි, ඒ දේවල් ගැන ඔවුන්ට කිසිම දැනුමක් නැහැ. මොකක් හෝ lease එකක් දමනකොට, ඒ පිළිබඳ ගිවිසුම්වලට ඇතුළත් වනකොට ඒවායේ මොනවාද තිබෙන්නේ කියලාවත් ඒ අය දන්නේ නැහැ. ඉංග්‍රීසි වචනයක්වත් නොදන්න අයට ඉංග්‍රීසියෙන් ලියපු ගිවිසුමක් තමයි දෙන්නේ. ඒ ගිවිසුමේ සඳහන් හැම ජේළියකටම ඔවුන්ගෙන් අත්සන් ගන්නවා, බැංකු හෝ ඒ මූල්‍ය ආයතන. අත්සන් කරන්න දන්නේ නැත්නම් ඇඟිලි සලකුණ - fingerprint එක - හෝ තබාගන්නවා. හැබැයි, මොකක්ද වෙන්නේ කියලා ඔවුන් දන්නේ නැහැ. වාහනයක් ගන්න තිබෙන ආසාවට ඔවුන් ඒකට අත්සන් කරනවා. හැබැයි, ගෙවීම් කටයුතු කිරීම අතපසු වුණොත් ඔහුට ගුටි කාලා තමයි වාහනය දෙන්නත් වෙන්නේ. මෙහෙම අවස්ථා අපි දකිනවා. මම මේක පැහැදිලි කරන්නම්.

විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාවට ඔවුන්ගේ ජීවනෝපාය නිසි ක්‍රමවේදයට සකස් කර දීම තමයි රජයේ වගකීම වෙන්නේ. ඒ වගකීම් සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, වාද විවාද කරලා රජය නිසියාකාරව අණපනත් හදනවා. අපේ රටේ තිබෙන බොහෝ අණපනත් ගොඩක් පැරණියි. එම නිසා ඒවා සංශෝධනය විය යුතුයි. අලුත් තාක්ෂණයත් එක්ක මේවා බද්ධ වෙලා නැහැ. එහෙම නැත්නම් අලුත් පරම්පරාවත් එක්ක බද්ධ වෙලා නැහැ. අපේ ඉන්න දරුවෝ -මේ අලුත් පරම්පරාව- මේ දේවල්වලට එකඟ නැහැ. ඔවුන්ට ඕනෑ වෙලාවකට mobile phone එකෙන් search කරන්න පුළුවන්. ඔවුන් mobile phone එකෙන් බලනවා, දැන් තිබෙන තත්ත්වය මොකක්ද, මෙතැනින් lease එකක් ගන්නවා නම් කොහොමද කර ගන්නේ කියලා. අන්න, ඒ තැනට මේ තරුණ පරම්පරාව දියුණු වෙලා ඉන්නේ. අපේ කාලයේදී වාගේ නොවෙයි. එහෙම නම් මේ පැරණි පනත් ටික සංශෝධනය වෙන්න ඕනෑ. මෙන්න මේ සංශෝධනය වීම තමයි අපට අවශ්‍ය වෙන්නේ. එහෙම නැතිව මොකක් හෝ යෝජනාවක් රජයෙන් ඉදිරිපත් කළාට පස්සේ විපක්ෂයෙන් කෑ ගහන එක නොවෙයි කරන්න ඕනෑ. ඔවුනුත් ඒවාට යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ. මේක මෙන්න මෙහෙම කරන්න පුළුවන් කියලා කියන්න ඕනෑ. හොඳ දෙයක් කරනකොට ඒකට සහයෝගය දෙන්න. ඒක තමයි අවශ්‍ය වෙන්නේ.

රටේ ජනතාව මුදල් හම්බ කරන නොයෙක් ක්‍රම තිබෙනවා. එක්කෝ රැකියාවක් කරලා මුදල් හම්බ කරනවා. එහෙම නැත්නම් ව්‍යාපාරයක් කරලා මුදල් හම්බ කරනවා. රැකියාවක් කරන කෙනාට ඔහුගේ ජීවනෝපාය ඉහළ නංවාගෙන, ගෙයක් දොරක් හදාගෙන යම් කිසි තැනකට එන්න රැකියාවෙන් ten-month loan එකක් ලබා දෙනවා. ඊට පස්සේ ඕනෑ නම් බැංකුවකට මොකක් හෝ උකස් කරලා ණයක් ගන්න පුළුවන්. මෙන්න මෙතැනින් තමයි ගැටලුව පටන් ගන්නේ. Loan එකක් ගත්තාම ඔහු ඒකෙන් උපරිම ප්‍රයෝජනය ගන්නවාද කියලාත් බලන්න ඕනෑ. මම ඒකයි කිව්වේ, මොකක්ද මේකෙන් කරන්නේ, කොච්චර මුදලක් හම්බ වෙනවාද, පොලිය කොච්චරද කියන එක ගැනවත් සමහරුන්ට දැනුමක් නැහැ කියලා.

දැන් high-tech භාවිත කරන්න පුළුවන්. ඒක මම හැම තැනකදීම කියන දෙයක්. අපි පුළුවන් තරම් තාක්ෂණය භාවිත කරන්න ඕනෑ. නමුත්, වර්තමානයේ ඒ තාක්ෂණය හරියට භාවිත වෙන්නේ නැහැ. සමහර බැංකු විතරයි තාක්ෂණය භාවිත කරන්නේ. සමහර මූල්‍ය ආයතන නොයෙකුත් අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරලා, ජනතාව රවටනවා. දිනකටත් පොලිය අය කරමින් මුදල් ලබා දෙන මූල්‍ය ආයතන තිබෙනවා, සතියකට පොලිය අය කරමින් මුදල් ලබා දෙන මූල්‍ය ආයතන තිබෙනවා. එහෙම කරලා ඒ ආයතන අධික පොලියක් ලබා ගන්නවා. එහෙම ආයතන ඕනෑ තරම් මේ රටේ තිබෙනවා. මේවායේ නියාමනයක් නැති එක තමයි ප්‍රශ්නය. නොදැනුවත්කම නිසා ජනතාව මේවාට අහු වෙනවා. අපේ ගම් පළාත්වල සමහර ගෙවල්වලට ගිහිල්ලා ගෘහිණිය තමයි මේවාට අල්ලා ගන්නේ. ඒ අයට මොනවා හෝ දෙයක් කියලා loan එකක් දෙනවා. දැන් Facebook එක හරහාත් ඒ සෙල්ලම පටන් අරගෙන තිබෙනවා. ඇයි, මේවා නියාමනය නොකරන්නේ? දැන් Facebook එක හරහාත් loan දෙන system එකක් තිබෙනවා. ඒවා නිසා විනාශ වෙච්ච පවුල් ඕනෑ තරම් තිබෙනවා. එහෙම ණය ගත්ත familiesවල හිටපු සමහර සාමාජිකයන් suicide කරගෙනත් තිබෙනවා. අපි මේ මූල්‍ය ප්‍රතිපත්ති සකස් කර තිබුණාට ප්‍රශ්න ඇති කරන කණ්ඩායම් ඉන්න නිසා මහ පොළොවේ මේවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවාට හරියට නීතිය ක්‍රියාත්මක වෙනවා නම්, ජනතාවට නීතිය පිළිබඳව අවබෝධයක් තිබෙනවා නම් මේ කිසි දෙයකට ඔවුන් අහුවෙන්නේ නැහැ.

හැබැයි, නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා අපි දකින්නේ නැහැ. මහ බැංකුවේ සියලු නිලධාරි මහත්ම මහත්මීන්ගෙන් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, සරල විධියට ජනතාව දැනුවත් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කරන්න කියලා. කොළඹ ඉන්න විධියට, කාර්යාලයේ ඉන්න විධියට ඒ ගැන හිතන්න එපා.

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

මහාචාර්යවරයෙක් හිතන්නේ ඔහුගේ level එක අනුව. ඔහු වෙන level එකකින් හිතන්නේ. එහෙම නොවෙයි හිතන්න ඕනෑ. ගමේ ඉන්න අහිංසකම මනුස්සයා හිතන විධියට හිතන්න. ඒ මනුස්සයා හිතන සරල විධියට හිතන්න. අන්න ඒ සරල තැනට ඇවිත් කටයුතු කරන්න. Loan එකක් ගැනීම, මූල්‍ය ප්‍රතිපත්ති වාගේ යම් යම් දේවල් ගැන ජනතාව දැනුවත් කිරීම උපරිම ආකාරයෙන් කරන්න. එවැනි තත්ත්වයක් නැති නිසා අපේ ගම් පළාත්වල මිනිස්සු අද වෙනකොට ගොඩක් දුක් විඳිනවා. එවැනි තත්ත්වයක් නැති නිසා කොහොල්ලෑ බබාට වෙච්ච දේ තමයි වෙන්නේ. මේ අතේත් ගාගන්නවා, අනෙක් අතේත් ගාගන්නවා. අත පය කිසිවක් එළියට ගන්න බැරි තැනට හිරවුණාම අවසානයේ කරන්න තිබෙන්නේ suicide කර ගන්න එක. ඒ විධියට පවුල් පිටින් විනාශ වෙන හැටි අපි දකිනවා. ඒ නිසා ජනතාව මේ ගැන දැනුවත් කිරීම ඉතාම වැදගත් දෙයක්.

ව්‍යාපාරිකයන් උත්සාහ කරන්නේ උපරිම ලාභ ලබා ගන්නයි. ඒකේ දෙකක් නැහැ. උපරිම ලාභ ගන්න ඒ ගොල්ලන් උත්සාහ කරනවා. මොන ක්‍රමයකට හෝ මොන දෙයක් කරලා හෝ උපරිම ලාභ ගන්න තමයි ඔවුන් උත්සාහ කරන්නේ. අත්සන් කරන ගිවිසුම්වලින් ඕනෑ දෙයක් කරන්න පුළුවන් විධියට තමයි වගන්ති ඇතුළත් කරලා තිබෙන්නේ. ඒ ගිවිසුම අත්සන් කරන කෙනා ඒ හැම දෙයකටම බැඳිලා ඉන්නවා. ආපසු ඒ ගැන කථා කරන්න දෙයක් නැහැ. මෙන්න මේ දේවල් නියාමනය කළ යුතුයි. ඒ නිසා වෙනම කණ්ඩායමක්, වෙනම කමිටුවක්, වෙනම ආයතනයක් ඒ වෙනුවෙන් ස්ථාපිත කරලා ජනතාවට තිබෙන මේ ගැටලු ටික නිරාකරණය කර ගන්න අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියට වැඩියෙන්ම එන්නේ ඉඩම් සම්බන්ධ පැමිණිලි. ඉඩම් ආරාවුල් විසඳන එක තමයි පොලීසියට වැඩියෙන්ම කරන්න තිබෙන්නේ. මූල්‍ය ප්‍රශ්න සම්බන්ධ පැමිණිලි තමයි පොලීසියට ඊළඟට වැඩිපුර එන්නේ. එවැනි නොයෙකුත් සිදුවීම් තිබෙනවා. ඊයේ-පෙරේදා එවැනි සිද්ධියක් වෙලා තිබෙනවා මම දැක්කා. බණ්ඩාරවෙල ප්‍රදේශයේ මූල්‍ය ආයතනයක කණ්ඩායමක් ගිහින් වාහනයක් පැදවූ අහිංසක වයසක මනුස්සයෙකුට ගහලා ඒ වාහනය අරගෙන ගිහිල්ලා තිබෙනවා. මොකද වුණේ කියලාවත් ඒ මනුස්සයා දන්නේ නැහැ. ඒ මනුස්සයාගේ පුතා වාහනයේ lease එක මාස දෙකකින් ගෙවලා නැහැ. ඒ නිසා ඒ මනුස්සයාට ගහලා වාහනය අරගෙන ගිහිල්ලා තිබෙනවා. දැන් ඒ මනුස්සයා ඉස්පිරිතාලේ ඉන්නවා. වාහනය ගන්න පොලීසියට කියලා ගිහිල්ලාත් නැහැ. චණ්ඩි ටිකක් අරගෙන ඇවිත් තමයි ඒ විධියට කටයුතු කර තිබෙන්නේ. එහෙම කරන්න පුළුවන්ද? මොකක්ද මේ ක්‍රමය? මේ ක්‍රමය වෙනස් විය යුතුමයි. ඒ නිසා විශේෂයෙන් මේ දේවල් නියාමනය කරන්න system එකක් ඇති කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගම්වල නොයෙක් විධියට පොලියට මුදල් දෙන මිනිස්සු ඉන්නවා. ඒ ගොල්ලන් හිතුමතේ, ඒ ගොල්ලන්ට අවශ්‍ය ප්‍රමාණයට පොලිය අය කරනවා. එවැනි යම්කිසි කණ්ඩායමක් ගම්වල ඉන්නවා. සමහර වෙලාවට ඒ අය විවිධ ආයතනවල ලියාපදිංචි - register - වෙලාත් ඉන්නවා. එහෙම ලියාපදිංචි වෙලා තිබෙන්නේ මහ බැංකුවේ නොවෙන්න පුළුවන්. නොයෙකුත් විධියේ ආයතන පිහිටුවාගෙන ඔවුන් ඒ කටයුතු කරගෙන යනවා. හැබැයි, ඒවාට නියාමනයක් නැහැ. ඔවුන්ට අවශ්‍ය විධියට පොලිය අය කර ගන්නවා. උපරිම ලාභ ලබන්න පුළුවන් විධියට මිනිස්සු සූරා කනවා. ඒක සුන්දර දෙයක් නොවෙයි. මේ වනකොට ඒ සල්ලි ගත්ත මිනිස්සු අන්තිම අසරණ තත්ත්වයට පත් කරලා තිබෙනවා. එම නිසා මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

Lease කරලා වාහනයක් ගන්න ගිවිසුම් අත්සන් කරනකොට අත්සන් 100ක් විතර ගන්නවා. නමුත් ඒ කිසිම දෙයක් ගැන ජනතාවට පැහැදිලි කරන්නේ නැහැ. පුළුවන් තරම් ඉක්මනට වාහනය ගන්න තිබෙන ආසාවට ඒ ලේඛන සියල්ලටම අත්සන් කරලා එනවා. මේ පිළිබඳවත් ජනතාව දැනුවත් කරන්න. අනිවාර්යයෙන්ම සිංහල භාෂාවෙන් හෝ ද්‍රවිඩ භාෂාවෙන් මේ ලේඛන සකස් කළ යුතුයි. ඒ කාරණයත් මම යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනවා. ඒ සඳහා සරල ක්‍රමයක් අනුගමනය කරන්න.

බැංකුවල පවතින පොලී අනුපාත දිහා බැලුවාම පෙනෙනවා, එක එක ගණන් අය කරන බව. පොඩි පොඩි වෙනස්කම් නම් තිබුණාට කමක් නැහැ. නමුත්, සමහර වෙලාවට ආකර්ෂණීය පොලියක් ලබා දීලා, බැංකුවලට තැන්පතු භාර ගන්නවා. එහෙම තැන්පතු භාර ගත්තාට පසුව ඒවායේ නියාමනයක් සිදු වෙන්නේ නැහැ. දැන් වෙලා තිබෙන දේවල් පේනවා නේ. ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. "සක්විති" කරපු වංචා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. ඇයි මේවා දකින්නේ නැත්තේ? ලංකාවේ මිනිස්සු කීදෙනෙක් සක්විතිගේ වංචාවලට අහු වුණාද? ETI එකේත් ප්‍රශ්නයක් ඇති වුණා නේ. එහෙම නම් දැන් අපි අනෙක් ආයතන පිළිබඳවත් ඇහැ ගහගෙන ඉන්න ඕනෑ. අහිංසක මිනිස්සු මෙවැනි වංචාවලට අහු වෙනවා.

ගොඩක් අය pension යනකොට ලැබෙන gratuity එක බැංකුවක තැන්පත් කරලා ජීවත් වෙනවා. ඒගොල්ලන් සාප කරන හැටි, ඒගොල්ලන් කථා කරන දේවල් දිහා බලන්න. ඒගොල්ලන් අපට වාගේම මේ Parliament එකටත් පුළුවන් තරම් ලියුම් ලිය-ලියා එවනවා, මේ ගැන බලන්න, අපට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ කියලා. මේ වාගේ සිද්ධි නිසා පසුගිය කාලයේ කීදෙනෙක් මිය ගියාද? රජයේ හෝ වෙනත් ආයතනයක සේවය කරලා pension ගියාට පසු ලැබෙන gratuity එක අරගෙන බැංකුවේ තැන්පත් කරලා ලැබෙන පොලියෙන් ජීවත් වෙන්න හදනකොට හොරෙක් ඇවිත් ඒ මුදලත් විනාශ කරලා දමනවා නම් මොකක්ද අපි කරන්නේ?

ඇයි අපි එතැනට යන්නේ? ඇයි අපට මේක නියාමනය කරගන්න බැරි? මම කියන්නේ මේ සඳහා වෙනම නියාමන ආයතන ඇති කරන්න කියායි. දැනටත් එවැනි ආයතන තිබෙනවා ඇති. නමුත්, ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මහ පොළොවේ ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. අහිංසක මිනිස්සු දවසින් දවස මොනවාට හෝ අහු වෙනවා. මෙන්න මේ තත්ත්වය වෙනස් කරගත යුතුමයි. මම කලිනුත් කිව්වා වාගේ, දවසේ පොලියට මුදල් ගන්න එකත් ඒ විධියම තමයි. හවස් වෙනකොට මුදල් දුන්නේ නැත්නම් ඒ පුද්ගලයා විනාශ කරන්න තරම්, සමහර වෙලාවට ඔහු මරණයට පත් කරන්න තරම් චණ්ඩි ටිකක් තමයි මේ හැමදෙයක්ම කරන්නේ. එහෙම වෙන්න බැහැ, රටක. අදාළ ප්‍රදේශවල ග්‍රාම නිලධාරිවරු ඉන්නවා, ක්ෂේත්‍ර රාජකාරිවල යෙදෙන පිරිසක් ඉන්නවා. මේ අය එකිනෙකාට සම්බන්ධ වෙලා - link වෙලා - නැහැ. තමන්ගේ කොට්ඨාසයේ මේ වාගේ දේවල් ක්‍රියාත්මක වෙනවා නම්, ඒවා නවත්වන්න පුළුවන් ක්‍රම ඕනෑ තරම් තිබෙනවා. ඒ සඳහා ග්‍රාම නිලධාරිවරයාට බලයක් තිබෙනවා; පොලීසියට බලයක් තිබෙනවා. ගමක නිලධාරින් කීදෙනෙක් ඉන්නවාද? එක් ග්‍රාම නිලධාරි වසමක නිලධාරින් හයදෙනෙක් ඉන්නවා. Graduate සංවර්ධන නිලධාරි කෙනෙක් ඉන්නවා. මේවා හරියට link වෙනවා නම්, තාක්ෂණය භාවිත කරන ක්‍රම ක්‍රියාත්මක වෙනවා නම්, මේ වැරදි නවත්වන්න ඕනෑ තරම් ක්‍රම තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙච්චර තීන්දු-තීරණ ගන්නවා. මේ සභාවේදී අණපනත් වෙනස් කරනවා. එහෙම නම්, ඒවා මහ පොළොවේ ක්‍රියාත්මක කරන්න අදාළ නිලධාරින්

දැනගත යුතුයි. ඒ වාගේම ඒවාට ක්‍රම හදන්නත් අදාළ නිලධාරින් දැනගත යුතුයි. අහිංසක ජනතාව බේරා ගැනීම තමයි අපේ අවශ්‍යතාව. ඒක කළ යුතුමයි. ඒකට මූලිකත්වය දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, විශේෂයෙන්ම high technology භාවිත කිරීම ගැන ගත්තාම අපි දකිනවා, ලෝකයේ කුමන බැංකුවකට ගියත්, ලංකාවේ කුමන තැනකට ගියත්, කඩේකින් බඩු ටිකක් අරගෙන කාඩ් එකෙන් ගෙව්වත් අපට ටක්ගාලා message එකක් එන බව. හැබැයි, සමහර බැංකුවලින් ණයක් ගත්තාම අපට ඒ පහසුකම දෙන්නේ නැහැ. සමහර බැංකුවලින් අපි ණයක් අරගෙන තිබෙනවා නම්, ඒ මාසයේ අන්තිමට අපේ වැටුපෙන් මෙන්න මෙච්චර කැපුණා, මෙන්න දැන් ඔබේ ගිණුමේ ඉතිරි ප්‍රමාණය කියා සඳහන් කරනවා. ඒ පහසුකම සමහර බැංකු ලබා දෙනවා; සමහර බැංකු ලබා දෙන්නේ නැහැ. ඇයි ඒක හැමෝටම කරන්න බැරි? ඇයි, එහෙම ජනතාව දැනුවත් කරන්න බැරි? දැන් හැම කෙනෙක් ළඟම phone එකක් තිබෙනවා. ඉතින් ඇයි ඒ දැනුවත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බැරි? අපි දන්නා සමහර චූන්පාන්කාරයෝ ඉන්නවා, ඔවුන් phone එකෙන් හැම දෙයක්ම කරනවා. ඒගොල්ලන්ට order එකත් යනවා; බේකරි හිමියාට message එකත් එනවා, මේ වෙලාවට මෙන්න මෙච්චර පාන් විකිණිලා තිබෙනවා, මේ වෙලාවට මේකට තව load කරන්න ඕනෑ, මේ තැනට යන්න ඕනෑ කියලා. ඒගොල්ලන් ඒ තරම් මේ තාක්ෂණය භාවිත කරනවා. Private sector එක මේ තාක්ෂණය භාවිත කරනවා. ගොඩක් වෙලාවට අපේ රාජ්‍ය ආයතනවල තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. මේකෙන් අපි ගොඩ ආ යුතුයි. එකකට එකක් ආයතන සම්බන්ධ නැති නිසා - link නැති නිසා - තමයි ගොඩක් වෙලාවට මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ.

අපි CRIB එක උදාහරණයකට ගනිමු. ඊශ්‍රායලයට යන්න දැන් විශාල පිරිසක් බලාගෙන ඉන්නවා. ඔවුන් ඒ සඳහා පුහුණු වෙලා, ඔක්කොම කරලා ඊශ්‍රායලයට යන්න සූදානම් වෙනකොට loan එකක් ගන්න යනවා. Loan එක ගන්න යනකොට කියනවා, ඔහු CRIB එකේ ඉන්නවා කියලා. හැබැයි, ඒ පුද්ගලයා දන්නේ නැහැ, CRIB එකේ ඉන්නවාද කියලා. අදාළ පුද්ගලයාට කියනවා, ඔයා කොහේ හරි ගිවිසුමකට ඇපකාරයෙක් වශයෙන් අත්සන් කරලා තිබෙනවා, එක්කෝ මොකක් හෝ ගෙවීමක් කරලා නැහැ කියලා. ඒ වාගේ දේවල් වෙන්න පුළුවන්. හැබැයි, ඔවුන් ඒ ගැන දන්නේ නැහැ. අවසානයේ ඊශ්‍රායලයට යන්න සූදානම් වෙනකොට තමයි මේ හැම දෙයක්ම දැනගන්නේ. ඇයි බැංකුවලින් මේ ගැන පොඩි දැනුවත් කිරීමක් කරන්න බැරි? ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඉස්සරහට ගිහිල්ලා බැලුවොත් දැනගන්න ලැබේවි, ඒ loan එක ගන්න බැරි වුණු අය ගොඩක්දෙනෙක් අද වෙනකොට සිටින බව. දවස් දෙක තුනකින් යන්න සියල්ල සූදානම් කරලා, වීසා එක ආවාට පසු බැංකුවෙන් loan එක දෙන්නේ නැහැ. මේ ප්‍රශ්න විසඳන්න තමයි ක්‍රම හැදෙන්න ඕනෑ. මේ ගැන ජනතාව දැනුවත් කරන්න ඕනෑ. මම හැම වෙලාවේදීම කියනවා, දැනුවත් කිරීම නැති නිසා තමයි අපේ රට ගොඩක් පසුපසින් සිටින්නේ කියලා. මම දැනුවත් නම්, මම දන්නවා මගේ frame එකේ ඉන්න. නමුත්, ගොඩක් අය ඒ ගැන දැනුවත් නැහැ. මම මේ කථාව කියනකොට සමහර අය හිතනවා ඇති, ගොඩක් අය මේවා ගැන දන්නවා කියලා. එහෙම නැහැ. මම මේ කියන්නේ ගම ගැන. අපේ නිලධාරින් ගැනවත්, අපේ ඥාති හිතවතුන් ගැනවත්, මේවා ගැන දැනුවත් පිරිස ගැනවත් නොවෙයි මම මේ කථා කරන්නේ. සාමාන්‍යයෙන් තේරුම් ගන්න පුළුවන් පිරිසක් ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. මම කථා කරන්නේ ගොඩක් පහළ මට්ටමේ ඉන්න මිනිසුන් ගැන. ගෙදර ඉන්න අහිංසක ගෘහිණිය මේ හොරුන්ට අහුවෙන එක නවත්වා ගන්න ඕනෑ. අන්න ඒකටයි මම මේ ගැන කථා කරන්නේ.

විශේෂයෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නම් නියාමනය විය යුතුමයි. එහෙම නැත්නම් අපි කරන්නේ ලොකු අසාධාරණයක්. මේ වෙනකොට අහිංසක මිනිස්සු මේවා නිසා ගැටලු විශාල ප්‍රමාණයකට මුහුණ දී සිටිනවා.

ගමකට ගිහිල්ලා බැලුවොත් ඒක හොඳටම තේරෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේක ඉතාම වැදගත් කියලා මම හිතනවා. විශේෂයෙන්ම CRIB එකට නම ඇතුළත් වීම පිළිබඳ කාරණයටත් විශේෂ අවධානයක් යොමු කරන්න අවශ්‍යයි. මොනවා හරි ක්‍රමයකින් CRIB එකට කෙනකුගේ නම යනවා නම්, ඒ පුද්ගලයා දැනුවත් කරන්න ඒ පුද්ගලයාට message එකක් එවන්න ඕනෑ. එහෙම නැත්නම් letter එකක් එවන්න ඕනෑ. එවැනි ක්‍රමයකින් අදාළ පුද්ගලයා දැනුවත් කරන්න ඕනෑ. බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් හෝ කුමන හෝ තැනකින් ඒ පුද්ගලයා දැනුවත් කරන්න ඕනෑ. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගියාම මේ වාගේ තත්ත්වයට පත් වෙච්ච විශාල පිරිසක් කරගන්න දෙයක් නැතිව අසරණ වෙලා ඉන්න බව අපට පේන්න තිබෙනවා. ඔවුන් ඒ ගැන දැනුවත් නම් ඒක clear කරගෙනයි එන්නේ. මොකක් හරි දෙයක් සම්බන්ධයෙන් බැංකුවකට ඇපකාරයෙක් වෙලා ඉන්න කෙනෙක් මෙවැනි තත්ත්වයකට පත්වෙලා ඉන්නවා නම්, ඔහු අදාළ පුද්ගලයා ළඟට ගිහිල්ලා කථා කරගෙන, "මේක ගෙවන්න, නැත්නම් මට ප්‍රශ්නයක් වෙනවා" කියලා ඒක clear කරගෙනයි එන්නේ. සමහර වෙලාවට හිතනවා ඇති, ඒ ගොල්ලන් මේ ගැන දන්නවා ඇති කියලා. හැබැයි, එහෙම නොවෙයි. මේ වාගේ තැනකට ගිහිල්ලා බැලුවොත් තේරෙයි, මේ මිනිස්සු අසරණ වෙලා ඉන්න ආකාරය. "අපි දන්නේ නැහැ, අත්සන් කළා" කියනවා. "ඒ කාලයේ එකකට අත්සන් කළා. ඒක ගෙවලා නැති නිසා මෙහෙම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා" කියනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කිරීම ඉතාම වැදගත් වෙනවා.

ඒ වාගේම, අපට යම් දෙයක් වෙනස් කරන්න හරිම අමාරුයි. අපේ රටේ දේවල් වෙනස් කරන්න හරිම අමාරුයි නේ. සාමාන්‍යයෙන් අපේ රටේ මොන දෙයක් වුණත් වෙනස් කරන්න ගොඩක් අමාරුයි. මම ප්ලාස්ටික් යෝගට් හැන්ද නවත්වන්න අවුරුදු තුනක් තිස්සේ මේ සභාවේ කෑ ගැහුවා. පාර්ලිමේන්තුවේ මගේ හැම කථාවකදීම කිව්වා, අවුරුද්දකට ටොන් තුනහමාරක් විතර ප්ලාස්ටික් යෝගට් හැඳි අපේ පොළොවට එකතු වෙනවා, ඒවා recycle වෙන්නේ නැහැ කියලා. ප්ලාස්ටික් යෝගට් හැන්ද ගැන මම මේ පාර්ලිමේන්තුවේ කරපු හැම කථාවකදීම කථා කළා. මම මේ පාර්ලිමේන්තුවට ආපු දවසේ ඉඳන් ඒ ගැන කථා කළා. මට ප්ලාස්ටික් යෝගට් හැන්දයි, ප්ලාස්ටික් straw එකයි නවත්වා ගන්න පුළුවන් වුණේ අවුරුදු තුනක් උත්සාහ කරලායි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට මට ඒ කාර්යය කරන්නත් අවුරුදු තුනක් විතර කථා කරන්න වුණා. මේවා ගැන හිතන්නේ නැත්තේ ඇයි? අවුරුද්දකට ප්ලාස්ටික් යෝගට් හැඳි ටොන් තුනහමාරක් පොළොවට එකතු වෙනවා. ඒවා recycle වෙන්නේ නැහැ. තව ටික කාලයකින් මේ රටට මොනවා වෙයිද? අවුරුදු තුනක් තිස්සේ උත්සාහ කරලායි ඒක තහනම් කර ගත්තේ.

දැන් ඇමෙරිකාවේ කිසිම වෙලාවක ප්ලාස්ටික් බෑග් හෝ මොනවත් දෙන්නේ නැහැ. ගෙනියන දෙයක් අතේ ගෙනියන්න ඕනෑ. පත්තර බෑග් එක නැත්නම්, වෙන බෑග් එකක් බැහැ. ඒක තමයි අතේ අරගෙන යන්නේ. මොකද, ඒ ගොල්ලන් ඒවායින් ඇතිවන ප්‍රශ්න දන්නවා. අපේ වාගේ පොඩි දූපතකට මෙවැනි දෙයක් කරගන්න බැරි ඇයි? මේ ප්ලාස්ටික් භාවිතය නවත්වන එක කරගන්න බැරි ඇයි? ඒවාට අපි යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්න ඕනෑ.

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේකට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගන්න ඕනෑ. ඒ හා සම්බන්ධ ආයතන සියල්ලම එකතු කරන්න ඕනෑ. ඒකට High technology භාවිත කරන්න ඕනෑ. High technology භාවිත කරන එක ඉතාම වැදගත් දෙයක්. අපි ඒවාට යන්න ඕනෑ. මොකද, අපි යම්කිසි දෙයක් වෙනස් කරනවාය කියන එක ලේසි පහසු දෙයක් නොවෙයි. ගෙදරක වුණත් එහෙමයි. මගේ ගෙදර තිබෙන රූපවාහිනිය අද ගිහිල්ලා තිබෙන තැනින් වෙනත් තැනකට මාරු කළොත් බලන්න පුළුවන් ඇති වන තත්ත්වය. ගෙදර රූපවාහිනිය තිබෙන තැන පොඩ්ඩක් වෙනස් කළොත් ගෙදර පස්දෙනෙක් ඉන්නවා නම්, ඒ පස්දෙනාම අදහස් පහක් කියන්නේ. මට පේන්නේ නැහැ කියයි, බෙල්ල රිදෙනවා කියයි. ඒ වාගේ මොනවා හරි දෙයක් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මම කියන්නේ මෙයයි. අපි මේ ආකාරයට වෙනස් කිරීම් කරනකොට, සංශෝධනයක් කරනකොට ඒ ගැන දැනුවත් කරලා කරමු. මොන සංශෝධනය කළත්, මෙතැන මොන තීන්දු තීරණ ගත්තත් ඒ තීරණ මහ පොළොවට යනකොට නිසි ක්‍රමයකට අනුව යන්න ඕනෑ. මේ දේවල් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම නියම ක්‍රමයකට කරලා මේ කටයුතු implement කරන්න ඕනෑ. එහෙම නැත්නම් අපි කොච්චර වාද විවාද කළත්, අපි කොච්චර වියදම් කරගෙන කෑ ගැහුවත් වැඩක් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.14]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ආණ්ඩු පක්ෂය නියෝජනය කරන කථිකයෝ බොහෝ විට කියනවා, "දැන් අපේ රටේ ආර්ථිකය ගොඩක් ඉදිරියට ඇවිල්ලා තිබෙන්නේ. අපේ රටේ ආර්ථිකය දැන් හරි මහට වැටිලා තිබෙන්නේ" කියලා. එතුමන්ලා කියනවා, දැන් පෝලිම් යුගය අවසන් කරලා තිබෙනවා කියලා. හැබැයි, මේ පෝලිම් යුගය අවසන් වුණේ කොහොමද? ඒ වාගේම, පෝලිම් යුගය ඇති කළේ කවුද කියන එක ගැනත් අපට කල්පනා කරන්න වෙලා තිබෙනවා. අපි ගෝඨාභය රාජපක්ෂ පාලනයට බාර දුන්නේ ආර්ථික වශයෙන් බංකොලොත් වෙච්ච රටක් නොවෙයි. හැබැයි, වැරදි තීන්දු තීරණ ගැනීම තුළින් අන්තිමට අපි කවදාවත් අහලා නැති, අපි කවදාවත් විඳලා නැති ආකාරයේ රට බංකොලොත්වීමකට මුහුණ දෙන්න වුණා. රට බංකොලොත්වීම තුළින් තමයි මේ පෝලිම් යුගය නිර්මාණය වුණේ. මේ වන විට පෝලිම් යුගය අවසන් වෙලා තිබෙනවා. හැබැයි, රුපියල් 100ට විතර තිබුණු පෙට්‍රල් ලීටරය රුපියල් 400ට විතර වැඩිවෙලා තිබෙනවා. විදුලි බිල සියයට 400කින් වැඩිවෙලා තිබෙනවා. ගෑස් සිලින්ඩරයක මිලත් තුන් ගුණයකින් විතර වැඩිවෙලා තිබෙනවා. මෙන්න මේ වාගේ හේතු නිසා අද පෙට්‍රල් ගහගන්නවත් විධියක් නැහැ; ඩීසල් ගහගන්නවත් විධියක් නැහැ. එතකොට අනිවාර්යයෙන්ම ඒ පාරිභෝජනයේ අඩුවීමක් වෙලා තිබෙනවා. අද පෝලිම් යුගය නැතිවෙලා තිබෙන ප්‍රධාන කාරණාවක් වනවා, ඒ මිල ගණන් තුන් හතර ගුණයකින් වැඩිවීම. එම නිසා දැන් පෝලිම් යුගය අවසන් වුණා කියලා අපට සතුටු වෙන්න විධියක් නැහැ. මොකද, ඒක කියන අයම තමයි පෝලිම් යුගය ඇති කළේ. පෝලිම් යුගය අඩු වෙලා තිබෙන්නේ ඒ මිල ගණන් හතර ගුණයකින් විතර වැඩි වෙච්ච නිසාමයි.

කෙසේ වෙතත්, අද විපක්ෂය නියෝජනය කරන අය නොවෙයි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා පසුගිය අවුරුදු දෙක, තුන ඇතුළත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 260,000ක් වසා දමා තිබෙනවා කියලා. මේ රටේ ආර්ථිකයට සියයට 75ක දායකත්වයක් ලබා දෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර. ඒ වාගේම රැකියා ගත්තොත්, අද වන කොට සියයට 45ක් රැකියා බිහි වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින්. එතකොට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 260,000කට වඩා වැඩි සංඛ්‍යාවක් වැසී තිබෙනවා නම් මේ ආර්ථිකයට කොච්චර සෘණාත්මක බලපෑමක් සිදුවෙලා තිබෙනවාද? මේ පාර්ලිමේන්තුවෙන් එළියට බැහැලා හන්දියකට ගිහිල්ලා ජනතාවගෙන් ඇහුවොත්, මේ ආර්ථිකයට සිදු වෙලා තිබෙන බලපෑම ගැන, මිනිස්සු කොච්චර අමාරුවෙන්ද ජීවත් වෙන්නේ කියන එක තේරුම් ගන්න පුළුවන්. මේ මැති ඇමතිවරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ පාර්ලිමේන්තුවෙන් එළියට බැහැලා මහ පොළොවේ ඇවිදලා බලන්න, මේ රටේ ජනතාව කොච්චර අමාරුවෙන්ද ජීවත් වෙන්නේ කියලා. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 260,000ක් බංකොලොත් වෙනවා කියන්නේ මේ රටේ ආර්ථිකයට විශාල බලපෑමක් ඇති වෙනවා කියන එකයි. ඒ වාගේම රැකියා ලක්ෂ ගණනක් මේ වෙන කොට අහිමි වෙලා තිබෙන එකයි.

මේ රටේ ව්‍යාපාරිකයන්ට අද මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන තත්ත්වය බලන්න. දැන් මේ ව්‍යාපාරිකයන් ණය අරගෙන තිබෙනවා. ව්‍යාපාර බංකොලොත් වීමත් එක්ක අද ඔවුන්ට ගත්තු ණය ටික ගෙවා ගන්න විධියක් නැති වෙලා තිබෙනවා. අද ලීසිං සමාගම්වල තිබෙන ප්‍රධානම දේ තමයි, - වාහන වෙන්න පුළුවන් එහෙම නැත්නම් වෙනත් වත්කම් වෙන්න පුළුවන්- දේපළ වෙන්දේසි කරන මට්ටමට ගිහිල්ලා තිබෙන එක. කිසිම හොයා බැලීමක් නැතිව ඒ කටයුත්ත වෙනවා. තමන්ට අයිති ඒ දේපළ වෙන්දේසි කරන්න පටන් අරගෙන තිබෙනවා. අද රජයක් හැටියට තමුන්නාන්සේලා ඒ වෙනුවෙන් මැදිහත් වීමක් වෙලා තිබෙනවාද? කිසිම මැදිහත් වීමක් නැහැ. අද ලීසිං ආයතන ඒ අයට ඕනෑ ඕනෑ විධියට කටයුතු කරනවා. මූල්‍ය ආයතන ඒ අයට ඕනෑ ඕනෑ විධියට කටයුතු කරනවා. මේ වනකොට ලක්ෂ ගණනකගේ නම් CRIB එකට ඇතුළත් වෙලා තිබෙනවා. රටක් හැටියට, රජයක් හැටියට මේවා වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ නේද? සුළු හා මධ්‍ය පරිමාණ ආයතනවලට අවශ්‍ය ණය පහසුකම් ලබා දෙන්න රජයක් හැටියට කටයුතු කරන්න ඕනෑ. ඒ කටයුතුවලට මීට වඩා මැදිහත් වෙන්න ඕනෑ.

අපි දන්නවා, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාත් ලෝක බැංකුව ඇතුළු මූල්‍ය ආයතන සංඛ්‍යාවක් සමඟ සාකච්ඡා කළා කියලා. අපට යම් යම් උදව් ලැබිලා තිබෙනවා. නමුත් ඒ ලැබුණු උදව් ප්‍රමාණවත් නැහැ. යම් ක්‍රමයක් යොදන්න, මේ CRIB එකට යන අයට සහනයක් ලබා දෙන්න. ඒ අයට තාවකාලිකව වසරක හෝ වසර දෙකක කාලයක් හෝ සහනයක් ලබා දෙන්න ඕනෑ. මම කියන්නේ CRIB එකේ ඉන්න සියලුදෙනාටම නොවෙයි. සමහර අය කරපු අයුතු ක්‍රියා නිසා CRIB එකට ගිහිල්ලා තිබෙනවා. මම කියන්නේ එවැනි අය ගැන නොවෙයි. ආර්ථිකය විනාශ වීම තුළින් CRIB එකට ගිය පිරිසක් ඉන්නවා. සොයා බලා ඒ අයට යම් සහනයක් ලබා දෙන්න රජයක් හැටියට මැදිහත් වෙන්න ඕනෑ.

විශේෂයෙන්ම පසුගිය වසර දෙක තුනේදී මේ රට බංකොලොත් වීම නිසා කෙනකුගේ ව්‍යාපාරවලට හානියක් වුණා නම් ඒ ව්‍යාපාරවලට, ඒ හානි ලැබූ අයට මූල්‍ය ශක්තියක් ලබා දෙන්න රජය මැදිහත් විය යුතුයි. අඩු පොලිය සහිත ණයක්, එහෙම නැත්නම් පොලී රහිත ණයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු වෙන්න ඕනෑ. ඒ වාගේම ඔවුන් CRIB එකෙන් අයින් කරලා යම් සහනයක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. හැබැයි, අද සිද්ධ වෙන්නේ මොකක්ද? අද මේ රටේ ප්‍රධාන පෙළේ අය, දේශපාලන වශයෙන් හිතවත් යම් පිරිසක් ලංකා බැංකුවෙන්, මහජන බැංකුවෙන් විශාල ණය මුදල් අරගෙන තිබෙනවා. හැබැයි, රුපියල් ලක්ෂ දෙකක, රුපියල් ලක්ෂ පහක ණය මුදලක් ගත් ව්‍යාපාරිකයාගේ යම්කිසි වටිනාකමක් ඇති දේවල් බැංකුවට පවරා ගන්නවා.

හැබැයි, සමහර ව්‍යාපාර කෝටි ප්‍රකෝටි ගණනින් ණය අරගෙන තිබෙනවා. ඒ ණය ටික බොල් ණය හැටියට කපා හරින්න තීන්දු කරපු මූල්‍ය ආයතන මේ රටේ තිබෙනවා. ඒ මහා පරිමාණයේ ව්‍යාපාරිකයන්ට දේශපාලන මැදිහත්වීම නිසා විශාල සහනයක් ලැබිලා තිබෙනවා. නමුත් සාමාන්‍ය ජනතාවට, සාමාන්‍ය ව්‍යාපාරිකයාට ඒ වාගේ සහනයක් ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ. අද මේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්න නම්, මේ ව්‍යාපාර ඉදිරියට ගෙන යන්න නම් බලශක්තියට යන වියදම අනිවාර්යයෙන් අඩු කරන්න ඕනෑ. මේ රට manufacturing hub එකක් කරන්න නම්, ජාත්‍යන්තරයත් එක්ක තරගකාරිත්වයක් ඇති රටක් කරන්න නම් බලශක්තිය සඳහා සහ විශේෂයෙන් විදුලි බිල සඳහා යන වියදම අඩු කිරීම අනිවාර්යයෙන් අවශ්‍ය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සහන ලබා දෙන බවක් කියනවා. අපි දන්නවා, යම් සහන ප්‍රමාණයක් අනිවාර්යයෙන් ලබා දෙන බව. මොකද, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ අරමුණ වෙන්නේ ඊළඟ ජනාධිපතිවරණයට ළං වෙන කොට සහන ලබා දීමයි. එහෙම නම්, ඒ සහන ලබා දෙන්න කටයුතු කරන්නේ මේ රටේ ව්‍යාපාරිකයන් වෙනුවෙන් නොවෙයි; ඒ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වෙලාවට නොවෙයි. ජනාධිපතිවරණය ළං වෙලා තිබියදී සහන ටිකක් ලබා දෙන්න සැලසුම් කරන්නේ ඒ ජනාධිපතිවරණයේදී වාසියක් ලබා ගන්න පුළුවන් විධියටයි. ඒ විධියට තමයි මේ හැම දෙයක්ම සැලසුම් කරන්නේ. අපි බලාපොරොත්තු වුණා, සහන ටිකක් ලබා දෙයි කියලා. එහෙම හරි සහන ටිකක් ලබා දෙන එක හොඳයි. නමුත් ජනාධිපතිවරණය ඉලක්ක කර ගන්නේ නැතුව ජනතාවට අවශ්‍ය සහන ටික ලබා දෙන්න හැකි ඉක්මනින් කටයුතු කරන්න ඕනෑ. මොකද, අද රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ වුවමනාව වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න මේ යම් යම් පිරිස් කොහොම හරි එකතු කරගෙන ඉදිරි ජනාධිපතිවරණයට අවශ්‍ය ශක්තිය ලබා ගන්නයි. අපට ආරංචි වෙලා තිබෙනවා මේ වන කොට සැලසුම්සහගතව වයින් ස්ටෝර්ස් 300කට බලපත්‍ර ලබා දෙන්න කටයුතු සැලසුම් කරගෙන යනවා කියලා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන යම් යම් මන්ත්‍රීවරුන්ට අල්ලසක් ලබා දෙන විධියට වයින් ස්ටෝර්ස් බලපත්‍ර ලබා දෙන්න මේ වන කොට කටයුතු කරගෙන යනවා. එහෙම නම්, අද මේ කරමින් තිබෙන්නේ මොකක්ද? එක පැත්තකින්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මේ අන්තිම මාස කිහිපයේ පුළුවන් තරම් හම්බ කර ගැනීමේ උත්සාහයක යෙදෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අනෙක් පැත්තෙන්, ජනාධිපතිවරයා උත්සාහ කරනවා වයින් ස්ටෝර්ස් බලපත්‍ර හරි ලබා දීලා, එහෙම නැත්නම් තවත් මොනවා හරි දෙයක් ලබා දීලා ජනාධිපතිවරණයට සම්පූර්ණ සහයෝගය ලබා ගන්න. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියනවා, මේ රට ඉදිරියට ගෙන යන්න නම් මේ රටට ජනමතයෙන් පත් වෙච්ච නායකයෙක් අනිවාර්යයෙන් අවශ්‍යයි කියලා. ඒ වාගේම, ජනමතයෙන් පත් වෙච්ච ආණ්ඩුවක් අවශ්‍යයි. එහෙම නැත්නම් මේ රටේ ව්‍යාපාරිකයන් තුළ විශ්වාසයක් ගොඩ නැඟෙන්නේ නැහැ. රටේ ජනතාව තුළත්, ව්‍යාපාරිකයන් තුළත් විශ්වාසය ගොඩ නැඟීම අත්‍යවශ්‍යයි. ඒ සඳහා ජාතික මැතිවරණයක් හෝ කුමන හෝ මැතිවරණයක් හැකි ඉක්මනින් ලබා ගන්න අනිවාර්යයෙන් කටයුතු කරන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.25]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රටට අවශ්‍ය මුදල් පනත් කෙටුම්පත් කිහිපයක් ගැන කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත්, මමත් දන්නා දෙයක් තමයි අපේ ලංකාවට 1948 නිදහස ලැබුණා කියලා. එදා ඉඳලා අද වනකල් විවිධ පුද්ගලයෝ අගමැති වෙලා, ජනාධිපති වෙලා කටයුතු කළා. අදත් ජනාධිපතිවරයෙක් පත් වෙලා පාලන බලය අරගෙන කටයුතු කරන බව ඔබ අපි හැම කෙනාම දන්නවා. හැබැයි, මෙතැනදී කාටවත් මඟ හරින්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. මේ රට වැටිච්ච එක ගැන එක කණ්ඩායමක් තවත් කණ්ඩායමකට ඇඟිල්ල දිගු කරනවා. ඒ වාගේම, තවත් කණ්ඩායමක් කියනවා, අපි නොවෙයි, මේක කළේ ඔයාලයි කියලා. හැබැයි, මට කියන්න තිබෙන දේ තමයි 1948 ඉඳලා අද වනකල් මේ ලංකාවේ බලයට පත් වෙච්ච සියලු පාලකයෝ අද අපේ රටේ ඉරණමට වග කියන්න ඕනෑ කියලා.

මේ ලංකාවේ ඉන්න ජනතාව පැහැදිලිවම මේ මන්ත්‍රීවරුන් 225දෙනාට පමණයි ඇඟිල්ල දික්කරන්නේ. මේ 225දෙනාට විතරක් ඇඟිල්ල දික්කරලා හරි යන්නේ නැහැ. මේ ලංකාවේ ඉන්නවා ලක්ෂ 15කට වැඩි නිලධාරි පිරිසක්. ඒ වාගේම ලංකාවේ දැනට ඉන්නවා කෝටි දෙකකට වැඩි ජනතාවක්. ඒ බොහෝ පිරිසක් ඡන්දදායකයෝ. හැබැයි, ඒ අය මොනවාද කරන්නේ? ඡන්ද කාලයක් ආවාම, ඡන්දයේ වටිනාකම දන්නේ නැතුව පොඩි පොඩි දේවල්වලට තමන්ගේ වටිනා ඡන්දය ලබා දෙනවා. එක්කෝ කෑම පාර්සලයකට, අරක්කු කාලකට, එහෙම නැත්නම් හට්ටියකට, මුට්ටියකට, වළඳකට, එහෙමත් නැත්නම් හාල්වලට, පොල්වලට තමයි තමන්ගේ වටිනා ඡන්දය ලබා දෙන්නේ. ඒක අපි සියලුදෙනාම දන්නා දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, දැන් මේ රට වෙනස් වෙන්න ඕනෑ. මේ රට වෙනස් කරන්න නම් ලෝකයේ දියුණු වෙලා තිබෙන රටවල් දිහා අපි බලන්න ඕනෑ. සිංගප්පූරුව අරගෙන බලන්න. සිංගප්පූරුව අපට වඩා වැටිච්ච රටක්. ඒ රට කොහොමද ගොඩ ගත්තේ? ඒ පාලකයා මෙන්ම ඒ රටේ පාර්ලිමේන්තුවේ හැම කෙනාම, පහළ හිටපු හැම කෙනාම එකට එකතු වුණා. අපේ රටේ එහෙම දෙයක් වුණාද? අපේ රටේ අවුරුදු එකහමාරකට පෙර තිබුණු තත්ත්වය අපි දන්නවා. ඒ වෙලාවේ අපි හැම කෙනාටම පාර්ලිමේන්තුවට එන්න බැරි වුණා; මහ පාරේ යන්න බැරි වුණා. ඒ වෙලාවේ අපි

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

හැංගිලා හිටියා; අපි ගුටි කෑවා. අපේ ගෙවල් ගිනිබත් කෙරුවා. මිනිස්සු මැරුවා. ඒ වාගේ යුගයක් මගේ ජීවිතේට දැකලා නැහැ. එහෙම තියෙද්දීත් අපි එකතු වුණාද? නැහැ. අපි මොනවාද කෙරුවේ? "අපට තනතුරු භාර ගන්න බැහැ. අපි ඡන්දයක් තියලා ආණ්ඩුවක් ගන්න ඕනෑ" කියලා තමයි විපක්ෂයේ හැම එක්කෙනාම වාගේ කල්පනා කෙරුවේ. එහෙම කල්පනා කරපු නිසා තමයි අද ලංකාව මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

අද අපේ ව්‍යාපාරිකයෝ වැටිලා. මේක, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොයම් කපන කාලය. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වී ටිකවත් ගන්න විධියක් නැහැ. සුළු පරිමාණ වී මෝල්කාරයෝ හැම කෙනාගේම ව්‍යාපාර වැටිලා. ඒ නිසා ගොවීන්ගේ වී ගන්න කෙනෙක් නැහැ. මම අපේ ආණ්ඩුවටත් ඇඟිල්ල දික්කරනවා. අපේ ජනාධිපතිතුමනි, කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමන්ලා තවම බලාගෙන ඉන්නවා. ගොවි මහත්වරු වී කරල් කපලා අස්වැන්න ගන්න කාලය වෙලාත් තවම ලංකාවේ එක තැනකවත් වී ගබඩාවක් ඇරලා නැහැ. රජය තවම වී කිලෝවක්වත් මිල දී ගත්තේ නැහැ. මිනිස්සු මහ පාරේ වී වෙළඳමින් වී ගොඩ ගහගෙන ඉන්නවා. ගත්තු ණය ගෙවන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ජනාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා වගකීමක් භාර ගත්තු ජනාධිපති කෙනෙක්. ඔබතුමාගේ කෘෂිකර්ම ඇමතිතුමාගෙනුත් මම ඉල්ලීමක් කරනවා, ඔබතුමන්ලා මේ ගොවි මහත්වරුන්ගේ ප්‍රශ්නවලට වහාම විසඳුමක් ලබා දෙන්න කියලා.

ඒ වගේම තමයි, අපේ සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය ගෙවන්න බැරි වෙලා ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයට ණය ගෙවන්න බැරි වෙලා CRIB එකට අහු වෙලා තිබෙනවා. ඒ CRIB එක නිසා ඒ අයට ඉදිරියේදී business කරන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. වහාම මේ ප්‍රශ්නයට සාධාරණ විසඳුමක් ලබා දෙන්න. බැංකුවෙන් මහා විශාල විධියට ණය ගත්තු අයට එහෙම වෙලා නැහැ. සාධාරණ විධියට වෙළඳාම කරපු වෙළඳුන්ගේ ඉදිරි වෙළඳාම කරන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒ වෙළඳුන්ට සාධාරණ විසඳුමක් ලබා දීලා මේ ලංකාව ලෝකයේ දියුණු වෙච්ච රටක් විධියට අපි ඉදිරියට අරගෙන යන්න ඕනෑ. එහෙම නැතුව ජනතාව රවට්ටලා අපි ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයෙන් ජය ගන්න ඕනෑය කියන දේශපාලනය කරන එක මම නම් අනුමත කරන්නේ නැහැ. ඇයි? අපේ රටේ තිබෙන තත්ත්වය අපි ඔක්කෝම දන්නවා. මේ වැටිච්ච රට ගොඩ ගන්න එක නායකයෙකුට විතරක් කරන්න බැරි දෙයක්. අපි ඔක්කෝම එකට එකතු වුණොත් පමණයි මේ ලංකාව ගොඩ ගන්න පුළුවන්. මම කලින් කිව්වා වාගේ අපේ රජයේ ඉන්න නිලධාරි ගොල්ලන්ටත් කියනවා ඔබටත් වගකීමක් තිබෙනවා කියලා. ලංකාවේ ඡන්දදායකයන්ටත් කියනවා, ඔබ උදලු තලයට, වක් පිහියට, හාල්වලට, පොල්වලට, අරක්කු කාලට, බත් පැකට් එකට ඡන්දය දෙන්න එපා කියලා. ඔබලාගේ ඡන්දයේ වටිනාකම ඔබ දන්නවා. පොඩි දේවල් දීලා ඔබ රවට්ටනවා. එහෙම රැවටිලා අන්තිමට ඔබගේ අනාගත දරුවන්ට විශාල ප්‍රශ්නයක් ඇති වෙනවා. ලෝකයේම අධ්‍යාපනයෙන් අපේ ලංකාව තමයි දියුණු වෙලා තිබෙන්නේ. හැබැයි, අපේ දරුවන්ට හරියට පාසලක් නැහැ. ලංකාවේ අධ්‍යාපනය තුළ එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

අපේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න නම් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනෑ. ලංකාව තුළ හැම සම්පතක්ම තිබෙනවා. අපේ රටටත් වඩා දුප්පත්ව තිබුණු රටවල්, මොන සම්පතක්වත් නැති රටවල් අද වනවිට දියුණු වෙලා තිබෙනවා. ඩුබායි, සිංගප්පූරුව වාගේ රටවල් අද වනවිට දියුණු වෙලා තිබෙනවා. කටාර් රාජ්‍යය දිහා බලන්න. ඇයි අපට ඒ වාගේ දියුණු වෙන්න බැරි? අපේ පාලකයන්ට රට ගොඩගන්න ඕනෑය, රට ඉදිරියට ගෙනයන්න ඕනෑය කියලා අවශ්‍යතාවක් නැහැ.

අපි මොනවාද කරන්නේ? කාලෙන් කාලෙට මැතිවරණයක් එනකොට, බොරු පොරොන්දු දෙනවා. මේ පොරොන්දු දේශපාලනය අපි නවත්වන්න ඕනෑ. "මම ආවොත් ඒවා දෙනවා. මේවා දෙනවා" කියන්න ඕනෑම කෙනෙකුට පුළුවන්. හැබැයි, ඒවා කරලා පෙන්වන්න ඕනෑ. එහෙම කරලා පෙන්වූවොත් තමයි විසඳුමක් ලැබෙන්නේ. ඕනෑම කෙනෙකුට ඕනෑම බරක් භාරගන්න පුළුවන්. හැබැයි, ඒ මනුස්සයාට ඒ බර ඔසවාගෙන ගමන් කරන්න පුළුවන් ශක්තිය, හයිය තිබෙන්න ඕනෑ. ඒකට ලෝකයත් එක්ක සම්බන්ධතා තිබෙන්න ඕනෑ, ලෝකයේ පිළිගැනීමක් තිබෙන්න ඕනෑ.

මට මතකයි, සුද්දන්ගේ ඩොලර් අපට ඕනෑ නැහැ, මුස්ලිම් රටවල තෙල් අපට ඕනෑ නැහැ කියපු යුගයක් ලංකාවේ තිබුණා. හැබැයි, සුද්දන්ගේ ඩොලර් සහ මුස්ලිම් රටවල තෙල් නැතුව පසුගිය කාලයේ අපි මහ පාරේ නිදා ගත්ත හැටි මතක නැද්ද? ඒ නිසා මම ඔක්කෝටම කියන්නේ මේකයි. ඒ වාගේ කථා කියලා, ඒ වචනවලින් ජනතාව සතුටු කරන්න පුළුවන්. නමුත් වචනවලින් ජනතාව සතුටු කළාට වැඩක් නැහැ. අපි ඒවා practically කරලා පෙන්වන්න ඕනෑ. එහෙම නැතුව "මටත් පුළුවන්. දෙන්නකෝ, මම භාර ගන්නම්" කිව්වාට වැඩක් නැහැ. භාර අරගෙනම බලන්න ඕනෑ. අපි දන්නවා නේ, රටේ තිබුණු තත්ත්වය.

ඒ නිසා මම ඔක්කෝගෙන්ම ඉල්ලීමක් කරනවා. රටේ ආදරණීය ජනතාවනි, ඔබ රැවටෙන්න එපා. ඔබ රැවටිලා නැවත වාරයක් පල්ලමට වැටුණොත්, ඊට පසුව කල්පනා කරලා වැඩක් නැහැ. එහෙම යුගයක් ඉදිරියට එයි. මැතිවරණ එනකොට ඔබේ ගම්වලට ඇවිල්ලා පොරොන්දු දහස් ගණනක් දෙයි. ඒ දෙන පොරොන්දු මොනවාද? සමහර අය කියනවා, මම රට සිංගප්පූරුවක් කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මතකයි පසුගිය මැතිවරණය කාලයේ එක පැත්තකින් ලී ක්වාන් යූ වාගේ කෙනෙක් හිටියා. අනෙක් පැත්තෙන් මහතිර් මොහමඩ් වාගේ කෙනෙක් හිටියා. නමුත් අද වනවිට ලී ක්වාන් යූ වාගේ සිටි කෙනාත් නැහැ, මහතිර් මොහමඩ් වාගේ සිටි කෙනාත් නැහැ. රට විනාශයි. අපි ලී ක්වාන් යූ සොයා යන්න අවශ්‍ය නැහැ, අපි මහතිර් මොහමඩ් සොයා යන්න අවශ්‍යත් නැහැ. අපේ ලංකාවේ -මාතෘ භූමියේ- ලී ක්වාන් යූ වාගේ හොඳ අය ඉන්නවා. මහතිර් මොහමඩ් වාගේ හොඳ අය ඉන්නවා. ඒ ලී ක්වාන් යූලාට, ඒ මහතිර්ලාට ශක්තිය දෙන්න. ඒ අයට මේ රට භාර දෙන්න. මේ රට ඉදිරියට ගන්න පුළුවන් දක්ෂයන්ට රට භාර දෙන්න ඕනෑ. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ තිබුණු තත්ත්වය ගැන අපි හැම කෙනාම දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

එහෙම නැහැ කියා කාටවත් කියන්න බැහැ. ඒක මහ හරින්න බැහැ. දැන් මේ රට තුළ ආර්ථිකමය වශයෙන් යම් කිසි ඉදිරි ගමනක් දකින්න තිබෙනවා. ඒ නිසා මේ රටේ සිටින හැම කෙනාටම මම කියන්නේ මේකයි. ඡන්ද කාලයට ඇවිල්ලා ඔබ

රවටන නායකයන්ට රැවටිලා නැවත මේ රට ඒ අයට භාර දුන්නොත් ඔබට නැවත වාරයක් මහ පාරේ නිදාගන්න වෙනවා. ඒ නිසා ඉදිරියේදී එවැනි යුගයකට යන්නේ නැතුව කල්පනා කරලා ලෝකයේ දියුණු රාජ්‍යයක් වශයෙන් අපි ගොඩ එන්න ඕනෑ. බලන්න, ආජන්ටිනාව දෙස. අවුරුදු නවයක් තිස්සේ ඒ රටේ ආර්ථිකය කඩා වැටී තිබෙන්නේ. තවම ගොඩ ගන්න බැරි වෙලා තිබෙනවා. ඊළඟට, පාකිස්තානය. අද ඒ රටේ ආර්ථිකයත් විනාශ වෙලා තිබෙන්නේ. බංග්ලාදේශය කියන්නේ හොඳට තිබුණු රටක්. අද වනවිට ඒ රටේ ආර්ථිකයටත් ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. එහෙම නම් අපි කල්පනා කළ යුත්තේ මොකක්ද? ලෝකයේම අපට තිබෙන එකම භූමිය අපේ මාතෘ භූමිය, මේ ලංකාව අපි රැකගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය දේශපාලනය කරනවා, රැකියාවක් වශයෙන්. හැබැයි, මගේ ලංකාවේ ඉන්නා ආදරණීය ජනතාවනි, දේශපාලනය කියන්නේ වෙළෙඳාමකුත් නොවෙයි, රැකියාවකුත් නොවෙයි, විනෝදයට කරන දෙයකුත් නොවෙයි කියන එක මම ඔබට කියනවා. දේශපාලනය කියන්නේ උතුම් දෙයක්; උතුම් කර්තව්‍යයක්. දේශපාලනය උතුම් කර්තව්‍යයක් ලෙස හිතාගෙන කටයුතු කරනවා නම්, මේ රටේ ජනතාව රවටන්නේ නැතුව ඇත්ත කියන්න පුළුවන් වෙන්න ඕනෑ. අපිට කරන්න බැරි නම් බැහැ කියන්න ඕනෑ. එහෙම කියලා අපේ රටයි, ජනතාවයි ඉදිරියට ගෙන යන්න ඕනෑ. එහෙම නැත්නම් හිඟන්නාගේ කකුලේ තිබෙන තුවාලය වාගේ හැම දාම ජනතාව විකුණ විකුණා ඡන්ද කාලයට එක එක පොරොන්දු දෙන්න තමයි වෙන්නේ. නමුත් එහෙම කරන්නේ නැතුව ලෝකයත් එක්ක ගනුදෙනු කරන්න පුළුවන්, ලෝකයත් එක්ක සම්බන්ධතා පවත්වන්න පුළුවන් දක්ෂ නායකයෙකුට ඉදිරි අනාගතයේදී අපේ රට භාර දීලා, අපි මේ මාතෘ භූමිය රකින්න ඕනෑය කියා ඔබ සියලු දෙනාගෙන්ම ඉල්ලීමක් කරමින් මා නතර වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.36]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මම මුලින්ම කථා කරන්න කැමැතියි, සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතේ - Secured Transactions Bill එකේ - තිබෙන ගැටලු, ප්‍රශ්න කිහිපයක් ගැන. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපි තවම මේ පනත් කෙටුම්පතට අදාළ සංශෝධන දැකලා නැහැ. මේ පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරනවා නම්, ඒ සංශෝධන අදාළ කාරක සභාවට ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ සංශෝධන ඒ කාරක සභාව අනුමත කරලා, කථානායකතුමාට රිපෝර්තුවක් ලබා දෙන්න ඕනෑ. ඊට පස්සේ තමයි ඡන්දයකට යන්න පුළුවන්. සංශෝධන ඉදිරිපත් කරන ක්‍රමය ගැන ප්‍රශ්නයක් මම මේ ඉදිරිපත් කරන්නේ. ඒකට පිළිතුරු දෙන්න මේ ගරු සභාවේ කවුරුවත් නැහැ. නමුත්, අපි ඒ ක්‍රමය හැම තිස්සේම අනුගමනය කළ යුතුයි. Online Safety Bill එකේදී කළා වාගේ මේ ක්‍රමය යටපත් කිරීම සුදුසු නැහැ. මම ඒක මුලින්ම කියන්න ඕනෑ.

මේ සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පතින් කියන්නේ මොකක්ද? සාමාන්‍යයෙන් අපි ණයක් ගන්න යනවා නම්, නිශ්චල වත්කමක් තමයි ඇපයට තබන්නේ. ඉඩමක්, ගොඩනැගිල්ලක්, කර්මාන්ත ශාලාවක්, නිවසක් වාගේ දෙයක් බැංකුවකට හෝ සමාගමකට ඇපයට තබලා තමයි අපි ණය ගන්නේ. ඒකට ක්‍රමයක් තිබෙනවා. නමුත්, මේ පනත් කෙටුම්පතින් කථා කරන්නේ චංචල දේපළ -වාහනයක් වෙන්න පුළුවන්, inventory එකක් වෙන්න පුළුවන්, බඩු තොග වෙන්න පුළුවන්- දීලා ණය ගන්නේ කොහොමද කියන එක ගැන. ඒ එක්කම, ණය ගන්න පුළුවන් සීමාව පුළුල් කර තිබෙනවා. අපට වත්කම් තිබෙනවා. නමුත්, ඒ හැම වත්කමක්ම නිශ්චල වත්කමක් නොවෙයි. චංචල වත්කම් තිබෙනවා. දැන් චංචල වත්කම් හරහාත් ණය ගන්න පුළුවන්. ඒ විධියට බලපුවාම නම් මේ පනත් කෙටුම්පත වැදගත්. අපි ඒකේ පසුබිම ගැන ටිකක් බලමු.

අපි මේ රටේ ව්‍යාපාර කරන කෙනෙක් ගැන බලමු. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, දකුණු ආසියාවේ වැඩිම විදුලි බිල ගෙවන රට බවට ලංකාව පත් වෙලා තිබෙනවා. දකුණු ආසියාවේ අනෙක් රටවල විදුලි බිල එක්ක සසඳපුවාම ලංකාවේ නිවසක සාමාන්‍ය විදුලි බිල අනෙක් රටවල නිවසක විදුලි බිල මෙන් තුන් ගුණයක් පමණ වෙනවා. ඒ වාගේම අපි ඊයේ පෙරේදා දැක්කා, මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ උණුසුම් තත්ත්වයක් ඇති වුණු බව. එතැනට එක එක අය ඇවිල්ලා විදුලි බිල ගැන වාද විවාද කළා. ඔවුන්ගේ මතය වුණේ විදුලි බිල අඩු කරන්න ඕනෑ කියන එකයි. ඒ අය හුඟක් වෙලාවට ඉල්ලුවේ ගාස්තු සංශෝධනයක් අවශ්‍යයි කියලායි. ඒ වාගේ පරිසරයක කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට, microfinance පැත්තේ ව්‍යාපාරවල නිරතවෙන අය ඔවුන්ගේ කටයුතුවල නිරත වෙන්නේ කොහොමද? විදුලි බිල වැඩි වීම නිසා ඒ අයගේ වියදම වැඩිවෙලා තිබෙනවා.

ඒ පසුබිම තුළම මම සඳහන් කරන්න ඕනෑ, මන්දපෝෂණය ගැනත්. 2023දී ළමා මන්දපෝෂණයෙන් පෙළෙන සංඛ්‍යාව - ජනවාරි මාසය ඉඳලා දෙසැම්බර් මාසය වෙනතුරු- මිලියන 2.9යි. ඒ සඳහා මානුෂීය ආධාර ඕනෑ කියලා යුනිසෙෆ් සංවිධානය කියලා තිබෙනවා. ඒ කියන්නේ එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික ළමා අරමුදල. ඒ වාගේම ඔවුන් සඳහන් කරනවා, ළමුන් හා කාන්තාවන් මිලියන 2.8කට පෝෂණය අවශ්‍ය බව හඳුනාගෙන තිබෙනවා කියලා. ළමා මන්දපෝෂණ ප්‍රශ්නය හුඟක්ම බලපාන්නේ කාන්තාවන්ට. මොකද, දරුවන්ගේ පීඩනය අම්මාට තමයි දැනෙන්නේ.

අද ග්‍රාමීය කාන්තාවන් මුහුණ දෙන ප්‍රධානතම ගැටලුවක් තමයි ක්ෂුද්‍රමූල්‍ය ණය අර්බුදය. ඔවුන් ණය ලබාගෙන කර්මාන්තයක් කරගෙන යන්න, microfinance වැඩක් කරන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි, ඒ ණය ගෙවා ගන්න බැරි වුණාම කාන්තාවන් ගොදුරුවලට හසු වෙනවා. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳව කළ පර්යේෂණයකට අනුව ක්ෂුද්‍රමූල්‍ය ණය නිසා කාන්තාවන් ලක්ෂ 28ක් පීඩාවට පත්වෙලා තිබෙනවා. මේ රට බංකොලොත් වුණා විතරක් නොවෙයි, මේ රටේ කුඩා ව්‍යාපාරත් බංකොලොත් වෙලා තිබෙනවා.

මේ ආර්ථිකය බිඳ වැටීමෙන් ව්‍යාපාර 263,000ක් වැසී ගොස් තිබෙන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කරන ලද නවතම සමීක්ෂණයෙන් හෙළිදරව් වෙනවා. මේක රජයේ ආයතනයක්. රජයේ ආයතනයක් කියන දේ තමයි මම මේ සඳහන් කරන්නේ. අපේ රටේ ව්‍යාපාර 263,000ක් වසා දමන්න සිදුවෙලා තිබෙනවා. ඉතින්, මෙවැනි පරිසරයක් තුළ ඉඳගෙන තමයි දැන් මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ. එතකොට, අපි මේ පනත් කෙටුම්පතේ තිබෙන ගැටලු සහ ප්‍රශ්න ගැන බැලුවොත්, එක් කාරණයක් තමයි අධීක්ෂණ මණ්ඩලයක් - Board of Authority - පිහිටුවීම කියන එක. එතකොට, මේක ස්වාධීන

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

වෙන්න ඕනෑ. පරාටේ නීතිය හරහා මම ඒක පැහැදිලි කරන්නම්. ස්වාධීන වෙනවා නම්, මුදල් අමාත්‍යාංශයෙන් මුදල් ලබා ගන්න ගියාම අනිවාර්යයෙන්ම එතැන යම් කිසි සම්බන්ධතාවක් ඇති වෙනවා. ඒ නිසා මෙහි ස්වාධීනත්වය ආරක්ෂා කරන්න ඕනෑ.

ඒ වාගේම සේවකයන්ගේ දීමනා පිළිබඳව ගත්තොත්, මම දැක්කා මෙහි එක කොටසක සඳහන් කර තිබෙනවා, එහි අධීක්ෂණය ඇමතිතුමා යටතට ගේනවා කියලා. නමුත් මට හිතෙන එක දෙයක් තමයි, මේක ස්වාධීන වෙන්න ඕනෑ කියන එක.

මම CRIB එක ගැනත් කථා කරන්න ඕනෑ. බැංකුවකින් හෝ වෙනත් මූල්‍ය ආයතනයකින් ණයක් අරගෙන එම ණය ගෙවා ගන්න බැරි වුණොත් ගෙවන්න වැඩිපුර කාලයක් ලබා දෙනවා. ඒත් ගෙවන්න බැරි වුණොත් CRIB එකේ නම සඳහන් කරනවා, "මෙන්න මේ කෙනා ණය ගෙවලා නැහැ"යි කියලා. එතකොට, ඒ විස්තර අනෙකුත් මූල්‍ය ආයතන සමඟ බෙදා ගන්නවා. ඊට පස්සේ ණයක් ගන්න තව මූල්‍ය ආයතනයකට ගියොත්, CRIB එකේ නම සඳහන් වෙලා තිබෙනවාද නැද්ද කියලා ඒ අය බලනවා. නම සඳහන් වෙලා තිබෙනවා නම්, ඒ ආයතනයෙන් ණය දෙන්නේ නැහැ. අපි CRIB එක දිහා බැලුවොත් කියන්න පුළුවන්, ඒක ක්‍රියාත්මක වන ආකාරය ගැන අපට සෑහීමකට පත් වෙන්න පුළුවන් කියලා.

2009 අංක 49 දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ CRIB එක ක්‍රියාත්මක වුණා. දැන් මේකෙන් කරන්න හදන්නේ ඒක ස්වාධීන වෙනම අධිකාරියක් හදලා ඒ කටයුතු ක්‍රියාත්මක කිරීමටයි. ඒ ස්වාධීනත්වයට යා යුතුයි කියායි මම නම් හිතන්නේ. ඒ නිසා තමයි මම මෙතැන මේ කරුණු සඳහන් කරන්නේ. අමාත්‍යාංශයේවත්, ඇමතිතුමාගේවත් අධීක්ෂණය නොවෙයි වැදගත්. එහෙම වුණොත් ඔක්කෝම පත් කිරීම් ඇමතිතුමා කරයි. පඩි වැඩි කරනකොට ඇමතිතුමා ඒක වෙන්නේ කොහොමද කියන එකත් තීරණය කරයි. එම නිසා ඒ තත්ත්වයෙන් මේ කටයුතු ගැලවෙන්න ඕනෑ කියන කාරණය සඳහන් කළ යුතුමයි.

ඒ වාගේම පරාටේ නීතිය ගැනත් මම ඉක්මනින් වචනයක් කියන්න කැමැතියි. අපි දන්නවා, අද පරාටේ නීතිය ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඉතින්, හුඟක් අය තර්ක කරලා කියනවා, පරාටේ නීතිය අයින් කරන්න ඕනෑ කියලා. මම හිතන විධියට අපට එච්චර සුළු විසඳුමකට යන්නට බැහැ. මොකද, ඒ තරම් සුළු විසඳුමකට ගියොත් අන්තිමට වෙන්නේ රටේ ණය දෙන ප්‍රමාණය එක් වරම අඩු වන එකයි.

ඇත්තටම අපි දැන් ආර්ථිකය වර්ධනය වන තැනකට යන්න ඕනෑ. ආර්ථිකය වර්ධනය වන තැනකට යන්න නම් විශාල ව්‍යාපාරිකයාට විතරක් නොවෙයි, කුඩා ව්‍යාපාරිකයාට, ඒ වාගේම ගෙදර ඉඳලා ව්‍යාපාර කරන කාන්තාවට ණය මුදලක් ලබා ගැනීම අනිවාර්යයෙන්ම පහසු කළ යුතුයි. දැන් පරාටේ නීතිය ක්‍රියාත්මක වුණත් එහි අඩු පාඩු තිබෙනවා. උදාහරණයක් හැටියට, ණයක් ගන්නකොට ඒ සඳහා කර්මාන්තශාලාවක් හෝ ඉඩමක් වාගේ නිශ්චල දේපළක් ඇපයට තැබුවා නම්, පසුව ණය පියවන්න ඕනෑ නේ. බැංකු හෝ අනෙකුත් මූල්‍ය ආයතන ඒකට මාස ගණන් කල් දෙනවා, සාකච්ඡා කරනවා. අන්තිමට එම ණය මුදල ගෙවාගන්න බැරි වුණොත් කියනවා, "ඔබගේ දේපළ විකුණන්න Board of Directors එක තීරණයක් අරගෙන තිබෙනවා. ඒ අනුව එම දේපළ විකුණන්න පත්තරේ දානවා" කියලා. ඒක විකුණනකොට ඒ ණය ගත් පුද්ගලයාට කිසිම දෙයක් කරන්න බැහැ. කොහොම වුණත් එම දේපළට වටිනාකමක් තිබෙනවා. උදාහරණයක් හැටියට, එහි වටිනාකම රුපියල්100යි, ඒ වටිනාකමට රුපියල් 75ක ණය මුදලක් අරගෙන තිබෙනවා කියලා හිතමු කෝ. එම දේපළ විකුණනකොට සමහර වෙලාවට ඒක විකුණන්න වෙන්නේ රුපියල් 50ට වෙන්න පුළුවන්. රුපියල් 50ට වික්කොත්, ඒ කථාව එතැනින් ඉවරයි. හැබැයි, එම දේපළේ වටිනාකම රුපියල් 50යි කියන එක කොහොමද දන්නේ? මොකද, ණය අයකර ගන්න ඕනෑ කෙනාම තමයි එහි වටිනාකම තීරණය කරන්නේ. ඒකයි එතැන තිබෙන ගැටලුව. ඉතින් කියනවා, "නැහැ, නැහැ, අපි පත්තරේ දානවා. මේක විකුණනවා, ඇවිල්ලා බලන්න කියලා එක එක්කෙනාට කියලා තිබෙනවා" කියලා. නමුත්, විශාල වශයෙන් චෝදනා තිබෙනවා. මම මේ ගැන කථා කරනකොට කථා කරන්නේ, බැංකුවල නාමයත් ආරක්ෂා වෙන්න ඕනෑය කියන පදනම මත ඉඳගෙන. මොකටද, මේ වගේ චෝදනාවලට මුහුණ දෙන්නේ? එම නිසා මම කියන්නේ, ස්වාධීන,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හරි.

ඒ නිසා මම කියන්නේ, ස්වාධීනව එම දේපළේ වටිනාකම තීරණය කළ යුතුයි කියලායි. ණය දුන්න ආයතනයට අමතරව, ස්වාධීනව වටිනාකම තීරණය කළ යුතුයි. ඒකයි මම කියන්නේ, පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම පැත්තක තියලා, අපි මේ වෙනස කරන්න ඕනෑ කියලා. මොකද, ණය ගත්ත එක්කෙනාටත් සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ. මොකද, ඒ දේපළේ වටිනාකම හරියට බලන්න ඕනෑ. ඒකට Independent valuation එකක් අවශ්‍යයි. එතකොට දන්නවා, හරියටම එතැන ජරා වැඩක්, වංචාවක් සිදු වෙලාද කියලා. සමහර වෙලාවට ඒ දේපළ අඩුවෙන් විකුණලා ලාභ ලබන සමහර නිලධාරීන් ඇති. ඒ චෝදනාව එනවා. මිනිස්සු පාර්ලිමේන්තුවේ කමිටුවලට ඇවිල්ලා මන්ත්‍රීවරුන් ඉදිරියේ හරියට ඒ වාගේ චෝදනා කරනවා. ඒක නිසා බැංකු ආරක්ෂා වෙන්නත් ඕනෑ. ඒවාත් ආරක්ෂා වෙන්න ඕනෑ නිසා තමයි ඒ ගැන අනිවාර්යයෙන්ම බලන්න කියලා මම යෝජනා කරන්නේ.

මම මහ බැංකුවෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. මොකද, අධීක්ෂණය කරන්නේ මහ බැංකුව නේ. ඒ නිසා ඒ අයගෙන් මම අහන්න කැමැතියි, ඔබතුමන්ලාට මේ පරාටේ නීතිය - parate execution law - ක්‍රියාත්මක කිරීමේ දත්ත තිබෙනවාද කියලා. උදාහරණයක් හැටියට ගත්තොත්, 2023 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය වනතුරු මේ වාගේ parate execution කීයක් කළාද? මේ parate execution කරලා කොච්චර නිශ්චල දේපළ අත් පත් කර ගත්තාද? ඒ වාගේම කොච්චර විකුණුවාද? ඒ විකුණපු ඒවායේ වටිනාකම කොච්චරද? ඒ වටිනාකම හරහා ලබා ගත්ත මුදල සාධාරණද නැද්ද කියන එක බලන්න ඕනෑ. ඒ වාගේ සාධාරණ ක්‍රමයකට මහ බැංකුවෙන් එය අධීක්ෂණය කළ යුතුයි. ඒක මහ බැංකුවම කරන්න ඕනෑ නැහැ. නමුත්, ඒ ගොල්ලන්ගේ උපදෙස් මත, ස්වාධීනව තක්සේරු කරන්න ඕනෑ. ඒ දේපළේ වටිනාකම මත ණය පියවා ගෙන, ඉතිරි මුදල ඒ ණය ගත්ත අයට යා යුතුයි.

මේ ටිකත් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Sir, I am going to wind up after asking this question very quickly in English and I would be grateful if somebody could provide some clarification on that. The Secured Transactions Act of 2009 as well as the new Secured Transactions Bill state that the secured collateral does not need to be owned by the debtor. This implies that the owner of the collateral should give the consent to the registering of the asset as security, but it is not explicitly stated. The Secured Transactions Act of 2009 states that the debtor has the right to continue to use the asset, but the new Bill states that the collateral is to be perfected. What the Secured Transactions Bill means by "perfection" is given in Clause 29(3), which states, I quote:

> "...the collateral shall be actually delivered into the possession and custody of the secured party or his authorized representative, and continue to remain actually, ostensibly and *bona fide* in such possession, until such time as the secured party seeks to enforce its rights in respect...."

So, the question I am asking is, does it mean that the debtor cannot have access to the asset for productive purposes, given the new law that has been brought in and would it not be detrimental to the debtor, especially the SMEs, if the asset is pledged as collateral, but has to be handed over to the secured party? I am just asking for a clarification to get this cleared.

Thank you very much for the time provided.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. Selvarajah Kajendran. You have six minutes.

[பி.ப. 2.49]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இச்சபையில் ஒருசில சட்டத் திருத்தங்கள் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. காலத்துக்குக் காலம் பல்வேறுபட்ட சட்டங்கள் உருவாக்கப்பட்டு வருவதோடு, அவ்வப்போது சட்டத் திருத்தங்களும் மேற்கொள்ளப்படுகின்றன.

இந்த நாடு முன்னேற்றப் பாதையில் சென்றுகொண்டு இருக்கின்றதா? என்றால், 'இல்லை' என்றுதான் கூறவேண்டும். நாடு அதலபாதாளத்துக்குள் வீழ்ந்துள்ளதால் பெற்ற கடனைச் செலுத்த முடியாமல் இருக்கிறது; மக்கள் தங்களுடைய நாளாந்த வாழ்க்கையைக் கொண்டுசெல்ல முடியாமல் பட்டினியோடு போராடுகின்றார்கள். இவ்வாறான துரதிருஷ்டவசமான ஒரு நிலையில்தான் இந்த நாடு இருக்கின்றது. இந்த நாட்டைச் சரியான பாதையில் கட்டியெழுப்புவது தொடர்பான சிந்தனையுடைய தலைவர்கள் இந்த நாட்டில் இல்லாததன் காரணத்தினால்தான் இந்த நாடு தொடர்ச்சியாக இவ்வாறான பின்னடைவுகளைச் சந்தித்துக்கொண்டிருக்கின்றது.

நீங்கள் இந்த நாட்டின் வரலாற்றை 75 வருட காலம் பின்னோக்கிப் பாருங்கள்! நீங்கள் எங்களுடைய தேசத்தின்மீது பாரியதோர் இனவழிப்பைக் கட்டவிழ்த்து விட்டிருந்தீர்கள்! அந்த இனவழிப்புக்கு எதிராகவும் வட, கிழக்குத் தமிழர் தேசத்தைப் பாதுகாப்பதற்காகவும் எங்களுடைய தேசியத் தலைவர் பிரபாகரன் அவர்கள் ஆயுதப் போராட்டம் ஒன்றை நடத்தியிருந்தார். உங்களுடைய அரசின் பாதுகாப்புச் செலவு மற்றும் உங்களுடைய படைகளுக்கு ஈடுகொடுத்துத்தான் அந்த ஆயுதப் போராட்டத்தை அவர் நடத்தியிருந்தார். அதுமாத்திரமன்றி, அவர் அந்தப் போராட்டக் காலத்தில் -20 ஆண்டுகளுக்கும் மேலாக - வடக்கு, கிழக்கில் ஒரு நடைமுறை அரசை நிறுவியிருந்தார். அப்பொழுது எங்களுடைய மக்கள் அங்கு ஒரு பொருளாதாரச் செழுமையை அனுபவித்தார்கள். பொருளாதார ரீதியான ஸ்திரத்தன்மையுடன், எங்களுடைய மக்கள் மிகப் பாதுகாப்பானதொரு சூழலில் வாழ்ந்த ஒரு வரலாறு இருக்கின்றது.

இறுதி யுத்தத்தின்போது, நீங்கள் எங்கள்மீது ஓர் இன வழிப்பைச் செய்து, எங்களுடைய பிரதேசத்தைக் கைப்பற்றினீர்கள். அப்பொழுது அங்கிருந்த பெருமளவான தங்கத்தையும் கைப்பற்றினீர்கள்! அவை தமிழக வைப்பகத்தில் எந்தளவுக்கு நேர்த்தியாக பேணிப் பாதுகாக்கப்பட்டிருந்தன என்பது உங்களுக்கு நன்றாகத் தெரியும்! நீங்கள் எங்கள்மீது யுத்தம் செய்தீர்கள்! உங்களுடைய இனவழிப்பிலிருந்து தப்பித்துக்கொள்வதற்காக எங்களுடைய தேசமும் யுத்தம் செய்தது. யுத்த சூழலுக்கும் முழுமையான பொருளாதாரத் தடைக்கும் மத்தியில், எங்களுடைய தேசம் தனக்குக் கிடைத்த வளங்களை வைத்து, தன்னைப் பொருளாதார ரீதியாக வளர்த்துக்கொள்ளக்கூடிய அளவுக்கு இருந்திருக்கிறது என்றால், அதற்குப் பிரதான காரணம், உண்மையும் நேர்மையும் அர்ப்பணிப்பும் உள்ள தலைவர் எங்களுக்கு இருந்ததுதான்.

நீங்கள் உலகம் முழுவதுமிருந்து பெருந்தொகை நிதியையும் உதவிகளையும் பெற்று, இந்த யுத்தத்தை வெற்றிகொண்டு இருந்தாலும்கூட, யுத்தம் முடிந்து 14 ஆண்டுகளுக்குப் பிற்பாடு, உங்களுடைய நாடு அதலபாதாளத்தில் வீழ்ந்திருக்கின்றது. இதற்கு இரண்டு காரணங்கள் உண்டு. ஒன்று, உங்களுடைய தலைவர்களிடம் நேர்மை இல்லை. அடுத்தது, இந்தத் தீவில் இருக்கக்கூடிய அனைத்து சமூகங்களையும் அரவணைத்துச் செல்கின்ற மனப்பான்மை உங்களிடம் இல்லை. ஆகவே, நீங்கள் உங்களுடைய போக்கில் ஒரு மாற்றத்தை ஏற்படுத்திக்கொள்ள வேண்டும்.

நீங்கள் அடுத்த சனாதிபதித் தேர்தலுக்குத் தயாராகிக் கொண்டு இருக்கின்றீர்கள். இப்பொழுதே பல வேட்பாளர்களுடைய பெயர்கள் அடிபடுகின்றன. ஆனால், வட, கிழக்குத் தமிழ் சமூகத்தை உள்வாங்குகின்ற வகையில், இந்த நாட்டில் 75 வருடங்களாக இருந்து வருகின்ற இனமுறுகலுக்கும் இனப் பாகுபாட்டுக்கும் காரணமாக இருக்கின்ற ஒற்றையாட்சி முறைமையை ஒழித்து, ஒரு சமஷ்டி அரசியலமைப்பைக் கொண்டுவந்து, இந்த நாட்டை ஐக்கியப்படுத்துவது பற்றி இதுவரை எந்தவொரு வேட்பாளரும் வாய்திறக்கவில்லை. இவ்வாறுதான் நிலைமைகள் தொடரப்போகின்றன என்றால், உங்களால் ஒருபோதும் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியாது.

இன்று சீனாவுக்கும் இந்திய மற்றும் மேற்குத் தரப்புக்கும் இடையிலான பூகோள ஆதிக்கப்போட்டி மிகவும் தீவிரமடைந்துகொண்டு இருக்கின்றது. இந்த நாடு இந்தப் போட்டியில் சிக்கிச் சின்னாபின்னமாகி, அழிந்து போகின்ற ஒரு நிலைமைதான் ஏற்படுமே தவிர, ஒருபொழுதும் இந்த

[ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා]

நாட்டைக் கட்டியெழுப்ப முடியாது. சிங்கப்பூரானது கேந்திர முக்கியத்துவம் வாய்ந்த இடத்தில் இருந்தாலும்கூட, அது தன்னை மிக அமைதியாக வளர்த்துக்கொண்டு இருக்கின்றது. அதற்கு அந்த நாட்டு ஆட்சியாளர்களின் இனவாதமற்ற, மதவாதமற்ற, பாரபட்சமற்ற மனநிலைதான் காரணமாக இருக்கிறது. ஆகவே, தயவுசெய்து நீங்கள் சிந்தித்து முடிவெடுங்கள்! அதன்மூலமாக மட்டும்தான் இந்த நாட்டைக் கட்டியெழுப்ப முடியும்.

தமிழர்களாகிய நாங்கள் இந்தத் தேசத்தைக் கட்டியெழுப் புவதில் பங்கெடுப்பதற்குத் தயாராக இருக்கின்றோம். அதற்கு இந்த நாட்டில் ஒற்றையாட்சி முறைமை ஒழிக்கப்பட்டு, எங்கள் மீதான ஒடுக்குமுறைகள் அனைத்தும் நிறுத்தப்பட்டு, தமிழர் தேசத்தவர்கள் சிங்களத் தேசத்தவர்களோடு சமத்துவமாக வாழக்கூடிய ஒரு சமஷ்டி அரசியலமைப்பை நீங்கள் கொண்டு வர வேண்டுமென்று நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

எங்களுடைய தேசத்துக்கு எதிரான பொருளாதார ரீதியான ஒடுக்குமுறைகள் தொடர்ந்தும் தீவிரமடைந்து வருகின்றன. அதுமாத்திரமன்றி, எங்களுடைய குடிப்பரம்பலை மாற்றிய மைப்பதற்கான வேலைத்திட்டங்களும் தீவிரமடைந்து வருகின்றன. மட்டக்களப்பு மாவட்டத்தின் மயிலத்தமடு பிரதேசத்திலிருந்து சிங்கள - பௌத்த ஆக்கிரமிப்பாளர்களை அகற்றி, அங்குள்ள தமிழ் பண்ணையாளர்கள் சுதந்திரமாகத் தொழில் செய்யக்கூடியதொரு நிலைமையை ஏற்படுத்த வேண்டுமென நாங்கள் தொடர்ந்து கோரிக்கை விடுத்து வருகின்றோம். கடந்த வாரம்கூட, சிங்களப் பெரும்பான்மை இனத்தவர்களால் அங்குள்ள பண்ணையாளர்களின் மேய்ச்சல் தரை தீயிட்டுக் கொளுத்தப்பட்டு இருக்கிறது. இந்த நடவடிக்கைக்கு காவல்துறையினரும் மகாவலி அபிவிருத்தி அதிகாரசபையினரும் முழுமையாகத் துணை நிற்கிறார்கள். எங்களுடைய பிரதேசங்களில் இன்றும் சிங்கள - பௌத்த மயமாக்கல் செயற்பாடுகள் நடைபெற்றுக்கொண்டு இருக் கின்றன. தையிட்டியில் சட்டவிரோதமாகக் கட்டப்பட்ட பௌத்த விகாரை இன்னும் அகற்றப்படவில்லை. அதுமாத்தி ரமன்றி, அதற்காகப் பறிக்கப்பட்ட காணிகளும் இன்னும் காணி உரிமையாளர்களிடம் மீளக் கையளிக்கப்படவில்லை.

இன்று வடக்கு மாகாணத்தில் கடற்றொழில் முற்றாக அழிக்கப்பட்டுக்கொண்டு இருக்கின்றது. நேற்று முன்தினம் கூட, இந்தியாவிலிருந்து அத்துமீறி வந்த மீனவர்களால் யாழ். மாவட்ட மீனவர்களின் பல மில்லியன் ரூபாய் பெறுமதியான வலைகள் அறுக்கப்பட்டு இருக்கின்றன. அத்துடன், அவர்களு டைய கடல் வளமும் அழிக்கப்பட்டிருக்கிறது. இவை திட்டமிட்ட ரீதியில் தமிழர்களுடைய பொருளாதாரத்தை அழிப்பதற்காக அரசாங்கத்தால் மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகளாகும். எங்களுடைய பிரதேசங்களிலுள்ள நிலங் களையும் கரையோரங்களையும் ஆக்கிரமித்து, கடற்படையினர் நிலைகொண்டு இருக்கிறார்கள். தமிழர்களை ஒடுக்குவதற்காக மட்டும்தான் அங்கு கடற்படையினர் நிறுத்தி வைக்கப்பட்டு இருக்கின்றார்களே ஒழிய, அவர்களுடைய பொருளாதாரத் தைப் பாதுகாப்பதற்காக அல்ல. வெறுமனே நீங்கள் நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதாகத் தொடர்ச்சியாகச் சொல்லி வருகிறீர்கள். இந்த நிலைமைகள் மாற்றப்பட வேண்டும். அங்கு கடற்படையினர் குந்தி இருக்கத்தக்கதாக எங்களுடைய கடல் வளங்கள் அழிக்கப்படுகின்றது என்றால், எங்களுடைய மீனவர்களுடைய முதலீடுகள் அழிக்கப் படுகின்றது என்றால், இந்த அரசாங்கத்தின் நோக்கம் என்ன?

நமது நாட்டின் பொருளாதாரத்துக்குப் பாரியளவில் பங்களிப்புச் செய்யக்கூடிய கடற்றொழில் வருமானம் அழிக்கப் பட்டாலும் பரவாயில்லை; தமிழர்கள் அழியவேண்டும் என்பதற்காக நீங்கள் அச்செயற்பாட்டைத் தடுக்காமல் பார்த்துக்கொண்டு இருக்கின்றீர்கள். இந்த நிலைமை தொடரு மாக இருந்தால், தமிழ் மக்களுக்கும் சிங்கள மக்களுக்கும் இடையிலான இடைவெளி வளருமே தவிர, ஒருபொழுதும் இந்த நாடு முன்னேறாது. ஆகையால், தயவுசெய்து நீங்கள் தமிழர்களுடன் ஒரு புரிந்துணர்வுக்கு வருவதற்குரிய நடவடிக்கைகளை எடுங்கள்! இந்த நாட்டிலுள்ள ஒற்றையாட்சி முறைமையை நீக்குங்கள்! வடக்கு, கிழக்கில் தமிழர்களுக்கான சுயாட்சி அதிகாரத்தைக் கொடுங்கள்! நாங்களும் நீங்களுமாகச் சேர்ந்து வீழ்ந்துபோயிருக்கின்ற இந்த நாட்டைக் கட்டியெழுப் புவோம். பூகோள ஆதிக்கப் போட்டிக்குள் சிக்கியிருக்கின்ற இந்த நாட்டை அமைதியானதொரு பூங்காவாக மாற்றி, ஆசியப் பிராந்தியத்தில் - இந்து சமுத்திரப் பிராந்தியத்தில் - வளர்ச்சி மிக்கதொரு நாடாகக் கட்டியெழுப்பு வதற்கு நீங்கள் இணைந்து செயற்பட முன்வர வேண்டுமெனக் கேட்டு விடைபெறு கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. S. Viyalanderan. You have 18 minutes.

[பி.ப. 2.57]

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා (වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ச. வியாழேந்திரன் - வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. S. Viyalanderan - State Minister of Trade)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் எனக்குப் பேச வாய்ப்பளித்தமைக்கு நன்றி. நாட்டினுடைய பொருளாதாரமானது கடந்தகால நிலை யிலிருந்து தற்போது படிப்படியாக எழுச்சி கண்டு வருகின்ற இந்தச் சூழலில், எமது பகுதிகளில் தவிர்க்கப்படவேண்டிய சில பிரச்சினைகளைச் சிலர் திட்டமிட்டு ஏற்படுத்துகின்ற நிலைமை யைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இது முற்றிலும் தடைசெய்யப்பட வேண்டும். அந்த அடிப்படையில் நான் இன்றைய விவாதத்தில் மூன்று விடயங்கள் குறித்து இந்த உயரிய சபையிலே பேசலாமென்று நினைக்கின்றேன்.

முதலாவது, மட்டக்களப்பு மாவட்டத்திலே மண்முனைப் பற்றுப் பிரதேச செயலகப் பிரிவில் உள்ள கிராமங்களில் மிக முக்கியமான, வரலாற்றுச் சிறப்புமிக்க ஒன்றாக ஆரையம்பதி என்று சொல்லப்படுகின்ற பழம்பெரும் கிராமமொன்று அமைந்துள்ளது. அது அதிகளவான புத்திஜீவிகளையும் பண்பாளர்களையும் கொண்ட கிராமங்களில் ஒன்றாகத் திகழ்கின்றது. அவ்வாறான வரலாற்றுச் சிறப்புமிக்கதும் கலை, பண்பாட்டு அம்சங்களைக் கொண்டதுமான ஆரையம்பதிப் பிரதேசத்திலே இருக்கின்ற, குறிப்பாக கி.பி. 5ஆம் நூற்றாண்டுக்குரியதாகக் கருதப்படுகின்ற காசிலிங்கேஸ்வரர் ஆலயம் அமைந்திருந்த காணிப்பகுதியை அண்மைக் காலத்தில் தொல்பொருள் திணைக்களம் தொல்பொருள் இடமாக அடையாளப்படுத்தியிருந்தது.

பின்னர் குறித்த அந்தக் காணிப்பகுதி கடந்த 2019.03.05 முதல் 2019.04.21 வரையான காலப்பகுதியில் தொல்பொருள் திணைக்களத்தினால் ஆய்வுக்குட்படுத்தப்பட்டிருந்தபோது, அங்கு இந்து ஆலயத்துக்குரிய - சிவாலயத்துக்குரிய பல்வேறு பட்ட சின்னங்கள், விநாயகர் சின்னங்கள், சிவலிங்கம்,

ஐந்துதலை நாகம் போன்றவையும் பூஜைக்குரிய உபகரணங் களும் பொருட்களும் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றன. கி.பி. 5ஆம் நூற்றாண்டின் ஆரம்ப காலப்பகுதியில் உலகநாச்சியின் தலைமையில் குணசிங்கனால் மண்முனையில் நிறுவப்பட்ட சிற்றரசின்மூலம் முன்னெடுக்கப்பட்ட சிவாலயப் பணிகளில் முதன்மையானது இந்தக் கோவில்குளம் காசிலிங்கேஸ்வரர் ஆலயப் பணி. இந்தியாவிலிருந்து உலகநாச்சியால் கொண்டு வரப்பட்ட சிவலிங்கமான படிக லிங்கமே காசிலிங்கேஸ்வரராக அங்கு பிரதிஷ்டை செய்யப்பட்டதாகக் கூறப்படுகின்றது. இதனையடுத்தே கிழக்கிலங்கையின் பிரச்சித்திபெற்ற ஸ்ரீ தான்தோன்றீஸ்வரர் ஆலயம் உலகநாச்சியால் அமைக்கப் பட்டதாக வரலாறு சான்று பகர்கின்றது.

கி.பி. 1622இல் மட்டக்களப்பு போர்த்துக்கேயர் வசமான தாகக் கூறப்படுகின்றது. சுதேச மதங்களை ஆதரிக்காத போர்த்துக்கேயரால் முதன்முதலாக மட்டக்களப்பு மாவட் டத்தில் அழிவுக்குள்ளானதும் இவ்வாலயமே! அதன் பின்னர் இவ்வாலயம் அமைந்திருந்த இடத்திலேயே ஆலமரத்தின்கீழ் சூலம் வைத்து வழிபடப்பட்டு வந்த சூழலில், மிக நீண்ட காலத்தின் பின்னர், 1961ஆம் ஆண்டு, ஆலயச் சூழலிலிருந்து தென்கிழக்காக 100 மீற்றர் தொலைவில் ஆகம விதிக்கமைய அமைக்கப்பட்ட விநாயகர் ஆலயத்தில் காசிலிங்கேஸ்வரர் ஆலயத்திலிருந்து கண்டெடுக்கப்பட்ட வழிபாட்டுச் சின்னங் களான சிவலிங்கம், ஐந்துதலை நாகம், பூசைக்குரிய உபகரணங்கள் ஆகியவை வைக்கப்பட்டு வழிபடப்பட்டு வருகின்றது. இந்தக் காசிலிங்கேஸ்வரர் ஆலயத்தின் வழிபாட்டுக்காகப் பயன்பட்ட சில தொல்பொருட்கள், பிரதேச செயலகம் ஊடாக தொல்பொருள் திணைக்களத்தின் அம்பாறை பிராந்திய அலுவலகத்தில் ஒப்படைக்கப்பட் டுள்ளன. தமிழர்களின் பண்பாட்டையும் அவர்கள் பின்பற்று கின்ற சைவ சமயத்தையும் பிரதிபலிக்கின்ற அவ்வாறான பல்வேறு தொல்பொருட்கள் அங்கு கண்டுபிடிக்கப்பட்டதை யடுத்து, அவ்வாராய்ச்சிப் பணி ஏதோவோர் அடிப்படையில் திட்டமிட்டு நிறுத்தப்பட்டது.

இப்பொழுது அந்தப் பகுதியிலே திட்டமிட்ட இனமுறு கலை ஏற்படுத்துகின்ற வகையிலே ஒரு பாடசாலையை அமைப்பதற்கான நடவடிக்கைகளைச் சிலர் மேற்கொண்டு வருவதாக அறிய முடிகின்றது. குறிப்பாக, தமிழர்களுடைய பாரம்பரிய வரலாற்றைப் பறைசாற்றி நிற்கின்ற அந்தப் பகுதியிலே, 10 - 15 மாணவர்களை மையப்படுத்தி ஒரு பாடசாலையை அமைத்து அந்தப் பகுதியை ஏதோவோர் அடிப்படையிலே தமது கட்டுப்பாட்டுக்குள் கொண்டுவர வேண்டும் அல்லது கபளீகரம் செய்ய வேண்டுமென்ற நோக்கிலே இவ்வாறான முயற்சிகள் ஒரு சகோதர சமூகத் தினரால் முன்னெடுக்கப்படுகின்றது. இந்தச் செயற்பாடு இனரீதியான நல்லுறவைப் பாதிக்கின்ற வகையிலே அமைந் திருப்பதாகவே நான் கருதுகின்றேன்.

அந்தப் பிரதேசம் பாதுகாக்கப்பட வேண்டிய ஒரு பிரதேசம். உண்மையிலே அந்த இடத்தில் திட்டமிட்ட குடியேற்றங்களை ஏற்படுத்துவது அல்லது இவ்வாறான பாடசாலை அல்லது பொதுக் கட்டிடங்களை அமைத்து ஓர் இனமுறுகலை ஏற்படுத்துவது சாலப் பொருத்தமானதல்ல. அந்த இடத்திலே நீண்டகால வரலாற்றைக் கொண்டதாக இருக்கின்ற அந்த ஆலயமும் அத்தோடு சேர்ந்த விடயங்களும் நிச்சயமாகப் பாதுகாக்கப்பட வேண்டும். ஆகவே, இவ்வாறான நடவடிக்கை களை முன்னெடுப்பவர்கள் அல்லது இதற்குப் பின்புலத்தில் இருக்கின்ற அரசியல்வாதிகள் அந்தச் செயற்பாடுகளை நிறுத்தவேண்டும். அந்தப் பிரதேசத்தினுடையது மட்டுமன்றி மட்டக்களப்பு மாவட்டத்திலுள்ள ஒட்டுமொத்தத் தமிழர் களுடைய இருப்பையும் கேள்விக்குட்படுத்துகின்ற ஒரு செயற்பாடாகவே இதனை நான் கருதுகின்றேன். ஆகவே இது தடுத்து நிறுத்தப்பட வேண்டும். இந்தப் பாடசாலை அமைக்கின்ற இவ்வாறான முயற்சிகளை நாங்கள் ஏற்றுக்கொள்ளமுடியாது. ஏனென்றால், அண்மையிலே வேறு பாடசாலைகள் இருக்கின்றபோது இந்தப் பாடசாலையை அமைப்பதை, அந்த இடத்தை அபகரிப்பதற்கான ஒரு முயற்சியாகவே நான் பார்க்கின்றேன். ஏற்கனவே ஆரையம்பதி என்கின்ற பழம்பெரும் தமிழ் பிரதேசத்தைச் சுற்றிப் பலவகையான கபளீகரங்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. எனவே, இதனைத் தொடர்ச்சியாக அனுமதிக்க முடியாது என்பதனை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இரண்டாவதாக, இதனோடு தொடர்புபட்டதாக அந்த மாவட்டத்தில் நடக்கின்ற இன்னுமொரு விடயத்தைக் கூற விரும்புகின்றேன். அதாவது, கோரளைப்பற்று தெற்கு - கிரான் பிரதேச செயலகப் பிரிவு சுமார் 630 சதுர கிலோமீற்றர் நிலப் பரப்பளவைக் கொண்ட ஒரு பிரதேசம்; 100 சதவீதம் தமிழ் மக்கள் செறிந்து வாழுகின்ற ஒரு பகுதி. அங்கு பெரும்பான்மை யாக விவசாயத்தைச் செய்பவர்கள் வாழ்கிறார்கள். அவ்வாறான பகுதியிலே கடந்த காலங்களிலே மேற்கொள்ள பட்ட முறையற்ற மண்ணகழ்வின் காரணமாக விவசாயம் பெருமளவிலே பாதிக்கப்பட்டது; பல விபத்துகள் ஏற்பட்டன; பிரதேச சபை வீதிகள் உடைக்கப்பட்டன; சில வீதிகள் சேதமடைந்தன. நீர்ப்பாசன அணைக்கட்டுகள் உடைக்கப் பட்டன. மொத்தத்திலே அந்தப் பகுதியே அழிக்கப்பட்ட சூழலிலே, கிரான் பிரதேச அபிவிருத்திக் குழுத் தலைவராக நான் கடந்த காலங்களிலிருந்து சேவையாற்றி வருகின்ற நிலையில், அங்குள்ள விவசாய அமைப்புகளின் கோரிக்கைக்கு அமைவாகவும் மக்களின் கோரிக்கைக்கு அமைவாகவும் அதனைத் தடுத்து நிறுத்தவேண்டுமென்று தீர்மானித்தோம்.

இருந்தபோதிலும் சில வாரங்களுக்கு முன்பு கிரான் பிரதேச செயலகப் பிரிவிலுள்ள முள்ளிவட்டுவான் பகுதியில் எம்.எம். ஆசீப், எம்.எச்.எம். இஸாட், ஐ. பாரூக், எம்.ஜே. அமீர் மற்றும் ஆத்துச்சேனைப் பகுதியில் எம்.ஏ.எம். அப்துல், பி.கே. முகார் ஆகிய 6 பேருக்கு மண்ணகழ்வுப் பத்திரங்கள் வழங்கப் பட்டிருக்கின்றன. ஆகவே, கடந்த வாரம் இடம்பெற்ற பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டத்திலே மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் விவசாய அமைப்புக்களின் கோரிக்கைகளை ஏற்று, ஏகமனதாக மேற்கொண்ட தீர்மானத்திற்கமைய, மண் அகழ்வுக் கான அனுமதிப் பத்திரங்கள் வழங்குவதை இடைநிறுத்துமாறு பிரதேச செயலாளருக்கு அறிவித்திருந்தோம். அதனால், கிரான் பிரதேச செயலாளர் திரு. சித்திரவேல் அவர்கள் உடனடியாக மண் அகழ்வுக்கான அனுமதிப் பத்திரங்கள் இடைநிறுத்தப் படுவதற்கான கடிதத்தை வழங்கியிருந்தார்.

அவ்வாறான சூழலிலே, இன்று கிரான் பிரதேசத்தில், குறிப்பாக வாழைச்சேனை, ஓட்டமாவடிப் பகுதிகளை மையப் படுத்திய சில அரசியல் பின்புலங்களைக் கொண்டவர் களுடைய செல்வாக்குக் காரணமாக, அதிகாரிகளுக்குச் சில அழுத்தங்களைக் கொடுத்து, பழைய அனுமதிப் பத்திரங்கள் GSMBக்குக் கொண்டுசெல்லப்பட்டு, ஏதோவோர் அடிப்படை யில் அங்கிருந்து புதிய அனுமதிப் பத்திரங்களைப் பெற்று மண் அகழ்வு நடவடிக்கை இடம்பெற்று வருகின்றது. சட்டவிரோத மண் அகழ்வு நடவடிக்கையைத் தடுத்து நிறுத்தியதற்காக கிரான் பிரதேச செயலாளரையும் அந்தப் பிரதேசத்தின் அபிவிருத்திக் குழுவின் தலைவராக இருக்கின்ற என்னை அந்தப் பதவியிலிருந்தும் மாற்ற வேண்டும் எனவும் எனது

[ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා]

இராஜாங்க அமைச்சுப் பதவியையும் நீக்க வேண்டும் எனவும் கருத்துகள் முன்வைக்கப்படுகின்றன. ஆகவே, எமது நாட்டின் வளத்தைப் பாதுகாப்பதற்கான சூழலை ஏற்படுத்துகின்ற போது, ஒரு சில மாபியாக்கள் - மண் மாபியாக்கள் அல்லது அவர்களுக்குப் பின்னால் இருந்து அவர்களை இயக்குகின்ற அரசியல்வாதிகள் இவ்வாறான நடவடிக்கைகளை முன்னெடுப் பதை ஏற்றுக்கொள்ள முடியாது. அந்தப் பிரதேசத்தின் அபிவிருத்திக் குழுத் தலைவராக முன்பிருந்த கௌரவ சிவநேசதுரை சந்திரகாந்தன் அவர்களாக இருந்தாலும் சரி, நானாக இருந்தாலும் சரி, அங்குள்ள விவசாய அமைப் புக்களின் கோரிக்கைகளை ஏற்று, இவ்வாறான நடவடிக்கை களைத் தடுத்து நிறுத்தியிருக்கிறோம். ஆனால், அரச அதிகாரி களுக்குக் கொடுக்கப்பட்ட சில அழுத்தங்களால் மீண்டும் அங்கே மண் அகழ்வுக்கான அனுமதி திறந்துவிடப்பட்டிருக் கின்றது. இதைத் தடுத்து நிறுத்த நடவடிக்கை எடுக்கும் பொழுது அங்கிருந்து சில எதிர்ப்புகள் எங்களை நோக்கி வருகின்றன.

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා.

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Hon. State Minister just mentioned about a school which is being established in the Batticaloa District. He and I attended the DCC meeting in Batticaloa last week. This particular school is called Sir Razik Fareed Vidyalaya. That has been started way back in 2020. So, we are not going to start a new school. Sir, it is proper to mention, while we are discussing about the Ministry of Finance, that Government side people are being given liquor permits. With those permits, there are bars opened closer to kovils and mosques. Because of that, they are trying to close this school, which is already in existence. That is why I wanted to make it very clear and with due respect to the Hon. State Minister, -

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

Hon. Presiding Member, give me my allotted time. Hon. Member, I can explain it to you after my speech. Thank you.

ஆகவே, மக்கள் துரோகச் செயல்களில் ஈடுபடுகின்றவர்கள் பற்றிப் பேசும்பொழுது, இவ்வாறான எதிர்ப்பு நடவடிக்கை களைச் சிலர் மேற்கொள்வது வேடிக்கையானதாக இருக் கின்றது. இது கிரான் பிரதேச செயலகப் பிரிவிலே இடம்பெற்ற ஒரு விடயமாகும்.

அடுத்ததாக, ஏறாவூர் பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட் பட்ட செங்கலடி பிரதேச அபிவிருத்திக் குழுத் தலைவராக - அதாவது ஏறாவூர் பற்று பிரதேச அபிவிருத்திக் குழுத் தலைவராகவும் நான் இருக்கின்றேன். அங்கு இரண்டு நாட்களாக ஒரு சிலர் எனக்கு எதிராக ஓர் ஆர்ப்பாட்டத்தை நடத்தியிருந்தார்கள். உண்ணாவிரதப் போராட்டம் என்ற வகையில் மேற்கொள்ளப்பட்ட அந்த ஆர்ப்பாட்டத்தின்போது, நான் பிரதேச செயலாளர்மீது அதிகாரத் துஷ்பிரயோகம் செய்வதாகவும் என்னை அந்தப் பிரதேசத்தின் பிரதேச அபிவிருத்தி குழுத் தலைவர் பதவியில் இருந்து நீக்க வேண்டும் என்றும் அவர்கள் தெரிவித்திருந்தனர். குறிப்பாக, மண் அகழ்வு அனுமதிப் பத்திரம் தொடர்பான விடயத்திலே நான் தலையிடுவதாகவும் பிரதேச செயலாளர்மீது அதிகாரத் துஷ்பிரயோகம் செய்வதாகவும் அவர்கள் கூறியிருந்தார்கள். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! குறிப்பாக, அங்கிருந்த சிலர் என்னுடைய பெயரைக் குறிப்பிட்டு, என்னைப் பற்றியும் என்னுடைய குடும்பத்தைப் பற்றியும் முறைகேடான விடயங்களைப் பேசியிருந்தார்கள். அதனை என்னுடைய சிறப்புரிமை மீறலாக நான் பார்க்கின்றேன். ஆகவே, அவர்களுக்கு எதிராக என்னால் மேற்கொள்ளக்கூடிய அத்தனை சட்ட நடவடிக்கைகளையும் மேற்கொள்ள இருக்கின்றேன். அதேநேரத்திலே, அது தொடர்பில் சகல விடயங்களையும் உள்ளடக்கிய ஓர் எழுத்துமூலமான அறிக்கை யைக் கௌரவ சபாநாயகர் அவர்களுக்குச் சமர்ப்பிக்கக் கடமைப்பட்டு இருக்கின்றேன்.

கடந்த காலத்திலே ஏறாவூர் பற்று பிரதேச செயலாளர் பிரிவில் 1,350 மண் அகழ்வு அனுமதிப் பத்திரங்கள் வழங்கப் பட்டிருந்தன. இவ்வாறு மண் அனுமதிப்பத்திரங்கள் வழங்கப் பட்டமையினால் அங்கு விவசாயம் பெரியளவிலே பாதிக்கப் பட்டிருக்கின்றது. தென்னிலங்கையிலிருந்து வந்தவர்கள் உட்பட அதிகளவான மண் மாபியாக்களால், வேப்ப வெட்டுவான் மற்றும் காரைக்காடு பிரதேசங்களின் சில இடங்களில், 30 - 40 அடி வரையிலும், வேறு சில இடங்களில் 10 - 15 அடி வரையிலும் மண் தோண்டப்பட்டிருக்கின்ற நிலையில், இன்று அந்த விவசாய நிலங்கள் மீன் பிடிக்கின்ற இடங்களாக மாறியிருக்கின்றன. தென்னிலங்கையிலிருந்து வரும் இந்த மாபியாக்களுக்கு அங்குள்ள சிலர் உடந்தையாக இருந்துகொண்டு, 1000க்கு மேற்பட்ட மண் அனுமதிப்பத்திரங் களை வைத்துக்கொண்டு, அந்தப் பகுதியின் வளங்களைச் சூறையாடினார்கள்.

நான் பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் என்ற வகையில், அதைத் தடுத்து நிறுத்தவேண்டும் என்ற நோக்கில், அதற்கான ஒரு systemஐ create பண்ணி, ஒரு mechanismஐ ஏற்படுத்தி, வேலைசெய்ய முற்பட்டபோது, கனிய வளத் திணைக்களம் அங்கு ஸ்தாபிக்கப்பட்டது. அதன்மூலம் ஒரு பொறிமுறையை உருவாக்கி, பதுளை வீதியிலுள்ள அந்தப் பகுதியைச் சேர்ந்த 60 சதவீதமானவர்களுக்கும், ஏறாவூர்ப் பற்றைச் சேர்ந்த 20 சதவீதமானவர்களுக்கும் அந்த மாவட்டத்தைச் சேர்ந்த 20 சதவீதமானவர்களுக்கும் - 100 சதவீதம் அந்த மாவட்டத்தை மையப்படுத்தி மாத்திரம் - அந்த அனுமதிப் பத்திரங்களை வழங்கவேண்டுமென்று பிரதேச அபிவிருத்திக் குழுவில் ஏகமனதாகத் தீர்மானம் எடுக்கப் பட்டது. அதனடிப்படையில் கனிய வளத் திணைக்களத்துடன் இணைந்து ஒரு சரியான பொறிமுறைக்கூடாக அனுமதிப் பத்திரங்களை வழங்குமாறு நான் கூறியிருந்தேன். அந்த அடிப்படையிலே, அங்கிருந்த கனிய வளத் திணைக்களம் அதைச் சரியான முறையிலே நடைமுறைப்படுத்திக் கொண்டிருந்தது.

ஆனால், அங்குள்ள எங்களுடைய பிரதேச செயலாளருக்கு யார், எந்தப் பின்புலத்தில் இருந்தவர்கள், என்ன வகையான அழுத்தங்களைக் கொடுத்தார்களோ தெரியாது? கனிய வளத்

திணைக்களத்தினரால் பெயர் குறிப்பிடப்பட்டவர்களில் 7 பேர் மாத்திரம் உள்வாங்கப்பட்டு, மொத்தமாக 27 பேருக்கு ஆற்று மணல் அகழ்வதற்கான அனுமதிப்பத்திரம் அனுப்பிவைக் கப்பட்டிருந்தது. அதில் அந்தப் பகுதியைச் சேர்ந்தவர்கள் உள்வாங்கப்பட்டிருந்தாலும், அந்தப் பகுதியைச் சேராதவர் களும் உள்வாங்கப்பட்டிருக்கின்றார்கள். இவ்வாறு உள்வாங் கப்பட்டவர்களில் ஏ.டபிள்யு.எம்.ரீ.கே.எஸ்.எம் பியசேன, எம்.எச்.எம் குணதுங்க, டள்யு.பீ.வீ.ரேணுகா, டீ.எம்.ஜே. திசாநாயக்க, டி.பீ.எம்.பிரேமரத்ன, எச்.எம்.சுமணசிறி, ஆர்.எம் அபேரத்ன, ரீ.ஜீ.ஏ ஜீவகுமார, டடீள்யு.எம்.ஜே வீரசிங்க ஆகிய 10க்கு மேற்பட்டவர்களுடைய பெயர்கள் அடங்குகின்றன. இதுமாத்திரமல்ல, அங்கு புதிதாக நான்கு பேருக்குக் கிரவல் அனுமதிப் பத்திரங்களும் வழங்கப்பட்டிருக்கின்றது: அதில் ஈ.எம்.எஸ் சந்தமாலி, டிலானி கசுன்குமாரி மற்றும் எஸ்.எம்.பியசேன ஆகியோருக்கு 30.01.2024இல் அனுமதி வழங்கப்பட்டிருக்கின்றது. இந்த அனுமதிப் பத்திரங்கள் பிரதேச செயலகத்திற்கூடாக GSMBஇற்கு அனுப்பிவைக்கப் பட்டிருக்கின்றது. வேண்டுமானால் இந்த விபரங்களை நான் சபாபீடத்திற்குச் சமர்ப்பிக்க முடியும்.

பிரதேச அபிவிருத்திக் குழுவின் தீர்மானத்திற்கமைய கனிய வளத் திணைக்களம் ஆட்களைத் தெரிவுசெய்யும் பொழுது, எந்த அடிப்படையில் இவர்கள் தெரிவுசெய்யப் பட்டார்கள் என்பதை உடனடியாக எனக்கு அறிவிக்குமாறு, நான் பிரதேச அபிவிருத்திக் குழுவின் தலைவர் என்ற அடிப்படையிலே கேட்டிருந்தேன். அதனைச் செவிமடுத்த பிரதேச செயலாளரும் இந்த அனுமதிப்பத்திரங்கள் வழங்கு வதைச் சற்று இடைநிறுத்துமாறு GSMBஇற்குக் கடிதம் அனுப்பியிருந்தார். அவ்வாறு பிரதேச செயலாளரால் கடிதம் அனுப்பிவைக்கப்பட்டதன் பிற்பாடு, கடந்த 2 தினங்களாக எனக்கெதிராக இந்தப் போராட்டம் இடம்பெற்றிருக்கின்றது. நான் இங்கு தெரிவித்த விபரங்களுக்கமைய கிரான் மற்றும் ஏறாவூர்ப்பற்று பிரதேச செயலாளர் பிரிவுகளிலே, மண் அகழ்வதற்கு எப்படிப்பட்டவர்கள் உங்வாங்கப்பட்டிருக் கின்றார்கள் என்பது பற்றி உங்களுக்குத் தெரிந்திருக்கும். அந்தப் பகுதியிலே இருக்கின்ற எங்களுடைய மக்கள் கடந்த யுத்த காலத்தின்போது, அந்த வனம் மற்றும் அந்தப் பகுதி வளங்களைப் பாதுகாப்பதிலே மிகவும் அர்ப்பணிப்போடு செயற்பட்டவர்கள். இன்று பதுளை வீதியில் இருப்பவர்களில் எத்தனை சதவீதமானவர்கள் உள்வாங்கப்பட வேண்டும் என்ற எமது தீர்மானத்தை மீறிச் செயற்பட்டதால்தான் அனுமதிப் பத்திரங்கள் வழங்குவதை இடைநிறுத்துமாறு நான் கூறியிருந்தேன். இதைப் புரிந்துகொள்ளாத ஒருசிலரால், அங்கு கடந்த தினங்களில் எனக்கு எதிராகக் கருத்துகள் பகிரப்பட்டன. ஆகவே, இது தொடர்பான விசாரணைகள் மேற்கொள்ளப்படவேண்டும் என்ற விடயத்தையும் நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அத்தோடு, அங்கு கனிய வள அகழ்வு முறைகேடாக இடம்பெற்றதனால் பாதைகள் சீரழிக்கப்பட்டதாகவும், பிரதேச சபையின் பாதைகள் பெரிதளவு பாதிக்கப்பட்டதாகவும் பிரதேச சபையின் செயலாளரினால் அறிக்கை சமர்ப்பிக்கப் பட்டிருக்கின்றது. அந்த அறிக்கையில் Wildlife Conservation Department, the Central Environmental Authority போன்ற திணைக்களங்கள் மற்றும் LOs உட்பட பலர் அங்குள்ள முறைப்பாடுகளைச் சுட்டிக்காட்டி இருக்கிறார்கள். அதுமட்டுமல்ல, புவிச்சரிதவியல் ஆய்வு சுரங்கப் பணியகம் - GSMB - சட்டபூர்வமான கள விஜயம் ஒன்றை மேற்கொண்டு, அங்கு கனியவள மண் அகழ்வு எந்த அடிப்படையில் மேற்கொள்ளப்பட்டிருக்கின்றது எனவும், அங்குள்ள ஒவ்வோர் இடங்களிலும் எவ்வாறான முறைகேடுகள் இடம்பெற்றிருக் கின்றது எனவும் அதனால் அங்கு ஏற்படுகின்ற பாதிப்புக்கள் தொடர்பாகவும் அறிக்கையிட்டிருக்கின்றது. அந்த அறிக்கை கடந்த வாரம் பிரதேச செயலகத்திற்கு அனுப்பி வைக்கப்பட்டிருக்கின்றது.

அதுமாத்திரமல்ல, நீர்ப்பாசனத் திணைக்களத்தினர் மட்டக்களப்பு மாவட்டத்திலே எந்தெந்தப் பகுதிகளில் எவ்வளவு அளவிலான மண் அனுமதிப் பத்திரத்தினைப் பெற்றுக்கொள்ள முடியும் என்பது தொடர்பில் விரிவான விளக்கத்தை அளித்திருக்கிறார்கள். இந்த reports எல்லாம் தயாரிக்கப்பட்டு ஓரிரு வாரங்கள்தான் ஆகின்றது. எனவே, இதற்குப் பிற்பாடுதான் சரியானதொரு திட்டமிடலை மேற்கொண்டு, ஒரு தீர்மானத்திற்கமைய மாவட்டத்தின் கனிய வளங்களைப் பாதுகாக்கின்ற வகையிலான நடவடிக்கைகளை மேற்கொள்ள முடியுமென்று நாங்கள் கூறுகின்றபொழுது, ஒருசிலர் இவ்வாறான புரிந்துணர்வற்ற முறையிலான நடவடிக்கைகளை மேற்கொண்டிருப்பதானது மிகவும் வேதனையான விடயம். ஆகவே, இது தொடர்பிலான விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டும். இது தொடர் பிலான சட்ட நடவடிக்கைகளை எடுப்பதற்கு - அது எந்தத் தரப்பினராக இருந்தாலும் - நான் தயாராக இருக்கின்றேன். இதில் எனது பெயரும் எனது குடும்பத்தினது பெயரும் பயன்படுத்தப்பட்டுள்ளது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, please wind up now.

ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
Give me one more minute, Sir.

குசலான்மலை என்ற இடத்திலே, சோதையன்கட்டு என்று சொல்லப்படுகின்ற பகுதியிலே சோழப் பிரதிநிதியால் கட்டப் பட்ட வரலாற்றுச் சிறப்புமிக்க ஓர் இந்து ஆலயம் இருக் கின்றது. அந்தக் குசலான்மலையிலே சோழப் பிரதிநிதிகள் இருந்து ஆட்சி செய்ததற்கான வரலாற்றுச் சின்னங்கள் இருக் கின்றது. நேற்றும் இன்றும் இடம்பெற்ற ஆர்ப்பாட்டத்திலே கலந்துகொண்ட தென்னிலங்கையின் முகவராகச் செயற்படு கின்ற ஏறாவூரைச் சேர்ந்த ஒருவர் என்னையும் எனது குடும்பத்தைப் பற்றியும் பிழையாகப் பேசியிருந்தார். இவர் யார் என்றால், தமிழர்களின் பூர்வீக இடமாகக் கருதப்படுகின்ற சோதையன்கட்டு பகுதியைக் கடந்த காலத்தில் அழிக்க முற்பட்ட ஒருவர். அங்கு தமிழ் மன்னர்கள் ஆண்டார்களா? என்பதை நக்கலாகக் கேள்விக்குட்படுத்தியதொரு நபர். எனவே, இவர் தொடர்பாகவும் விசாரணைகள் மேற்கொள்ளப் பட வேண்டுமென்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

ගරු සෙයියිඩ් අලි සාහිර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Hon. Presiding Member, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අලි සාහිර් මවුලානා මන්ත්‍රීතුමා.

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

Sir, when the Hon. S. Viyalanderan was speaking, I rose to a point of Order. He told me that he did not want to give me time.

Sir, this is what I was trying to mention. கௌரவ இராஜாங்க அமைச்சர் வியாழேந்திரன் அவர்களது பேச்சிலே மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட மண்முனை மேற்கு கோவில்குளம் பகுதியில் இனமுறுகலை ஏற்படுத்துவதற்காக பாடசாலை ஒன்று உருவாக்கப்படுவதாகச் சொன்னார். ஒருநாளும் பாடசாலைகள் இனமுறுகலை ஏற்படுத்துவதற்காக உருவாக்கப்படுவதில்லை. அதுமட்டு மல்ல, குறித்த பாடசாலை அங்கு 2020ஆம் ஆண்டிலிருந்து இன்றுவரை மாகாண சபை அதிகாரிகளின் உத்தரவுடன், அவர்களது அனுமதியைப்பெற்று நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. அங்கு 5 - 10 மாணவர்கள்தான் படிப்பதாக அவர் சொன்னார். ஆனால், அங்கு 40 மாணவர்கள் படித்துக் கொண்டு இருக்கிறார்கள். அந்தப் பகுதியில் தமிழ், முஸ்லிம் மக்கள் ஒற்றுமையாக வாழ்ந்துகொண்டிருக்கிறார்கள். நாங்கள் எல்லோரும் இனமுறுகலைத் தவிர்த்து நல்லிணக்கத்தைப் பேணுபவர்கள் என்று கௌரவ இராஜாங்க அமைச்சர் வியாழேந்திரன் அவர்களுக்கு நன்கு தெரியும். இப்பொழுது அந்தப் பகுதிகளில் - Finance Ministry - நிதியமைச்சினூடாக பலருக்கு liquor permit கொடுத்திருக்கிறார்கள். அந்த அனுமதியைப் பெற்றுக்கொண்டுள்ளவர்கள் அங்கு bars திறக்கின்றபொழுது, அந்த இடங்களில் பாடசாலைகள் இருக்கக்கூடாது என்ற எண்ணத்தில் அப்பாடசாலைகளை மூடுவதில் அவசரம் காட்டுகிறார்கள். அது தொடர்பில் கௌரவ கிழக்கு மாகாண ஆளுநர் அவர்கள் உடனடியாக அங்கு சென்று பாடசாலை சரியான முறையில் அமைக்கப்பட்டு இருக் கின்றதா என்று உரியமுறையில் விசாரணைகளை மேற் கொண்டிருக்கிறார். எனவே, பாடசாலைகளை அமைப்பது இனமுறுகலை ஏற்படுத்துவதற்கு அல்ல என்பதை நான் இங்கு பதிவு செய்யக் கடமைப்பட்டிருக்கின்றேன்.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු එස්. වියාලේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
பாராளுமன்ற உறுப்பினர் செயிட் அலி ஸாஹிர் மௌலானா அவர்களுக்கு நான் இங்கு ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். நாங்கள் உண்மையிலே அந்த இடத்தில் ஓர் இன நல்லிணக்கத்தைப் பேண விரும்புகின்றோம். கி.பி. 5ஆம் நூற்றாண்டு காலப்பகுதியில் அந்த இடத்தை உலக நாச்சியார் என்ற இளவரசி ஆண்டதாகவும், அங்கு ஓர் இந்து ஆலயம் இருந்ததற்கான வரலாற்றுச் சான்றுகளும் தொல்பொருள் திணைக்களத்தி னூடாகக் கண்டறியப்பட்டு இருக்கின்றது. அதுசம்பந்தமாகப் படங்களுடன் கூடிய ஆதாரங்களை நான் உங்களுக்குத் தரமுடியும். அங்குள்ள இந்துக்களால் - சைவ மக்களால் புனித பூமியாகக் கருதப்படுகின்ற அந்த இடத்தைப் பாடசாலைக்கு மட்டுமல்ல, வேறு எதற்காகவும், யாராக இருந்தாலும் திட்டமிட்டு எடுப்பது என்பது ஏற்றுக்கொள்ள முடியாதவொரு விடயம். அந்த இடம் புனிதமாகப் பாதுகாக்கப்பட வேண்டும். அங்கு எந்தக் காரணம் கொண்டும் மதுபானச்சாலை திறப்பதற்கு ஆரையம்பதி மக்கள் அனுமதிக்க மாட்டார்கள்; நாங்களும் அதற்கு அனுமதி வழங்கமாட்டோம் என்பதை நான் இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු දිලුම් අමුණුගම මහතා**
(மாண்புமிகு திலும் அமுனுகம)
(The Hon. Dilum Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ජගත් සමරවික්‍රම මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. JAGATH SAMARAWICKRAMA took the Chair.*

[අ.භා. 3.20]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, න්‍යාය පත්‍රයේ අදට නියමිත ප්‍රධාන කටයුතු අතර තිබෙන එකක් තමයි, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වන නියමය. 'Waterfront' කියන ව්‍යාපෘතිය අවසන් කරන්න දී තිබූ කාලය ඒ නියමය හරහා අවුරුද්දකින් දීර්ඝ කර තිබෙනවා. දැන් එම ව්‍යාපෘතියේ වැඩ අවසන් වෙලා තිබෙන බව කියනවා. 2023 දෙසැම්බර් මාසයේ 31වන දා වනකල් ඒ ඉදි කිරීම්වලදී වැය විය යුතුව තිබූ යම් යම් බදුවලට අදාළව සහන ලබා දීම සඳහා වන යෝජනාව අද මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්න ඔබතුමන්ලා බලාපොරොත්තු වෙනවා.

එම ව්‍යාපෘතියට දීලා තිබෙන බදු සහන සීමාව සංශෝධනය කිරීම සම්බන්ධවත් යමක් කිව යුතුයි. අදාළ කාල පරිච්ඡේදය තුළ

ඒ බදු සහන ලබා දී තිබුණා. අපට ඒ ගැන ගැටලුවක් නැහැ. හැබැයි, මීත් ඉදිරියට යන කොට ගැටලුවක් මතු වෙනවා. මොකද, IMF එකේ කොන්දේසියකට අපි සියලුදෙනා එකඟ වෙලා ඉන්නවා. එය ඉතා හොඳ කොන්දේසියක් කියලා අපි හිතනවා. ඒ තමයි, Strategic Development Projects Act එක යටතේ දෙන්න පුළුවන් බදු සහන සම්බන්ධයෙන් තමන්ට ඕනෑ විධියට තීරණ ගන්න ඇමතිවරයාට බැහැ කියන එකඟතාව. ඒ එකඟතාවට ඇවිල්ලා තිබෙනවා. මේ කියන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ගෙනාවේ එවකට සිටි බැසිල් රාජපක්ෂ ඇමතිවරයා. BOI එකට තිබුණු බලතල අයින් කරලා -ඇත්ත වශයෙන් ඊට එහා ගිහිල්ලා- දේශපාලන අධිකාරියකට බලය දුන්නා, තමන්ට ඕනෑ ඕනෑ විධියට ඒ බදු සහන දෙන්න. අපි IMF එකත් සමඟ කරපු සාකච්ඡාවල ප්‍රතිඵලයක් හැටියට සහ සමස්ත ජනතාව පක්ෂ භේදයකින් තොරව කියා සිටියා, ලබා දෙන මේ බදු සහන පිළිබඳව -කාටද ඒ බදු සහන දීලා තිබෙන්නේ, කොච්චර කාලයක් සඳහා ද ඒවා දීලා තිබෙන්නේ යනාදිය පිළිබඳව- විනිවිදභාවයක් තිබෙන්න ඕනෑ කියලා. මොකද, දිගට හරහට VAT එක වැඩි කරනවා; PAYE tax එක වැඩි කරනවා. හැබැයි, සමහරුන්ට බදු සහන දෙනවා. එහි ප්‍රතිඵලයක් හැටියට රජයේ බදු ආදායම අඩු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලබා දී තිබෙන සියලු බදු සහන නිසා රජයට අහිමි වුණු බදු ආදායම ගණන් හදලා ජනතාවගේ දැන ගැනීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ website එකේ ලංකාවේ ප්‍රථම වතාවට පළ කර තිබෙනවා. SDPs ගත්තොත්, ව්‍යාපෘති 14කට බදු සහන දීලා තිබෙනවා. මෙසේ රජයට ලැබිය යුතුව තිබූ බදු ආදායම සම්බන්ධයෙන් යම් ගණනය කිරීමක් එහි සඳහන්ව තිබෙනවා. Website එකෙන් ලබා ගත් පිටපතක් සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා.

BOI එක යටතේ දීලා තිබුණු නොයෙකුත් බදු නිදහස් කිරීම් නිසා, 2022/2023 අවුරුද්දට කර්මාන්ත ක්ෂේත්‍රයට දීලා තිබුණු බදු නිදහස නිසා රජයට නොලැබුණු බදු ආදායම රුපියල් බිලියන 8 ½යි; සේවා අංශයෙන් රුපියල් මිලියන 730යි; ඇඟලුම් අංශයෙන් රුපියල් බිලියන 5.2යි; කෘෂි කාර්මික අංශයෙන් රුපියල් මිලියන 500යි. ඒ වාගේම, power sector එකෙන්, ඒ කියන්නේ බලශක්ති ක්ෂේත්‍රයෙන් රුපියල් බිලියන 5.4යි; IT servicesවලින් රුපියල් බිලියන 2යි; යටිතල පහසුකම්වලින් රුපියල් මිලියන 800යි; Tourismවලින් රුපියල් මිලියන 500යි. ඒ අනුව ගිය අවුරුද්දේ රජයට ලැබිය යුතු නමුත්, අය කර ගත්තේ නැති ප්‍රමාණය රුපියල් බිලියන 24යි. ඊට කලින් අවුරුද්දේ ඒක රුපියල් බිලියන 55.7ක් හැටියට සඳහන් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඒ ලේඛනය **සභාගත*** කරනවා.

අපි මේ ඉදිරිපත් කරන තොරතුරු ජනතා ජයග්‍රහණ හැටියට භාර ගන්නවා. මොකද, අපි සටන් කරලා තමයි, මේ විනිවිදභාවය ලබා ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙන්නේ.

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් විනාඩි දෙකක් ලබා දෙන්න.

අපි procure කරන කොට, ඒ කියන්නේ මිල දී ගැනීම්වලදී කොච්චර ටෙන්ඩර් ආවාද, ඒ ටෙන්ඩර් මොනවාද, ඒ එක් එක් ටෙන්ඩරයේ ගණන කීයද, කාටද ඒ ටෙන්ඩර් ලබා දුන්නේ කියන තොරතුරුත් අපේ රටේ ඉතිහාසයේ පළමුවතාවට ඉදිරිපත් කර තිබෙනවා. ඒකත් අපේ ජයග්‍රහණයක් හැටියට අපි භාර ගන්නවා. මම ඒ ලේඛනයත් **සභාගත*** කරනවා.

ලංකාවේ ප්‍රථම වතාවට තමයි, මේ තොරතුරු ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ගිය මාසය ඇතුළත දුන්නේ මොනවාද කියලා සඳහන් ලැයිස්තුව තිබෙනවා. මේ ලේඛනයේ උඩින්ම තිබෙන ආයතනයට තමයි, අවසාන ටෙන්ඩර් එක දීලා තිබෙන්නේ. ඒ, State Trading Corporation එකට. ඒක දීලා තිබෙන්නේ, අඩි 40 කන්ටේනර් 32ක කුකුළු බිත්තර ගේන්නයි. ඒකේ වටිනාකම රුපියල් මිලියන 463ක් කියලා දක්වලා තිබෙනවා. ඒකට ටෙන්ඩර් 9ක් ඇවිල්ලා තිබෙනවා. ඒක තුනකට කඩලා තමයි දීලා තිබෙන්නේ. පළමුවැනි එක දීලා තිබෙන්නේ, AV Poultry Farm කියන එකට. දෙවැනි එක දීලා තිබෙන්නේ ඉන්දියාවේ SKM Egg Products Exports (India) Ltd එකට. තුන්වැනි එක දීලා තිබෙන්නේ, JJ Exports කියන එකට. ඒවායේ මිල ගණන් සඳහන් වෙනවා. උදාහරණයක් හැටියට කිව්වොත් පළමුවැනි ටෙන්ඩරය රුපියල් මිලියන දෙසීයතුනයි ගණනකට දීලා තිබෙනවා. ඒ ටෙන්ඩර් තුන ලැබිලා තිබෙනවා. මුදල් අමාත්‍යාංශය භාර ඇමතිවරයා දැන් මේ ගරු සභාවේ නැහැ. හරි නම් එතුමා දැන් මෙහි ඉන්න ඕනෑ. මොකද, එතුමාගේ අමාත්‍යාංශය යටතේ වන කාරණාවක් ගැන තමයි අද මෙතැන කථා කරන්නේ.

මුදල් රාජ්‍ය ඇමතිවරුන් දෙදෙනාගෙන් එක්කෙනෙක්වත් දැන් මෙහි නැහැ. මෙහෙම නොවෙයි මේක වෙන්න ඕනෑ. මේ තොරතුරු මදි කියලා මම කියනවා. මොකද, අපට අවශ්‍ය වෙන්නේ, ඒ තුන්දෙනාගේ ටෙන්ඩර් කොපමණද, ඒ වාගේම මිලියන 203කට දුන්නා නම් අනෙක් අයගේ ටෙන්ඩර් මොනවාද කියන එකයි. අපට ඒක දැන ගන්න ඕනෑ. ඒක තමයි, අපි බලාපොරොත්තු වෙච්ච විනිවිදභාවය. ඒක තමයි අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක එකඟ වෙච්ච කාරණය.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, මම අද උදේ "The Island" පත්තරේ දැකපු පුවතක් පිළිබඳව. එහි සඳහන් වන්නේ, සීනි බදු සම්බන්ධයෙන් පැන නැඟිලා තිබෙන ගැටලුව ගැන. ඒ ගැටලුව සම්බන්ධයෙන් ලියුමක් එවලා කියා තිබෙනවා, විගණකාධිපතිවරයා මොනවා කිව්වත් ආණ්ඩුවට කිසිම පාඩුවක් වෙලා නැහැ, අලාභයක් වෙලා නැහැ කියලා. අද අපි -පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු- රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී මේ කාරණය නැවතත් අවධානයට ගත්තා. ෂමීන්ද්‍ර ෆර්ඩිනැන්ඩු කර්තෘතුමා තමයි මේ තොරතුරු පිටුපස දිගින් දිගටම ඉන්නේ. අනෙක් අයත් මේ ගැන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ තිබෙනවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලිපි ශීර්ෂය යටතේ යොමු කරන ලද ලියුමක්. මේ ලියුමේ සඳහන්ව තිබෙනවා, සීනි බදු වෙනස් කිරීම

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

නිසා තෝරා ගත්තු කොම්පැනි 12ක් විසින් අයුතු ලාභයක් ලබා තිබෙනවා කියලා, මේ transaction එකට අදාළව. මම මේ අවස්ථාවේ මේ ලියුම **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි මුදල් අමාත්‍යාංශයේ නියෝජ්‍ය ලේකම්තුමාගෙන් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්තුමාගෙන් සෘජුව ඇහුවා, වැඩිපුර ලාභයක් ලබා තිබෙන්නේ, අවුරුද්දේ ඔවුන් කරපු සියලු business නිසා ද, එහෙම නැත්නම් මේ බදු වෙනස් කිරීම නිසා ද -ඒ කියන්නේ, සීනි කිලෝවකට රුපියල් 50ක් ලෙස තිබුණු බද්ද ශත 25ට ගෙනාපු නිසා ද- කියලා. සීනි කිලෝවකට රුපියල් 50ක්ව තිබුණු import බද්ද ශත 25ට අඩු කළා. රුපියල් 50න් ශත 25 අඩු කළාම ඉතිරි වන රුපියල් 49.75 පාරිභෝගිකයාට යනවා වෙනුවට - ආණ්ඩුවෙන් භාර ගත්තේ නැති ටික- ඔවුන්ගේ බැංකු ගිණුම්වලට දමා ගත්තා වාගේ වැඩක් මේක. ඔවුන් විගණනයක් කරලා සංඛ්‍යා කිහිපයක් සඳහන් කර තිබෙනවා. මම මේ ඔක්කෝම ටික කියවන්නේ නැහැ. සමාගම් හයකට අදාළ ගණනය කිරීම් පමණයි අවසන් කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිතත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හරි, මම තවත් විනාඩියකින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළමුවැනි කොම්පැනිය, මිලියන 124යි. දෙවැනි එක, මිලියන 27යි. තුන්වැනි එක, මිලියන 481යි. හතර වැනි එක, මිලියන 81යි. පස්වැනි එක, මිලියන 453යි. හයවැනි එක, මිලියන 230යි. ඉතුරු ඒවාට අදාළ ගණනය කිරීම් අවසන් කරලා නැහැ. මෙතැන මිලියන 1,400ක -බිලියන 1.4ක- විතර ප්‍රමාණයක් තිබෙනවා. දැන් මුදල් අමාත්‍යාංශය කියනවා, මේක අය කර ගන්න බැහැ, ඕනෑ නම් අයුතු ලෙස ලබා ගත් ලාභයෙන් සියයට 30ක විතර බද්දක් පනවන්න පුළුවන් නම්, එය පනවමු කියලා. නමුත් ඒක හරි යන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව දැන් අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මම තවත් විනාඩියකින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා අපි මුදල් අමාත්‍යාංශයට ලියනවා. මේක බදු සංශෝධනය නිසා ලබා ගත් ලාභයක් කියලා ඔවුන් පිළිගන්නවා නම්, ඒක ඒ සමාගම්වලට අයිති ලාභයක් නොවෙයි. ඒක ජනතාවට අයිති ලාභයක්. ඒක අය කර ගත යුතුයි කියලා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, මේ කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව නතර කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජීවන් තොන්ඩමන් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.30]

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා (ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜீவன் தொண்டமான் - நீர் வழங்கல் மற்றும் பெருந்தோட்ட உட்கட்டமைப்பு வசதிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Jeevan Thondaman - Minister of Water Supply and Estate Infrastructure Development)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இது சில விடயங்களைப் பேசவேண்டிய தருணம்! முதலில் இந்திய வீட்டுத்திட்டம் பற்றிக் குறிப்பிட விரும்புகின்றேன். இந்திய அரசாங்கத்தின்மூலம் எமக்குக் கிடைத்திருக்கின்ற 10,000 வீட்டுத்திட்டத்தை நாங்கள் நேற்று - 19ஆம் திகதி - ஆரம்பித்து வைத்தோம். முதலில் 1,300 வீடுகளை 45 தோட்டங்களில் அமைக்க இருக்கிறோம். இது 10,000 பாரத்-லங்கா வீட்டுத்திட்டத்தின் முதற்கட்டமாகும். சமூக வலைத்தளங்களிலாக இருக்கட்டும், வெகுசன ஊடகங்களிலாக இருக்கட்டும், இந்த வீட்டுத்திட்டம் ஆரம்பித்து வைக்கப்பட்ட பின்னர் பல்வேறுபட்ட கருத்துகள் சொல்லப்பட்டன. அதில் நான் முக்கியமானதொரு விடயத்தைக் கவனித்தேன். நாங்கள் கட்சி பார்த்து வீடு கொடுப்பதாகச் சிலர் குறிப்பிட்டிருந்தார்கள். நான் இந்தச் சபைக்கு ஒரேயொரு விஷயத்தைத் தெளிவுபடுத்த விரும்புகின்றேன். நாங்கள் இன்னும் பயனாளிகளின் பெயர்ப் பட்டியலை வெளியிடவில்லை. இவ்வாறான நிலையில், எப்படி நாங்கள் கட்சி பார்த்து வீடு கொடுப்பதாகச் சொல்ல முடியும்? எந்த அரசாங்கத்தில் கட்சி பார்த்து, யார் யாருக்கு வீடுகள் கொடுக்கப்பட்டன? அதன்மூலம் எப்படித் தொழிற்சங்க அங்கத்தவர்களை உயர்த்தினார்கள்? என்பது மக்களுக்கும் தெரியும்; இங்குள்ள அரசியல் தலைவர்களுக்கும் தெரியும்! எதிர்த்தரப்பில் அமர்ந்திருக்கின்ற கௌரவ வேலுகுமார் அவர்களுக்கும் தெரிந்த விடயம்!

நாங்கள் மக்களுக்கு என்ன செய்திருக்கிறோம் என்பதைச் சொல்ல விரும்புகின்றேன். இலங்கைத் தொழிலாளர் காங்கிரஸின் அங்கத்தவர்களுக்கு வீடுகளை வழங்குமாறு நான் சொல்லவில்லை. 2012-2019 காலப்பகுதியில் வீட்டுத்திட்டத்தில் புறக்கணிக்கப்பட்ட மக்களுக்கு வீடுகளைக் கொடுக்குமாறுதான் நான் வலியுறுத்தினேனே தவிர, எனது கட்சிக்காரர்களுக்கு வீடுகளைக் கொடுக்குமாறு சொல்லவில்லை. என்னிடம் அந்த மாதிரியான புத்தி கிடையாது. இப்படியான பிரச்சினைகள் வரக்கூடாது என்பதற்காக நாங்கள் முதன்முறையாக criterion ஒன்றை form பண்ணி இருக்கிறோம். இதில் இருக்கக்கூடிய முக்கியமானதொரு விடயம் என்னவென்றால், "தோட்டத்தில் வேலைசெய்தால் அல்ல, தோட்டத்தில் பிறந்தாலே வீடு!" என்பதுதான்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

நான் இப்பொழுது சொல்ல வருகின்ற விடயத்தை பல தடவை சொல்லியிருக்கிறேன். இன்று பெருந்தோட்டங்களில் கிட்டத்தட்ட 251,000 குடும்பங்கள் வாழ்கின்றன. அவற்றில் 176,000 குடும்பங்களுக்கு வீட்டுப் பிரச்சினை இருக்கிறது. இன்று பெருந்தோட்டத் துறையில் 115,000 பேர்தான் தோட்டத் தொழிலாளிகளாக வேலை செய்கின்றார்கள். ஆனால், அங்கு கிட்டத்தட்ட 10 இலட்சம் மக்கள் வசிக்கின்றார்கள். அவர்களையும் இந்தப் பயனாளிகள் பட்டியலில் உள்ளடக்க வேண்டும் என்றுதான் நாங்கள் வேண்டுகோள் விடுத்தோம். அதுமட்டுமல்ல, நாங்கள் ஒருபடி மேலே சென்று, பயனாளிகள் பட்டியலில் இன்னுமொரு விடயத்தை உள்ளடக்குமாறு சொல்லியிருக்கிறோம். கௌரவ அமைச்சர் ரமேஷ் பதிரண அவர்கள் பெருந்தோட்ட அமைச்சராக இருந்த காலப்பகுதியில் தோட்டங்களிலுள்ள சேவையாளர்களுக்கும் கட்டாயம் வீடு கொடுக்கப்பட வேண்டும் என்ற கோரிக்கை தோட்டச் சேவையாளர்கள் சங்கம் மூலமாக முன்வைக்கப்பட்டது. ஏனென்றால், அவர்களும் தோட்டத்தில் பிறந்தவர்கள்! அதனால் நாங்கள் அவர்களையும் இந்தப் பயனாளிகள் பட்டியலில் உள்ளடக்கி இருக்கிறோம்.

அதுமட்டுமல்ல, இன்றைக்கு தோட்டப் புறங்களிலுள்ள நிறையப் பிள்ளைகள் படித்து, கொஞ்சம் கொஞ்சமாக முன்னேறி, ஆசிரியர்களாக இருக்கின்றார்கள். அவர்களுக்கும் இந்த வீட்டுத்திட்டத்தில் வீடுகளை வழங்குவதற்கு நாங்கள் திட்டமிட்டிருக்கின்றோம். இன்றைக்கு மலையகத்தில் இருக்கின்ற கலைஞர்கள் எந்தளவுக்கு சர்வதேச ரீதியாக அங்கீகாரம் பெற்றாலும், அவர்களுக்கு உள்நாட்டில் அந்த அங்கீகாரம் கிடைப்பதில்லை. ஆனாலும், மலையக சமூகத்துக்குத் தலைமை வகிக்கின்ற நாங்கள், எங்களால் முடிந்தளவு இந்த வீட்டுத்திட்டத்தில் அவர்களுக்கும் வீடுகளை ஒதுக்கிக் கொடுத்திருக்கின்றோம். நாங்கள் இப்படி நியாயமான முறையில்தான் செயற்படுகின்றோமே ஒழிய, கட்சி பார்த்து, தொழிற்சங்கம் பார்த்துச் செயற்படவில்லை.

நான் இங்கு இன்னொரு விடயத்தையும் மக்களுக்காகத் தெளிவுபடுத்த விரும்புகின்றேன். இன்றைக்கு வலப்பனையில் போராட்டமொன்று நடந்தது. அதில் கலந்துகொண்ட மக்கள், தங்களுக்கு வீடு கிடைக்கவில்லையென்ற குற்றச்சாட்டை முன்வைத்திருந்தார்கள். எங்களுடைய மக்களுக்கு வீட்டுத்திட்டங்களை வழங்கிய இந்திய அரசாங்கத்துக்கும் இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். 2015இலிருந்து 2024 வரைக்கும் இந்திய அரசாங்கத்தினூடாகக் கிடைத்திருக்கின்ற வீடுகளின் எண்ணிக்கை 14,000. இந்தப் 14,000 வீடுகளையும் நாங்கள் சரியான முறையில் பகிர்ந்தளிக்க வேண்டும். நான் தேர்தல் காலத்தில் சொன்ன அதே விடயத்தை இன்றைக்கும் சொல்கின்றேன். அதாவது, மலையகத்தில் வீட்டுப் பிரச்சினையுள்ள 176,000 குடும்பங்கள் இருக்கின்றன. இந்த 14,000 வீடுகளால் அவர்களுடைய வீட்டுப் பிரச்சினையை முழுமையாகத் தீர்க்க முடியாது. இதனால் 14,000 குடும்பங்கள்தான் பயன்பெறும். அப்படி இருக்கும்போது நாமும் கொஞ்சம் சிந்தித்தாக வேண்டும்.

தமிழ் முற்போக்குக் கூட்டணியின் தலைவர் கௌரவ மனோ கணேசன் அவர்கள் நேற்று ஓர் அறிக்கை விட்டிருந்தார். அதனை நான் ஊடகங்களில் பார்த்தேன். இந்தப் 10,000 வீட்டுத்திட்டத்துக்கு அவர் பிள்ளையார்சுழி போட்டதாக அதில் குறிப்பிட்டிருந்தார். பாவம்! இதைப் பிள்ளையார் கேட்டால் அவரே அழுவார்! எங்களுடைய மக்களின் பிரச்சினைகளுக்கு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுப்பதற்காகத்தான் நான் அரசியலுக்கு வந்தேனே ஒழிய, பெயர் போடுகின்ற அரசியல் செய்வதற்காகவோ, பதவி ஆசைக்காகவோ வரவில்லை. அவ்வாறான புத்தியும் எனக்கில்லை.

இந்த 10,000 வீட்டுத்திட்டத்தை கௌரவ மனோ கணேசன் அவர்கள்தான் கொண்டுவந்தாரா? அப்படியே வைத்துக் கொள்வோம்! மலையக மக்களுக்கான பிரஜா உரிமையையும் அவர்கள்தான் பெற்றுக்கொடுத்தாரா? அப்படியே வைத்துக்கொள்வோம்! இப்படியே விட்டால் நாளைக்கு அவர் சொல்வார், "மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ அவர்களை ஜனாதிபதியாக்கியதும் நான்தான்" என்று. இது ஒருவேளை உண்மையாக இருக்கலாம்! கௌரவ வேலு குமார் அவர்களே, நான் சொல்வது சரிதானே! நான் என்ன சொல்கின்றேன் என்றால், இருக்கின்ற குறுகிய காலத்துக்குள் நாம் எல்லோரும் ஒன்றிணைந்து கட்சி பேதமின்றிச் செயற்பட வேண்டும் என்றுதான். நான் இதை மீண்டும் மீண்டும் வலியுறுத் திக்கொண்டுதான் இருக்கின்றேன். நாட்டில் ஏற்பட்டுள்ள பொருளாதார நெருக்கடிக்கு அப்புறம் கிட்டத்தட்ட 57 சதவீதமான மலையக மக்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் வாழ்கின்றார்கள். ஆனால், மலையக மக்களைப் பிரதிநிதித் துவப்படுத்துகின்ற 10 பாராளுமன்ற உறுப்பினர்களும் இச்சபைக்குள் கருத்துக்களால் மோதிக்கொள்கின்றார்கள்; வெளியில் வந்து கைகுலுக்கிக்கொள்கின்றார்கள். இது என்ன நியாயம்? எனக் கேட்கின்றேன்.

இன்றைக்கு நுவரெலியா மாவட்டத்திலும் ஒரு போராட்டம் நடந்தது. அதில் ஈடுபட்டிருந்த மக்கள், "எங்களுக்கு 'மலையகத் தமிழர்' என்ற அடையாளத்தை தனித்துவமாகக் கொடுத்தாக வேண்டும்" என்ற கோரிக்கையை முன்வைத்திருந்தார்கள். இவ்விடயம் சம்பந்தமான என்னுடைய அபிப்பிராயத்தை நான் வெளிப்படையாக ஊடகங்களில்கூட சொல்லியிருக்கின்றேன். 'இந்திய வம்சாவளித் தமிழர்' என்று இருப்பது, ஒரு வகையில் கடந்த காலங்களில் எங்களுக்கு நடந்த அநீதிகள், அநியாயங்களை அங்கீகரிக்கின்ற மாதிரியான ஒரு பட்டம்! ஆனாலும், நான் மக்கள் பிரதிநிதியாக, மக்கள் என்ன சொல்கின்றார்களோ, அதையும் கேட்கின்ற நிலைப்பாட்டில் இருந்தாக வேண்டும். சிவில் அமைப்புகளாக இருக்கட்டும், இங்கிருக்கின்ற மலையகப் பிரதிநிதிகளாக இருக்கட்டும், எல்லோரும் ஒன்றிணைந்து கலந்துரையாடி, ஒற்றுமையாக மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் இது தொடர்பில் ஒரு கோரிக்கையை முன்வைப்போம் என்று அதனால்தான் நான் சொல்கிறேன். நமக்கு ஒரு தனி அடையாளம் வேண்டுமென்றால், அதைக் கேட்போம். இன்று இந்த நாட்டினுடைய யாப்பின் பிரகாரம், இலங்கைத் தமிழர்கள் இருக்கிறார்கள்; சிங்கள மக்கள் இருக்கிறார்கள்; இந்திய வம்சாவளித் தமிழர்கள் இருக்கிறார்கள். இந்த நாட்டில், இலங்கையனாக இருக்க வேண்டும் என்று எனக்கும் ஆசைதான். அப்படியிருக்கும்போது -

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

Sir, I rise to a point of Order.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

Hon. Velu Kumar, I did not mention your name now. You should have raised the point of Order when I mentioned your name. - *[Interruption]* Relax, Hon. Velu Kumar. - *[Interruption.]* Sir, I would like to let you know that when I mentioned his name, he did not speak.

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

என்னைப் பொறுத்தவரை, நம்மை 'மலையகத் தமிழர்' என்று சொல்வதைவிட, 'மலையக வம்சாவளித் தமிழர்' என்று சொல்வது நல்லது. ஏனெனில், அதற்குள் அனைத்து மக்களையும் உள்வாங்க முடியும்.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Sir, I rise to a point of Order.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, please, allow him to raise his point of Order. Go ahead, please.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் 10,000 வீட்டுத்திட்டத்தை ஆரம்பித்ததை நாங்கள் வரவேற்கிறோம். அதில் உங்களுடைய கட்சிக்காரர்களுக்கு வீடுகளைக் கொடுத்திருக்கிறீர்களா, இல்லையா? என்பது எங்களுக்குத் தெரியாது. நீங்கள் அமைச்சராக இருந்தும் உங்களுக்கு வீட்டுத்திட்டப் பயனாளிகளின் பெயர்ப்பட்டியல் வெளியிடப்பட்டிருப்பது தெரியாமல் இருப்பது ஆச்சரியமாக இருக்கின்றது. பயனாளிகளின் பெயர்ப்பட்டியல் வெளியிடப்பட்டு, அப்பயனாளிகளுக்கு வீடுகள் ஒதுக்கப்பட்ட பின்னர்தான் இந்த வீட்டுத்திட்டத்தை ஆரம்பித்திருக்கிறார்கள். நீங்கள் இவ்விடயத்துக்குப் பொறுப்பான அமைச்சராக இருந்தும், இது பற்றி உங்களுக்குத் தெரியாமல் இருப்பதையிட்டு, நான் ஆச்சரியப்படவேண்டி இருக்கிறது. ஆகவே, அந்தப் பெயர்ப்பட்டியலைத் தேடிப் பாருங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වෙලාවේ කථා කරන්න.

ගරු ජීවන් තොණ්ඩමන් ඇමතිතුමා.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ வேலுகுமார் அவர்களே, நீங்கள் சொல்வது நியாயமான ஒரு விடயம்தான். ஆனால், தனிப்பட்ட ரீதியாகத் தயாரிக்கப்பட்ட பெயர்ப்பட்டியல் எனக்குத் தெரியாது. நீங்கள் பாராளுமன்ற உறுப்பினராக இருக்கிறீர்கள். -*[இடையீடு]* நான் சொல்லி முடிக்கிறேன். தயவுசெய்து, கையை விரித்துக் காண்பிக்காதீர்கள்! எதிர்க்கட்சியில் இருந்தால், இவ்வாறுதான் கையை விரித்துக் காண்பிக்கவேண்டி வரும்.

கௌரவ வேலு குமார் அவர்களே, ஒரு பாராளுமன்ற உறுப்பினராக உங்களுக்குத் தெரியும், பயனாளிகளின் பெயர்ப்பட்டியல் வெளிவரும்போது, *[இடையீடு]* கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் பேசும்போது நான் இடையீடு செய்யவில்லையே! Let me answer, Hon. Velu Kumar. You asked a question. So, let me answer. You are interrupting all the time. - *[Interruption]* இந்த விடயத்துக்குப் பொறுப்பான அமைச்சராக இருக்கின்ற நான், வீட்டுத் திட்டத்துக்குரிய பயனாளிகளின் பெயர்ப்பட்டியலைப் பார்த்து அங்கீகரித்த பிறகுதான், அந்த வீட்டுத்திட்டம் பயனாளிகளை முழுமையாகப் போய்ச் சேரும். நாங்கள் இந்த வீட்டுத்திட்டத்துக்கென criterion ஒன்றைத் தயாரித்திருக்கிறோம். கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் பார்த்த பயனாளிகளின் பெயர்ப்பட்டியல் எதுவென்று எனக்குத் தெரியாது. ஆனால், நான் கையெழுத்து இட்டால்தான் அந்தப் பெயர்ப்பட்டியல் செல்லுபடியாகும். கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் கவலைப்படாதீர்கள்! அது பற்றி நாங்கள் பார்த்துக்கொள்கிறோம். நான் இன்னும் சில விடயங்களை இங்கு சொல்ல விரும்புகிறேன். நாங்கள் 'மலையக வம்சாவளித் தமிழர்' என்ற அடையாளத்துக்குள் வந்தால், அனைவரும் ஒன்றிணைந்து செயற்பட முடியும். - *[Interruption]* Once I finish you can ask, Hon. Member.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Okay.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Thank you.

அதனால்தான் நான் இந்த மாதிரியான கோரிக்கை ஒன்றை முன்வைக்கிறேன். நாம் அனைவரும் ஒன்றிணைந்து செயற்பட்டால் கட்டாயம் ஒரு மாற்றத்தைக் கொண்டுவர முடியும்.

இந்த வீட்டுத்திட்டத்தினூடாக சிலருக்கு வீடுகள் கிடைத்திருக்கின்றன; இன்னும் சிலருக்கு வீடுகள் கிடைக்கவில்லை என்றும் இப்பொழுது சொல்கிறார்கள். இவ்வாறான பிரச்சினைகள் கட்டாயம் எழத்தான் செய்யும்! கடந்த அரசாங்க காலத்திலும் இந்தப் பிரச்சினை எழுந்தது; இப்பொழுதும் எழுந்திருக்கிறது. நான் ஏற்கனவே சொன்னதுபோல, எங்களுக்கு 14,000 வீடுகள்தான் கிடைத் திருக்கின்றன. ஆனால், மலையகத்தில் 176,000 குடும்பங்கள் இருக்கின்றன. இவ்விடயம் சம்பந்தமாக நாங்கள் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் ஒரு கோரிக்கையை முன்வைத்து, காணி உரிமை சம்பந்தமான விடயத்தை முன்னெடுத் திருக்கிறோம். இந்த விடயத்துக்கு நீங்கள் அனைவரும் கட்சி பேதமின்றி ஒத்துழைப்பீர்கள்; ஆதரவளிப்பீர்கள் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. ஏனென்றால், ஒதுக்கப்பட்ட மக்கள் சார்ந்த பிரச்சினை தொடர்பிலான பிரேரணை ஒன்றை கௌரவ மனோ கணேசன் அவர்களும் கௌரவ அநுர குமார திஸாநாயக்க அவர்களும் இணைந்து இச்சபையில் கொண்டுவந்தார்கள். அது சம்பந்தமான விவாதத்தில் ஆளும் கட்சி மற்றும் எதிர்க்கட்சியைச் சேர்ந்த 42 உறுப்பினர்கள் பேசியிருக்கிறார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙනවා.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Hon. Velu Kumar took some time allocated to me.

அந்த மக்களுடைய வாழ்க்கையில் கட்டாயம் ஒரு மாற்றத்தைக் கொண்டுவர வேண்டும், குறிப்பாக, அவர்களுக்கு காணி உரிமை வேண்டும் என்பதற்காக இவ்வாறு இரு தரப்பினரும் அந்தப் பிரேரணைக்கு ஆதரவு கொடுத்தார்கள். மாண்புமிகு ஜனாதிபதி மூலமாக 4,000 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீட்டை மேற்கொண்டு, எதிர்வரும் ஏப்பிரல் அல்லது மே மாதத்துக்குள் காணி உரிமை வழங்குவோம். அதற்குக் கட்டாயம் அனைத்து உறுப்பினர்களும் முன்வந்து ஒத்துழைப்பீர்கள் என்று நான் நம்புகின்றேன்.

இன்றைக்கு இருக்கின்ற சூழலில் வாழ்க்கைச் செலவு அதிகரித்துக்கொண்டு செல்கின்றது. ஆனாலும், அரசாங்கம் என்ற வகையில், எங்களால் எந்தளவுக்கு முடியுமோ அந்தளவுக்கு மக்கள்மீது பாரத்தைச் சுமத்தாமல் இருப்பதற்கான நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம். மக்கள் மீதான பாரம் குறைக்கப்படும் என்ற நம்பிக்கை எனக்கு இருக்கின்றது. இன்று பெரிய பிரச்சினையாக இருப்பது தோட்டத் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினை! இப்பிரச்சினை சம்பந்தமாக நாங்கள் பெருந்தோட்ட நிறுவனங்களுடன் பேச்சுவார்த்தை நடத்தினோம். பெருந்தோட்ட நிறுவனங்களுக்கு கூட்டு ஒப்பந்த முறைமைக்கு வருவதற்கு இஷ்டம் இல்லை என்றே நான் நினைக்கின்றேன். அதுமாத்திரமன்றி, தோட்டத் தொழிலாளர்களின் அடிப்படைச் சம்பளத்தை அதிகரிக்க முடியாது என்ற நிலைபாட்டிலும் அவை இருக்கின்றன. இதனால்தான் கௌரவ அமைச்சர் மனுஷ நாணாயக்கார அவர்கள் மூலமாகச் சம்பள நிர்ணய சபையைக் கூட்டி, நாங்கள் சம்பள உயர்வுக்கான கோரிக்கையை விடுத்திருக்கின்றோம். பெரும்பாலும், இந்த மாத இறுதிக்குள் இது சாத்தியமாகுமென நான் நினைக்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
மன்னிக்கவும்!

நான் இன்னுமொரு விடயத்தைச் சொல்லியாக வேண்டும். கௌரவ உறுப்பினர் அவர்களே, கட்சி பார்த்து வீட்டுத்திட்டத்தில் வீடுகளைக் கொடுப்பதாகத்தானே நீங்கள் என்மீது குற்றச்சாட்டு முன்வைக்கிறீர்கள். அப்படியென்றால், நான் வெளிப்படையாகவே ஓர் அழைப்பை விடுக்கிறேன். நீங்கள் அரசியல் ரீதியாக எதிர்க்கட்சியில் இருங்கள்; கௌரவ எதிர்க்கட்சித் தலைவருக்கு ஆதரவு கொடுங்கள்! அதில் எனக்கு எந்தப் பிரச்சினையும் இல்லை! எதிர்வரும் திங்கட்கிழமை நாங்கள் ஒரு கூட்டத்தைக் கூட்டுவோம். அந்தக் கூட்டத்துக்கு எனது அமைச்சின் அதிகாரிகளையும் அழைக்கின்றேன். அப்போது, நீங்கள் இந்த வீட்டுத்திட்டம் சம்பந்தமான பிரச்சினைகளை முன்வையுங்கள்! நீங்கள் மட்டுமல்ல, யார் யார் வர விரும்புகிறார்களோ, அவர்கள் எல்லோரும் தாராளமாக வரலாம். கண்டி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்களும் இங்கு இருக்கிறார். *[இடையீடு]* தயவுசெய்து நீங்கள் எல்லோரும் கட்டாயம் கலந்துகொள்ள வேண்டும். என்னால் முடிந்ததை நான் செய்கிறேன். கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் ஒரு கேள்வி கேட்க வேண்டுமெனச் சொன்னீர்களே, கேளுங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසන්.

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය ගන්න.

ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ அமைச்சர் அவர்களே, இப்பொழுது ஆரம்பிக்கப்பட்டிருக்கின்ற இந்திய வீட்டுத்திட்டத்தின் வீடுகள் 7 பேர்ச்சஸ் நிலத்திலா அல்லது 10 பேர்ச்சஸ் நிலத்திலா அல்லது 15 பேர்ச்சஸ் நிலத்திலா கட்டப்படுகின்றன என்பதைக் குறிப்பிட முடியுமா?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Can I respond?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
Yes, please.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජීවන් තොණ්ඩමන් ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் கேட்ட விஷயம் சம்பந்தமாக ஆரம்பத்தில் ஒரு குழப்பம் இருந்தது.அந்தக் குழப்பத்துக்குக் காரணம் என்ன என்பதை நான் இங்கு தெளிவுபடுத்துகிறேன். *[இடையீடு]* ஒரு நிமிடம் தாருங்கள்! நான் முடிக்கின்றேன்.

Let me answer the question first! You keep asking questions. Do you not want an answer? - *[Interruption.]* Listen, till now, what have you done for the people? You have only been sitting and bargaining saying "I want this position" and "I want that position". You almost betrayed your Party Leader, the Hon. Mano Ganesan. What right do you have to come and talk? Let me explain! *[Interruption.]* Give me a minute. Hon. Member, let me finish my answer.

2020இல் கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்கள் பிரதமராக இருக்கும்போது, 10 பேர்ச்சஸ் காணிக்கு அமைச்சரவை அனுமதி வழங்கப்பட்டது. ஆனாலும், அதைப் பெருந்தோட்ட நிறுவனங்கள் வழங்கவில்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, මේ එතුමාගේ කාලය.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Give me one minute, Sir.

ஆனால், இப்பொழுது PMMDமூலமாக -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[பி.ப. 3.42]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2015ஆம் ஆண்டு இருந்த எங்களுடைய 'நல்லாட்சி' அரசாங்கத்திடம் நாங்கள், எங்களுடைய பெருந்தோட்ட மக்களின் வாழ்க்கைநிலை மாற்றமடைய வேண்டும் என்ற அடிப்படையில் அம்மக்களுக்குப் பிரதானமாக 7 பேர்ச்சஸ் நிலமும் தனி வீட்டுத்திட்டமும் வழங்கப்பட வேண்டுமெனக் கோரிக்கை விடுத்தோம். அதற்கமைய, அம்மக்களுக்கு 7 பேர்ச்சஸ் வீதம் நிலம் ஒதுக்கப்பட்டது. அதற்கென ஒதுக்கப்பட்ட நிலத்தில் வீட்டுத்திட்டமும் நடைமுறைப் படுத்தப்பட்டது. அதற்குப் பிறகு ஆட்சிக்கு வந்தவர்கள், "எங்களுடைய மக்களுக்கு 7 பேர்ச்சஸ் நிலம் போதாது. ஆகையால், நாங்கள் 10 பேர்ச்சஸைப் பெற்றுக்கொடுக்கப் போகின்றோம்" எனவும் "அங்கு கட்டப்படுகின்ற வீடுகள் குருவிக் கூடுகளாக இருக்கின்றன; அவற்றின் கூரைகள் பறக்கின்றன. ஆகையால், slab இடப்பட்ட வீடுகளைக் கட்டப்போகின்றோம்" எனவும் கூறி, ஏற்கெனவே நடைபெற்றுக்கொண்டிருந்த வேலைத்திட்டத்தைக் குழப்பியடித்தார்கள். அன்று நாங்கள் எந்தளவுக்கு இந்த வேலைத்திட்டத்தை நிறைவு செய்தோமோ, அதே நிலையில்தான் இன்றும் இருக்கின்றது.

கௌரவ மனோ கணேசன் அவர்கள் ஊடகமொன்றுக்குக் கூறியதுபோல, இந்த 10,000 வீட்டுத்திட்டமானது, 2017ஆம் ஆண்டு எங்களுடைய 'நல்லாட்சி' அரசாங்க காலத்திலே முன்வைக்கப்பட்டது என்பதையும், இப்பொழுது அதே 7 பேர்ச்சஸில்தால் வீட்டுத்திட்டம் நடைபெறுகின்றது என்பதையும், அதே சதுரஅடியில்தான் வீடுகள் கட்டப் படுகின்றன என்பதையும் அதே அமைப்பில்தான் கூரைகள் அமைக்கப்படுகின்றன என்பதையும் நான் இங்கு மிகத் தெளிவாகக் கூறிவைக்க விரும்புகின்றேன். எங்களுடைய 'நல்லாட்சி' அரசாங்க காலத்தில் ஆரம்பிக்கப்பட்ட வீட்டுத் திட்டத்தை 2020இல் தொடர்ந்திருந்தால், கடந்த 4 வருடங்களில் ஆயிரக்கணக்கான வீடுகளை அமைத் திருக்கலாம். ஆனால், வெட்டித்தனமாக 7 பேர்ச்சஸுக்குப் பதில் 10 பேர்ச்சஸ் என்றார்கள்; கூரைக்குப் பதில் slab என்றார்கள். இவ்வாறு சொல்லிச் சொல்லி காலத்தை இழுத்தடிப்புச் செய்து, இன்றும் அவர்கள் நாங்கள் விட்டுச் சென்ற இடத்தில்தான் இருந்துகொண்டிருக்கிறார்கள்.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ගරු ඇමතිතුමාට අවස්ථාව දෙන්න. හැබැයි, මගේ කාලය මට දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු ඇමතිතුමා.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்களே, 10 பேர்ச்சஸ் காணி வழங்கப்படுகின்றது. நீங்கள் 10,000 வீட்டுத்திட்டம் வந்ததென்று சொன்னீர்கள்!

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
ஏழு பேர்ச்சஸ்தான் வழங்கப்படுகின்றது.

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ உறுப்பினர் அவர்களே, 1, 2, 3 என்று எண்ணிப் பாருங்கள்! 10 பேர்ச்சஸ் காணி வழங்கப்படுகின்றது. *[இடையீடு]* நீங்கள் ஹந்தானையில் 22 ஏக்கர் காணி எடுத்தீர்கள் தானே! அப்பொழுது உங்களுக்குத் தெரியவில்லையா 10 பேர்ச்சஸா, 7 பேர்ச்சஸா? என்று. *[இடையீடு]* -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, -

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

நான் ஒரேயொரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். தயவுசெய்து, கேளுங்கள்! *[இடையீடு]* Wait! Let me finish. Sir, how can you give him time when it is about my Ministry? Sir, he is talking about my Ministry and I deserve to answer. Let me finish my answer.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ අමාත්‍යාංශය, -

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

இந்த 10,000 வீட்டுத்திட்டத்தை 2017இல் இந்தியப் பிரதமர் நரேந்திர மோடி அவர்கள் நுவரெலியாவில் வைத்து அறிவித்தாக இவர் சொல்கிறார். *[இடையீடு]* கௌரவ வேலு குமார் அவர்களே, நீங்கள் 2017ஆம் ஆண்டிலிருந்து 2019வரை 10,000 வீட்டுத்திட்டத்தில் ஒரு வீட்டையாவது கட்டி இருக்கின்றீர்களா? நாங்கள் ஆட்சிக்கு வந்தபிறகுதான் வீடுகளைக் கட்டினோம்.*[இடையீடு]* கௌரவ வேலு குமார் அவர்களே, 4,000 வீட்டுத்திட்டம் வந்தபிறகுதான் 10,000 வீட்டுத்திட்டம் வந்தது. மறைந்த தலைவர் ஆறுமுகன் தொண்டமான் அவர்கள் மூலமாகத்தான் 4,000 வீட்டுத்திட்டம் வந்ததென்று நீங்கள் ஊடகமொன்றுக்குச் சொல்லி இருக்கிறீர்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, මේ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ කාලය.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මොකක්ද මේ කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මගේ වෙලාව මට දෙන්න. එතුමාට එහෙම වෙලාව දෙන්නේ ඇයි? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. තරහා නැහැ.

மலையக மக்களின் வாழ்க்கை நிலையை மாற்றுவதற்காக நாங்கள் செய்த வேலைத்திட்டத்தை இழுத்தடிப்புச் செய்து, மூடிமறைப்புச் செய்து, கடைசியில் இன்று அதே இடத்தில் நின்றுகொண்டு, கூக்குரல் இடுவதால் மட்டும் அவர்களின் வாழ்க்கை நிலை மாறிவிடப் போவதில்லை. இன்றும் வீட்டுத்திட்டம் 7 பேர்ச்சஸ் நிலத்தில்தான் ஆரம்பிக்கப் பட்டிருக்கிறது. அதே சதுர அடியில், அதே அமைப்பிலான வீடுகள்தான் கட்டப்படுகின்றன. அன்று சர்வதேச அமைப்புகளின் கண்காணிப்பின்கீழ் மேற்கொள்ளப்பட்ட வீட்டுத்திட்டமானது, இன்று தங்களுக்குத் தேவையான -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 2කින් අවසන් කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මම විනාඩි දෙකයි කථා කර තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩියක් වැඩියෙන් දීලා තිබෙනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 5ක් දෙන්න. මම විනාඩි දෙකයි කථා කර තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට විනාඩියක් වැඩියෙන් දීලාත් තිබෙනවා.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

බලන්න, මම වචන කීයද කථා කර තිබෙන්නේ කියලා. එහෙම නම් කථා කරන්න ඕනෑ නැහැ නේ. එහෙම අසාධාරණකම් කරන්න එපා. මම වචන කීයක් කථා කරලා තිබෙනවාද කියලා බලන්න. මට වෙලාව දෙන්න. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

அதே இடத்தில் அதே வீட்டுத்திட்டத்தைத் தொடர வேண்டிய நிலைமைதான் இன்று இவர்களுக்கு ஏற்பட்டிருக் கிறது என்பதை நான் இந்த இடத்தில் கூறிவைக்க விரும்புகின்றேன்.

தோட்டப்பகுதிகளில் இருக்கக்கூடிய காணிகளை வெளி யாருக்குப் பெற்றுக்கொடுக்கின்ற நடவடிக்கை இந்த ஆட்சியில் தொடர்ச்சியாக நடைபெறுகின்றது. குறிப்பாக, கண்டி மாவட் டத்தைச் சேர்ந்த முன்னாள் அமைச்சர் மாண்புமிகு மஹிந் தானந்த அலுத்கமகே அவர்கள் இங்கு இருக்கின்றபோது நான் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, கண்டியில் இருக்கின்ற ஹந்தானைத் தோட்டத்தில் எனக்கு 22 ஏக்கர் நிலம் இருப்பதாக கௌரவ அமைச்சர் ஜீவன் தொண்டமான் அவர்கள் தற்போது சொன்னார். ஹந்தானையிலுள்ள அந்த 22 ஏக்கர் நிலத்தைக் கண்டுபிடித்து, அதை அங்கிருக்கக்கூடிய பொதுமக்களுக்குப் பகிர்ந்துகொடுக் குமாறு நான் அவரைக் கேட்டுக் கொள்கின்றேன். அதேபோல, ஹந்தானைத் தோட்டத்தில் Hanthana Bird Park என்ற ஒரு நிறுவனத்துக்கு-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

අර ගලබොඩවත්ත දීපු එක ගැනද ඔබතුමන්ලා කථා කරන්නේ?

கலபொட தோட்டத்தில் ஏறக்குறைய 600 ஹெக்டெயாரும் மவுன்ஜீன் தோட்டத்தில் ஏறக்குறைய 300 ஹெக்டெயாரும் வெளி நிறுவனங்களுக்குத் தாரைவார்த்துக் கொடுக்கப் பட்டுள்ளது. ஒரு ஹெக்டெயாருக்கு வெறும் 4,000 ரூபாய் மட்டும்தான் குத்தகையாக அறவிடப்படுகின்றது. ஏன் அதைத் தோட்ட மக்களுக்குப் பகிர்ந்தளிக்க முடியாது? ஏன் அதைத் தோட்ட மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துவதற்காகப் பகிர்ந்தளிக்க முடியாது?

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අළුත්ගමගේ මන්ත්‍රීතුමා.

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ මිත්‍ර වේලු කුමාර් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ගලබොඩවත්තේ කෙරෙන ව්‍යාපෘතියට ඔබතුමා විරුද්ධද කියලා. ඒ කෙරෙන ව්‍යාපෘතියට ඔබතුමා විරුද්ධ ද?

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
අපි කියලා තිබෙන්නේ, ඒ ජීවත් වෙන ජනතාවට අවශ්‍ය දේ කරලා ඕනෑ ව්‍යාපෘතියක් කරන්න කියලායි.

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මගේ ප්‍රශ්නය ඔබතුමා ඒ ව්‍යාපෘතියට විරුද්ධ ද නැද්ද කියන එක විතරයි. ඒකට විරුද්ධ නම් විරුද්ධයි කියන්න.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
දැනට විරුද්ධයි. අපි විරුද්ධයි.

**ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි. එච්චරයි.

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கலபொடவா இருக்கலாம், மவுண்ட்ஜீனாக இருக்கலாம், ஹந்தானையா இருக்கலாம், அங்கு இருக்கக்கூடிய மக்களுக்கு அவசியமான அடிப்படை வசதிகளையும் அவர்களது வாழ்வா தாரத்துக்கான வழியையும் ஏற்படுத்திக் கொடுத்த பின்னர், தோட்டங்களை வெளியாருக்குக் கொடுப்பதில் எங்களுக்குப் பிரச்சினையில்லை. Bungalowஇல் இருப்பவர்களுக்கு 'லயன்' களில் இருப்பவர்களுடைய வலியோ, 1,000 ரூபாய் நாட்கூலி யோடு ஏழ்மையிலும் பட்டினியிலும் வாழ்ந்துகொண்டு இருக்கின்றவர்களுடைய வருத்தமோ தெரியப்போவதில்லை! இந்த சபையில் Cabinet அமைச்சராக இருக்கின்ற ஒருவர், இந்தச் சபையைப் பிழையாக வழிநடத்தக்கூடிய வகையில், கண்டி மாவட்டத்தில் இருக்கின்ற ஹந்தானைத் தோட்டத்தில் எனக்குக் காணி இருப்பதாகச் சொல்லியிருந்தார். அதற்காக நான் அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஹந்தானை என்பது, விண்வெளியில் இல்லை; அமெரிக்கா வில் இல்லை. அது கண்டியிலிருந்து 3 கிலோமீற்றர் தொலைவில்தான் உள்ளது. ஆகவே, அவர் அங்கு வந்து, அந்தக் காணியைத் தேடிப் பார்த்து, அதை அந்தத் தோட்டத்தில் இருக்கக்கூடிய மக்களுக்குப் பகிர்ந்து கொடுக்கலாம். அதற்கு எங்களுடைய கௌரவ முன்னாள் அமைச்சர் மஹிந்தானந்த அலுத்கமகே அவர்கள் உதவி செய்ய வேண்டுமென நான் இந்த இடத்தில் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුප පස්කුවල් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම සතුටුදායක තත්ත්වයක් තමයි දැන් මේ සභාව තුළ පෙනෙන්න තිබෙන්නේ. පසුගිය කාලයේ නිවාස හැදීම ඇතුළු අනෙකුත් සංවර්ධන කටයුතු සඳහා මුදල් නොමැතිව බරපතළ අර්බුදයක හිටපු අපේ රට, වර්තමානය වන විට සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත්ව ගෙන යන ආකාරය හැම පැත්තෙන්ම පෙනෙන්න තිබෙනවා. අපේ රටට සියලු රටවල සහයෝගය ලැබෙමින් පවතිනවා. අද අපි කථා කරන්නේ, ඉන්දියානු රජයේ සහයෝගයෙන් හදන නිවාස පිළිබඳ ප්‍රශ්නයක් ගැන. අපි නිවාස හදනවා. ඉන්දියාවෙන් ඇවිල්ලා ඒ සඳහා සහාය දෙනවා. කොහොමද මේක කෙරෙන්නේ කියන ප්‍රශ්නය තමයි දැන් මෙතැන තිබෙන්නේ. සියලු මන්ත්‍රීවරුන්ට මම කියන්න කැමැතියි, තමුන්නාන්සේලා මේ විරුද්ධ වෙන්නේ, වතුකරයේ ජනතාවට නිවාස ලබා දීම සම්බන්ධයෙන් බව. ඒ වාගේම ලක්ෂ 20කට අපි ඉඩම් ඔප්පු දෙනවා. නාගරිකව ජීවත් වන තවත් 50,000කට අපි සින්නක්කර ඔප්පු දෙනවා. ලක්ෂ 20ක් වන ඒ ජනතාව මෙච්චර කල් හිටියේ බද්දට. ස්වර්ණ භූමි, අර භූමි, මේ භූමි යටතේ ඉන්න මිනිස්සු ඔක්කෝටම සින්නක්කර ඔප්පු ලබා දෙනවා. ඒ අනුව රට තුළ මේ වනකොට සතුටුදායක තත්ත්වයක් නිර්මාණය වෙමින් පවතිනවා. අර්බුදයක් තිබුණත්, ප්‍රශ්න තිබුණත්, ඉන් ගොඩ ගිහිල්ලා නැතත්, ජනතාවට දැන් දැනෙන්න පටන්ගෙන තිබෙනවා ඔවුන්ගේ ප්‍රශ්න මේ රජයෙන් විසඳනවා කියලා. ලක්ෂ 20කට ඉඩම් ඔප්පු දෙනවා කියන එක සෙල්ලමක් නොවෙයි.

අද මට කෝල් එකක් ආවා, තමන්ගේ වත්තේ ගහක් කපා ගත්ත මිනිහා පොලීසියෙන් අරගෙන ගිහිල්ලා කියලා. ඇයි ඒකට බලපත්‍රයක් ලබා ගත යුතුව තිබෙන්නේ? බලපත්‍රයක් නැත්නම්, ගිනිකූරු ගහකටවත් හානියක් කරන්න බැහැ. වහල කඩාගෙන වැටුණත්, තමන්ගේ වත්තේ ගහක් කපාගෙන පරාලයක් දාගන්න බැහැ. ඒ නීතිය සහමුලින්ම වෙනස් වෙනවා. ඒකට විරුද්ධ ද කියලා මම ඔබතුමන්ලාගෙන් අහනවා. ඒකට විරුද්ධ ද? ආර්ථික අර්බුදයේ පතුලටම කිඳා බැහැපු වෙලාවේ, IMF එකෙන් සුබසාධන කටයුතු කප්පාදු කරනවා කියලා හැමෝම කිව්වා. ලක්ෂ 18කට ලබා දුන් සමෘද්ධි සහනාධාරය දැන් ලක්ෂ 24ක් දක්වා වැඩි කර තිබෙනවා, අස්වැසුම ප්‍රතිලාභය තුළින්. මේ ආර්ථික අර්බුදයෙන් ජනතාව පීඩාවට පත් වෙච්ච නිසා අස්වැසුම ප්‍රතිලාභය වැඩි කර තිබෙනවා, ලක්ෂ 24ක් දක්වා පිරිසකට ලබා දීමට. නමුත්, සමෘද්ධිය වාගේ ජීවිත කාලයටම සහනාධාර දෙන්න නොවෙයි අස්වැසුම ප්‍රතිලාභය ගෙනාවේ. මේ ප්‍රතිලාභය අපි සදහටම, පරපුරෙන් පරපුරට ලබා දෙන එකක් බවට පත් කරන්නේ නැහැ. ඒ ලක්ෂ 24න් ලක්ෂ 12ක් සවිබලගන්වන්න

අපට මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන දීලා තිබෙනවා. ගරු රමේෂ් පතිරණ ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ජනාධිපතිතුමාගේ පූර්ණ නායකත්වයෙන් යුතුව ඒ වැඩසටහන අපි ලබන මාසයේ ගාල්ලෙන් පටන් ගන්නවා. කෘෂි කර්මාන්තය, වෘත්තීය පුහුණුව, විදේශ රැකියා ඉලක්ක කරලා ක්ෂුද්‍ර ව්‍යවසායක මට්ටම ශක්තිමත් කරන්න තමයි ඒ පවුල් ලක්ෂ 12 සවිබලගන්වන්නේ. දැන් ඒ සඳහා හැම අතින්ම පදනම සකස් වෙනවා. නමුත්, ප්‍රශ්නත් තිබෙනවා. විදුලි බිලේ ප්‍රශ්නය තිබෙනවා. ඒක ජනතාවට දරාගන්න අමාරුයි. නමුත්, පෙරට වඩා දැන් ඉතාම හොඳ තත්ත්වයක රට තිබෙන්නේ. පසුගිය කාලයේ උද්ධමනය තිබුණා, සියයට අනූ ගණනකට. දැන් උද්ධමනය සියයට හයයි. ඒක නරකද?

හැබැයි, ඒ අල්ල පනල්ලේ විරුද්ධ පක්ෂයේ නායකතුමා මොකක්ද කරන්නේ? එතුමා තමන්ගේ කණ්ඩායමේ ඉන්න දක්ෂයන්ට දඬුවම් කරන්න පටන් ගෙන තිබෙනවා. අපි මේ විධියට රටම සංවර්ධනය කරනකොට එතුමා විරුද්ධ පක්ෂයේ ඉන්න දක්ෂයන්ට දඬුවම් කරන්න පටන් ගෙන තිබෙනවා. සරත් ෆොන්සේකාට පල නොකියා පලා බෙදන්න දයා රත්නායක ගෙනැල්ලා තිබෙනවා. අවුරුදු ගණනාවක් තිස්සේ පක්ෂයට වැඩ කරපු සරත් ෆොන්සේකාට දැන් වැඩේ දෙනවා. එතුමාට අධිකරණයේ පිහිට තමයි දැන් තිබෙන්නේ. අධිකරණයට ගිහිල්ලා එතුමාට කියන්න පුළුවන්, "අනේ ස්වාමීනි, පක්ෂයෙන් මා එළවන එක නවත්වන්න" කියලා.

මේ ඒකාධිපති වියරුව ආර්. ප්‍රේමදාසටත් තිබුණා. උගතුන් පෙන්වන්න බැරි, දක්ෂයන් පෙන්වන්න බැරි ලෙඩේ ආර්. ප්‍රේමදාසටත් තිබුණා. එතුමාට ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි ඇතුළු තවත් නායකයන් ගණනාවක් පෙන්වන්න බැරිව ගියා. පුතාටත් ඒ ලෙඩේම හැදිලා. ඒ ගැන අපට කනගාටුයි. විනාශයේ ලකුණු පෙන්වන, පරාජයේ ලකුණු පෙන්වන, උගතුන් පෙන්වන්න බැරි, දක්ෂයන් පෙන්වන්න බැරි ලෙඩේ හැදිලා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් පල නොකියා පලා බෙදන්න කෙනෙක් ගෙනාවා. ඒ කවුද? නාලක ගොඩහේවා මහත්තයා. නාලක ගොඩහේවා ගෙනැල්ලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට පහර ගහනවා. මේ ආර්ථිකය වෙනුවෙන්, තමන්ගේ පක්ෂය වෙනුවෙන් කාලාන්තරයක් තිස්සේ වැඩ කරපු මිනිස්සුන්ටයි මේ පහර ගහන්නේ. මේ වෙනකොට මුළු රටම එක පැත්තකින් නැඟිටිනවා. අපි ලක්ෂ 20කට ඔප්පු දෙනවා. ආර්ථික අර්බුදයට ලක් වෙච්ච අයට අස්වැසුම ප්‍රතිලාභය දෙනවා. ඒ අතරින් ලක්ෂ 12ක් සවිබලගන්වනවා. තවත් 50,000කට සින්නක්කර ඔප්පු දෙනවා. අපි දන්නවා, රාජ්‍ය සේවකයන්ට ලබා දෙන ජීවන වියදම් දීමනාව රුපියල් 10,000කින් වැඩි කරලා තිබෙන බව. අර්බුදයක් පවතින අතරත් අපි විශ්‍රාම වැටුපත් වැඩි කරලා තිබෙනවා. අපි ආබාධිත ප්‍රජාවට ලබා දෙන දීමනාව වැඩි කළා. වැඩිහිටි ප්‍රජාවට ලබා දෙන දීමනාව වැඩි කළා. අපි අර්බුදයට ලක් වුණු ජනතාවට සෙත සලසන අතර ආර්ථික පුනර්ජීවනයට අවශ්‍ය කටයුතුත් මේ වෙනකොට සිදු වෙනවා. ඒ වාගේම, විදේශ රැකියා ප්‍රවර්ධනය ඉතාම ඉහළයි. ජනවාරි මාසයේ විතරක් සංචාරකයන් ලක්ෂ 2 ඉක්මවා මෙරටට පැමිණ තිබෙනවා. මේ ඉලක්කය සාධනීය වුණොත් වසරක් තුළ -වසර අවසානය වන විට- ලක්ෂ 24ක් දක්වා සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යනවා. ඊට අඩු වෙන්නත් පුළුවන්. නමුත්, අපි බලාපොරොත්තු වූ ඉලක්කය කරා යනවා.

දැන් විරුද්ධ පක්ෂ භීතියට පත් වෙලා තිබෙනවා. සමහර විරුද්ධ පක්ෂවලින් කියනවා, ඔවුන්ට සියයට 51ක ඡන්ද ප්‍රතිශතයක් තිබෙනවා කියලා ඉන්දියාවෙන් කියන බව. අනේ! කොච්චර අසරණ තත්ත්වයකට ඔවුන් පත් වෙලා ද? ඊයේ පැවැති "කරට කර" වැඩසටහනේදී මට ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා හමු වුණා. එතුමා කිව්වා, "මම ඇමෙරිකාවේ ඉන්න අපේ සහෝදරයෙකුට කථා කරලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යවන්න ලෑස්ති කළා. මචං, මෙන්න අපේ පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය, කියවලා බලන්න" කියලා. ඔහු කිව්වා ලු, "පිස්සු ද, ඕක බලන්න ඕනෑ නැහැ. ඔය ප්‍රතිපත්ති ප්‍රකාශනය සුපිරියි. හැබැයි, රටේ ජනතාවට තහවුරු කරන්න අපි දිනනවා කියලා. මොනවා හරි කරලා මැතිවරණය දිනන බව පෙන්වන්න. ලංකාවේ මිනිස්සුන්ගේ හැටියක් තමයි, මැතිවරණය දවසේ උදේ නැඟිටිනකොට දිනන පක්ෂයට ඡන්දය දීම. ඒක හොඳ ද, නරක ද, සුදු ද, කළු ද කියලා බලන්නේ නැහැ" කියලා. ඇමෙරිකාවේ ඉන්න සහෝදරයෙක් තමයි එහෙම කියා තිබෙන්නේ. කාටද? ලක්ෂ්මන් නිපුණආරච්චිට. හොඳද, නරකද බලලා උදේට ඡන්දය දෙනවා. දිනන පක්ෂය කිව්වාම, හැමෝම යනවා. මොන පක්ෂය ද දිනන්නේ? දිනන්නේ ජනතා විමුක්ති පෙරමුණයි කියලා කිව්වොත්, අන්න ගිහිල්ලා ඒ පක්ෂයට කතිරය ගහනවා කියලා මේ අය හිතාගෙන ඉන්නවා. මොකද, ගෝඨාභයට ගහනකොට ඒ ගොල්ලන් මතයක් හැදුවා, ගෝඨාභය දිනනවා කියලා. ගෝඨාභය දිනුවා. මහින්ද දිනනවා කියලා මතයක් හැදුවා, මහින්ද දිනුවා. නමුත් එහෙම නොවෙයි වුණේ. එතුමන්ලා කරපු සේවාව, එතුමන්ලා ඉතිහාසයේ කරපු දේවල්, එතුමන්ලාගේ පළපුරුද්ද ආදී ඔක්කෝම බලලා තමයි ජනතාව ඡන්දය දුන්නේ. නමුත්, ජනතා විමුක්ති පෙරමුණ දැන් අලුත් පදයක් කියාගෙන යනවා, "අපි දිනනවා-අපි දිනනවා" කියලා. එහෙම කිව්වාම හැමෝම ඡන්දය ලබා දෙයි කියලා තමයි හිතාගෙන ඉන්නේ. නමුත්, ජනතාව ඡන්දය දෙන්නේ එහෙම බලලා නොවෙයි. ලංකාවේ කිසිදු සමීක්ෂණ වාර්තාවකින්, විද්‍යාත්මක පදනමකින් එළිදක්වපු සමීක්ෂණ වාර්තාවකින් තොරව කියනවා, ඔවුන් දිනනවා, සියයට 51ක ඡන්ද ප්‍රතිශතයක් ඔවුන්ට තිබෙනවා කියලා. එවැනි කිසිම සමීක්ෂණ වාර්තාවක් නැහැ. 1986දීත් මේ වාගේ මායාවක් තිබුණා. එදාත් ඔවුන් තරුණ තරුණියන්ට කිව්වා, ආණ්ඩුව පරාජය කරලා ලබන අවුරුද්දේ අනිවාර්යයෙන්ම ජය ගන්නවා කියලා. මොකක්ද, වුණේ? 60,000ක මිනිස් ඝාතනයකින් තමයි ඒක අවසන් වුණේ. අධි බලාපොරොත්තු දීලා, ව්‍යාජ සිහින ලෝක මවලා, ගල්කටස් දීලා සිහින ලෝකයක් බලන්න යැව්වා. ඒ සිහින ලෝකයට ගිය අය අවසානයේ දී පරාජය වුණා. ඒ වාගේම තමයි මෙතුමන්ලා මෙවරත් ක්‍රියා කරන්නේ. මෙවර ඒ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට නොහැකි නිසා දැන් අලුත් ක්‍රමයක් අත්හදා බලනවා. රටේ ජනතාවගේ ඡන්දය මේ අයට නැහැ. නමුත් සමහරු කියනවා, ඔවුන් සියයට 90ක් දිනුම් කියලා. ඒ නිසා අපට ජනතා විමුක්ති පෙරමුණ ගැන කථා කරන්න දෙයක් නැහැ. ඔවුන්ගේ බොඳ වන සිහිනය එහෙම්ම ම පැත්තක තිබුණාදෙන්.

සජිත් ප්‍රේමදාසගේ උගතුන් විරෝධී, දක්ෂයන් විරෝධී කැපිල්ල දෙස බලන්න. දැන් දැළි පිහියෙන් කපන්න පටන් අරගෙන තිබෙන්නේ තමන්ගේ පක්ෂය තුළ ඉන්න දක්ෂයන්. අනෙක් පැත්තෙන් චම්පික රණවක පැත්තකට දැම්මා. *[බාධා කිරීමක්]* ඒක තමයි. පොඩ්ඩක් ඉන්න, මම ඒ ගැන කියන්නම්. දෙවතාවක්, තුන්වතාවක්, හතරවතාවක් මම ඒ ගැන කියනවා. මේවා කියන්න ඕනෑ, ජනතාවට ඇහෙන්න. රිදුණාද ඒකට? රිදුණත් කලබල වෙන්න එපා. ඇත්ත කථාව ඒක නේ. දැන් පක්ෂයේ ප්‍රධානීන්ට ගහන්න පටන් අරගෙන නේ. ඒක තමයි තත්ත්වය.

අනෙක් පැත්තෙන්, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙන් අපි කරන්නේ මොකක්ද කියන එක මම පැහැදිලි කළ යුතුයි. අලුත් ගමක්, අලුත් රටක්, දියුණු රාජ්‍යයක් කියන සංකල්පයට තමයි අපි යන්නේ. අලුත් ගමක්, අලුත් රටක්, දියුණු රාජ්‍යයක් කියන සංකල්පයේදී මෙතෙක් කල් තිබුණු සුබසාධන ක්‍රමය ක්‍රමානුකූලව නැති කරමින්, අලුත් දේශයක් කරා යන්න අවශ්‍ය නිෂ්පාදන ආර්ථිකය අපි ගොඩනගනවා. ක්ෂුද්‍ර මට්ටමින් තමයි ඒක පටන් ගන්නේ. අස්වැසුම ප්‍රතිලාභීන් අතරින් ලක්ෂ 12ක්

[ගරු අනුප පස්කුවල් මහතා]

සවිබලගැන්වීම සඳහා අපට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනය භාණ්ඩාගාරයෙනුත්, ආසියානු සංවර්ධන බැංකුවෙනුත්, ලෝක බැංකුවෙනුත් ලැබී තිබෙනවා. ඒ යටතේ අපි ඒ ජනතාව කොටස් තුනකට වෙන් කර ගන්නවා. පළමුවැනි කොටස තමයි විදේශ රැකියා ඉලක්ක කර ගත්ත වෘත්තීය පුහුණුව ලබා දෙන කණ්ඩායම. ජපන් භාෂා පන්ති, ඉංග්‍රීසි භාෂා පන්ති පවත්වලා, හෝටල් ක්ෂේත්‍රය, ඉදිකිරීම් ක්ෂේත්‍රය ඇතුළු සියලු ක්ෂේත්‍ර ඔස්සේ මේ වර්ෂය තුළ විදේශ රැකියා සඳහා යැවීමට අපි ලක්ෂයක් තෝරා ගන්නවා. දෙවැනි ක්ෂේත්‍රය තමයි කෘෂිකර්මාන්තය, සත්ව පාලනය, තේ වගාව, කුරුඳු වගාව, රබර් වගාව, ගම්මිරිස් වගාව ඇතුළු ආහාර භෝග වගාව. ඒ සඳහා අර ලක්ෂ 12ක පිරිස අතරින් ලක්ෂ 3ක් තෝරා ගන්නවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සහ පුහුණුව ලබා දෙනවා. පළමුව අවශ්‍ය කරන්නේ සෑම කෙනෙකුගේම මනස සකස් කිරීමයි. දුප්පත් - දිළිඳු - මානසිකත්වය නැති කරන්නේ නැතිව, වෛරී මානසිකත්වය නැති කරන්නේ නැතිව, "මට බැහැ. මට හැකියාව නැහැ" කියන මානසිකත්වය නැති කරන්නේ නැතිව, "මම තුන්වැනි ලෝකයේ රටක මිනිහෙක්" කියන මානසිකත්වය නැති කරන්නේ නැතිව කවදාවත් ජයග්‍රාහී මාවතට ඒ පුද්ගලයා යොමු කරන්න බැහැ. ඒ නිසා අපි පළමුවෙන්ම දිළිඳු මානසිකත්වය නැති කරනවා. බුදුන් වහන්සේ දේශනා කළා වාගේ පළමුව සිත තමයි හදන්නේ. සිත පළමුව සකස් කරනවා. සිත තුළ රෝපණය කරනවා, "මම ශක්තිමත් පුරවැසියෙක්. මම දක්ෂයෙක්" කියලා. ඊට පස්සේ තමයි ඔහුට අවශ්‍ය දැනුම සහ ශක්තිය ලබා දෙන්නේ. සිත සකස් කරලා ක්‍රියාව වෙනස් කරනවා. ක්‍රියාව වෙනස් කළාම තමයි වචනය, තමන් කියන දේ වෙනස් වෙන්නේ. මේ ආකාරයට තමයි ලක්ෂ 12ක් සවිබලගැන්වීමේ ක්‍රියාවලිය අපි ලබන මාසයේ ගාල්ලෙන් පටන් ගන්නේ.

අපි ලංකාව පුරාම තේ වගාව ප්‍රවර්ධනය කරනවා. දුප්පත්ම අයත්, දැඩි දුෂ්කරතාවට පත් වුණු අයත් කියන කණ්ඩායම් දෙකම එකට අරගෙන ඒගොල්ලන් සවිබලගැන්වීම කරනවා. එහෙම නැතිව නිකම් සල්ලි දෙන ව්‍යාපාරයක් නොවෙයි, අස්වැසුම කියන්නේ. එක පැත්තකින් ලක්ෂ 24කට අස්වැසුම ප්‍රතිලාභය ලබා දෙනකොට අනෙක් පැත්තෙන් ඒ අයගෙන් ලක්ෂ 12ක් තෝරාගෙන ඒ ලක්ෂ 12න් නිෂ්පාදන ආර්ථිකයක් හදන්න අවශ්‍ය කටයුතු අපි කරනවා. ඒ නිෂ්පාදන ආර්ථිකය සකස් වෙනකොට අපි අංක එකට ඉලක්ක කරන්නේ අපනයනය. මොකද, දැන් දේශීය වෙළෙඳ පොළ හැකිළිලා තිබෙන නිසා. ඒ යටතේ තේ වගාවට අපි අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, ගම්මිරිස් වගාවට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, කුරුඳු වගාවට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, කුකුළු නිෂ්පාදනවලට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, කිරි නිෂ්පාදනවලට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, අනෙකුත් සත්ව පාලන කටයුතුවලට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා, ආනයන ආදේශන භාණ්ඩ, එනම් මේ රට ආනයනය කරන භාණ්ඩ නිෂ්පාදනවලට අංක එකේ ප්‍රමුඛතාව ලබා දෙනවා. ජනතාවගේ ආර්ථිකය සකස් කිරීමේ ඒ ක්‍රියාවලිය සහ ක්ෂුද්‍ර මට්ටමේ නිෂ්පාදන ක්‍රියාවලිය ලබන මාසය වෙනකොට පටන් ගන්නවා.

ඊළඟට අපි "සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන" ඇති කිරීමට "එක ගමක් - එක නිෂ්පාදනයක්" කියන ජපානයේ සහ චීනයේ ක්‍රියාත්මක ක්‍රමය තමයි තෝරා ගත්තේ. අපි පසුගිය දා චීනයට ගියා. ඒ වෙලාවේ අපි අමාත්‍යාංශ 5ක නිලධාරින් කණ්ඩායමක් ගියා. වෘත්තීය පුහුණුව සඳහා අපි චීනයත් එක්ක ගිවිසුම්ගත වුණා, අස්වැසුම ප්‍රතිලාභීන් දසලක්ෂයක් වෘත්තීය පුහුණුව තුළින් ශක්තිමත් කරන්න. එහි තිබෙන "ත්‍රී ගෝජස්" කියන වෘත්තීය පුහුණු ආයතනය වාගේ ආයතන 33ක් සමඟ අපි ගිවිසුම්ගත වුණා. ඒ අනුව අපේ අමාත්‍යාංශය ලබන වසර වෙනකොට පටන් ගන්නවා, සංචාරක වෘත්තිකයන් පුහුණු කිරීමේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක්. අපට කියන්න තිබෙන්නේ මේ ගමන තිරසාරයි, වැඩ පිළිවෙළක් තිබෙනවා, නිෂ්පාදන ආර්ථිකයකට ක්‍රමිකව යනවා, අනෙකුත් පක්ෂ වාගේ ඉබාගාතේ නොවෙයි යන්නේ කියන එක. ඒ නිසා අපි සියලුදෙනාට කියනවා, පියවරෙන් පියවර, පඩියෙන් පඩිය, පඩියෙන් පඩිය නඟිමින් ඉලක්කය කරා යන මේ ගමනට එකතු වෙන්න කියලා. ගමරාළ අලියාගේ නැට්ටේ එල්ලිලා දිව්‍ය ලෝකය බලන්න ගිහිල්ලා වැටුණා වාගේ වැටෙන්න එපා. නැවතත් මේ තිරසාර ගමන කරා යන්න අපත් එක්ක එකතු වෙන්න කියලා සමස්ත ජනතාවට අපි ආරාධනා කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.07]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයකට පස්සේ හොඳ කථාවක් ඇහුවා. ඒ ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා නින්දෙන් නැඟිටලා කියලා නම් දැනෙනවා. නින්දෙන් ඇහැරුණාට, ආපහු නින්ද යනවා නම් හොඳයි. මොකද, නින්දෙන් නැඟිටලා ඉන්න බැහැ. කළුවර පැත්තේ ගියොත් ගහලා පන්නනවා නේ. ඒක හින්දා ඕවා පාර්ලිමේන්තුව ඇතුළේදීම කියන එක හොඳයි. දැන් මේ රටේ මිනිස්සුන්ට වැල් බයිලා කියනවා. මේ රටේ මිනිස්සුන්ට තුන් වේල කාලා, ඇඳලා ඉන්න බැරි වෙන්න රට විනාශ කළ අය දැන් සජිත් ප්‍රේමදාස ආණ්ඩු හදන එක ගැන කථා කරනවා. දැන් සජිත් ප්‍රේමදාසගේ තාත්තා -රණසිංහ ප්‍රේමදාස මැතිතුමා- හදපු,-

**ගරු අනුප පස්කුවල් මහතා**
(மாண்புமிகு அனுப பஸ்குவல்)
(The Hon. Anupa Pasqual)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න දෙයක් තිබෙනවා. එතුමා කිව්වා, කළුවර ගියොත් ගහයි කියලා. අපි හැම දාම කළුවර ඉඳන් තමයි පාර්ලිමේන්තුවට එන්නේ; ගෙදර ඉඳන් එන්නේ. ගෙදර ඉඳන් තමයි මම හැම දාම පාර්ලිමේන්තුවට එන්නේ. ඔබතුමා කිව්වා, ගෙදර ගියොත් ගහනවා කියලා. මම හැම දාම ගෙදර ඉඳන් එන්නේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කාගේවත් නම කිව්වේ නැහැ. මට කථා කරගෙන යන්න දෙන්න. එතුමාට ඔබතුමා වෙලාව දෙනවා නම් වෙන ඕනෑ වෙලාවක දෙන්න. මට මගේ කථාව කරගෙන යන්න දෙන්න.

දැන් එතුමා කියනවා, අපේ පක්ෂය උගතුන්ට ගහනවා කියලා. එතුමා උගතුන් කියන්නේ කවුද කියලා දන්නවාද දන්නේ නැහැ. මොකද, නාලක ගොඩහේවා කියන්නේ අට පාස් මිනිහෙක්ද? අපි ගත්තේ උගතෙක් තමයි. හර්ෂ ද සිල්වා මහත්මයාත් එක්ක

ප්‍රශ්නයක් වුණාද, නැද්ද කියන එක ඔබතුමාට වැඩක් නැහැ. ප්‍රශ්න ඇති වෙනවා නම් ඔබතුමන්ලාට හොඳයි නේ. නිකම් අනුන්ගේ පක්ෂවලට ඇඟිලි ගහන්නේ නැතුව ඉන්න. දැන් වැරදිලා නේ තිබෙන්නේ, නන්නත්තාර වෙලා නේ ඉන්නේ. ඔබතුමා රාජ්‍ය ඇමති වෙලා මෙච්චර කල් මේ රටේ මිනිස්සු වෙනුවෙන් කරපු එක දෙයක් කියන්න. කළුතර මිනිස්සු වෙනුවෙන් කරපු එක දෙයක් කියන්න. *[බාධා කිරීමක්]* ඒක ඔබතුමාගේ වෙලාවේදි කියා ගන්න. මේ රටේ මිනිස්සු වෙනුවෙන් එක දෙයක්වත් කරන්න බැරුව ඉද්දී සජිත් ප්‍රේමදාස මහත්මයා බස් එකක් දෙනකොට ඇඟ රිදෙනවා, බඩ රිදෙනවා, පපුව රිදෙනවා. විළි ලජ්ජයි තමයි. එතුමා ගමේ ඉස්කෝලෙට ගිහිල්ලා smart classroom එකක් දෙනකොට ඔබතුමන්ලාගේ රෙදි ගැලවෙනවා තමයි. ඒ රෙදි ගැලවෙන එක ගැන කියන්න මේ පාර්ලිමේන්තුව හැර එළියේ තැනකුත් නැහැ ඔබතුමාට. මොකද, ගමට යන්න බැහැ, ගමේ රැස්වීමක් තියන්න බැහැ. ඉතින් මෙතැනට ඇවිල්ලා ඔහේ කෑ ගහලා යනවා. ගමේ ඉන්නේ හැංගිලා.

සජිත් ප්‍රේමදාස මහත්මයා දේශපාලනය කොහොමද කරන්නේ, එතුමා ආණ්ඩු ගන්නේ කොහොමද කියන එක ගැන බය වෙන්න එපා, දහලන්න එපා. ඉස්සර රනිල් වික්‍රමසිංහ මහත්මයාටත් ඔබතුමන්ලා ඔහොම නේ කිව්වේ. ඔබතුමාට දේශපාලන සදාචාරයක් තිබෙනවා නම් මෙහෙම කරනවාද? මේ ජනාධිපතිතුමා පත් කරන දවසේ ඊ වෙනකම් ඩලස් අලහප්පෙරුමත් එක්ක, සමගි ජන බලවේගයත් එක්ක ඉඳලා ඊ අර -*[බාධා කිරීමක්]* ගම්වලට රිළව් නටවන්න ආවාම -මම හිතන්නේ ඔබතුමාත් දැකලා ඇති- "කපුරාල ගහපන් බල්ටියක්" කිව්වාම රිළවා බල්ටියක් ගහනවා. ඒ වාගේ අරහෙන් පණිවුඩය ආවා, "ගහපන් බල්ටියක්" කියලා. ගැහුවා බල්ටියක්. එහෙම ඇමතිකම් ගත්තාම ඔහොම කඹුරන්න වෙනවා තමයි. ඒ නිසා මේක මතක තියාගන්න. මේ රටේ වැදගත් මිනිස්සුන්ට, වැඩක් කරන මිනිස්සුන්ට බොරුවට අවලාද නඟන්න සූදානම් වෙන්න එපා. මම ඔබතුමාට ඊට වැඩිය මොකුත් කියන්න යන්නේ නැහැ. මොකද, ඔබතුමා ඔය රාජ්‍ය ඇමතිකමෙන් මේ රටට මෙලෝ දෙයක් කළේ නැහැ කියලා ඔබතුමාම කිව්වා. මම රූපවාහිනී වැඩසටහනකදීත් ඔබතුමාගෙන් ඒ ගැන ඇහුවාම ඔබතුමා කිව්වා, මම කළේ භාෂාව උගන්වපු එක කියලා. භාෂාව උගන්වන්න ඇමතිකමක් මොකටද? භාෂාව උගන්වන්න ගුරුවරු යොදවන්න ඕනෑ. ඒකට රාජ්‍ය නිලධාරින් ඉන්නවා. මේ ඇමතිකම් දීලා, වාහන දීලා, තෙල් පුච්චලා භාෂාව උගන්වන ඇමතිවරු යොදවන්න ඕනෑ නැහැ. ඒක තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ඔබතුමන්ලා වාගේ කට්ටිය ඕනෑ වෙලා තිබෙන්නේ. එහෙම නැතුව ඔබතුමන්ලා මේ රටට කරන දෙයක් නැහැ. සරත් ෆොන්සේකා මහත්මයාගේ ප්‍රශ්නයයි, හර්ෂ ද සිල්වාගේ ප්‍රශ්නයයි අපි බේරා ගන්නම්. ඒ හින්දා දහලන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට හදන වැඩ පිළිවෙළ ගැන දැන් කථා කරනවා. රටේ අලුත් ප්‍රමුඛතා අපි දැක්කා. ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, පශු සම්පත්වලට ප්‍රමුඛතාව දෙනවා කියලා, කිරිවලට ප්‍රමුඛතාව දෙනවා කියලා. මම මේක අහනවා. ඔබතුමා යන්න එපා, මේ ඉතිරි ටිකත් අහගෙනම යන්න. දැන් බිත්තර පිළිබඳ ප්‍රශ්නයට උත්තරයක් තිබෙනවාද? ගරු රාජ්‍ය ඇමතිතුමනි, විළි ලජ්ජයි නේ. අවුරුදු එකහමාරක් තිස්සේ මේ රටේ බිත්තර හිඟයට උත්තරයක් හොයාගන්න පුළුවන් වුණාද? ඉන්දියාවෙන් තමයි බිත්තර ටික ගේන්නේ. බිත්තර හිඟයට උත්තරයක් හොයන්න මාස 6යි යන්නේ. එවැනි ප්‍රශ්නයකට උත්තරයක් හොයාගන්න බැරි ඔබතුමන්ලාගේ ආණ්ඩුව නැවත මේ රටේ ආර්ථික සංවර්ධනයක් ඇති කරනවා කියනවාද? එහෙනම් ඒක අහන අයත් පිස්සෝ, පිළිගන්න අයත් පිස්සෝ. මේ රටේ පිස්සෝත් ඉන්න ඇති. හැබැයි දැන් හොඳට තේරුම් අරගෙන තිබෙනවා, කාත් එක්කද මේ කටයුත්ත කරන්නේ කියලා. මේ රටේ ආර්ථිකය විනාශ කරලා ඉවර වෙලා තිබියදී, JVP එක ටිකක් නැඟිටිනකොට JVP එකට ගහනවා, සජබය නැඟිටිනකොට සජබයට ගහනවා හැර මොනවත් කරනවා කියලා කියන්න බැහැ. මොකද, කරපු දේ හොඳටම ඇති නේ. මේ රටේ තුන්වේල කාලා හිටපු මිනිස්සුන්ට තුන්වේල කාලා ඉන්න නැති කරලා ආපහු සැරයක් "අපි කරනවා" කියලා කියන්න ඔබතුමන්ලාට හැකියාවක් නැහැ. ඒකෙන් ඔබතුමන්ලාගේ දේශපාලන විඥානය මොකක්ද කියන එක හොඳට තේරෙනවා. ඒ නිසා ඔය වාගේ ප්‍රකාශ කිරීමෙන් ඔබතුමන්ලාගේ කඳවුරේ ඉන්න බුද්ධිමත්, වැදගත් මිනිස්සුන්ටත් නිගාවක් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැක්කා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා හොඳ යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා. ඒ තමයි පාසල්වලට දේශපාලනඥයන්ගේ නම් දාන්න එපා කියන එක. ඇත්තටම ඒක හොඳ වැඩක්. එතුමාට ඒ සිතුවිල්ල ආවේ සද්භාවයෙන් නම් ඒක ඉතා හොඳයි. මේ රටේ ජීවතුන් අතර ඉන්න සමහර දේශපාලනඥයන්ගේ නම් දැම්මා ම දරුවන්ට පාසල්වලට යන්න හිතෙන්නේ නැතුව ඇති. ඒ හින්දා මම හිතනවා ඒක හොඳ වැඩක් කියලා. හැබැයි අපි මේ කාරණය කියනවා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් එතුමාගේ අතේ තිබෙන සල්ලිවලින් නොවෙයි නේ, හෝමාගම, මාතර එහෙම ඉස්කෝල හැදුවේ. රටේ සල්ලිවලින්නේ හැදුවේ. එහෙම නම් එතුමාගේ නමත් ඉවත් කරගන්න වෙනවා. අපි දන්නේ නැහැ, ඒවා හැර මේ යෝජනාව මෙතැන ඉඳලා ඉස්සරහට යන එකක්ද කියලා.

දෙවනුව එතුමා තව ප්‍රකාශයක් කළා, මේ පාසල්වලට දේශපාලනඥයන්ට යන්න බැහැ කියලා. ඒකත් හොඳයි, වරදක් නැහැ. හැබැයි ඒ යෝජනාව ගෙනාවේ කුමන පදනමකින්ද කියලා අපි පොඩ්ඩක් හොයන්න ඕනෑ. එක්කෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාට පාසල්වලට යන්න බැරිකම නිසාද, නැත්නම් සජිත් ප්‍රේමදාස මැතිතුමා පාසල්වලට ගිහිල්ලා බස් රථ දෙන එක, නැත්නම් smart classrooms දෙන එක නතර කරන්න මේ වෙලාවේ ගන්න තිබෙන එකම පියවර ඒක වෙච්ච නිසාද එහෙම කිව්වේ කියලා සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගේ හෘදය සාක්ෂියෙන් විමසන්න. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා පාසල්වලට දේශපාලනඥයන්ගේ නම් දාන්න එපා කියන යෝජනාව සද්භාවයෙන් ගෙනාවා නම් ඒක හොඳයි. මොකද, අපේ ආණ්ඩුවකදි අපේ දේශපාලනයේ යෙදෙන සහ යෙදුණු පුද්ගලයන්ගේ නම්වලින් පාසල් නම් කිරීමේ බලාපොරොත්තුවක් අපට නැහැ. ඒක අනාගතයේදී සිද්ධ වෙන්නේත් නැහැ කියලා අපි කියනවා.

මේ මොහොතේදී මේ රටට කථා කරන සමහර ඇමතිවරු මේ මොහොතේ රටේ තිබෙන ප්‍රශ්න සියල්ලම ඇති වෙන්න අත උස්සපු අය. මේ රටේ බෙහෙත් හිඟයක් ඇති වෙලා, රෝහල්වල බෙහෙත් නැතිව මිනිස්සු මැරෙනකොට, ඒ බෙහෙත් හොරකම කළේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා අපි ආණ්ඩුවට කෑ ගහලා කිව්වා. කෙහෙළිය රඹුක්වැල්ලට විරුද්ධව අපි විශ්වාස භංග යෝජනාව ගෙනාවාම සියලුදෙනා ලජ්ජා නැතිව ඒකට එරෙහිව අත ඉස්සුවා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරලා තිබෙන හැම හොරකමක්ම සාධාරණීකරණය කරන්න මේ ආණ්ඩුවේ ඉන්න හැම කෙනෙක්ම අත ඉස්සුවා.

[ගරු හේෂා විතානගේ මහතා]

ඒ විතරක් නොවෙයි, සීනි වංචාව ඇතුළු මේ සියලු දේවල් සමාජගත වන එක නතර කරන්න කටයුතු කළා. මේ ආසන්න කාලයේ සමාජ ජාලා කප්පාදුව කළ වෙලාවේ ආණ්ඩුවේ සියලුදෙනා ඒකට සහයෝගය දීලා දැන් සද්ද නැතිව ඉන්නවා. මේ මොහොතේ මහ බැංකුව ප්‍රකාශ කරන සමහර සංඛ්‍යා දත්ත, ලේඛන බැලුවාම සහ මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රකාශවලින් හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ කාලයේ පිස්සු නැටුවා කියන එක පැහැදිලි වෙනවා. ඒ වාගේම කබ්රාල් මහත්මයා මහ බැංකු අධිපති විධියට යනකොට කැබිනට් ඇමතිවරයෙකුගේ වරප්‍රසාද දීලා එතැනට යවන්න මේ ඉන්න මන්ත්‍රීතුමන්ලා ඔක්කොම සහයෝගය දුන්නා. එහෙම නම්, මේ මොහොතේ මේ රට හදන්න මේ දමන හැම සෙල්ලමක්ම, හැම ගේමක්ම -ආපහු අලුත් ජවයකින් නැඟිටින්න, වෙනත් ආකාරයකින් එන්න, චන්ද්‍රිකා නෝනා ගෙනැල්ලා සන්ධානයක් හදලා මේකට පූට්ටු කරන්න, එහෙම නැත්නම් ජනාධිපතිකම අහෝසි කරලා අගමැති වෙලා පාර්ලිමේන්තුවට ආපහු ඇවිල්ලා කාලය දීර්ඝ කරගන්න- ගැන මේ රටේ ජනතාව හොඳ අවධානයකින් ඉන්නේ. ඒ මොන ගේම ගැහුවත් තව මාස 4යි, 5යි තිබෙන්නේ. ඊට පස්සේ, මේ රටේ ජනතාවගෙන් අධික ලෙස බදු මුදල් අයකර ගනිමින්, ඔවුන්ට ජීවත් වීමේ අයිතිය අහිමි කරන්න කටයුතු කිරීමේ ගනුදෙනුව බේරා ගන්න අවශ්‍ය ක්‍රියා මාර්ග සජබයේ අපි ගන්නවා. මේ රටේ ජනතාව තවත් රවට්ටන්න පෙරගමන්කරුවෝ ඉස්සරහට දාලා, මේ වෙලාවේ රටේ තිබෙන සැබෑ තත්ත්වය වසන් කිරීමට උත්සාහ කරන්න එපා කියමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.15]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

எனக்கு ஒதுக்கப்பட்ட 8 நிமிடம் 6 ஆகக் குறைக்கப் பட்டிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! முதலிலே, என்னுடைய தாயார் அமிர்தநாதன் செபமாலை அவர்களின் மரணச் செய்தி அறிந்து, என்னுடைய துயரத்திலே கலந்துகொண்டு, தொலைபேசி ஊடாகவும் நேரடியாகவும் தங்களுடைய அனுதாபத்தைத் தெரிவித்த அனைத்துள்ளங் களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன். குறிப்பாக, கௌரவ சபாநாயகர் அவர்கள் நேரில் வந்து தனது அனுதாபத்தைத் தெரிவித்திருந்தார். அதற்காக அவருக்கு முதலிலே நான் நன்றி சொல்லக் கடமைப்பட்டுள்ளேன். அதுபோல், மாண்புமிகு ஜனாதிபதி அவர்களும் தனது ஆழ்ந்த இரங்கல் செய்தியை தொலைநகல் ஊடாக அனுப்பியிருந்தார். அதேபோல, கௌரவ பிரதமர் அவர்களும் கௌரவ எதிர்க் கட்சித் தலைவர் அவர்களும் தொலைபேசி ஊடாகத் தங்களது அனுதாபத்தைத் தெரிவித்தார்கள். அடுத்து, நேரடியாகக் கலந்துகொண்ட வடக்கு, கிழக்கு மாகாணங்களின் ஆளுநர் களான சாள்ஸ் அம்மையாருக்கும் செந்தில் தொண்டமானுக்கும் பாராளுமன்ற உறுப்பினர்களான கௌரவ ஹரீஸ், கௌரவ சாள்ஸ் நிர்மலநாதன், கௌரவ சிறீதரன், கௌரவ காதர் மஸ்தான், கௌரவ சுமந்திரன் ஆகியோருக்கும் மற்றும் பொது மக்களுக்கும் எனது கட்சித் தொண்டர்கள் அனைவருக்கும் எனது நன்றியை இந்த உயர் சபையினூடாகத் தெரிவித்துக் கொள்ள விழைகிறேன்.

நேற்றைய தினம் மன்னார் மாவட்டத்தின் நொச்சிக்குளம் பகுதியில் AK-47 என்ற ஆயுதத்தால் ஒருவரைப் படுகொலை செய்வதற்கான முயற்சி மேற்கொள்ளப்பட்டது. அங்கே இவ் வாறான சம்பவங்கள் தொடர்ந்து நடந்துகொண்டே இருக்கின்றது. முன்னர் உயிலங்குளத்தைச் சேர்ந்த இரண்டு பேர் வெட்டிக் கொல்லப்பட்டார்கள். அதன்பிறகு, நொச்சிக் குளத்திலே van ஒன்றினால் மோதப்பட்டு ஒருவர் படுகொலை செய்யப்பட்டார். அதன்பின்பு, pistolஇனால் சுடப்பட்டு ஒருவர் படுகொலை செய்யப்பட்டார். இப்பொழுது, AK-47பாவிக்கப் பட்டு இருக்கின்றது. அடுத்து என்ன weapons பாவிக்கப் படுமோ தெரியவில்லை. அங்கே, ஒரு police post இருக்கின்றது. அந்த police post மீதான எனது நம்பிக்கை யின்மையை இங்கு நான் குறிப்பிட விரும்புகிறேன். இந்த விடயத்தைக் கவனத்தில் எடுத்து ஆராயுமாறு பொதுமக்கள் பாதுகாப்பு அமைச்சரிடம் நான் கேட்டிருந்தேன். எங்களுடைய சொந்தங்கள் சாதாரண போராளிகளுக்கு அஞ்சலி செலுத்தும் வகையில் சில படங்களைச் சமூக வலைத்தளங்களில் பதிவேற்றியமைக்காகப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு இன்னும் விடுதலை செய்யப்படாமல் இருக்கின்றார்கள். ஆனால், நொச்சிக்குளத்தில் மக்களைப் படுகொலை செய்வதற்காக pistol, AK-47 போன்ற ஆயுதங்கள் பாவிக்கப்பட்டிருக்கின்றன. பொலிசார் இந்தச் சம்பவங்களில் ஈடுபட்டவர்களைக் கண்டுபிடிப்பதற்கான சாத்தியக்கூறுகளை என்னால் காண முடியவில்லை. Pistolஇனால் சுட்டுக் கொல்லப்பட்ட நபர் புதைக்கப்பட்டு இன்றைக்கு பல நாட்களாகி விட்டது. சுட்டவரைக் கைதுசெய்ய முடியாத பொலிசார் அங்கிருப்பது ஏன்? என்று நான் கேட்க விரும்புகிறேன்.

அதுமட்டுமல்ல, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! தலைமன்னார் கிராமத்திலே இயான்சி பர்னான்டோ என்ற 10 வயதுச் சிறுமியைப் பாலியல் வன்புணர்வு செய்து, கழுத்தை நெரித்துக் கொலை செய்திருக் கிறார்கள். இந்த நாட்டிலே என்ன நடக்கிறது? இன்று ஏற்பட்டிருக்கின்ற பொருளாதார வீழ்ச்சி நிலையிலிருந்து நாட்டை மீட்டெடுக்க வேண்டும் என்று சொல்லுகின்ற அதேவேளை, வடக்கு, கிழக்கிலே இப்படியான சம்பவங்கள் ஊக்குவிக்கப்படுகின்றன. எங்களுடைய இளைஞர், யுவதி களைப் போதை வஸ்துகளுக்கு அடிமையாக்கி, அந்த இளைஞர் சமுதாயத்தையே ஒழிக்கின்ற வகையிலான செயற்பாடுகளே இங்கு இடம்பெற்றுக் கொண்டிருக்கின்றது.

இன்றைய தினம் யாழ்ப்பாணத்தில் இந்தியத் தூதரகத்தின் முன்னால் எங்களுடைய மீனவர்கள் ஒரு போராட்டத்தைச் செய்திருக்கின்றார்கள். அவர்களுடைய அந்தப் போராட்டம் நியாயமானது. அதாவது, இந்திய 'ரோலர்'கள் எமது கடற் பரப்பினுள் அத்துமீறி வந்து, எமது மீனவர்களுடைய வாழ்வா தாரத்தை மிகமோசமாகப் பாதிக்கும் வகையில் செயற்படு வதற்கு எதிர்ப்புத் தெரிவித்தே அவர்கள் அந்தப் போராட் டத்தை மேற்கொண்டிருக்கின்றார்களே ஒழிய, அவர்கள் இந்தியாவுக்கு எதிரான சக்தியாக இருக்க மாட்டார்கள் என்பதை நான் இங்கே குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, எங்களுடைய மீனவர்கள் தொழில் செய்கின்ற கடற் பரப்பிற்குள் இந்திய 'ரோலர்'கள் நுழைவதை இந்தியா உடனடியாக நிறுத்தவேண்டும். அவர்களுக்கு ஆழ்கடலில் தொழில் செய்வதற்கான வாய்ப்புகளை உருவாக்கிக் கொடுக்க வேண்டும் என்பது என்னுடைய கோரிக்கையாக இருக்

கின்றது. அப்படியாக அவர்கள் தமது தொழிலை மேற் கொள்கின்றபோது, எங்களுடைய தேசத்தின் எல்லைகளுக்குள் வந்து தொழில் செய்கின்ற சந்தர்ப்பம் இருக்காது என்பது எங்களுடைய கருத்து.

நிதி சம்பந்தமான சட்டமூலங்கள்மீது விவாதம் நடந்து கொண்டிருக்கின்ற இந்த வேளையில் நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். இன்றைக்குப் பரவலாக வரியை ஏற்றியிருக்கின்ற நிலையில், வருமான வரி அதிகரிப்பும் மக்களைத் தாக்கியிருக்கின்றது. அந்த வரியை அறவிடுவதற் கான சரியான வழிமுறை பற்றிச் சிந்திக்க வேண்டும். ஏனெனில், இந்த வரிச்சுமை சாதாரண மக்களுடைய தலைகளில் சுமத்தப்பட்டிருக்கின்ற நிலையில், அதனைச் செலுத்துபவர்கள் கொஞ்சப் பேராக இருக்கின்ற அதேவேளை, பலர் ஏமாற்றி அதனைச் செலுத்துவதிலிருந்து தப்பிக்கின் றார்கள். அந்த வகையில், இந்த வரியினூடாக ஊழலும் இலஞ்சமும் மேலோங்கியிருக்கின்றதே ஒழிய, நாட்டில் ஏற்பட்ட பொருளாதார வீழ்ச்சியினால், சாதாரண மக்களுக்கு ஏற்பட்ட உணவுப் பிரச்சினை மற்றும் வாழ்வாதாரப் பிரச்சினை தீர்க்கப்படவோ அதற்கு நிவாரணம் வழங்கப் படவோ இல்லை என்பது என்னுடைய கருத்து. ஆகவே, அரசாங்கம் இந்த வரியை உயர்த்துகின்ற நிலை ஏற்படுகின்றபோது, அதை எப்படி அறவிடுவது என்பதைத் திட்டமிட வேண்டும்; வரி ஏய்ப்புச் செய்பவர்களுக்கு என்ன தண்டனை என்பதைச் சொல்ல வேண்டும். இந்த விடயங்களை மிகச் சரியாக நடைமுறைப்படுத்துவதன்மூலம் இந்த நாட்டின் பொருளாதாரத்தை வளப்படுத்த முடியும் என்பதை அரசாங் கத்திற்கு ஓர் ஆலோசனையாகக் கூறி, வாய்ப்பளித்தமைக்கு நன்றி தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එච්.එම්.එම්. හරීස් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 11ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.23]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு முன்னர் பேசிய எங்களுடைய பாராளுமன்ற உறுப்பினர் கௌரவ அமிர்தநாதன் அடைக்கலநாதன் அவர்கள் தனது தாயாருடைய மறைவையிட்டுப் பலரும் அனுதாபம் தெரிவித் தமைக்காக நன்றி கூறியிருந்தார். அந்த வகையில், அவருடைய தாயாரின் இறப்புக்கு நானும் எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவிக்கின்றேன்.

இன்று இந்த நாட்டில் எல்லோரும் தேசத்தின் வளர்ச்சிக் காகப் பாடுபட வேண்டிய ஒரு சூழ்நிலை இருக்கின்றது. இந்தத் தேசத்தின் விடுதலைக்காக ஆங்கிலேயர்களுடைய காலத்தில் அவர்களுக்கு எதிராகப் போராடியவர்கள் இந்த நாட்டில் துரோகிகளாக அறிவிக்கப்பட்டிருந்தார்கள். குறிப்பாக, இந்த தேசத்தின் சுதந்திரத்திற்காக, விடுதலைக்காகப் பல்லாயிரம் பேர் உயிர்த் தியாகம் செய்தார்கள்; பல்லாயிரம் பேர் சிறையில் வாடியிருந்தார்கள்; பலர் துரோகிகளாகப் பிரகடனப்படுத்தப் பட்டார்கள். எமது இலங்கை தேசத்தில் நான் பிரதிநிதித்துவப் படுத்துகின்ற கல்முனை மண்ணைச் சேர்ந்த ஈஸா அனீஸ் லெப்பை மற்றும் காரியப்பர் ஆகிய 2 முக்கிய சகோதரர்கள் உட்பட மேலும் 5 முஸ்லிம் சகோதரர்கள் அன்றைய ஆங்கிலேய ஆட்சியாளர்களால் துரோகிகளாகப் பிரகடனப் படுத்தப்பட்டிருந்தார்கள். அண்மையில் முன்னாள் சனாதிபதி கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் சிலரை மட்டும் அந்தத் துரோகிகள் பட்டியலிலிருந்து விடுவித்துத் தேசப் பற்றாளர்களாக Gazette பண்ணியிருந்தார். அதில், நான் மேற்கூறிய 7 முஸ்லிம்களும் உள்ளடக்கப்படவில்லை. எனவே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அவர்களும் இந்த அரசாங்கமும் இதனைக் கவனத்திலெடுத்து, அவர்களையும் துரோகிகள் பட்டியலிலிருந்து மீட்டு, தேசப்பற்றாளர்களாக Gazette பண்ணவேண்டும் என்று இந்த இடத்தில் வேண்டுகோள் விடுக்கின்றேன்.

'கொவிட்' தொற்றுக் காலத்தில் எமது மார்க்கக் கடமைப்படி அடக்கம் செய்யப்படவேண்டிய முஸ்லிம் சகோதரர்களுடைய 'ஜனாஸா'கள் எரிக்கப்பட்டன. உலக நாடுகளில் எல்லாம் 'கொவிட்' தொற்றினால் இறந்த 'ஜனாஸா' கள் அடக்கம் செய்யப்பட்டுக்கொண்டு இருந்தபொழுது, இலங்கையில் மட்டும் அவற்றை எரிப்பதற்குத் தீர்மானம் எடுக்கக் காரணமாக இருந்த சுகாதார அமைச்சின் அதிகாரிகளையும், இதற்குப் பின்னணியில் இருந்த அரச உயர் மட்டத்திலுள்ளவர்களையும் குற்றப் புலனாய்வுப் பிரிவினர்மூலம் விசாரணைக்குட்படுத்தி, இவ்வாறான பிழையானதொரு தீர்மானம் எடுத்ததற்காக அவர்களைத் தண்டிக்க வேண்டும். அதேநேரம், இதனால் பாதிக்கப்பட்ட குடும்பங்களுக்கு நஷ்டஈடு வழங்கவேண்டு மென்றும் நான் இந்தச் சபையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, இன்று நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கல்முனைத் தேர்தல் தொகுதியில் சில சம்பவங்கள் நடைபெறு கின்றன. குறிப்பாக, பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் அரச சொத்துக்களைப் பாதுகாக்கவேண்டிய கடமை எங்களுக்கு இருக்கின்றது. அந்த அடிப்படையில் கல்முனை மாநகரத்தின் இதயப் பகுதியில் 200 கோடி ரூபாய்க்கு மேற்பட்ட பெறுமதியுடைய 'பிஸ்கால் காணி' என்று சொல்லப்படுகின்ற அரச காணியை ஒருசில நபர்கள் அபகரித்த பொழுது, அதற்கு எதிராக அன்று பிரதேச சபை வழக்குத் தாக்கல் செய்திருந்தது. நான் மாநகர மேயராக இருந்தபொழுது, அன்று நாங்கள் முழுமையான சட்ட நடவடிக்கைகளில் ஈடுபட்டு, குறித்த காணியானது அரச காணி என்பதற்கான தீர்ப்பினைப் பெற்றிருந்தோம். பின்பு அந்த நபர்கள் குறித்த வழக்கை மேன்முறையீடு செய்திருந்தார்கள். அப்பொழுது நாங்கள் எங்களுடைய மாநகர சபைச் சட்டத்தரணிகளை ஈடுபடுத்தி மேன்முறையீட்டு வழக்கிலும் வெற்றி பெற்றிருந்தோம்.

நான்கு வருடங்களுக்கு முன்பு குறித்த மாநகர சபைக் காணியினை அபகரிப்பதற்காக முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கருணா உட்படப் பலர் பல அச்சுறுத்தல்களை விடுத்தும்கூட, அப்போது இருந்த மாநகர சபை முதல்வர், சிரேஷ்ட சட்டத்தரணி ஏ.எம். றகீப் மற்றும் நான் அந்தக் காணியை அரச காணியாக மாநகர சபை நிர்வாகத்திற்குள் கொண்டுவந்தோம். துரதிருஷ்டவசமாக அப்போதிருந்த கல்முனைப் பிரதேச செயலாளர் அந்தக் காணியைக் கல்முனை மாநகர சபைக்குக் கையளிப்பதற்குத் தரமுடியாது என்று எழுத்துமூலம் பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்திருந்தார். ஆனால், கடந்த நான்கு மாதங்களுக்கு முன்பு நான் அதில் தலையிட்டு, இப்போது இருக்கின்ற கல்முனைப்

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

பிரதேச செயலாளர் ஜே. லியாகத் அலி, கல்முனை மாநகர சபை ஆணையாளர் ஏ.எல்.எம். அஸ்மி ஆகியோருடன் இணைந்து அதிலிருந்த சட்ட சிக்கல்களை எல்லாம் நீக்குவதற்கு எடுத்த நடவடிக்கை காரணமாக அந்தக் காணி திரும்பவும் மாநகர சபையிடம் ஒப்படைக்கப்பட்டது. இன்று அதனை அவர்கள் அபிவிருத்தி செய்து, மக்கள் பாவனைக் காகத் திறந்து விட்டிருக்கிறார்கள்.

இதில் வேடிக்கை என்னவென்றால், நாங்கள் குறித்த காணியை மீட்கின்ற போராட்டத்தில் ஈடுபட்டபொழுது, குறித்த காணியை அபகரித்த சில முஸ்லிம் வர்த்தகர்கள் பல கோடி ரூபாயுடன் எங்களுடன் சமரசம் செய்வதற்கு முன்வந்தார்கள். அதேபோன்று கனடாவிலிருந்து வந்த இன்னுமொரு வர்த்தகரும் பல கோடி ரூபாயைக் கொடுத்து குறித்த காணியைக் கைப்பற்றுவதற்கு முற்பட்டபொழுதுகூட, மக்களினால் தெரிவுசெய்யப்பட்ட பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் நாங்கள் அவர்களுடைய பணத்துக்குச் சோரம் போகாமல், நேர்மையாக அந்த அரச காணியை மக்களுடைய இடமாக மாற்றுவதில் முழுமையாக ஈடுபட்டதை எல்லாம் வல்ல இறைவன் பார்த்துக்கொண்டு இருந்தான். நாங்கள் நேர்மையாகச் செயற்பட்டோம் என்ற ஆத்ம திருப்தி எங்களிடம் இருக்கின்றது. நாங்கள் இவ்வளவு நேர்மையாகவும் தியாகத்துடனும் செய்த இந்த விடயத்தை, இன்று சில சின்னஞ்சிறு அரைவேக்காட்டு அரசியல்வாதிகள் தங்களுடைய அரசியல் இலாபத்திற்காக, 20 வருட காலமாக இல்லாத தீர்வைத் தாங்கள் பெற்றுக் கொடுத்தாகக் கூறி, அம்பாறை மாவட்டத்தின் பிரபல ஊடகவியலாளர் நூருல் ஹுதா உமர் குறிப்பிட்டதுபோல, மோசமான ஒரு நவீன 'சேவைத் திருட்டு' அரசியல் கலாசாரத்தை அரங்கேற்றுவதை அந்த மக்கள் ஏற்றுக்கொள்ளமாட்டார்கள். எனவேதான் எங்களுக்கிருக் கின்ற இந்தப் பாராளுமன்ற பதவிக் காலத்தில் எங்களுக்குள்ள அதிகாரத்தை மிக நேர்மையாகப் பயன்படுத்திக்கொள்கின்ற நான் இறைவன் சாட்சியாக இங்கு சொல்லிக்கொள்ள விரும்புவது, பண ஆசைக்காக அரச காணிகளை வளைத்துப் போடுவது, பினாமியாக உறவினரின் பெயரில் அரச காணிகளை வைத்துக்கொள்வது போன்ற செயல்கள்மூலம் ஓர் inch நிலத்தைக்கூட எங்களுடைய இந்த அரசியல் காலத்தில் நாங்கள் பெற்றிருக்கவில்லை. இன்று ஊழலில் பெயர்போன, மக்களுடைய நிலத்தை அபகரித்த சில அரைவேக்காட்டு அரசியல்வாதிகள் மனப்பால் குடித்துக்கொண்டு பேசுகின்ற விடயத்தை இந்தச் சபையில் நான் கண்டித்துக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, இன்று மருதமுனைப் பிரதேசத்தில் உள்ள அழகான கடற்கரையைக் கடல் அரித்துக் கொண்டிருக்கின்றது. அதேபோல்தான் கல்முனையிலும் சாய்ந்தமருதுவிலும் நடை பெறுகின்றது. இதனைத் தடுப்பது சம்பந்தமாகக் கடந்த சில மாதங்களுக்கு முன்பு ஜனாதிபதி செயலகத்தில் ஜனாதிபதியின் செயலாளர் சமன் ஏக்கநாயக்க அவர்கள் தலைமையில் நடை பெற்ற கூட்டத்தில் அதற்கான நிதியொதுக்கீடுகள் செய்யப் பட்டும் அந்த வேலைகள் மந்தகதியிலேயே நடைபெறு கின்றன. எனவே அங்கிருக்கின்ற கடற்கரையைப் பாதுகாப்பது மட்டுமல்லாமல், ஆயிரக்கணக்கான மீனவ சமூகத்தினுடைய தொழில் பாதுகாக்கப்படுவதற்காக, கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமைத்துவத் திணைக்களம் அவசரமாக அந்தக் கடலரிப்புத் தடுப்புச் சுவர்களை உருவாக்க வேண்டுமென்று இந்தச் சபையில் நான் வேண்டுகோள் விடுக்க விரும்புகின்றேன்.

அதேநேரம், எங்களுடைய மாவட்டத்தில் வெள்ளத்தினால் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கான நஷ்டஈடு கொடுக்கப் படாதது மட்டுமல்லாமல், அவர்கள் அடுத்த போக விவசாயத் துக்காகத் தயாராகிக்கொண்டிருக்கின்ற இந்த நிலைமையில், அங்கு சேதமடைந்த கால்வாய்கள், மதகுகள், அணைக்கட்டுகள் என்பவற்றை -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஜகத் சமரவிக்ரம அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. JAGATH SAMARAWICKRAMA left the Chair, and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, குறிப்பாக எங்களு டைய நீர்ப்பாசன அமைச்சர் மாண்புமிகு பவித்ராதேவி வன்னிஆரச்சி அவர்கள் இங்கு இருக்கின்ற வேளையில் நான் இதனைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, எங்களு டைய அம்பாறை மாவட்டத்தில் அண்மையில் ஏற்பட்ட வெள்ளத் தினால் நீர்ப்பாசனக் கால்வாய்கள், மதகுகள், அணைக்கட்டுகள் என்பன சேதமடைந்திருப்பதனால் வரு கின்ற போகத்தில் விவசாயம் செய்ய முடியாத நிலைமை இருக்கின்றது. சேதமடைந்த நீர்ப்பாசனக் கட்டமைப்புகளைப் புனரமைப்புச் செய்வதற்காக கிட்டத்தட்ட 4,000 மில்லியன் ரூபாய் தேவையென்று மதிப்பிடப்பட்டிருப்பதாகக் கடந்த DCC கூட்டத்தில் நீர்ப்பாசனப் பணிப்பாளர் சொல்லியிருக்கின்றார். ஆகவே, மாண்புமிகு அமைச்சர் அவர்களே, இந்த நாட்டின் நெல் உற்பத்தியில் பெரும் பங்கு வகிக்கின்ற அந்த விவசாயிகளைப் பாதுகாக்கும் வகையில் அங்கு சேதமடைந்த நீர்ப்பாசனக் கட்டமைப்புகளைக் குறுகிய காலத்துக்குள் திருத்தி அமைப்பதற்கு நடவடிக்கையெடுக்குமாறு அந்த மாவட்டத்தின் பிரதிநிதி என்ற ரீதியில் கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දිලුම් අමුණුගම රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.34]

**ගරු දිලුම් අමුණුගම මහතා (ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலும் அமுனுகம - முதலீட்டு மேம்பாடு இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilum Amunugama - State Minister of Investment Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1977 කාලයේ මේ පාර්ලිමේන්තුවට පැමිණි ප්‍රවීණ දේශපාලනඥයකු වන ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා අභාවප්‍රාප්ත වෙලා තිබෙනවා. මගේ කථාව ආරම්භ කරන්න පෙර එතුමාගේ අභාවය පිළිබඳව ජනාධිපතිතුමා වෙනුවෙනුත්, අග්‍රාමාත්‍යතුමා වෙනුවෙනුත්, අපේ

ආණ්ඩු පක්ෂය වෙනුවෙනුත්, මේ සභාව වෙනුවෙනුත් ශෝකය ප්‍රකාශ කරනවා. ඒ වාගේම, අපේ ගරු අධෙක්කලනාදන් මන්ත්‍රීතුමාගේ මෑණියන්ගේ අභාවය වෙනුවෙනුත් මේ අවස්ථාවේ මම ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙර මතු කරපු ප්‍රශ්න කිහිපයකට මම මුලින්ම පිළිතුරු දෙන්නට අවශ්‍යයි. ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා මතු කරපු 29වන වගන්තිය යටතේ සහ 20 වන වගන්තිය යටතේ ආකාර දෙකකට සුරැකුම් අයිතිවාසිකම් පරිපූර්ණත්වයට පත් කරන්න පුළුවන් කියන ප්‍රශ්නයට තිබෙන පිළිතුර ටිකක් දීර්ඝයි. එය ඉදිරිපත් කරන්න කාලය ගතවන නිසා මම ඒ පිළිතුර **සභාගත*** කරනවා.

අද මේ විවාදය පුරාවටම අපි දැක්කේ පසුගිය කාලයේ ජනතාවට ඇති වෙච්ච තත්ත්වය සහ වර්තමානයේ ඇතිවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු වේදනාවෙන් ශබ්ද නඟා කථා කළ විධිය. අපි සියලුදෙනා පැහැදිලිව වටහා ගත යුතුයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කෑ ගහන්නේ රෝගයේ වේදනාව පිළිබඳව, රෝග ලක්ෂණ පිළිබඳව බව. පසුගිය කාලයේ අපේ රටේ ආර්ථිකයේ ඇති වෙච්ච රෝග ලක්ෂණ පිළිබඳව මේ සභාවේ අපි ඕනෑ තරම් කථා කරලා තිබෙනවා. අද කථා කරන්නේ ඔළුව රිදෙනවා, කකුල රිදෙනවා, කොන්ද රිදෙනවා කියලා මිසක්, ඒවාට කරන ප්‍රතිකර්මයක් පිළිබඳව කිසි කෙනෙක් අදහස් දක්වන්නේ නැහැ. විමල් වීරවංශ මැතිතුමාත්, විපක්ෂයේ කණ්ඩායම් ගණනාවකුත් කියනවා අපි දැක්කා, අපේ ආණ්ඩුව රට බංකොලොත් කෙරුවා කියලා. මේ රට බංකොලොත් කිරීමට කවුරු කවුරු හරි වග කියන්න ඕනෑය කියලා කියනවා. ජනතාවට ජීවත් වෙන්න අමාරුයි කියලා කියනවා. හැබැයි, ඒ ප්‍රශ්න විසඳන්න කරන්න ඕනෑ මොකක්ද කියලා කිසි කෙනෙකුගෙන් සඳහන් වන්නේ නැහැ.

අපි පැහැදිලිව මතක තියා ගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. රට බංකොලොත් වුණේ කොහොමද කියලා අපි කෙටියෙන් කල්පනා කරලා බැලුවොත්, සමහර මන්ත්‍රීවරු කියපු ආකාරයට දේශපාලනඥයන් ගත්ත සමහර ප්‍රතිපත්ති, තීන්දු තීරණ ඒකට බලපෑවා. බණ්ඩාරනායක මැතිතුමාගේ කාලයේ ඉඳන් අපි දේශීය ද්‍රව්‍යවලින් පමණක් යැපෙන්න තීරණය කළා; සංවෘත ආර්ථිකයකින් පමණක් යැපෙන්න තීරණය කළා. ඒ ආර්ථික ක්‍රමය තුළ කෘෂි කර්මාන්තය දියුණු වුණා. රට නැගෙමින් පැවතුණා. ඒ තත්ත්වය තව කාලයක් පවත්වාගෙන ගියා නම් ඉන්දියාව වාගේ යම් මට්ටමකට ස්වයංපෝෂිත වුණාට පස්සේ අපටත් ආර්ථිකය විවෘත කරන්න හැකියාව තිබුණා. හැබැයි, ඒ කාලයේ හිටපු විපක්ෂය සියලු දේ ලබාදෙනවා කියලා ජනතාවට දීපු පොරොන්දු අනුව ඒ අය මැතිවරණය ජයග්‍රහණය කරලා, ආර්ථිකය විවෘත කිරීමේ ප්‍රතිඵලයක් හැටියට අපේ ආනයන සඳහා යන වියදම වැඩි වෙලා, අපනයන ආදායම අඩුවීමේ ප්‍රතිඵලයක් හැටියට අය වැය පරතරයක් ගොඩ නැඟුණා. අවුරුදු 76ක නිදහසක් ගැන කථා කෙරුවත්, එයින් අවුරුදු 30ක්ම යුද්ධ කරන්න වෙච්ච රටක්, අපි. අවුරුදු 30ක් තිස්සේ නොයෙකුත් කරුණු කාරණා නිසා, ඒ යුද්ධයත් හරියාකාරව අවසාන කරන්න බැරි වෙච්ච නිසා ගොඩ නැඟිච්ච අය වැය පරතරය පියවීම සඳහා තිබුණු එකම විසඳුම තමයි තවත් ණය ගැනීම. අය වැය පරතරය පියවීම සඳහා දිගින් දිගටම ණය ගැනීමට සිදු වුණා. කොවිඩ්-19 වසංගතයෙන් ලෝකයම වෙළා ගත්තාට පසු, ඒ සියලු ණය දීපු රටවල් සහ ආයතන තම තමන්ගේ ප්‍රශ්න බලා ගත්තා විනා, වෙනත් රටවලට උපකාර කිරීමට ඉදිරිපත් වුණේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ විශාල බලයකින් පත් වෙච්ච ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ භාණ්ඩාගාරය හිස්වෙලා, එහි ප්‍රතිඵලයක් හැටියට එතුමා ධුරයෙන් ඉවත් වුණාට පස්සේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ ආණ්ඩුව බාර ගත්තා.

හැබැයි, මේ රෝග ලක්ෂණ සහ රෝගයේ වේදනාව ගැන කියලා කෑගැහුවාට, රනිල් වික්‍රමසිංහ මැතිතුමා භාර ගන්නකොට රෝගියා හිටියේ ICU එකේ. ඔබතුමන්ලා, අපි ගෙවල් අතහැර දාලා ගිහින් හිටියේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ඔබතුමා ගියේත් නැහැ, මම ගියේත් නැහැ. මම දන්නවා ඔබතුමා ගියේ නැහැ කියලා. හැබැයි, අපේ මන්ත්‍රීවරු 80දෙනෙකුගේ ගෙවල් පිච්චුණා. මහ පාරේ පෝලිම් තිබුණා; විදුලිය තිබුණේ නැහැ; ලෙඩා හිටියේ ICU එකේ. හැබැයි, ICU එකේ හිටපු ලෙඩාගේ වේදනාව ගැන කෑ ගැහුවා මිසක්, ලෙඩේට ප්‍රතිකර්ම කරන විධියක් ගැන කවුරුවත් කථා කළේ නැහැ. ඒ ICU එකේ හිටපු ලෙඩා බලන්න Galle Face එකට ගිහිල්ලා තව පොඩ්ඩෙන් එක්කෙනෙක් ගුටිකාලා එයාටත් ICU එකට යන්න වෙනවා. ලෙඩා බලන්න ගියා මිසක් ලෙඩේට ප්‍රතිකර්ම කරන විධියක් ගැන කවුරුවත් කථා කළේ නැහැ. එවෙලේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආරාධනා කළා, දොස්තර මහත්වරු ඔක්කොටම. සජිත් ප්‍රේමදාස මැතිතුමා බෙහෙතුත් කිව්වා නේ, ඒ දවස්වල. කොවිඩ් වසංගතය දවස්වල එතුමා දොස්තර මහත්මයෙක් වාගේ බෙහෙතුත් කිව්වා නේ. ජනාධිපතිතුමා ඒ දොස්තර මහත්වරු සියලුදෙනාටම ආරාධනා කෙරුවත්, ලෙඩාට ප්‍රතිකාර කරන්න කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. ඉදිරිපත් වුණේ එක දොස්තර මහත්මයෙක් විතරයි. රනිල් වික්‍රමසිංහ දොස්තර මහත්මයා විතරයි ICU එකේ හිටපු ලෙඩාට ප්‍රතිකර්ම කරන්න ඉදිරිපත් වුණේ. හැබැයි, එතුමා ප්‍රතිකර්ම කරන්න භාර අරගෙන ඒ කටයුතු කරනකොට, ලෙඩේ හොඳ කරන්න නම් තිත්ත බෙහෙත් දෙන්න වෙනවා. ලෙඩා කැමැති බෙහෙත් දීලා ලෙඩේ හොඳ කරන්න බැහැ. ඒ නිසා ලෙඩා හොඳ කරන්න තිත්ත බෙහෙත් දෙනකොට ඒ බෙහෙත් තිත්තයි කියමින්, රෝග ලක්ෂණ ගැන කියමින්, රෝගියාගේ වේදනාව ගැන කියමින් කෑගැහුවාට වැඩක් වෙන්නේ නැහැ. අපි කළ යුත්තේ ඒ ප්‍රතිකර්ම කරන කෙනාට උදවු උපකාර කරන එකයි.

අද අපි සියලුදෙනා පිළිගන්න ඕනෑ, මොන තත්ත්වය ඇති වුණත් එවැනි ආර්ථික තත්ත්වයක් නැවත නඟා සිටුවන්න, එහෙම නැත්නම් ඉහළ යමින් පවතින ආර්ථික තත්ත්වයක් බවට පත් කරන්න එතුමාට හැකියාව ලැබිලා තිබෙනවා කියලා. අද උද්ධමනය එක ඉලක්කමකට - single digit එකකට - පැමිණ තිබෙනවා. ඔබතුමා දන්නවා, 2023 මුල් කාර්තුවේ උද්ධමනය සියයට 67ක් බව. හැබැයි, අද ඒක එක ඉලක්කමකට පහත බැහැලා තිබෙනවා. අද නැවත ආර්ථිකය වර්ධනය වෙන්න පටන්ගෙන තිබෙනවා. අවුරුදු ගණනාවකට පස්සේ ගම්වල සංවර්ධනය සඳහා මුදල් ලබා දීම ආරම්භ වෙලා ඒ සඳහා යෝජනා සකස් කරමින් තිබෙනවා. බහුකාර්ය නිලධාරින් වැනි තාවකාලික සහ දෛනික පදනමින් හිටපු අයගේ රැකියා ස්ථිර වෙමින් තිබෙනවා. ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩසටහන් ආරම්භ කර තිබෙනවා. 2023 අග භාගයේදී විතරක් ඩොලර් බිලියන 1.8ක ආයෝජනවලට අපට අත්සන් කරන්න පුළුවන් වුණු බව ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය ඇමතිවරයා හැටියට මම දන්නවා. මේ වෙනකොට ආයෝජන පරිසරය හොඳ තත්ත්වයකට පත් වෙලා තිබෙන බව අපි අවංකව කියනවා. අද කවුරු කොහොම කිව්වත්, Port City එකට ආයෝජන පැමිණෙනවා. නෙළුම් කුළුන අද සම්පූර්ණ කර අවසන්, කාමරයක් ගන්න විධියක් නැහැ බද්දටවත්. ඉරිසියාවක් තිබෙන්න පුළුවන් මේ දොස්තර මහත්තයාගේ ප්‍රතිකර්ම ගැන. නමුත්, අද ICU එකේ හිටපු ලෙඩා සාමාන්‍ය වාට්ටුවට දමන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හැකියාව ලැබිලා තිබෙනවා. හැබැයි, සියලුදෙනා මතක තබාගන්න ඕනෑ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දිලුම් අමුණුගම මහතා]

කාරණයක් තිබෙනවා. ඒ තමයි, රෝගියා තවම ඉන්නේ වාට්ටුවේ මිසක් ගෙදර යන තත්ත්වයට පත් වෙලා නැහැ කියන එක.

අපේ සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. අපි දැක්කා, විමල් වීරවංශ මැතිතුමන්ලා එහෙම එදා කටයුතු කළ ආකාරය. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත් එහෙමයි; මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේත් එහෙමයි. මොකක් හෝ ආයෝජනයක් ගෙනෙන්න යනකොට - LNG බලාගාරය ගෙනෙන්න යනකොට - මෙන්න මේක ඉන්දියාවට විකුණන්න යනවා, අරකයි, මේකයි කියලා මහ ලොකුවට කෑගහලා ඒ ව්‍යාපෘති නතර කළා. එහි ප්‍රතිඵලයක් හැටියට අපට පැය 15ක්, 16ක් කළුවරේ ඉන්න සිදු වුණා. අදත් මේ රටට ආයෝජන ගෙන එනකොට ඒ ආයෝජන ගෙනෙන රට මොකක්ද, ඒ රටේ ජනාධිපති කවුද, ඒ රට අපිත් එක්ක යාළුද, නැද්ද වාගේ දේවල් අපට බලන්න බැහැ. වියට්නාමය දියුණු වුණේ කොහොමද කියලා බැලුවොත්, වියට්නාමය දියුණු වුණේ වැඩිපුරම ඇමෙරිකානු ආයෝජන නිසා. හැබැයි, ඇමෙරිකාව ගිහින් වියට්නාමය ආක්‍රමණය කරලා, ඒ මිනිස්සු මරලා, අවුරුදු ගණනක් යුද්ධ කරලා අවසානයේ පරාජයත් වුණා. හැබැයි, ඇමෙරිකානු ආයෝජනවලින් තමයි අද වියට්නාමය දියුණු වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපි අවුරුදු 30ක් සටන් කරපු LTTE එකට සහයෝගය දක්වපු දෙමළ ඩයස්පෝරාවට ආරාධනා කරලා තිබෙන්නේ, ඇවිල්ලා උතුරුකරයේ ආයෝජනය කරන්න කියලා. අපේ අල්ලපු රටට, ඉන්දියාවට අපේ දේවල් විකුණනවාය කිව්වාට අපි කිසි දෙයක් විකුණන්නේ නැහැ. අපේ රටට කිලෝමීටර 23ක් පමණ එහායින් තිබෙන අල්ලපු රට ලෝකයේ දෙවැනි විශාලම ආර්ථිකය තිබෙන රට වෙනකොට, අපේ රට දියුණු කිරීම සඳහා ඊට වඩා දුරින් තිබෙන රටක් එක්ක කටයුතු කරනවාට වැඩිය, ඒ ආර්ථිකයත් එක්ක වැඩ කරන එක තමයි පහසුම වෙන්නේ. "අමුල්" ව්‍යාපෘතියට ගැහුවා. අමුල් ව්‍යාපෘතිය ඉන්දියාවේ ක්‍රියාත්මක වන ඉතාම සාර්ථක ව්‍යාපෘතියක්. අපට බැරි වුණා, ඒක කරන්න. අද බදු ගහනවා කියලා දිගින් දිගටම චෝදනා කරනවා. මේ බදු ගහන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? අපට බංකොලොත් වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇයි? රජයට කරන්න බැරි වැඩ, ලෝකයේ අනෙක් රටවල් නොකරන වැඩ අපේ රටේ රජය විසින් කරන්න ගිහින් තමයි මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අර කිව්වා වාගේ, ගොඩ වෙද්දු ඉන්නවා. දොස්තර මහත්තයා බෙහෙත් කරනකොට වටේ ඉන්නවා ගොඩේ වෙද්දු. ගොඩ වෙද්දු ගිහිල්ලා ඒ ප්‍රතිකර්ම කිරීම නතර කළාම, රෝගියා ආපහු ICU එකට තමයි යවන්න වෙන්නේ කියන කාරණය මම මතක් කරන්නට ඕනෑ. ඒ නිසා අපි කරුණාවෙන් මේ කාරණය කියන්න ඕනෑ. දැන් ගිහිල්ලා හාමුදුරුවරු අවුස්සනවා, මෙන්න රට ඉන්දියාවට දෙන්න යනවා කියලා. අපි එහෙම කරන්නේ නැහැ. ආයෝජකයෙක් ආවාම ඒ ආයෝජනය අපි ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ආයෝජකයා ඉන්දියාවේද, රුසියාවේද, චීනයේද කියන එක නොවෙයි ප්‍රශ්නය. අපේ ආයෝජන නීතිවලට අනුගත වෙනවා නම්, ඒ ආයෝජනය අපි ලබා ගන්න ඕනෑ.

අපි උදාහරණයක් විධියට පාඩු ලබන ආයතන ගනිමු. පෞද්ගලික අංශයත් එක්ක සම්බන්ධ වෙන්න බැරි එවැනි ආයතන තිබෙනවා. ප්‍රධාන වශයෙන් ප්‍රවාහන ක්ෂේත්‍රය, හමුදා ක්ෂේත්‍රය, සෞඛ්‍ය ක්ෂේත්‍රය, විදුලිබල ක්ෂේත්‍රය, පෙට්‍රෝලියම් ක්ෂේත්‍රය ගත්තොත් මේ ක්ෂේත්‍ර සියයට සියයක් පෞද්ගලික අංශයත් එක්ක සම්බන්ධ කරන්න බැහැ.

දැන් අමුල් සමාගම ගැන කථා කරනවා. කවුරුවත් අමනාප වෙන්න ඕනෑ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, NLDB එකේ ගොවිපළවල් ලංකාව පුරා තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ කොයි ගොවිපළද ලාභයක් ඇතිව පවත්වාගෙන යන්නේ? මම නම් අහලා නැහැ, ඒ මොනම ගොවිපළක්වත් ලාභයක් ඇතිව පවත්වාගෙන යනවා කියලා. අපේ පළාතේත් ඒ ගොවිපළවල් තිබෙනවා. ඒ ඉඩම් අපතේ ගිහිල්ලා, ගස්වල පොල් නැහැ, ඒවාට පොහොර දමන්නේ නැ. එළුවෝ 10යි, 12යි ඉන්නේ. එළුවන් ගණනට වඩා සේවකයන් ඉන්නවා. මේ විධියේ ප්‍රයෝජනයක් නැති ආයතන නිසා අද ජනතාව මත බදු පැටවිලා තිබෙනවා.

තවත් උදාහරණයක් ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ගනිමු. මධ්‍යම පළාත නියෝජනය කරන රෝහණ දිසානායක මැතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව ගත්තොත්, කොයි වත්තේ ද තේ ගස් තිබෙන්නේ ගරු රාජ්‍ය ඇමතිතුමනි? එක තේ ගහක් ළඟ ඉඳලා අනෙක් තේ ගහ ළඟට යන්න ත්‍රී-රෝද රථයක් ඕනෑ. එච්චර ඈතකින් තමයි තේ ගස් තිබෙන්නේ. දලු ආදායමක් ලැබෙන්නේ නැහැ. සේවක සංඛ්‍යාව වැඩියි. රජය සතුව තබා ගැනීම වෙනුවෙන් අපි ඉඩම් අක්කර ගණනාවක් අපතේ යවනවා. ඒවා තිබුණත් වැඩක් නැහැ. අපි මොකක් හෝ සමාගමක් එක්ක -ඇමෙරිකානු සමාගමක් එක්ක- එකතු වෙලා කෝපි වවන්න ගියොත් කියනවා, රෝහණ දිසානායක රාජ්‍ය ඇමතිතුමාගේ පළාතේ තිබෙන ඇල්කඩුව වැවිලි සමාගම ඇමෙරිකාවට විකුණුවා කියලා. හන්තාන වත්තේ ඉන්දියානු සමාගමක් එක්ක වෙන මොනවා හෝ -කොකෝවා- වවන්න ගියොත් කියනවා, හන්තාන ඉන්දියාවට විකුණුවා කියලා. මුහුද විකුණුවා කියනවා, නෝර්වේ රාජ්‍යයට. මේ වැදි බණ නිසා තමයි අද මේ රට මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මහත්මයාටත්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාටත් ඔය ලණු දුන්නා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා නම් එහෙම ලණු කන කෙනෙක් බව අපට මේ දක්වා පෙනිලා නැහැ කියන කාරණයත් මම මතක් කරන්න අවශ්‍යයි.

මම දීර්ඝව කථා කරන්නේ නැහැ. හිටපු ගමන් මේවාට විරුද්ධව බෞද්ධ බලවේග ගොඩ නඟන්න හදනවා. ඊට පසුව මහානායක ස්වාමීන් වහන්සේලා හමුවෙලා ඒ අය අවුස්සලා ලියුම් ලියවා ගන්න උත්සාහ කරනවා. මොකක් හරි කරලා අපි මේ රෝගය සුව කරන්න හදනකොට, රෝගයට සම්බන්ධ ප්‍රශ්න විසඳන්න හදනකොට, රටට ආයෝජන ගෙන එන්න හදනකොට ඒවා නතර කරන්න හදනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඹේවෙල ගොවිපොළ ගැන ඔබතුමා දන්නවා නේ. අඹේවෙල ගොවිපොළ තිබුණේ කොහොමද? අඹේවෙල ගොවිපොළ හැරී ජයවර්ධන මහත්මයාට දුන්නා. ඒ දෙනකොට මේ රටේ විශාල කුසුකුසුවක් ඇති වුණා. අද අඹේවෙල ගොවිපොළේ තත්ත්වය මොකක්ද කියලා ගිහින් බලන්න. ශ්‍රීලන්කන් ගුවන් සේවය එයාර් ලංකා එකට පසු එමිරේට්ස් ගුවන් සේවයත් එක්ක යම් ගිවිසුමකට එළඹුණා. එතකොට රටට පාඩුවක් තිබුණේ නැහැ; බරක් තිබුණේ නැහැ. බදු ගෙවන ජනතාව පිට ඒ බර පැවරුණේ නැහැ. අද ශ්‍රීලන්කන් ගුවන් සේවයේ සියලු බර ජනතාව පිට පැටවිලා තිබෙනවා. ඒකට ටයර් එකක් දමනවා නම්, ඇණ මුරිච්චියක් දමනවා නම් ඒ සියලු බර රටේ ජනතාවගේ බදු ගොඩට පැටවිලා ඉවරයි. ජනතාව නඩත්තු කළ යුතු මෙවැනි ආයතන විශාල සංඛ්‍යාවක් රජය සතුව තියාගන්නවා කියන්නේ, ජනතාව සතුව තියා ගන්නවා කියන එකයි. ඒවායේ බර ජනතාවට දරන්න වෙන තාක්කල් එයින් නිදහස් වීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ කියන කාරණය මතක් කරන්න ඕනෑ. රජයට ව්‍යාපාර කරන්න බැහැ කියන එක තමයි ජනාධිපතිතුමාගේ පැහැදිලි ප්‍රතිපත්තිය. ඔබතුමා

දන්නවා නේ රජයේ නිලධාරින් එක්ක ව්‍යාපාර කිරීම කෙසේ වෙතත්, අපේ අමාත්‍යාංශවල එදිනෙදා වැඩ ටිකවත් කර ගන්න අපහසු බව. ඉතාම හොඳ නිලධාරින් ඉන්නවා වාගේම, "Good morning!" කිව්වත්, "බැහැ" කියන නිලධාරින් තමයි රාජ්‍ය අංශයේ වැඩිපුරම ඉන්නේ. ඉතින්, එහෙම නිලධාරින් එක්ක farms නොවෙයි, අපේ ආයතන පවත්වා ගෙන යන්නේත් බොහොම අමාරුවෙන්. ගොඩ වෙළඳකම්වල ප්‍රතිඵල හැටියට රජයේ ආයතන තවදුරටත් පාඩු විඳිමින් අප සන්තකයේම තියාගන්න හැදුවොත්, කවදාවත් මේ ප්‍රශ්නයෙන් ගොඩ යන්න අපට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ කියන කාරණයත් මම මතක් කරන්න අවශ්‍යයි.

ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ලේඛනයක් සභාගත කළා. මේ රටට ආපු ආයෝජනවලට බදු සහන දීපු නිසා, ඒ සහනවල ප්‍රතිඵලයක් හැටියට රටට වෙච්ච පාඩුව ගැන එතුමා සඳහන් කළා. මේක පුදුම ආර්ථික විද්‍යාවක් ගරු අධ්‍යාපන අමාත්‍යතුමනි. BOI එක සහන දෙන නිසා තමයි ඒ ආයෝජන ලංකාවට ඇවිත් තිබෙන්නේ. ඒ සහන නොදුන්නා නම් ඒ ආයෝජන ලංකාවට එන්නේ නැහැ. අවුරුදු පහක බදු සහන දෙන නිසා ව්‍යාපෘති ගණනාවක් ඇවිත් - ගිය අවුරුද්දේ ඩොලර් බිලියන 1.8ක ව්‍යාපෘති ඇවිත් - ගිවිසුම් අත්සන් කරලා ක්‍රියාත්මක වෙනකොට කියනවා, "බදු ගෙව්වා නම් රජයට මෙච්චර ආදායමක් එන්න තිබුණා. නමුත් එහෙම නැති නිසා රජයේ බදු පාඩුව මෙච්චරයි" කියලා. ඒක සම්පූර්ණයෙන් ජනතාව නොමඟ යැවීමක්. ඒ නිසා දැන්වත් මේ කුහක දේශපාලනය නතර කරන්න ඕනෑ. මෙහි ප්‍රතිඵල අප සියලුදෙනාටම භුක්ති විඳින්න සිද්ධ වුණා. ඒ නිසා, මේ කුහක දේශපාලනය නතර කළ යුතුයි. ගැලරියට කථා කරන එක නතර කරලා, ඊළඟ ඡන්දය ගැන හිතලා කථා කරන එක නතර කරලා, අඩුම තරමින් මේ රට භාර ගන්න කොන්දක් තිබුණු එකම මිනිහාටවත් මේ වැඩේ කරගෙන යන්න ඉඩ දෙන්න ඕනෑ. එසේ නොමැතිව මේ වැදි බණ ඇහුවොත් වන්නේ නැවතත් මේ රට ICU එකට යවන්න වෙන එකයි කියන කාරණය මතක් කරමින්, අඩු තරමින් දැන්වත් මේ ආයෝජනවලට සහාය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින්, මට මේ කාලය වෙන් කර දීම පිළිබඳව ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, සුරක්ෂිතලත් ගනුදෙනු පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය වෙනත් දිනයකට කල් තැබීම, ගරු සභානායකතුමා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත
## நம்பிக்கைப்பொறுப்பு பற்றுச்சீட்டுக்கள் (திருத்தம்) சட்டமூலம்
## TRUST RECEIPTS (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවර වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## උකස් (සංශෝධන) පනත් කෙටුම්පත
## ஈட்டுச்சட்டம் (திருத்தம்) சட்டமூலம்
## MORTGAGE (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "උකස් (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත
## நிதி குத்தகைக்கு விடுதல் (திருத்தம்) சட்டமூலம்
## FINANCE LEASING (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "කල්බදු මූල්‍යකරණ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත
## உள்நாட்டு நம்பிக்கைப்பொறுப்பு பற்றுச்சீட்டுக்கள் (திருத்தம்) சட்டமூலம்
## INLAND TRUST RECEIPTS (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවර වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දේශීය භාර ලදුපත් (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
## கம்பனிகள் (திருத்தம்) சட்டமூலம்
## COMPANIES (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවර වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

## ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
## ஆவணங்கள் பதிவு (திருத்தம்) சட்டமூலம்
## REGISTRATION OF DOCUMENTS (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම පිළිබඳ විවාදය ඉදිරි දිනයකදී තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.*
*அதன்படி விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*The Debate stood adjourned accordingly.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

න්‍යාය පත්‍රයේ විෂය අංක 8 සහ 9 දරන යෝජනා අනුමත කිරීම.

## ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත: නියමය
## செயல்நுணுக்க அபிவிருத்திக் கருத்திட்டங்கள் சட்டம்: கட்டளை
## STRATEGIC DEVELOPMENT PROJECTS ACT: ORDER

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 නොවැම්බර් 28 දිනැති අංක 2360/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.01.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආනයන හා අපනයන (පාලන) පනත: රෙගුලාසි
## இறக்குமதி மற்றும் ஏற்றுமதி (கட்டுப்பாட்டு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජනවාරි 11 දිනැති අංක 2366/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.02.08 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.51ට, 2024 පෙබරවාරි 21 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 4.51 மணிக்கு பாராளுமன்றம், 2024 பெப்ருவரி 21, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 4.51 p.m. until 9.30 a.m. on Wednesday, 21st February, 2024.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.